

කොවිඩ් ව්‍යාප්තිය




# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | தினமின

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ උඳුවප් පුර තියවක ලත් ගුරු දින | කාණ්ඩය 112 | පත්‍රය 01 | පිටු 28 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2020 දෙසැම්බර් 17 බ්‍රහස්පතින්දා

ස්වර්ණභූමියේ අතීතාවලෝකනය අද පත්‍රය සමඟ

## කොවිඩ් 19න් පීඩාවට පත් වූ සැමට

# ඉතිහාසයේ අඩුම පොලියට උත්සව සමයේ ක්ෂණික ණයක්

## වාර්ෂික පොලිය 0.625%යි

## මාස 10කින් ගෙවීමේ පහසුකම්

## අයදුම් කළ වහාම ගිණුම්වලට මුදල්

## උපරිමය රුපියල් 50,000යි

මහින්ද අලුත්ගෙදර

ප්‍රවතින කොවිඩ් වසංගත තත්ත්වය තුළ අභියෝග රැසකට මුහුණ දී සිටින සැමට එළඹෙන උත්සව සමය වෙනුවෙන් ක්ෂණික ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කරයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ මඟ පෙන්වීම යටතේ රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන ඇමැති ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතාගේ උපදෙස් මත මේ ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා වන චක්‍රලේඛය අමාත්‍යාංශ ලේකම් ජේ. ජේ. රත්නසිරි මහතාගේ අත්සනින් යුතුව නිකුත් කොට ඇත. පිට 06



දිනමිණ 111

**දින දින දිනේවා 'දිනමිණ' සඳුන් රුක**

රට දැය සමය රකිනා මිණි පහන් රුක
සියයක් ආයු පසු කරමින් රුපුන් දැක
බියපත් නොවී පෙරටම යන අයුරු දැක
දින දින දිනේවා 'දිනමිණ' සඳුන් රුක

*රඹුකන සිද්ධාර්ථ හිමි*

## බුද්ධි තොරතුරට රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂ නිසි පියවර ගෙන නැ

පිට 6

හිටපු වැ.බ. අධ්‍යක්ෂ ජනපති කොමිසමට කියයි



## වැඩි පිරිසකට ප්‍රතිලාභ ලැබෙන ව්‍යාපෘතිවලට ප්‍රමුඛතාව දෙන්න

පිට 6

## STF මූලස්ථානයේ රාජකාරියක් නැති ලොක්කන් නිසා වැඩ කොට උඩ

නිලධාරීන් 64කට රථ දෙක බැගින්
රියැදුරන් 128ක් යොදවලා
තවත් 10ක් එවන්න සැලසුමක්
මාසයකට ඉන්ධන ලීටර් 250ක්
රාජකාරිවලට ඇත්තේ බසයක් සහ ජීප් රියක් පමණයි පිට 6



## පාස්කු දා ප්‍රහාරයේ වින්දිතයන්ට සහන සැලසීම ගැන අගරදගුරු ප්‍රසාදය

පිට 6

## ජාතික සම්පත් විකුණන්නේ නෑ කියූ ආණ්ඩුව ජනතාවට පිටුපාලා



නදී මාණික්කගේ

ජාතික සම්පත් විකිණීමේ පෙර ගිවිසුම් අහෝසි කරන බවට පොරොන්දු වෙමින් බලයට පැමිණි වත්මන් ආණ්ඩුව ජනතාවට පිටුපාමින් ක්‍රියා කරන බව ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික සුනිල් හඳුන්නෙත්ති මහතා පෙරේදා (15) බත්තරමුල්ල පක්ෂ කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවේදී පැවැසීය. පිට 06

## උපරිමාධිකරණ සංකීර්ණයේ නඩු කටයුතු අද ඇරඹේ

නෙල්කා මැදගෙදර

උපරිමාධිකරණ සංකීර්ණයේ ඇති වූ ගිනි ගැනීමේ සිද්ධියට අදාළව සිදු කරන විමර්ශන හේතුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ ඊයේ (16) කිසිදු නඩු විභාගයක් නොපැවැත්වුණු අතර එම නඩු සියල්ල අද (17) කැඳවීමට තීරණය කර තිබේ.

## උපරිමාධිකරණයේ ගින්න ගැන ස්වාධීන පරීක්ෂණයක් කරන්න

එජාපය රජයෙන් ඉල්ලයි පිට 6

## මව සහ දරුවා යට කළ රියැදුරු සොයා මෙහෙයුම්

පිට 6

## කොවිඩ්

පිට 6

ආසාදිතයෝ 785ක් සුවය ලබති

## 73%ක් සුවය ලැබීම රටේම ජයග්‍රහණයක්

වෛද්‍ය හරිත අලුත්ගේ

## තවත් කොරෝනා මරණ තුනක්

මුළු ගණන 160 දක්වා ඉහළට

## ඉඩ ඇති රෝහල් කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානවලට

සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් තීරණයක්

තල් අරණේ මල් වෙඩි පුපුරයි

## එල්පීඑල් කිරුළ ජැෆ්නා ස්ටැලියන්ස්ට




ජැෆ්නා ස්ටැලියන්ස් - 188/6 (20) සොහේබ් මලික් 46, තිසර පෙරේරා නොදැවී 39, ධනංජය ද සිල්වා 33, අවිශ්ක ප්‍රනාන්දු 27, ජොන්සන් චාල්ස් 26
(ධනංජය ලක්ෂාන් 36/3) ගෝල් ග්ලැඩියේටර්ස් - 135/9 (20) භානුක රාජපක්ෂ 40, අසාම් ඛාන් 36 ( සොහේබ් මලික් 13/2, උස්මාන් ශින්වාරි 20/2)



ජයග්‍රහණයෙන් පසු යාපනයේ තරුණයන් රතිඤ්ඤා දල්වමින් ප්‍රීතිය සැමරූ අයුරු.
*ඡායා - උතුරු පළාත් විශේෂ*

## ගින්න සුළුවෙන් හිතන්න බෑ

පා. මන්ත්‍රී මනූෂ පිට 6






## දිනමිණ 111 වැනි සංවත්සර අතිරේකය දොළොස්මහේ පහන අද පත්‍රය සමඟ

## පොදුරද මඬුලු තරුණ පාර්ලිමේන්තුවේ සෞඛ්‍ය ඇමැති ධුරය ඩිලාන්ට



ශ්‍රී ලංකාවට ඉමහත් අභිමානයක් එක් කරමින් පොදු රාජ්‍ය මණ්ඩලීය තරුණ පාර්ලිමේන්තුවේ ප්‍රධාන නිල 05න් එකක් වන සෞඛ්‍ය ඇමැති ධුරයට ඩිලාන් අබේවර්ධන මහතා පත් කර තිබේ. පිට 06

## වැලිසරින් පැන්න ආසාදිතයා අල්ලයි

ආශ්‍රිතයෝ සොයා පරීක්ෂණ පිට 6

## පාස්කු දා ප්‍රහාරයෙන් මැරුණු අයට වඩා බේරුවල-දිගන සිද්ධිවල වින්දිතයන්ට වන්දි දීලා

පිට 6

## 'රේඩියෝ ගුරුවරයා' සා.පෙළ ඉංග්‍රීසි ප්‍රශ්න පත්‍ර හෙට 'දිනමිණ' සමඟ



# සේනා උවදුර මඬින්න එන්පීවී වයිරසය

## හානිය අනුව වගා සහන දීමට අවධානය

**නදී මාණික්කගේ**

සේනා දළඹු උවදුර මැඩ පැවැත්වීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මේ වන විට එන්පීවී වයිරසය ක්ෂේත්‍රගත කරන බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඩබ්.එම්.ඩබ්. වීරකෝන් මහතා ඊයේ (16දා) දිනමිණට පැවසුවේය.

සේනා දළඹු උවදුර නිසා හානිවූ වගාබිම් පිළිබඳ තක්සේරු වාර්තාවක් කරන ලෙස ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කර ඇති බවත් විලෝපිකයන් හා පරපෝෂිතයන් විශාල වශයෙන් ගුණනය කර ක්ෂේත්‍ර නිලධාරීන්ට බෙදා දීමට කටයුතු කර ඇති අතර අවුරුදු එකහමාරක පමණ කාලයක සිට කරන ලද පර්යේෂණවල ප්‍රතිඵලයක් ලෙස එන්පීවී නම් වයිරසය වාණිජ මට්ටමින් ක්ෂේත්‍රයට නිකුත් කිරීම ආරම්භ කර ඇති බවත් හෙතෙම පැවසීය.

ආර්ථිකමය හානියක් වගාවට සිදුවීමට නම් 30% ක පමණ අස්වනු හානියක් සිදුව තිබිය යුතු බවත් වගාවට හානියක් වී ඇත්නම් තක්සේරු වාර්තා පරීක්ෂා කර බලා යම් සහනයක් ලබා දීමට අවශ්‍ය හැකියාව පිළිබඳ රජය ප්‍රතිපත්තිමය තීරණයක් ගනු ඇතැයිද අධ්‍යක්ෂ ජනරාල්වරයා කියා සිටියේය.

# කොරෝනා වසංගතය මැද සියයට 1.5ක ආර්ථික වර්ධනයක්

## ජන හා සංඛ්‍යාලේඛන නවතම වාර්තාව කියයි

**නුවන් හෙට්ටිආරච්චි**

ශ්‍රී ලංකාවේ ආර්ථිකය කොරෝන ව්‍යසනය ඇතිවීමෙන් පසු 2020 වසරේ තුන්වැනි කාර්තුව සියයට 1.5ක ධනාත්මක වර්ධනයක් වාර්තා වන බව ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සඳහන් කරයි.

ශ්‍රී ලංකා ඉතිහාසයේ දරුණුම ආර්ථික කඩාවැටීම මේ වසරේ දෙවන කාර්තුවේදී සිදු වුවද තෙවැනි කාර්තුවේදී වාර්තාගත ධනාත්මක වර්ධන වේගය පිළිබිඹු කර ඇති බවත් 2019 වසරේ තුන්වන කාර්තුව සමඟ සසඳන විට සමස්ථයක් ලෙස කෘෂි කර්මාන්තය, නිෂ්පාදන කර්මාන්ත, තොග හා සිල්ලර වෙළඳාම, භාණ්ඩ හා මගී ප්‍රවාහනය, තොරතුරු තාක්ෂණය, විදුලි සංදේශ සේවය, මූල්‍ය හා රක්ෂණ සේවා, දේපළ වෙළෙඳාම්, වෘත්තීය සේවා සහ පෞද්ගලික සෞඛ්‍ය සේවා ඇතුළු බොහෝ සේවා ක්‍රියාකාරකම් 2020 තෙවන කාර්තුවේ ධනාත්මක වර්ධන අනුපාතවක් වාර්තා කර ඇති බවත් ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නවතම වාර්තා වේ.

එම මාධ්‍ය නිවේදනය අනුව එය 2019 වසරේ දෙවන කාර්තුවේ වාර්තා කළ 1.1%ක වර්ධන අගය හා සසඳනවිට 2020 දෙවන කාර්තුවේදී 16.3% දැවැන්ත කඩා වැටීමක් සිදුවී ඇත.

එමෙන්ම රටේ ප්‍රධාන ආර්ථික අංශ තුන වන කෘෂිකර්මාන්තය 5.9%කින්ද කාර්මික ක්ෂේත්‍රය 23.1%කින්ද සේවා ක්ෂේත්‍රය 12.9%කින්ද මේ වසරේ දෙවන කාර්තුවේදී කඩාවැටී ඇතැයි එම මාධ්‍ය නිවේදනයේ වැඩිදුරටත් සඳහන් වේ.

# දැදුරු ඔයේ ගිලී 9 හැවිරිදි දරුවා මරුට

**මාවතගම සමූහ - කේ. සෙනරත් බණ්ඩාර විසිනි**

පාඩම් අවසන් කර බයිසිකල් පදිමින් සිටි 9 හැවිරිදි දරුවාගේ සිරුර දැදුරු ඔයේ තිබී හමුවී ඇතිබව මාවතගම පොලිසිය පවසයි.

මෙසේ දියේ ගිලී මිය ගොස් ඇත්තේ මාවතගම අහස් පොකුණ වත්තේ පදිංචි දිනුර සත්සර නැමැති පාසල් සිසුවෙකි. ඔන්ලයින් මාධ්‍යයෙන් නිවෙසේ සිට පාසල් වැඩ කළ දරුවා, එය අවසන් වීමෙන් පසු නිවෙස අසල මාර්ගයේ බයිසිකල් පැද ඇත. දරුවා සවස් වන තෙක් නිවෙසට නොපැමිණීම නිසා ඒ ගැන සොයා බැලීමේ දී අසල පිහිටි දැදුරු ඔයේ තිබී දරුවා ගේ සිරුර පසුගියදා (14දා) හමුව ඇත.

# මහර කැරැල්ලට මුල් වූ රැඳවූවන් සීඅයිඩිය හඳුනා ගනී

**රක්ෂණ ශ්‍රියන්ත**

මහර බන්ධනාගාරය තුළ කැරැල්ලක් නිර්මාණය කළ රැඳවූවන් පිළිබඳ මේ වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරීන් විසින් හඳුනාගැනීමක් සිදුකර තිබෙන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පවසයි.

මහර බන්ධනාගාරයේ පසුගියදා ඇතිවූ සිද්ධිය සම්බන්ධයෙන් මේ වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් ප්‍රකාශ 344ක් සටහන් කරගෙන තිබේ.

මහර බන්ධනාගාර සිද්ධිය සම්බන්ධයෙන් පෙරේදා (15) දින පමණක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ප්‍රකාශ 35ක් සටහන් කරගෙන තිබූ බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පැවසීය.

ඒ අනුව බන්ධනාගාර නිලධාරීන් 107ක්, රැඳවූවන් 147ක්, හෙද නිලධාරීන් 17ක් සහ වෛද්‍යවරුන් 09 දෙනකුගේ ප්‍රකාශ මේ වන විට සටහන් කර ගෙන ඇත.

මහර බන්ධනාගාරයේ කැරැල්ල නිර්මාණය කළ රැඳවූවන් පිළිබඳ තව දුරටත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරීන් විසින් විමර්ශන සිදුකරන බවද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේය.

# යාපනේ බන්ධනාගාරය ඉන්දීය ධීවරයන් ගන්න බැහැ කියයි

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

ඩෙල්ෆ්ට් මුහුදු තීරයේදී නාවික හමුදාවේ අත්අඩංගුවට පත්වූ ඉන්දීය ධීවරයන් 22 දෙනා බාර ගැනීම කොරෝනා බිය නිසා යාපනය බන්ධනාගාරය ප්‍රතික්ෂේප කර ඇත. ලබන 18දා දක්වා මොවුන් රිමාන්ඩ් බන්ධනාගාර ගත කරන ලෙස පෙරේදා (15දා) යාපනය මහේස්ත්‍රාත්වරයා නියෝගයක් දුන්නේය.

අපීසීආර් පරීක්ෂණ වාර්තා නොමැතිව බන්ධනාගාරය ඔවුන් බාර නොගන්නා බවට ධීවර නිලධාරීන් පසුව අධිකරණයට දන්වා ඇත.

ඒ අනුව ඔවුන් දින 14ක නිරෝධායනයකට හා පීසීආර් පරීක්ෂාවකට ලක් කරන ලෙස අධිකරණය නියෝගයක් දී ඇත. ඉන්දීය ධීවරයන් ලබන 22දා දක්වා යාපනය නිරෝධායන මධ්‍යස්ථානයට යොමු කර ඇත.

## තවත් ඉන්දීය ධීවරයෝ 7ක් නිරෝධායනයට

කල්පිටිය සමූහකල්පිටිය උච්චිමුණේ දූපතේ පිහිටි නාවුක හමුදා නිරෝධායන මධ්‍යස්ථානයේදී මොවුන් දින 14ක් නිරෝධායනය කෙරෙන බව නාවුක හමුදා නිලධාරියකු පැවසුවේය. කල්පිටිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයා සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා මේ පිරිස අධීක්ෂණය කරයි. කල්පිටිය විජය නාවුක හමුදා මුර සංචාරක යාත්‍රාවක් අත්අඩංගුවට ගැනීම කර ඇති බව නාවුක හමුදාව පවසයි. අධිකරණ කටයුතු කල්පිටිය පොලිසිය විසින් කිරීමට නියමිතය.

මෙරට මුහුදු සීමාවට අනවසරයෙන් ඇතුළු වූ ඉන්දීය ධීවරයින් 7 දෙනකු හා ඔවුන් ගමන් ගත් ධීවර යාත්‍රාව පෙරේදා (15දා) නාවික හමුදාව අත්අඩංගුවට ගෙන ඇත.

# සෞඛ්‍ය රීති කැඩූ 1493ක් අත්අඩංගුවට

**රක්ෂණ ශ්‍රියන්ත**

මුහුණු ආවරණ පැලඳීම සහ නියමිත දුරස්ථභාවය තබා ගැනීම ඇතුළු නිරෝධායන රීතීන් උල්ංඝණය කළ පුද්ගලයන් 1493 දෙනකු මේ වන විට පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත.

ඊයේ (16) උදෑසන 6.00න් අවසන් වූ ගතවූ පැය 24 තුළ පමණක් නිරෝධායන රීතීන් උල්ලංඝණය කළ පුද්ගලයන් 48 දෙනකු අත්අඩංගුවට ගත් බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා පවසයි.

සෑම විටම සෞඛ්‍ය බලධාරීන්ගේ නියෝග පිළිපදින ලෙසත් පී.සී.ආර්අ, ඇන්ටිජන් පරික්ෂන හෝ වෙනත් පරීක්ෂණ කර ගන්නා ලෙස බලධාරීන් නියෝග කළ විට එයට අවනත වන ලෙසත් හැකිතරම් සංචරණය සීමාකරමින් කටයුතු කරන ලෙසද පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා ඉල්ලා සිටී.

# ඉන්දීය ධීවරයන් මුලතිව් මුහුදේ මාළු බෑම නවත්වන්න

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

ඉන්දීය ධීවරයන් මුලතිව් මුහුදු සීමාව ආක්‍රමණය කිරීමට එරෙහිව උතුරේ හා දකුණේ ධීවර සංගම් එක්ව පෙරේදා (15දා) මුලතිව් දිසාපති කාර්යාලය ඉදිරිපිට විරෝධතාවක් පවත්වා ඇත.

මුලතිව් ධීවර සහයෝගීතා ව්‍යාපාරය, එක්සත් ධීවර සංගමය, ධීවර කාන්තා සංගමය හා ජාතික ධීවර සහයෝගීතා ව්‍යාපාරය මෙම විරෝධතාව සංවිධාන කොට ඇත.

රජය සමග සාකච්ඡා කොට වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස ඉල්ලා විරෝධතාකරුවන් මුලතිව් දිසාපති කේ. කනකේස්වරන් මහතාට ලිපියක් බාර දී ඇත. එයට දින 15ක් ඇතුළත විසඳුමක් නොලැබුණහොත් දැඩි ක්‍රියා මාර්ගයක් ගන්නා බවට ධීවර සමිති දන්වා සිටී.

# ලක්ෂ 5ක හොර සල්ලි අල්ලයි

**රක්ෂණ ශ්‍රියන්ත**

ගොකරැල්ල ප්‍රදේශයේදී රුපියල් පන්දහසේ ව්‍යාජ මුදල් නෝට්ටු 100ක් සමග සැකකරුවන් දෙදෙනකු

පොලිසිය පෙරේදා (15) අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් දෙහිඅත්තකණ්ඩිය සහ ගොකරැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවන්ය. සැකකරුවන් ඊයේ (16) අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි. ගොකරැල්ල පොලිසිය විමර්ශන සිදුකරන අතර වැඩිදුර විමර්ශන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත භාරදීමට නියමිතය.

මේ දිනවල සාප්පු සවාරි සහ විවිධාකරයේ මිලදී ගැනීම් සිදු කරද්දි සැලකිලිමත් වන ලෙසත් මෙවැනි වංචනිකයන් විසින් සමහර විට මුදාහල මුදල් නෝට්ටු තිබිය හැකි බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා කියා සිටියේය.

# වැලිකන්දට නව අලි වැටක්



**චන්දිමා කරුණාරත්න**

මහවැලි කලාපයේ ගොවි ජනතාවගේ සමාජීය, ගැටලුවක් වී තිබෙන වන අලි ගම් වැදීම පාලනය කිරීම සඳහා නවීන තාක්ෂණය භාවිතා කර අලි වැට සංවර්ධනය කිරීමේ නියමු ව්‍යාපෘතියක් පොළොන්නරුව වැලිකන්ද, කන්දකාඩුව ප්‍රදේශයේ දී පසුගියදා (12) ආරම්භ කරනු ලැබීය.

මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය සිරිපාල ගම්ලත් මහතාගේ ප්‍රධානත්වයෙන් මෙම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කෙරිණි.

නියමු ව්‍යාපෘතිය සඳහා, ශ්‍රී ලංකා නව නිපැයුම් කරුවන් ගේ කොමිසම, වනජීවි දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ සහාය, ලැබුණු බව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සඳහන් කරයි.

නව ව්‍යාපෘතිය මඟින් සංවර්ධනය කෙරෙන විදුලි වැට කිලෝමීටර් එකක දුරක් සඳහා වැය වන්නේ රුපියල් ලක්ෂ හයක් වැනි මුදලකි. එය සාමාන්‍ය විදුලි වැට ඉදිකිරීම සඳහා වැය වන මුදලට වඩා රුපියල් ලක්ෂ තුනක අඩුවීමකි. එමෙන්ම මෙම විදුලි වැට හරහා කිලොවොට් 17 ක උපරිමයක් දක්වා විදුලිය බල ධාරිතාවක් යෙදවිය හැකිය. එමගින් විදුලි වැට ස්පර්ශ කරන අලි න්ට, සාමාන්‍ය විදුලි වැටට වඩා වැඩි විදුලි ධාරිතාවක් නිකුත් කෙරේ.

එමඟින් වන අලි න්ට, ගම්මාන සඳහා ඇතුළු වීමේ ඉඩකඩ අහිමි වන අතරම, විදුලි වැට ට, හානි කරන අවස්ථාව ද අහිමි කෙරේ. දැනට පවතින විදුලි වැට මඟින් යෙදවන ස්ථාවර විදුලිය ධාරිතාව කිලොවොට් 07 ක් පමණ වේ. එමෙන්ම නියමු ව්‍යාපෘතියෙන් හඳුන්වා දෙන විදුලි වැට හරහා යෙදවෙන විදුලි ධාරිතාව අඩු වැඩි කිරීමේ හැකියාව පවතියි.

තවද නව නියමු ව්‍යාපෘතියෙන් හඳුන්වා දෙන විදුලි වැට මඟින්, අලි විදුලි වැට ආසන්නයට පැමිණෙන අවස්ථාවේ දී , ප්‍රදේශයේ විදුලි වැට ආසන්නයේ සිටින පදිංචි කරුවන් ට ඒ පිළිබඳව කෙටි පණිවුඩයක් නිකුත් කෙරේ. මෙම නියමු ව්‍යාපෘතිය යටතේ කරපොල, කන්දකාඩුව සිට සිංහපුර දක්වා කිලෝමීටර් 32 ක දුරක් අලි වැට දුරක් සංවර්ධනය කෙරේ.

එය නිරීක්ෂණය කිරීම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් සිදුකරනු ඇත. ව්‍යාපෘතිය සාර්ථක වුව හොත් සියළු මහවැලි කලාප සඳහා හඳුන්වා දෙන බව මහවැලි කලාප ආශ්‍රිත ඇළවේලි හා ජනාවාස පොදුයටිතලපහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍ය සිරිපාල ගමලත් මහතා සඳහන් කළේ ය.

මෙම අවස්ථාවට ශ්‍රී ලංකා නව නිපැයුම් කරුවන් ගේ කොමිසමේ කොමසාරිස් ජනරාල් මහාචාර්ය රංගික හල්වතුර මහතා, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හයවෙනි සැහැල්ලු සේවා බලකායේ , කන්දකාඩුව කඳවුරේ අණදෙන නිලධාරි ලුතිනන් කර්නල් ආචාර්ය නිශාන්ත මුත් තන්ත්‍රිගේ මහතා, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ( තාක්ෂණ) ඉංජිනේරු පී.ජී ගුණපාල මහතා , මහවැලි අධිකාරියේ පර්යේෂණ සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අධ්‍යක්ෂ කෞශල්‍යා විජේවීර මහත්මිය, මහවැලි බී කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකරු නොයෙල් ජයසිරි මහතා ඇතුළු පිරිසක් සහභාගි වී සිටියහ.

# වික්ටෝරියා වේල්ලේ සවිය මැන බැලීමට අනුමැතිය දීමට මැදිහත් වන්න

## මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා ජනපතිගෙන් ඉල්ලීමක් කරයි

**අසේල කුරුළුවංශ**

වසර තිහක් පැරණි වික්ටෝරියා වේල්ලේ ස්ථායිතාව යළි විශ්ලේෂණය කිරීමට ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන IWWRMP (Integrated Watershed and Water Resources Management Project) ව්‍යාපෘතියෙන් මුදල් වෙන් කිරීමට සූදානම් වුවත් ඒ සඳහා වාරිමාර්ග අමාත්‍යාංශයේ අනුමැතිය මෙතෙක් ලැබී නොමැති බව දන්වා ඊට මැදිහත්වීමක් කරන ලෙස මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ. ගමගේ මහතා ජනපතිවරයාගෙන් ලිඛිත ඉල්ලීමක් කර තිබේ.

මේ ලිපියේ වැඩිදුරටත් මෙසේ ද සඳහන් වේ.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂවරයා විසින් පසුගිය සැප්තැම්බර් මස 14 වැනි දින වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්වරයා වෙත මේ බව ලිඛිතව දන්වා තිබෙනවා. අදාළ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අන්තර් ජාතික මට්ටමින් සහයෝගය ගනිමින් කටයුතු කළ යුතුව තිබෙන පසුබිමක වේල්ලේ ස්ථායිතාව පිළිබඳ විශ්ලේෂණයට මෙතෙක් අනුමැතිය ලැබී නෑ.

මහනුවර දිගන ප්‍රදේශයේ පසුගිය අගෝස්තු මස 28 වැනි දින ප්‍රථම වරට භූ කම්පන තත්ත්වයක් වාර්තා වුණා. එදින සිටි මේ දක්වා කෙටි කාලසීමාවකදී භූ කම්පන 09ක් වාර්තාවී තිබෙනවා. මේ සම්බන්ධයෙන් භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ ජ්‍යෙෂ්ඨ භූ විද්‍යාඥයන්, ඉංජිනේරුවරුන්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූ විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් ඇතුළු විද්වත් මණ්ඩලයක් සමඟ මා සාකච්ඡා වාර දෙකක් පවත්වා තිබෙනවා. උද්ගතව පවත්නා තත්ත්වය උදෙසා දිගු කාලීන සහ කෙටි කාලීන ක්‍රියාමාර්ග ගත යුතු බවට එහිදී තීරණය වුණා.

මේ සම්බන්ධයෙන් සමීප අධ්‍යයනයන් තවදුරටත් සිදු කරමින් පවතිනවා. බරපතළ මට්ටමේ අවදානම් තත්ත්වයක් මෙතෙක් නිර්මාණයවී නොමැති බව විද්වත් මතයයි. කෙසේ වුවත් මේ ප්‍රදේශය ආසන්නයේ ඉදි කර ඇති වසර 30ක් පමණ පැරණි සුවිශේෂී වැදගත්කමකින් යුතු වික්ටෝරියා ජලාශය සම්බන්ධයෙන් පවතින අවදානම කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත් කොට සැලකිය යුතු බවට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ප්‍රමුඛ රජයේ නිලධාරීන් මෙන්ම විද්වතුන් ද පෙන්වා දෙනවා. ඒ සඳහා ගත හැකි පියවරක් ලෙස ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් යෝජනා කළේ වසර 30ක් පමණ පැරණි මේ වේල්ලේ ස්ථායිතාව පිළිබඳ යළි විශ්ලේෂණය කිරීම සුදුසු බවයි. සැප්තැම්බර් මස 14 වැනි දින වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්වරයා වෙත මේ බව ලිඛිතව දන්වා තිබෙන බව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂවරයා පවසනවා. අදාළ ක්‍රියාවලිය සම්බන්ධයෙන් අන්තර් ජාතික මට්ටමින් සහයෝගය ගනිමින් කටයුතු කළ යුතුව තිබෙන පසුබිමක වේල්ලේ ස්ථායිතාව පිළිබඳ විශ්ලේෂණයට මෙතෙක් අනුමැතිය ලැබී නෑ.

දිගන ප්‍රදේශයේ දිගින් දිගටම ඇතිවූ මේ භූ කම්පන තත්ත්වය පිළිබඳ අවධානය යොමු කර ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන් යෝජනා කළේ වික්ටෝරියා ජලාශ වේල්ලේ ස්ථායිතාව සම්බන්ධව විශ්ලේෂණය කිරීමට සිදු කරන අධ්‍යයන කඩිනම් කරගැනීමට අදාළ අංශ වෙත අවශ්‍ය උපදෙස් දෙන ලෙසයි.



# රට වටා නව කොරෝනා දෙවැනි රැල්ලේ තතු

## වවුනියාව මහාධිකරණයේ අධිනීතිඥවරයකුටත් කොරෝනා

**උතුරු පළාත් විශේෂ**
**රසුල දිල්හාර ගමගේ**

වවුනියාව මහාධිකරණයේ අධිනීතිඥවරයකුට කොරෝනා වයිරසය වැලඳී ඇති බව ඊයේ (16) උදෑසන සනාථ වී තිබේ.

වවුනියාව මහාධිකරණ කාර්යාලයේ සේවය කළ පොලිස් නිලධාරියකු කොරෝනා ආසාදිතයකු බවට හඳුනාගැනීමෙන් පසුව වවුනියාව මහාධිකරණය තාවකාලිකව වසා දමා එහි සේවකයන් පීසීආර් පරීක්ෂණවලට ලක් කිරීමෙන් පසුව අධිනීතිඥවරයා කොරෝනා ආසාදිතයකු බව තහවුරුවී ඇත. මේ අධිනීතිඥවරයා කල්මුණේ ප්‍රදේශයේ පදිංචිකරුවකු වන අතර ඔහු මීට දින කිහිපයකට ඉහතදී කල්මුණේ ප්‍රදේශයට ගොස් ආපසු පැමිණ ඇත.

## පෑලියගොඩ මාළු වෙළෙඳපොළ තොග වෙළෙඳාම අරඹයි

**බුද්ධිකා ඉඹුලාන**

කොවිඩ් 19 ආසාදිතයන් හමුවීම නිසා ඔක්තෝබර් මස 21 වැනි දින වසා දමන ලද පෑලියගොඩ මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණය සෞඛ්‍ය ක්‍රමවේදවලට අනුව තොග වෙළෙඳාමට විවෘත කිරීම ඊයේ (16) උදෑසන සිදු කෙරිණි. මේ අවස්ථාවට ධීවර ඇමැති ඩග්ලස් දේවානන්දා සහ රාජ්‍ය ඇමැති කංචන විජේසේකර මහත්වරු ද එක්ව සිටියහ.

මෙහි පළමු අදියර යටතේ විවෘත කරන ලද්දේ අලෙවිසල් 78කි. දෙවන අදියර ලෙස අද (17) අනෙක් තොග අලෙවිසල් විවෘත කිරීමට කටයුතු යොදා ඇත.

සෞඛ්‍ය උපදෙස් නිසියාකාරව පිළිපදින ලෙස මත්ස්‍ය වෙළෙඳ සංගමයේ නිලධාරීන්ට ධීවර ඇමැතිවරයා උපදෙස් දෙන ලදි. මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණයට ඇතුළු වන සියලුම ව්‍යාපාරිකයන්ට හැඳුනුම්පතක් නිකුත් කරන අතර අනෙක් සියලු දෙනාගේ පැමිණීම සහ පිටවීම සටහන් කිරීමට ලේඛනයක් පවත්වාගෙන යෑමට ඇමැතිවරයා විසින් මත්ස්‍ය වෙළෙඳ සංගමයේ සභාපති සහ ලේකම් වෙත දැනුම් දුන්නේය. විශේෂයෙන් සනීපාරක්ෂක කටයුතු නිසි පරිදි පවත්වාගෙන යන ලෙසත්, දිනපතා විසබීජහරණය කරන ලෙසත් ඇමැතිවරයා උපදෙස් දී තිබේ.

මෙහිදී අදහස් දැක්වූ රාජ්‍ය ඇමැති කංචන විජේසේකර මහතා මෙසේ ප්‍රකාශ කළේය.

'තාවකාලිකව අද දින සිට තොග වෙළෙඳ කටයුතු මත්ස්‍ය සංකීර්ණයේ රථ ගාලේ සිදු කරනවා. වසර 10ක පමණ කාලයක සිට මේ මත්ස්‍ය සංකීර්ණ ගොඩනැගිල්ලෙහි අලුත්වැඩි කටයුතු සිදුවී නෑ. වර්තමාන රජයේ ප්‍රතිපාදන මත මේ මත්ස්‍ය සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු සඳහා ලක්ෂ 900ක් වෙන් කර තිබෙනවා. එම අලුත්වැඩියා කටයුතු ඉදිරි සති 03ක කාලයේදී අවසන් කිරීමටත් බලාපොරොත්තු වෙනවා. අනතුරුව සිල්ලර වෙළෙඳාම ඇතුළු තොග වෙළෙඳාම පෙර තිබූ පරිදි පවත්වාගෙන යෑමට අපේක්ෂා කරනවා. මාර්ග සංවර්ධන අධිකාරියෙන් වෙළෙඳ සංකීර්ණයට ප්‍රවේශ වීමට නව ප්‍රවේශ මාර්ගයක් මේ වන විටත් සකස් කරමින් පවතිනවා.'

## අරණායක ප්‍රා. ලේකම් කාර්යාලයේ 6ක් ස්වයං නිරෝධායනයට

**අරණායක ප්‍රදීප් කුමාර**

කොවිඩ් 19 ආසාදිතයකුගේ ළඟම ආශ්‍රිතයකු අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිටීම නිසා එහි නිලධාරීන් හය දෙනකු ස්වයං නිරෝධායනයට යොමු කිරීමට පෙරේදා (15) කටයුතු කළ බව අරණායක මහජන සෞඛ්‍ය නිලධාරී වෛද්‍ය රසාංජන මෙන්ඩිස් මහතා පැවැසීය. මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය. 'ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විදේශ රැකියා අංශයේ සේවය කරන නිලධාරිනියකගේ සැමියාට මෙලෙස කොවිඩ් ආසාදනයවී තිබෙනවා. ඔහු කොළඹ වරායේ සේවය කරන අයෙක්. ඉකුත් 13 වැනිදා ඔහු අසනීපවී මාවනැල්ල රෝහලට ගොස් ප්‍රතිකාර ගැනීමේදී කොවිඩ් ආසාදනයවී ඇති බව තහවුරුවී තිබෙනවා. එනිසා නිලධාරිනිය සමීපව ඇසුරු කළ එම කාර්යාලයේ පස් දෙනකු ස්වයං නිරෝධානයට යොමු කිරීමට කටයුතු කළා.'

## සබරගමු සරසවියේ බාහිර දේශකවරියකට කොරෝනා

**බළන්ගොඩ විශේෂ සහ බෙලිහුල්ඔය සමූහ**

සබරගමු විශ්වවිද්‍යාලයයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ බාහිර දේශකවරියකට කොරෝනා වයිරය ආසාදනයවී ඇතැයි පේරාදෙණිය රෝහලකින් සිදු කළ පීසීආර් පරීක්ෂණයේදී තහවුරුවී ඇතැයි ඉඹුල්පේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා ඊයේ (16) පැවැසීය. ඇය ඉකුත් 07 වැනිදා සබරගමු විශ්වවිද්‍යාලයට පැමිණ ඇති අතර ඉකුත් සෙනසුරාදා (12) විශ්වවිද්‍යාලයෙන් පිටව ගොස් තිබේ. ඇය නුවර ප්‍රදේශයේ පදිංචිකාරියක වන බවත්, එම ප්‍රදේශයට ගිය පසු ඇතිවු කැස්ස සහ උගුරේ ආබාධයක් හේතුවෙන් සිදු කළ පීසීආර් පරීක්ෂණයේදී කොරෝනා ආසාදනයවී ඇති බවට තහවුරු වූ බව ඉඹුල්පේ පරිපාලනය මහජන සෞඛ්‍ය පරීක්ෂක පී. ටී. සී. ප්‍රනාන්දු මහතා පැවැසීය. ඇය නවාතැන්ගෙන සිටි බෙලිහුල්ඔය ප්‍රදේශයේ පුද්ගලයකු සහ පළමු ආශ්‍රිතයන් හතර දෙනකු නිරෝධායනයට යොමු කර ඇත.

## මැදවච්චියේ 30ක් නිරෝධායනයට

**කැබිතිගොල්ලෑව සමූහ**

පොලිස් නිලධාරිවරයකුට කොරෝනා ආසාදනය වීම හේතුවෙන් මැදවච්චිය තම්මැන්නෑව ගම්මානයේ 30කට ආසන්න ආශ්‍රිතයන් ප්‍රමාණයක් නිරෝධායනය කිරීමට මැදවච්චිය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු පසුගියදා කටයුතු කළහ.

කොළඹ ප්‍රදේශයේ රාජකාරී කටයුතු සිදු කළ මේ නිලධාරියා නිවාඩු ලබා මැදවච්චිය තම්මන්නෑව පදිංචි නිවෙසට පැමිණ නිවාඩු අවසන් කර නැවත කොළඹ පොලිස් ස්ථානයට පැමිණ ඇත. ඉන්පසු දින කොළඹින් කළ පීසීආර් පරීක්ෂණයෙන් ඔහුට කොවිඩ් ආසාදනය වී ඇති බව හඳුනාගෙන ඇත. එම හේතුවෙන් ඔහුගේ නිවෙසේ පුද්ගලයන් සහ ආශ්‍රිතයන් මෙලෙස නිරෝධායනයට යොමු කර තිබේ.

## යාපනයෙන් කොරෝනා ආසාදිතයන් 13ක් හමුවේ

**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

යාපනයේ විවිධ පළාත්වලින් පෙරේදා (15) දින කොරෝනා රෝගීන් 13ක් හමු වූ බව උතුරු පළාත් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ඒ. කේතීස්වරන් මහතා පැවැසීය.

මේ පිළිබඳව වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'මේ 13 දෙනා හමුවී තිබෙන්නේ යාපනයේ පුද්ගලයන් 355ක් පීසීආර් පරීක්ෂණවලට ලක්කිරීමෙන් පසුවයි. මේ නව කොරෝනා රෝගීන් උඩුවිල් ප්‍රදේශයෙන් 6ක්, තෙලිප්පලෙයි ප්‍රදේශයෙන් 3ක්, නල්ලූර් හා සන්දිලිපායි පළාත්වලින් දෙදෙනා බැගින් ද හමු වුණා.

යාපනයේ සෑම ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි දිනපතාම පීසීආර් පරීක්ෂණ 500කට ආසන්න ප්‍රමාණයක් සිදු කරනවා. යාපනයේදී මේ දිනවල වැඩිම කොරෝනා රෝගීන් සංඛ්‍යාවක් හමු වූයේ මරදනාමඩු පොදු වෙළෙඳපොළේ පිරිස අතරින්.'

## නිරෝධායන නීති උල්ලංඝනය කර උත්සව පැවැත්වූ 47ක් හුදෙකලා කෙරේ

**මඩකලපුව සමූහ ටී. එල්. ජවුෆර්කාන්**

නිරෝධායන නීති උල්ලංඝනය කරමින් උත්සව පැවැත්වූ මඩකලපුව ප්‍රසිද්ධ සංචාරක නේවාසිකාගාරයක හිමිකරු ඇතුළු වැඩසටහන් සංවිධාන කළ පෞද්ගලික ආයතනයක 46 දෙනකු හුදෙකලා කර ඇති බව කල්ලඩි මහජන සෞඛ්‍ය පරීක්ෂක එස්. අම්ර්තාබ් මහතා පැවැසීය. පෙරේදා (15) මඩකලපුව කල්ලඩි ග්‍රීන් ගාර්ඩන් සංචාරක නේවාසිකාගාරයක මඩකලපුව සොෆ්ට්ලොජික් ලයිෆ් පෞද්ගලික ආයතනයකින් මේ උත්සවය පවත්වා ඇත.

## බඩල්කුඹුර අලුපොත හුදෙකලා කෙරේ

**ඩී. එස්. ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ**

බඩල්කුඹුර අලුපොත ගම්මානයෙන් කොවිඩ් 19 ආසාදිතයන් 24 දෙනකු හමුවීමෙන් පසු ඊයේ (16) සිට එම ගම්මානය හුදෙකලා කිරීමට පියවරගෙන ඇතැයි මොනරාගල දිසාපති ගුණදාස සමරසිංහ මහතා පැවැසීය.

කොළඹ මරදාන ප්‍රදේශයේ සිට අලුපොත ගම්මානයට පැමිණ සිටි පුද්ගලයකු කොවිඩ් ආසාදිතයකු බවට අනාවරණය වීමත් සමඟ ඔහු සිටි නිවෙසේ පිළිකා රෝගයෙන් පෙළෙමින් සිටි කාන්තාවක් ද කොවිඩ් 19 රෝගය වැළඳීමෙන් ඉකුත්දා (10) මිය ගොස් ඇත. අනතුරුව ගම්වැසියන් දෙසීයකට ආසන්න පිරිසක් පීසීආර් පරීක්ෂණවලට යොමු කිරීමෙන් පසු විසි දෙදෙනකු කොවිඩ් 19 ආසාදිතයන් බවට හඳුනාගෙන තිබේ.

මේ තත්ත්වය මත සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ මත මේ ගම්මානය හුදෙකලා කළ බව දිසාපතිවරයා වැඩිදුරටත් පැවැසීය.

### ගිනිකොණ

දන මන නව රසය සමඟින් පුබුදුවන
යන එන මඟ පවා තනිකම දුරු කරන
දෙනයන මතින් පැන නැණැසෙහි නතර වන
දිනමිණ යෙහෙන් වැජඹේවා දිනෙන් දින



ගජමන් නෝනා

### අද නාත්තා

වල් ටික කපා ගන්නට පල්ලියෙ වත්තේ
පූජකතුමන්ලා පිහියා අර ගත්තේ
මුස්ලිම් ඇමැතියකු සිටි කඳුරට පැත්තේ
කොමිසමකට ඇවිත් එය පවසා ඇත්තෙ!

පිළිගෙන සහරාන්ලා අරගත් පැත්ත
එළි කර තිබෙන්නේ තොරතුරු දැන ගත්ත
ජන හමු තියා කී දේ සහතික ඇත්ත
අනුකම්පා කරමු ! පොඩි බබෙකුට තොත්ත

රටේමුල්ලේ මුදන්නායක

## තඹුත්තේගම ආර්ථිකයේ කොවිඩ් ආසාදිතයෝ 7ක්



**තලාව සමූහ**
**බී. ඩබ්. ඩී. ධර්මකීර්ති**

තඹුත්තේගම විශේෂ ආර්ථික මධ්‍යස්ථානයේ කරන ලද පීසීආර් පරීක්ෂණවලින් කොවිඩ් 19 ආසාදිතයන් 7 දෙනකු හමුවූ බව මහජන සෞඛ්‍ය පරීක්ෂක බුද්ධික මල්ලවආරච්චි මහතා පවසයි.

මේ ආසාදිත පුද්ගලයන් අනුරාධපුර විශේෂ ප්‍රතිකාර මධ්‍යස්ථානය වෙත යොමු කර ඇත.




දිනමිණ
The Dinamina
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2020 දෙසැම්බර් 17 බ්‍රහස්පතින්දා

# දිනමිණ කන්තෝරුව

දිනමිණ අද 111වන උපන්දිනය සමරයි

කාලය වෙනස් වෙයි. තාලය ද වෙනස් වෙයි. ලෝකය පරිවර්තනවලට හසු වන අතර මානව සමාජය එහි ගොදුරක් බවට පත් වෙයි. විවිධ ප්‍රවණතා පැමිණ මිනිස් චර්යාරටා වෙනස් කරයි. ඒ ප්‍රවණතා මත්තෙහි තව ප්‍රවණතා පැමිණ කැලැඹීම් ඇති කරයි. පරණ සංකල්ප හා න්‍යාය අහෝසි වෙයි. අලුත් සංකල්ප හා අලුත් න්‍යාය ඉදිරියට එයි. යුද්ධ, වසංගත, ස්වාභාවික විපත් කඩා වැදී සමෘද්ධිය විනාශ කරයි. යළි බන්දුවේ සිට නැගී සිටින්නට සිදු වෙයි. නැගීම හා බැසීම ස්වාභාවිකය. ඒවාට ඔරොත්තු දෙමින් පරිණාමයට පත්වීම එහි නීතිය වෙයි. පුද්ගලයකුට වුව ආයතනයකට වුව පොදු ධර්මතාව එය වෙයි.

අදට අපේ උපන්දිනය යෙදී තිබේ. අවුරුදු එකසිය දහයක් හෙවත් දසක එකොළහක් ගෙවී ඇත. එකසිය එකොළොස් වන අවුරුද්ද අද සිට ආරම්භ වෙයි. දැන් අප ලෝකය දෙස බලන්නේ වඩාත් පරිණත ආකාරයෙන්ය. ඉතිහාසයේ සිද්ධි මතින් පමණට වඩා ප්‍රීති නොවන ලෙස ද පමණට වඩා ශෝක නොවන ලෙස ද පඬුවන් උපදේශන සපයා තිබේ. එහි අර්ථය වන්නේ උපේක්ෂාවෙන් ලොව දෙස බලනු! යන්නය. ආවේගකාරී ගතිය පත්තරයකට සුදුසු දෙයක් නොවේ. අප කිසිදිනෙක කිසි සිද්ධියක් හමුවේ ආවේගශීලී වූයේ නැත. හැඟුම්බර වූයේ නැත. අමෙරිකාවේ හැඟුම්බර පත්තර කලාව "යෙලෝ ජර්නලිසම්" යනුවෙන් හැඳින්විණි. එය ප්‍රතික්ෂේප වී බොහෝ කල්ය.

1909 දෙසැම්බර් 17දා දිනමිණ දිනපතා පුවත්පත ආරම්භ වන්නේ ජාතියේ බුද්ධිමය අවශ්‍යතාවක් සපුරාලීම සඳහාය. ජනතාවට ඇත්ත ආරංචි ලබා දෙමින්, ඔවුන්ගේ දැනුම වඩමින් ඔවුන් ගත යුතු ක්‍රියාමාර්ග සඳහා මඟ පෙන්වන්නෙක් නොවීය. එවකට අපේ රට පැවැතියේ ඉංග්‍රීසි පාලනය යටතේය. මහා බ්‍රිතාන්‍යයේ මහ රජන අපගේ ද උත්තම පාලිකාව වූවාය. ජාතිය එක අතෙකින් පරාධීන මානසිකත්වයේ පසු වූ අතර, තව අතෙකින් බෙදී, වෙන් වී, විසිරී සිටියේය. ජාතියක් ඒකරාශී කිරීම ද මතවාදීව සන්නද්ධ කිරීම ද දිනමිණට පැවරුණු වගකීම විය. එහිම තවත් අර්ථයක් වන්නේ නිදහස් සටනේ පුරෝගාමියකු වන්නට දිනමිණට හැකියාව ලැබුණු බවය. දෙස-බස-රැස සුරක්ෂිත කිරීම අපේ තේමා පාඨය විය. අදටත් එය නොවෙනස්ය.

අපේ පත්තර කලාව තුළ අපටම අනන්‍ය වූ විශේෂ ලක්ෂණ කිහිපයක් තිබේ. එක; ජාතිවාදී - ආගම්වාදී හා අන්තවාදී අදහස් ප්‍රකාශනවලට ඉඩක් නොදීමය. දෙක; දේශීයත්වයට, ඓතිහාසික උරුමයට හා සංස්කෘතික හර පද්ධතියට ප්‍රමුඛතාව දීමය. තුන; රාජ්‍ය ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යෑමට හා රටේ සංවර්ධනය ශක්තිමත් කිරීමට හවුල්කාරයකු ලෙස සහභාගි වීමය. හතර; භාෂා හා සාහිත්‍ය ආදී විෂය ක්ෂේත්‍රවල අභිවර්ධනය උදෙසා කැපවීමක් සිදු කිරීමය. දිනමිණ මුල සිටම මෙබඳු ප්‍රතිපත්ති මාලාවක් අනුගමනය කරමින් සිය සන්නිවේදන ක්‍රියාවලියෙහි නිරත වන්නේ ජනමාධ්‍ය සංගම් හා උපදේශන සහා ආචාරධර්ම පද්ධතියක් ගැන කතා කරන්නට පෙර සිටය.

1970 ගණන් වන විට අග්නිදිග ආසියාවේ විධිමත් පත්තර ආයතනය ලෙස ප්‍රකට වූයේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමය. එනමින් වැඩිදියුණුවට පත්වන්නේ 1909 දී ආරම්භ කළ දිනමිණ කන්තෝරුවය. ලේක්හවුසියේ අක්මුල් ඇත්තේ දිනමිණ පත්තරය තුළ යැයි කිව හැකිය. සමහරු අදටත් ලේක්හවුසිය හැඳින්වීම සඳහා දිනමිණ කන්තෝරුව යන්න යොදති. ශ්‍රී ලංකාවේ මුද්‍රිත ජනමාධ්‍යයේ පුරෝගාමියා වන්නේ ද ලේක්හවුස් ආයතනයයි. පත්තර කලාව තුළ නව ආරක් ඇති කිරීමටත් පත්තර කර්මාන්තයට විධිමත් කළමනාකරණ රටාවක් හඳුන්වා දීමටත් අප ආයතනය සමත් වී තිබේ. විවිධ ජනමාධ්‍ය ආයතන පැවැතිය ද මාධ්‍ය සේවක අයිතිවාසිකම් සුරක්ෂිත කළ ආයතනය ලේක්හවුසිය වෙයි.

2000 ගණන්වල සිටම ලෝක පත්තර කලාව තුළ විවිධ අර්බුද හටගෙන තිබේ. අලෙවියේ බිඳවැටීම, ආයතන පාඩුලැබීම, කඩදාසි මිල ඉහළ යෑම හා තවත් ගැටලු ඊට හේතුසාධක වී ඇත. ලෝක පත්තර කලාව තුළ මතු වන චලන මෙන්ම රටේ දේශපාලන චලන ද පත්තර ආයතනයකට බලපායි. ඒවායින් බැහැරව හුදෙකලාව දුවන පත්තර කර්මාන්තයක් තිබිය නොහැකිය. සමාජ - ආර්ථික හා දේශපාලනික ප්‍රවණතාවලට මුහුණ දෙමින්ම අපගේ පැවැත්ම හා ප්‍රතිපත්ති ආරක්ෂා කර ගැනීමට අප සමත් වී තිබේ. එහි ප්‍රණාමය හිමි විය යුත්තේ මේ ආයතනයේ ඉහළ කළමනාකාරිත්වයටය. එච්. එස්. පෙරේරා මහතා අපූරු පත්තරයක් රටට දායාද කළ අතර ඩී. ආර්. විජයවර්ධන මහතා දැවැන්ත පත්තර ආයතනයක් බිහි කළේය. එහි ශක්තිමත් අඩිතාලම කිසිවකුටත් වෙනස් කළ නොහැකිය.

අප ආ ගමන් මග දෙස ආපසු හැරී බැලුව හොත් එය එතරම් සුන්දර නැත. වරෙක කැරලිකරුවෝ අපේ පත්තරවලට හා මතවාදවලට පහර දුන්හ. තව වරක් කොටි ත්‍රස්තවාදියෝ ආයතනයට කඩාවැදී පහර දුන්හ. මෙලෙස විවිධාකාර ගැටුම්වලට මුහුණ දෙන්න ද, ඊනියා මතවාද පරාජය කරන්න ද අපට සිදු විය. එහිදී අපගේ සාමූහික ප්‍රයත්න හැමවිටම නිවැරදි වූ අතර, හැමවිටම සාර්ථකභාවයට ද පත් විය. ඉතිහාසය දෙස ආපසු හැරී බලන විට නිහතමානී ආඩම්බරයක් අප කා තුළත් මතු වේ. ඒ අපගේ චින්තනයේ හා පරිශ්‍රමයේ ප්‍රතිඵල අප ඉදිරිපිට ඇති බැවිනි. පත්තර ආයතනයක වගකීම වන්නේ ජාතියට මඟ පෙන්වීමය: එලෙසම ජනතාවගේ වේදිකාවක් ලෙස ක්‍රියා කිරීමය. ඒ දෙකම ඉටු කරන්නට දිනමිණ උත්සාහ කරයි.

මෙබඳු දැවැන්ත ආයතනයක් බිහි කිරීමට හා පවත්වා ගෙන යෑමට දායක වූ සැමට ජාතියේ කෘතඥතාව හිමි විය යුතුය. නව දේශපාලන අධිකාරිය යටතේ වඩාත් පුළුල් නිදහසක් ද ලැබී තිබේ. දැන් අප සමබර යැයි කියන්නට පුළුවන. ආණ්ඩුවට මෙන්ම විපක්ෂයට ද ඉඩප්‍රස්තා දීම අපගේ ක්‍රමය වී ඇත. නිදහස් ජන මාධ්‍යයේ යථා ස්වරූපය එයයි.



දිල්රුගෙ සීවිද

| | |
|---|---|
| එක් සියවසක් ජන හදවත් හැඳින | දැන |
| තව දශකයක් පසු කර පෙරමුණට | යන |
| එකසිය එකොළහෙත් තුණු ජවයෙන් | දිලෙන |
| දිනමිණ පුවත්පත් අඹරෙහි හිරු | කිරණ |






පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික හා සංඛ්‍යාන විද්‍යා දෙපාර්තමේන්තුවේ මහාචාර්ය
මාලක රණතිලක

# ජනතාවට වැඩ කරන පළාත් සභාවක්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට දහතුන් වැනි සංශෝධනය ගෙන එමින් පළාත් සභා ක්‍රමය හඳුන්වා දෙනු ලැබුවේ බලය විමධ්‍යගත කිරීමේ අරමුණිනි. එම අරමුණු ඒ ආකාරයෙන්ම ඉටු වුවේද යන ප්‍රශ්නය අදටත් අප අතර සාකච්ඡාවට බඳුන් වන්නේ මධ්‍යම රජය එක් අතකින් පළාත් සභාවලට බලය අනෙක් අතින් එම බලය ලබා ගැනීම හේතුවෙනි. ඒ සම්බන්ධව උතුරු නැගෙනහිර පළාත් සභා නියෝජිතයන් නිතර විවේචනාත්මක අදහස් පළ කළත් සිංහල බෞද්ධ බහුතරය ජීවත් වන ප්‍රදේශවල පිහිටි පළාත් සභා මගින් එම හඬ උතුරු නැගෙනහිරින් තරම් ප්‍රබලව මතු නොවිණි.එසේ වුවත් එම පළාත් සභාවන්හි ප්‍රධාන ඇමැතිවරුන් මහ ඇමැති සම්මේලනවලදී පළාත් සභාවලට දහතුන් වන සංශෝධනයෙන් පවරා තිබෙන බලතල ඒ අකාරයෙන්ම දී නොමැති බව සෑම අවස්ථාවකදීම සාකච්ඡාවට බඳුන් කර තිබේ. පළාත් සභා මුදල් කාබාසිනියා කරන සුදු අලියකු බවට චෝදනා කරමින් එය අහෝසි කළ යුතු බවට සාමාන්‍ය ජනතාව වෙතින් පමණක් නොව දේශපාලනඥයන් වෙතින්ද විටින් විට අදහස් පළව ඇත. දැන් අපි වසර තුනකට ආසන්න කාලයක් පළාත් සභා නොමැතිව කල් ගෙවන්නෙමු. පළාත් සභා නොමැති වීම අපේ ජීවිතවලට සිදුකර තිබෙන බලපෑම කුමක්ද යන්න සොයා බැලීමේදී එය ප්‍රමාණාත්මකව ඉතාම අඩු අගයක තිබෙන බවට තර්කයක් නොමැත. ජනපතිවරයා විසින් මැතිවරණයට දින නියම කර පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසු කොවිඩ් අර්බුදය නිසා මැතිවරණය දිනෙන් දින කල් යද්දී පාර්ලිමේන්තුව යළි රැස් කරන්නැයි විපක්ෂය හඬ නැගීය.ඒ සඳහා අධිකරණය වෙත යෑමට දේශපාලන පක්ෂ මෙන්ම සමාජ කණ්ඩායමක් පියවර ගත්හ.මේ තුළින් පාර්ලිමේන්තුවක අවශ්‍යතාව දේශපාලනය සම්බන්ධ මළ පොතේ අකුරක් නොදන්නා අයට පවා දැනෙන්නට විය.එවැනි අවශ්‍යතාවක් පළාත් සභා සම්බන්ධයෙන් ජනතාව තුළ නොමැත. පළාත් සභා තිබුණත් නැතත් අපට කමක් නැතැයි ජනතාව පවසන්නේ ඒ නිසාය.

## සීමා නිර්ණ ගැටලු

'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යනු රටේ මූලික නීතියයි.එයට අනුව පළාත් සභා ක්‍රියාත්මක විය යුතුය. පළාත් සභා මැතිවරණයට අදාළ වූ 1988 අංක 2 දරන පැරණි පනතට අනුව පළාත් සභා විසුරුවා හැරියායින් පසුව මාස දෙකක් තුළ මැතිවරණය පවත්වා මහ ඇමතිවරයකුත් පළාත් ආණ්ඩුවකුත් පත් කරගත යුතුය.යහ පාලන ආණ්ඩු සමයේ ගෙනා 2017 අංක 17 දරන පනත මගින් පළාත් සභාවක් විසුරුවා හැර සති 8 ක් තුළ මැතිවරණය පැවැත්විය යුතුය යන නීතිය ඉවත් කරනු ලැබීය. එතෙක් පැවැති මැතිවරණ ක්‍රමය වෙනුවට මිශ්‍ර හා සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ ඡන්ද විමසීම පැවැත්වීම සඳහා යෝජනාවක් පාර්ලිමේන්තුවේ සම්මත කළ අතර ඒ සඳහා ඡන්ද කොට්ඨාස සීමා නිර්ණය කිරීම අත්‍යවශ්‍යය කාරණයක් විය.සීමා නිර්ණයේදී ඇතිවූ ගැටලු හේතුවෙන් දිනෙන් දින පළාත් සභා මැතිවරණය කල්ගිය අතර වත්මන් ආණ්ඩුව පැරණි ක්‍රමය යටතේ මැතිවරණය කඩිනමින් පැවැත්වීම කෙරෙහි අවධානය යොමුකර තිබේ.මේ සඳහා හැකි ඉක්මණින් පක්ෂ නායකයන් එකතු වී යම් එකඟතාවයකට පැමිණ කැබිනට් මණ්ඩලය වෙත නැවත ඉල්ලීමක් කරන්නැයි අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතාද පවසා ඇත.එකී ඉල්ලීම කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව කැබිනට් මණ්ඩලය විසින් ඒ සම්බන්ධව දීර්ඝ වශයෙන් සාකච්ඡා කොට තීන්දුවක් ගැනීමට නියමිත බව කැබිනට් ප්‍රකාශක ජනමාධ්‍ය අමාත්‍ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා පවසා තිබේ. මැතිවරණ කොමිෂන් සභාවේ නව නියෝජිතයන් හමු වූ අවස්ථාවේ අගමැතිවරයාද ඔවුන්ට පවසා තිබුණේ පළාත් සභා මැතිවරණය කඩිනමින් පැවැත්වීමට ඇති හැකියාව සොයා බලන ලෙසය. මේ අනුව වත්මන් ආණ්ඩුව තුළ පළාත් සභා මැතිවරණය කඩිනමින් පැවැත්වීම සඳහා උනන්දුවක් පවතින බව පැහැදිලිව පෙනෙන්නට ඇත.

## ඉන්දියාවේ උනන්දුව

ඉන්දියාවේ අවශ්‍යතාවක් මත අපට පළාත් සභා බලහත්කාරයෙන් පැටවූවක් බව රටම දන්නා කරුණකි. පළාත් සභා සියල්ල අක්‍රීයව පවතිද්දී ඉන්දියාව ඒ සම්බන්ධයෙන් හඬ අවදි කිරීම තුළින් පෙනෙන්නේ ඔවුන් අපේ රටේ දේශපාලන ක්ෂේත්‍රයේ හැසිරීම සම්න්ධව දක්වන උනන්දුවේ ස්වභාවයයි.කෙසේ වුවත් පළාත් සභාවලට නිසි බලය බෙදීමක් සිදුවුණේද යන ප්‍රශ්නයට එහා ගිය තවත් ප්‍රශ්න රැසක් තිබේ. එනම් පළාත් ජනතාවගේ අවශ්‍යතා සම්බන්ධව පළාත් සභා නියෝජිතයන් තුළ නිසි අවබෝධයක් තිබුණේද යන ප්‍රශ්නයයි. ඔවුන් පළාත් සභා තුළින් ජනතාවට අවශ්‍ය වැදගත් ව්‍යාපෘති දියත් කරනු ලැබුවේද යන ප්‍රශ්නය අප හමුවේ තිබේ. පසුගිය කාලය පුරා පළාත් සභා ක්‍රියාත්මක වූයේ පාර්ලිමේන්තු සිහින දකින මහජන නියෝජිතයන්ගේ තාවකාලික නවාතැනක් ලෙසිනි.පාර්ලිමේන්තු මැතිවරණයේදී ජනතාව ප්‍රතික්ෂේප කරන බොහෝ දෙනකු ඊළඟට නතර වන්නේ පළාත් සභාවේය. එතැනට ගියදා පටන් ඔවුන් සිහින දකින්නේ පාර්ලිමේන්තු යෑමට මිස පළාතේ ජනතාවට වැඩක් කරන්නට නොවන්නේය.පසුගිය මහ මැතිවරණයේදී ජනතාව ප්‍රතික්ෂේප කළ බොහෝ පිරිසක් දැන් දතකට මදිමින් සිටින්නේ කෙසේ හෝ පළාත් සභාවට යෑමටය.පළාත් සභා ස්ථාපිත කිරීමේ අරමුණු බිඳ වැටීමට මෙයද එක් හේතුවකි. ජනතාව තුළ පළාත් සභා සම්බන්ධව ප්‍රසාදයක් ඇති නොවන්නේ මේ නිසාය. අදද මේ රටේ ජනතාව වෙතින් විමසීමක් කළහොත් ඔවුන් වැඩි දෙනා පළාත් සභාවලට විරුද්ධය.ඔවුන් ඇත්තෙන්ම විරුද්ධ වන්නේ පළාත් සභාවලට වඩා එය වර්තමානයේ ක්‍රියාත්මක වන ආකාරයටය. එසේ නම් අප කළ යුතු වන්නේ එම දුර්වලතා මඟ හරවා ගැනීමට පියවර ගැනීම මිස පවතින ආකාරයෙන්ම පළාත් සභා පවත්වාගෙන යාම නොවන්නේය.

> මේ රටේ ජනතාව වෙතින් විමසීමක් කළහොත් ඔවුහු වැඩි දෙනා පළාත් සභාවලට විරුද්ධය. ඔවුන් ඇත්තෙන්ම විරුද්ධ වන්නේ පළාත් සභාවලට වඩා එය වර්තමානයේ ක්‍රියාත්මක වන ආකාරයටය. එසේ නම් අප කළ යුතු වන්නේ එම දුර්වලතා මඟ හරවා ගැනීමට පියවර ගැනීම මිස පවතින ආකාරයෙන්ම පළාත් සභා පවත්වාගෙන යෑම නොවන්නේය.

මධ්‍යම රජයේ පාසල්වල ගුරු අතිරික්තයක් තිබියදී පළාත් සභා පාසල්වල දැඩි ගුරු හිඟයක් පවතී. රෝහල් පද්ධතිය ගත්තද පළාත් සභා යටතේ ඇති රෝහල් ක්‍රියාක්මක වන්නේ අවම පහසුකම් මධ්‍යයේය. මධ්‍යම ආණ්ඩුවෙන් පළාත් සභාවලට වෙන් කරන මුදලින් 60% කටත් වැඩි ප්‍රමාණයක් වැය කරනු ලබන්නේ රාජ්‍ය සේවක වැටුප්වලටය. පළාත් මට්ටමින් ආණ්ඩුකාරවරු, මහ ඇමැතිවරු, ඇමැතිවරුන් හා මන්ත්‍රීවරු සිටියදී පළාත් සභා සම්බන්ධ තීන්දු තීරණ ගැනීමට මධ්‍යම රජයේ ඇමැතිවරයෙක්ද සිටී. මෙය එක්තරා අන්දමකින් පළාත් සභාවලට නාස් ලණුව දැමීමකි.ඒ ඒ පළාත්වල සිදු කෙරෙන නිෂ්පාදන සඳහා වෙළෙඳපොළ පවතින්නේ අගනුවරය. පළාත් සභා සතුව ඔවුන්ගේ නිෂ්පාදන සඳහා අගය එකතු කිරීමේ වැඩපිළිවෙළක් නොමැති නිසා පළාත් මට්ටමින් කෙරෙන නිෂ්පාදන වල ලාභය එකතු වන්නේ බස්නාහිර පළාතටය. එක් පුටුවක් මිලට ගැනීමට රුපියල් ලක්ෂ පහ හය වියදම් කරන්නට බස්නාහිර පළාත් සභා නියෝජිතයෝ කටයුතු කරද්දී සෙසු පළාත් සභා නියෝජිතයන්ට මුදල් නොමැති බව පවසමින් මැසිවිලි කියන්නට සිදුවී ඇත්තේ මේ නිසාය. නිර්මාණශීලිත්ව අතින් පළාත් සභා සිටින්නේ බිංදුවේය.මධ්‍යම රජයේ අතකොලුවක් බවට පත්ව ඔවුන්ගේ අඬ හැරයට සීසාන තත්ත්වයකට අද පළාත් සභා පත්ව තිබෙන්නේ ඒවාට පත්වූ මහජන නියෝජිතයන්ගේ වරදිනි. පළාත් සභා පිහිටුවා බලය විමධ්‍යගත කිරීම යනු උතුරු පළාත් සභාවේ දෙමළ අයකු මහ ඇමැති වීම නොවේ. තමන් වෙනුවෙන් තීරණ ගැනීම සඳහා තමන් පත්කළ නියෝජිතයන් ඒ සඳහා කටයුතු කරන්නේය යන හැඟීම එම ප්‍රදේශයේ ජනතාව තුළ ඇතිවිය යුතුය. එය උතුරේ තබා දකුණේද ජනතාව තුළද ඇතිවී නොමැති බව කනගාටුවෙන් වුව කිව යුතුව තිබේ.


යහ පාලන සමයේ උතුරු මැද පළාත් සභාවේ ප්‍රධාන ඇමැතිවරයා එම පළාතේ බිඳ වැටී තිබෙන අධ්‍යාපනය නගා සිටුවීමට වැඩසටහනක් සකස් කරනු ලැබීය. ප්‍රාථමික පාසල් වල ගණිත,විද්‍යා හා ඉංග්‍රීසි ගුරු හිඟය නිසාත්, එම විෂය ක්ෂේත්‍රවලට අදාළ ප්‍රතිඵල පළාත් සභා පාසල්වල පහළ මට්ටමක තිබීම නිසාත් ඔහු පළාත තුළින් පුහුණු ගුරුවරු හා ගුරු සහකයන් බඳවා ගැනීමට වැඩපිළිවෙළක් දියත් කළේය. නමුත්යහ පාලන ආණ්ඩුවේ අධ්‍යාපන ඇමැතිවරයා එය ක්‍රියාත්මක කිරීමට ඉඩ නොදුන් නිසා එම වැඩපිළිවෙළ අතර මඟ නැවතිණි.මේ අකාර කකුළෙන් ඇදීම් මධ්‍යම රජය විසින් සිදුකරන අවස්ථා බොහෝය.පළාත් සභාව යටතේ සිටින ඉංජිනේරුවරයෙකුට වසරකට වැඩ කිරීමට ලැබෙන්නේ රුපියල් මිලියන 10 කි.මෙම මුදල කිසිසේත් ප්‍රමාණයත් නොවන්නේය.පළාත් සභා තුළට කොටු වී අති විශාල මානව සම්පත් ප්‍රමාණයක් නිකරුණේ නාස්ති වන බව අප දැන් හෝ තේරුම් ගත යුතුය.පළාත් සභා නඩත්තු කිරීමට වැය කරන මුදලට සරිලන සේවාවක් ඉන් නොලැබෙන නිසා පළාත් සභා සුදු අලියකු ලෙස හඳුන්වාදීමට ජනතාව පෙලඹී සිටිති.ගින්නක් නොමැතිව දුමක් නොනගින්නා සේ මෙම කතාවේද පැහැදිලි සත්‍යයක් තිබේ.එවැනි පසුබිමක් තුළ පළාත් සභා මැතිවරණයක් පැවැත්වීමටත් ඉන් අනතුරුව ඇමැති මණ්ඩලයක් සහ මන්ත්‍රී කණ්ඩායමක් නඩත්තු කිරීමත් කොවිඩ් වයිරස් ව්‍යාප්තිය හමුවේ ආර්ථික අර්බුදයකට ලක්ව සිටින අපට කළ හැකිද යන්න සම්බන්ධව ගැඹුරින් කල්පනා කර බැලිය යුතුය.

## අඩුපාඩු හඳුනා ගැනීම

පය බරවායට පිටිකර බෙහෙත් බැඳීමෙන් පලක් නැත. පළාත් සභාවල පවත්නා අඩුපාඩු අප මුලින් තේරුම් ගත යුතුය.එසේ නොකර මැතිවරණයක් පවත්වන්නට ඕනෑ නිසා පළාත් සභා මැතිවරණය පැවැත්වීම මඟින් පාර්ලිමේන්තු වරම් අහිමි වූ දේශපාලනඥයන් කිහිප දෙනෙකු සතුටු වනවා මිස ජනතාව ලබන සතුටක් නම් නොමැත.පළාත් පාලන ආයතන නියෝජිත සංඛ්‍යාවද නව මැතිවරණ ක්‍රමය යටතේ විශාල ලෙස ඉහළ ගොස් ඇත.ඒ අතරට එකතුවන පළාත් සභා මන්ත්‍රීවරුන් නඩත්තු කිරීම සඳහා වැය කිරීමට සිදුවන්නේද ජනතා බදු මුදල්ය.ජනපතිවරයා වැය තම වැය ශීර්ෂ කපා හරිමින් වියදම් අඩු කිරීමට මුල පුරා සිටියදී සෙසු පාර්ශව වෙතින්ද ජනතාව අපේක්ෂා කරන්නේ එවැනි කැප කිරීමකි.පවතින තත්ත්වය තුළ වඩා ප්‍රායෝගික වන්නේ පළාත් පාලන ආයතන තවත් ශක්තිමක් කර එම ආයතනවලට වැඩ කිරීම සඳහා පසුබිම සැකසීමය.පළාත් සභා ක්‍රියාත්මක කළ යුතුම නම් එය ක්‍රියාත්මක කළ යුත්තේ එහි ආරම්භක අරමුණු බිඳ නොවැටෙන ආකාරයටය.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සිදු කරමින් එවකට ආණ්ඩුව පැවසුවේ කඩිනමින් නව ව්‍යවස්ථාවක් ගෙන ඒමට කටයුතු කරන බවය. දැනට සිදු කර තිබෙන ව්‍යවස්ථා සංශෝධන මගින් අත්විඳි කරුණු සියල්ල සැලකිල්ලට ගනිමින් හොඳ ශක්තිමක් ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම රජයේ අරමුණ වී තිබේ.එහිදී පළාත් සභා සම්බන්ධයෙන්ද විශේෂ අවධානයක් යොමු කළ යුතුව තිබේ.තව දුරටත් පළාත් සභා පවත්වාගෙන යෑමට බලාපොරොත්තු වන්නේ නම් මධ්‍යම රජයේ ඔඩොක්කුවෙන් පළාත් සභා ඉවතට ගත යුතුය. නැතහොත් සිදුවන්නේ මධ්‍යම රජයේ අවශ්‍යතාව අනුව පළාත් සභා ක්‍රියාත්මක වීමය.ජනතා මුදල් අති විශාල ප්‍රමාණයක් වැය කරමින් මධ්‍යම රජයේ සෙවණැල්ලක් නඩත්තු කිරීමෙන් රටට අත්වන සුගතියක් නැත.පළාත් සභාවලට තනිව නැගී සිටීමට ශක්තිය දිය යුතුය.විධායක ජනපති ධුරය මගින් යම් ආකාරයකට මේවා පාලනය කිරීම වරදක් නැත.එසේ නොකර පසුගිය තිස් අවුරුද්ද තුළ ක්‍රියාත්මක වූ ආකාරයට පළාත් සභා ක්‍රියාත්මක වන්නේ නම් සිදුවන්නේ පළාත් සභා සුදු අලියෙක් බව තව තවත් සමාජය තුළ තහවුරු වීමය.

**අසේල කුරුළුවංශ**



# අවශේෂ කැලෑ ඉඩම් චක්‍රලේඛය: තුලනාත්මක විග්‍රහයක්



ආචාර්ය
නිමල් ගුණතිලක
සම්මානිත මහාචාර්ය
පේරාදෙණිය
විශ්වවිද්‍යාලය



**රජයේ අවශේෂ කැලෑ මැයෙන් යුතුව වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේ ලේකම් විසින් 2020-11-04 දිනැතිව නිකුත් කළ MWFC/1/2020 චක්‍රලේඛය පිළිබඳ හා ඊට අදාළව, 'රජයේ ඉඩම් කළමනාකරණය' මැයෙන් 2020-11-10 දිනැතිව ඉඩම් කොමසාරිස් ජනරාල් නිකුත් කළ 2020/18 චක්‍රලේඛය පිළිබඳ කතිකාවක් නිර්මාණය වී තිබේ. 1/2020 චක්‍රලේඛය මඟින්, රජයේ අවශේෂ කැලෑ කළමනාකරණය සම්බන්ධයෙන් ඊට පෙර නිකුත් කර තිබූ 5/2001, 2/2006 සහ 5/98 චක්‍රලේඛ අවලංගු විය.**

**රජයේ අවශේෂ කැලෑ ඉඩම් නව චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමේදී පරිසර සංරක්ෂණයට එල්ල විය හැකි බලපෑම් අවම කර ගැනීම සඳහා එම චක්‍රලේඛයේ අන්තර්ගතය පිළිබඳ යථා අවබෝධයක් ලැබීම වැදගත් වනු ඇත. මෙම ලිපියෙන්, එම MWFC/1/2020 චක්‍රලේඛය පිළිබඳ විශේෂයෙන් අවධානය යොමු කෙරෙයි.**

රජයේ අවශේෂ කැලෑ කළමනාකරණය සම්බන්ධයෙන් පෙර තිබූ චක්‍රලේඛ කිහිපයක් අවලංගු කරමින්, ඒ වෙනුවට රජයේ අවශේෂ කැලෑ කළමනාකරණය (MWFC/1/2020) සහ රජයේ ඉඩම් කළමනාකරණය (ඉඩම් කොමසාරිස් චක්‍රලේඛ අංක 2020/18) යන නව චක්‍රලේඛ යුගලය මෑතදී නිකුත් කෙරිණි. ඒවායේ අන්තර්ගත පරිපාලනමය හා ඒ හා සම්බන්ධිත දෛනික කරුණු පිළිබඳ විචාරාත්මක මහජන උද්‍යෝගයක් සහ කතිකාවක් නිර්මාණය වීම යහපත් ප්‍රවණතාවකි. මන්දයත්, රජයේ පාර්ශ්වයෙන් මේ කාරණා සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමේදී හෝ තීරණ ගැනීමේදී මහජනයාගේ පාර්ශ්වයෙන් ඉදිරිපත් වන අදහස් ද සැලකිල්ලට ගනු ඇතැයි යන විශ්වාසය පෙරදැරි කරගෙනය.

### අවශේෂ කැලෑ

වර්තමාන තත්ත්ව යටතේ අවශේෂ කැලෑ යැයි හඳුන්වන කැලෑ රොදක හෝ ලඳු කැලෑවක දක්නට ලැබෙන ජෛව විද්‍යාත්මක වටිනාකමට පරිබාහිරව විවිධ පාරිසරික සේවා රැසක් ඉටු කරන වැදගත් පරිසර පද්ධතීන් ලෙස ඒවා අගැයීමට ලක්කළ යුතුව ඇත. එබැවින්, මෙම අවශේෂ කැලෑ ඉඩම් ප්‍රායෝගික ලෙස කෙටිකාලීන සංවර්ධන ක්‍රියාවලීන් සඳහා පරිවර්තනය කිරීමට ප්‍රථමයෙන් එම කැලෑ මඟින් ඉටුවන පාරිසරික සේවාවන්ගෙන් ලැබිය හැකි දීර්ඝකාලීන ආර්ථික හා සමාජීය ප්‍රතිලාභ පිළිබඳ සන්සන්දනාත්මක අගැයීමක් සිදුවිය යුතුය. එය ශ්‍රී ලංකාව ද ඇතුළු සමස්ත ලෝකයම පිළිගන්නා 'හරිත ආර්ථික ප්‍රතිපත්ති'වලට අනුගත වීමකි. මේ සඳහා රජය පාර්ශ්වය වෙනුවෙන් පරිසර අමාත්‍යාංශය මෙන්ම ඒ යටතේ ඇති මධ්‍යම පරිසර අධිකාරියටද ඉතා වැදගත් මෙන්ම භාරදූර වගකීමක් පැවරී ඇත. මෙම නව චක්‍රලේඛ නිකුත් කිරීමට පාදක වී ඇති ප්‍රධානම හේතු කිහිපයකි. ඒ අතර, අධික විදේශ විනිමයක් වැය කරමින් මෙරටට ආනයනය කරන එනමුත් ලංකාවේ දේශගුණික තත්ත්ව යටතේ පහසුවෙන් වගා කළ හැකි බෝග වර්ග 16ක් වගා කිරීමට, නිශ්චිත ක්‍රමවේදයකට යටත්ව ආයෝජක ව්‍යවසායකයන් වෙත තාවකාලිකව ඉඩම් පවරා දීම ද ඇතැයි දැනගැනීමට තිබේ. ඒ වත්මන් රජයේ ප්‍රතිපත්තීන්ට අනුවය. මෙය එම විදේශ විනිමය ප්‍රමාණය මෙරට රඳවා ගැනීමට අමතරව අතිරික්තයක් වෙතොත් එය අපනයනය සඳහා ද යොදාගත හැකිය යන අපේක්ෂාව මුදුන්පත් කරගැනීමට තබන මූලික පියවරකි. එමෙන්ම, මෙය අතිශය කාලෝචිත හා වැදගත් ප්‍රයත්නයකි. ප්‍රමුඛතාව දිය යුතු වැඩසටහනකි. එනමුත්, එය ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පාරිසරික විද්‍යාත්මක සංසිද්ධීන්වලට අනුකූලව සිදුකළ යුතු බැව් නොකිවමනාය.

### ගෝලීය දේශගුණ ආපදා

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම් අන්තෝනියෝ ගුටරේස් පසුගිය 2 වැනිදා ලෝක ප්‍රජාව හමුවේ පවසා ඇත්තේ අද මුළු ලෝකයම දේශගුණික හදිසි ආපදා තත්ත්වයකට පත්වී ඇති බවය. ඊට හේතුව ලෙස ඔහු සඳහන් කරන්නේ, ගෝලීය උෂ්ණත්වය ක්‍රමයෙන් ඉහළ යෑමත් සමඟ සිදුවන ගෝලීය දේශගුණික විපර්යාසයන් තීව්‍ර වීමේ පැහැදිලි ප්‍රවණතාවක් මතුව තිබීමය. මේ හේතුවෙන්, අධික වර්ෂාපතනයන්, ක්ෂණික ජල ගැලීම්, නායයෑම් මෙන්ම දිර්ඝ හා දැඩි නියං කාල වැඩිවීම ද සිදුව තිබේ. මේ නිසා නව කෘෂිකාර්මික ව්‍යාපෘති ආරම්භ කිරීමේදී අහිතකර දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීම මෙන්ම හැකිතාක් දුරට ඒවා අවම කිරීම සඳහා මුල් අදියරේ පටන්ම සැලසුම් යෙදීම වැදගත්ය. තවද පරිසර පද්ධති මඟින් ඉටුවන පාරිසරික සේවා පිළිබඳ නිසි වැටහීමකින් කටයුතු කිරීම ද වැදගත් වේ.

චක්‍රලේඛ 01/2020 බලනොපාන ඉඩම්

රජයේ අවශේෂ කැලෑ ඉඩම් පිළිබඳ මෑතකදී නිකුත් කළ චක්‍රලේඛ යුගලයේ අන්තර්ගත කරුණු හා ඒවායින් සිදුවිය හැකි පාරිසරික බලපෑම් පිළිබඳ මනා අවබෝධයක් ලබාගැනීම ප්‍රථමයෙන්ම කළ යුතුය.

**ඉහත සඳහන් චක්‍රලේඛයේ හතරවැනි පරිච්ඡේදයේ සඳහන් පරිදි පාරිසරික සංවේදී යැයි හඳුනාගන්නා ඉඩම් ඉදිරියේදී කළමනාකරණය කිරීමට බලාපොරොත්තු වන්නේ කුමන දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් මඟින් ද යන්න පිළිබඳ අපැහැදිලිතාවක් ඇති බව පෙනී යි. එලෙස හඳුනාගත් ඉඩම් අදාළ දෙපාර්තමේන්තුවලට නැවත පවරා දී ඉතිරිය පමණක් ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් ලේකම්වරුන් ප්‍රධාන කමිටු මඟින් සංවර්ධන කටයුතු සඳහා යොදාගැනීමට යොමු වන්නේ ද යන්න සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ.**

රජයේ අවශේෂ කැලෑ කළමනාකරණය සඳහා ඉදිරිපත් කළ MWFC/1/2020 චක්‍රලේඛයේ සඳහන් පරිදි පහත සඳහන් ඉඩම් මෙම අවශේෂ කැලෑ යටතට නොගැනෙන බව ප්‍රකාශ කර ඇත.

1. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන,
   * සංරක්ෂිත වනාන්තර
   * රක්ෂිත වනාන්තර
   * යෝජිත රක්ෂිත වනාන්තර
2. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන
   * ජාතික රක්ෂිත භූමි
   * අභය භූමි
   * වන අලි කළමනාකරණ රක්ෂිත
3. පහත සඳහන් තත්ත්ව යටතේ ඇති වෙනත් ඉඩම්,

i. නීතියකින් හෝ රෙගුලාසියකින් හෝ වෙනත් මොනයම් හෝ ව්‍යවස්ථාපිත කරුණකින් පරිසරය පිළිබඳ කටයුතු කරන රජයේ දෙපාර්තමේන්තුවකට, ආයතනයකට, අමාත්‍යාංශයකට අයත් වන කැලෑ ප්‍රදේශ මෙකී අවශේෂ කැලෑ යටතට නොගැනීම.

ii. මීට අමතරව ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටුව, දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව හා අන්තර් අමාත්‍යාංශ ඉඩම් පරිහරණ කමිටුව මේ වන තෙක් ගෙන ඇති තීරණවලට හා ගරු අධිකරණය විසින් මේ වන විටදී ඇති තීරණවලට බලපෑමක් ඇති නොවිය යුතු වන අතර,

iii. වන ව්‍යාපෘති, වනාන්තර සංවර්ධනය හා ආනතිය අංශක 30 ට වැඩි කඳු බෑවුම් සහිත ඉඩම්, පාරිසරික වශයෙන් දැඩි සංවේදී යැයි හඳුනාගෙන ඇති ඉඩම් තවදුරටත් ආරක්ෂා කිරීමට මෙම චක්‍රලේඛය බාධාවක් නොවිය යුතු යැයි ද එහි සඳහන් වන අතර,

iv. 2020/08/09 දිනැති අංක 21 දරන අතිගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කර ඇති ගැසට් නිවේදනයේ සඳහන් ඒ ඒ අමාත්‍යාංශවල කාර්යභාරයන්ට අනුව වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයේත්, වනජීවී රැකවරණය අලිවැට සහ අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙළ හා කැලෑ නැවත වගා කිරීම හා වනසම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ විෂයය පථයට ගැනෙන කාර්යයන් සහ කර්තව්‍යයන්වලටත්, සුවිශේෂී ප්‍රමුඛතාවලටත්, 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් පරිදි ජාතික වනවැස්ම 30% දක්වා ඉහළ දැමීමේ ඉලක්කය සපුරා ගැනීමට අවශ්‍ය ඉඩම් ප්‍රමාණය තබාගැනීමට ඇති කරුණුවලට ද බාධාවක් කර නොගත යුතු බව ද සඳහන් කර ඇත.

v. අමාත්‍යාංශ ඉඩම් පරිහරණ කමිටුව මේ වන තෙක් ගෙන ඇති තීරණවලට හා ගරු අධිකරණය විසින් මේ වන විට දී ඇති තීරණවලට බලපෑමක් ඇති නොවිය යුතු වන අතර,

vi. තවද, මෙම චක්‍රලේඛය මඟින් ආර්ථික හා වෙනත් ඵලදායී කටයුතුවලට භාවිත කිරීමට ඉඩම් නිදහස් කිරීමේදී පහත සඳහන් කාණ්ඩයන්ට අයත් භූමි ප්‍රදේශ එම කටයුතුවලට තෝරා නොගැනීමට සැලකිලිමත් විය යුතු යැයි ද එම චක්‍රලේඛයේ තවදුරටත් සඳහන්ය.

a. ගංගා ඇළදොළ ආදී පරිසර සංවේදී භූමි ප්‍රදේශ

b. අධික බෑවුම් සහිත ප්‍රදේශ

c. ජල පෝෂක ප්‍රදේශ

d. වන අලි සංක්‍රමණ භූමි තීර

e. ඓතිහාසික, සංස්කෘතික හෝ පුරාවිද්‍යාත්මක වැදගත්කමක් සහිත ප්‍රදේශ

f. 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇතුළත් පරිසර ප්‍රතිපත්තීන්ට අනුකූලව ජෛව විවිධත්වය සුරක්ෂිත කිරීමේ කාර්යය සහ වනවැස්ම ඉහළ නැංවීමේ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා යෝජිත භූමි

g. වඳවීමේ තර්ජනයට ලක්ව ඇති ශාක හා සත්ත්ව විශේෂ සුරක්ෂිත කිරීමේ කාර්යය සඳහා සංරක්ෂණය කළ යුතු ප්‍රදේශ.

h. රජයේ අනාගත සංවර්ධන කාර්යයන් සඳහා හඳුනාගෙන ඇති ප්‍රදේශ

i. වෙනත් සුවිශේෂ කරුණු මත සංවර්ධන ක්‍රියාකාරකම්වලට භාජන කිරීම සඳහා සුදුසු නොවන ප්‍රදේශ

j. අනාගතයේදී ප්‍රජා නායකත්වය සමාජ වනවිද්‍යාත්මක කාර්යයන්ට යොදාගැනීම සඳහා යෝජිත ප්‍රදේශ

මෙම චක්‍රලේඛයේ අන්තර්ගතය පිළිබඳ ඉහත දීර්ඝ පැහැදිලි කිරීමෙන් ගම්‍ය වන්නේ පාරිසරික, පුරාවිද්‍යාත්මක හෝ ඓතිහාසික වැදගත්කමක් ඇති සියලුම අවශේෂ කැලෑ ඉඩම් හඳුනාගැනීම සඳහා ප්‍රමුඛත්වය දීමෙන් පසු ඉතිරිවන අවශේෂ කැලෑ ඉඩම් ග්‍රාමීය සංවර්ධනය, නැවත පදිංචි කිරීම්, කෘෂිකාර්මික කටයුතු, නාගරික සහ මංමාවත් සංවර්ධනය ආදී කටයුතු සඳහා යොදාගැනීම සුදුසු වන බවය.

ඉහත සඳහන් කරුණු සියල්ලටම පරිබාහිරව පවත්නා අවශේෂ කැලෑ ඉඩම්වල අයිතිය තවදුරටත් රජය සතුව පවත්වා ගනිමින් ඒවායේ පරිසරයට, වනජීවී සම්පත්වලට සහ කැලෑවලට හානියක් නොවන පරිදි ආර්ථිකමය හා වෙනත් ඵලදායී කටයුතු සඳහා භාවිත කිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන්ට හා ප්‍රාදේශීය ලේකම්වරුන්ට හැකිවන පරිදි මෙම MWFC/1/2020 දරන චක්‍රලේඛයෙන් ඉඩකඩ ලබා දී ඇතැයි ද එහි සඳහන් වේ.

### වගකිව යුත්තා හඳුනා ගැනීම

ඉහත සඳහන් චක්‍රලේඛයේ හතරවැනි පරිච්ඡේදයේ සඳහන් පරිදි පාරිසරික සංවේදී යැයි හඳුනාගන්නා ඉඩම් ඉදිරියේදී කළමනාකරණය කිරීමට බලාපොරොත්තු වන්නේ කුමන දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් මඟින් ද යන්න පිළිබඳ අපැහැදිලිතාවක් ඇති බව පෙනී යි. එලෙස හඳුනාගත් ඉඩම් අදාළ දෙපාර්තමේන්තුවලට නැවත පවරා දී ඉතිරිය පමණක් ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් ලේකම්වරුන් ප්‍රධාන කමිටු මඟින් සංවර්ධන කටයුතු සඳහා යොදාගැනීමට යොමු වන්නේ ද යන්න සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ.

එසේ නැතහොත් මෙවන් චක්‍රලේඛ මඟින් පවරාගන්නා සියලු ඉඩම් එක් එක් ප්‍රාදේශීය ලේකම්වරුන් මඟින් අදාළ සංරක්ෂණ, සංවර්ධන හෝ ඒවායේ සම්මිශ්‍රණ කටයුතු ලෙස ඔවුන්ගේ මූලිකත්වයෙන් කළමනාකරණය කිරීමට බලාපොරොත්තු වන්නේ දැයි පැහැදිලි කිරීම අවශ්‍ය වේ.

මෙහිදී පැනනගින තවත් අපැහැදිලිතාවක් වන්නේ මෙම පාරිසරික හා පුරාවිද්‍යාත්මක ආදී කටයුතු සඳහා වැදගත් නොවන ඉඩම් වෙන්කර ගැනීමෙන් පසු ඉතිරි ඒවායේ පරිසරයට, වනජීවී සම්පත්වලට සහ කැලෑවලට හානියක් නොවන පරිදි ආර්ථිකමය හා වෙනත් ඵලදායී කටයුතු සඳහා භාවිත කළ හැකි වන්නේ කවර ආකාරයකටද යන්නය. එමනිසා MWFC/1/2020 චක්‍රලේඛයේ දෙවැනි ඡේදයේ අවසාන කොටසේ සඳහන්ව ඇති නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳ තවදුරටත් පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ.

**ධම්මික සෙනෙවිරත්න**




# ඇවිළෙන සහ අවුළන ගිනි

කටකතා පැතිරීම අපේ සමාජයට අලුත් දෙයක් නොවේ. බොරුවට පියාපත් ඇත්තේය යන යෙදුම ඊයේ නැවත සිහිපත් කළේ අලුත්කඩේ උපරිමාධිකරණයේ ගින්න ඇතිවීමත් සමඟය. ඕනෑම පුවතක සත්‍ය අසත්‍ය නොදැන මුග්ධ ජනයා වල්මත් වූවන් සේ හැසිරීම කෙතරම් පිළිකුල් සහගත ක්‍රියාවක් ද යන්න අලුත්කඩේ ගින්නෙන් පැහැදිලිය.

අපේ රටේ නීති විවරණය කරන ප්‍රධාන ආයතනය ශ්‍රේෂ්ඨාධිකරණයයි. එහි ඇතිවූ කාර්මික දෝෂයකින් හටගත් ගින්න නිවා දැමීමට රටේ වගකිවයුතු අංශ යුහුසුලු විය. එහි ප්‍රතිඵලය වූයේ ඉතා ඉක්මනින් ඒ ගින්න නිවාදැමීමට හැකි වීමයි. එනමුත් ඒ ගින්නට පිදුරු දැමූ කුහක අවස්ථාවාදීහු සමාජ මාධ්‍ය ජාල ඔස්සේ මුළු රටම ගිනි තැබූහ.

බෞද්ධ යැයි කියාගන්නා රටක බුදුන් වහන්සේ පෙන්වා දුන් සිතීමේ හා විමසීමේ නුවණ අපේ ජනයාගෙන් එක් කොටසකට නොමැතිවීම කනගාටුවට කරුණකි. කුහකත්වයෙන් පිරුණු සමාජයක බොරුව සහ කටකතා රජ කරන බවක් පෙනේ. බොරුව සහ කටකතා යනු අයිසින් තැවරූ කේක් කැබැල්ලක් හා සමානය. අයිසින් ටික ගැලවී ගිය කල නිකම්ම නිකම් පාන් කැබැල්ලක් බව බොහෝ දෙනා දැනගත්ත ද සීනි මිශ්‍ර අයිසින් කෑමට කැමතිය. සත්‍යය කටුකය. තිත්ත රසය. අරළු බුළු නෙල්ලි පිරි කසාය කෝප්පයකට වඩා පැණි බීම බෝතලයක් බීමට බොහෝදෙනා ප්‍රිය කරති. බොරුව යනු අයිසින් මිශ්‍ර කේක් කැබැල්ලකි. පැණි බීම බෝතලයකි. ඉතා ඉක්මනින් එය කෑමටත්, බීමටත් මිනිස්සු ප්‍රිය කරති. සත්‍යය පෙනි පෙනී අසත්‍ය පැතිරවීමෙන් එසේ කරන පුද්ගලයන් බලාපොරොත්තු වන්නේ කුමක් ද? ඒ ඔවුන් තුළ පවතින කුහක දේශපාලන ආසාවන් විය හැකිය. එය සංතෘප්ත කර ගැනීම ඔවුන්ගේ අරමුණයි.

රටක සංවර්ධන ක්‍රියාවලියට දියුණු සන්නිවේදන ක්‍රම අත්‍යවශ්‍යය. එහෙත් ඒ දේවල් යොදාගත යුත්තේ වෛරය, ක්‍රෝධය, බොරුව රජ කරන සමාජයක් ගොඩනැඟීමට නොවන්නේය. ප්‍රජාතන්ත්‍රවාදී රටක නීතියේ ආධිපත්‍යය හොඳ ලක්ෂණයකි. විවිධ නඩු තීන්දු මඟින් ඒ නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කළ වකවානුවක උපරිමාධිකරණ සංකීර්ණයේ කාර්මික දෝෂයකින් හටගත් ගින්නට ඔවුන් එක් කළේ පිදුරුය. ඒ මඟින් ඔවුන්ගේ කුහකත්වය ප්‍රදර්ශනය කෙරිණි. සියලු බාධක මැද රට නිශ්චිත ඉලක්කයක් කරා මෙහෙයවන මොහොතක බොරු කටකතා වැපිරීමෙන් කිසිවෙකු ලබන ජයක් නැත. නීතියේ දෙවඟන හොඳින් යුක්තිය පසිඳලන්නීය.


අධිකරණ ක්ෂේත්‍රයේ නඩු පමාවීම්වලට පිළියම් සොයමින් ඉන්නා වකවානුවක අහඹු ලෙස සිදු වූ සිදුවීමකට බොරු කටකතා පැතිරීමෙන් නූගත් ජනයා කුපිත කිරීම ඔවුන්ගේ ඉලක්ක බව පෙනේ. එහෙත් යුක්තිගරුක සමාජයක් පතන කිසිවෙක් මෙවැනි බොරු කටකතාවලට නොරවටෙති. කෙසේ නමුත් මෙහි සත්‍ය දැන දැන කසාය බිවූ ගොළුවන් සේ හැසිරෙන පුද්ගලයන් අපේ රටේ සිටින බව ද නොරහසකි. සාක්ෂරතා ඥානයෙන් ඉහළ රටක් වශයෙන් ශ්‍රී ලංකාව හැඳින්වුවද සමාජ මාධ්‍ය ජාලාවන්හි හැසිරෙන පුද්ගලයන්ගේ බොරුවලට අත්තටු මැවීම හා ඒවා පිළිගන්නා පිරිසක් රටේ සිටීම බුද්ධියට හා විමසුමට නිගා දීමකි.

රටක අධිකරණ පද්ධතිය යනු රටේ සමස්ත ජනතාවගේ මානව හිමිකම් සිවිල් සමාජයේ ආරවුල් සියල්ලටම සාධාරණ විසඳුම් ගෙන දෙන උත්තරීතරම ආයතනයයි. එහි සංවිධානාත්මක ව්‍යුහයක් ඇත්තේය. එහි ඇති නඩු වාර්තාවලට කිසිඳු හානියක් නොවන්නේ ලේඛනාගාරය තුළ ඒවා ආරක්ෂා වී පැවතීම නිසාය. විනිශ්චය ශාලාවක්, ලේඛනාගාරයක් එකම ස්ථානයක උපරිමාධිකරණ සංකීර්ණයක නොමැති බව බොහෝදෙනා නොදන්නවා විය හැකිය. එහෙත් විනිශ්චය ශාලාවේ ලේඛනාගාරය නොමැති බව මේ සිද්ධියෙන් පසුව හෝ නොදන්නා අය දැන ගැනීම හොඳ දෙයකි.

විවිධ ප්‍රදේශවල පවතින අධිකරණවල මේ සියලු දේ ඉතා ආසන්නයේම පවතින්නේය. ඒ අනුව අලුත්කඩේ උපරිමාධිකරණ සංකීර්ණය ඒ අයුරින් නොදන්නා මිනිසුන්ට ඒත්තු ගැන්වීමකට පුළුවන. එහෙත් අලුත්කඩේ උපරිමාධිකරණ සංකීර්ණයේ ලේඛනාගාරයට කිසිඳු හානියක් වී නැත.

අපේ රටේ නීතියේ දෙවඟන ඉතා හොඳින් නීතිය පසිඳලයි. බොරුව කිසිදිනෙක රජ නොකරයි. කියන්නා කෙසේ කීවත් අසන්නා සිහිබුද්ධියෙන් ඇසිය යුතුය කියන ප්‍රකට කියමන සිහිපත් කරමින් සත්‍ය සත්‍යයෙන්ම ජය ගන්නේය.

**මහින්ද ආරියවංශ**



| ගොවිසෙත | සුපිරි වාසනා | ලග්න වාසනාව | කෝටිපති කප්රුක | සංවර්ධන වාසනාව | ජයෝදා | ශනිදා වාසනාව | සුපර් බෝල් | ජාතික සම්පත | අද කෝටිපති | වාසනා සම්පත | දරු දිරි සම්පත |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2020 - 11 - 29 | 2020 - 11 - 27 | 2020 - 10 - 26 | 2020 - 09 - 27 | 2020 - 07 - 31 | 2020 - 10- 26 | 2020 - 10 - 26 | 2020 - 09- 27 | 2020 - 10-21 | 2020 - 10 - 26 | 2020 - 11 - 26 | 2020 - 07 - 30 |
| දිනුම් වාරය - 2616 | දිනුම් වාරය - 1552 | දිනුම් වාරය - 2964 | දිනුම් වාරය - 630 | දිනුම් වාරය - 354 | දිනුම් වාරය - 1701 | දිනුම් වාරය - 3413 | දිනුම් වාරය - 1228 | දිනුම් වාරය - 1065 | දිනුම් වාරය - 1083 | දිනුම් වාරය - 1632 | දිනුම් වාරය - 013 |
| 20 38 66 70 | 15 29 33 50 | 18 23 28 34 | 11 21 45 64 | 22 23 40 | 19 24 27 42 | 03 06 53 67 | 11 27 35 42 | 3 3 4 4 1 4 | 02 06 15 50 | 07 18 27 57 | 04 12 33 63 |
| අක්ෂරය P | සුපිරි අංකය -08 | ලග්නය-වෘශ්චික විශේෂිත අංක රු 500 තෑගි සඳහා-7942 | ඉංග්‍රීසි අක්ෂරය- E | දෛව අංකය - 02 අක්ෂරය- L | අක්ෂරය-G | අක්ෂරය - B | අක්ෂරය - Q විශේෂ අංකය -5767 | අක්ෂරය -Y | අක්ෂරය - M | අක්ෂරය - Z | අක්ෂරය - U |

# පාස්කු දා ප්‍රහාරයේ වින්දිතයන්ට සහන සැලසීම ගැන අගරදගුරු ප්‍රසාදය

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් විපතට පත් වූ පවුල්වල ගැටලු නිරාකරණය කර ඔවුන්ට සහන සැලසීම සම්බන්ධයෙන් අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ අගමැතිවරයා ඇතුළු රජයට ප්‍රසංශාව පළ කරති.

අනාගතයේදී මෙවැනි සිදුවීම් ඇති නොවන පරිදි ජනාධිපතිවරයාගේ සහ අගමැතිවරයාගේ මැදිහත්වීම තුළ රටේ අනාගතය ශක්තිමත් කරන්නට හැකිවෙතැයි විශ්වාස කරන බවත් පැවැසූ අගරදගුරු හිමිපාණෝ, ඒ විශ්වාසය තුළ අගමැතිවරයා ගැන බලාපොරොත්තු රඳවා තිබෙන බවත් කීහ.

හෙතෙම මේ බව පැවැසුවේ පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරයෙන් විපතට පත්වූ පවුල්වල ගැටලු නිරාකරණය කිරීම හා ප්‍රහාරයට ලක්වූ දේවස්ථානවල ඉදිරි සංවර්ධන කටයුතු පිළිබඳ අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී ඊයේ (16) පැවැති සාකච්ඡාව අවසානයේ අදහස් දක්වමිනි.

පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයෙන් විපතට පත්වූවන් වෙනුවෙන් කටුවාපිටිය ප්‍රදේශයේ ක්‍රියාත්මක නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් නැවත ආරම්භ කර කඩිනමින් වැඩ අවසන් කරන්නැයි අගමැති මහින්ද රාජපක්ෂ මහතා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නිලධාරීන්ට මෙහිදී උපදෙස් දුන්නේය. මේ ව්‍යාපෘතිය යටතේ නිවාස 24ක් ඉදිකෙරෙන අතර දැනට ඉඩම් හිමි පුද්ගලයන් වෙනුවෙන් තවත් නිවාස 5ක් කටුවාපිටිය ප්‍රදේශයේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් ඉදිකිරීමට නියමිතය. ප්‍රහාරයෙන් පීඩාවට පත්ව කොළඹ අවට කුලී නිවෙස්වල සිටින පවුල් 33ක් වෙනුවෙන් නිවාස සංවර්ධන අධිකාරියේ යෝජිත නිවාස සංකීර්ණයකින් නිවෙස් 33ක් වෙන් කර දෙන ලෙසද අගමැතිවරයා මෙහිදී නිලධාරීන්ට උපදෙස් දුන්නේය. මේ පිරිසට අමතරව ප්‍රහාරයෙන් පීඩාවට පත්ව බදුල්ල, මහනුවර ඇතුළු රට පුරා විසිරී සිටින පවුල් 11ක් වෙනුවෙන් ඒ ඒ ප්‍රදේශවලින් නිවාස අවශ්‍යතා සපුරාදීමටද මෙහිදී එකඟතාව පළ විය.

විපතට පත්වූවන් සඳහා ශ්‍රී ජයවර්ධනපුර රෝහල මගින් ලබාදෙන වෛද්‍ය පහසුකම් පුළුල් කිරීමට උපදෙස් දුන් අගමැතිවරයා ඔවුන්ට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර සහ රෝහල් කාමර පහසුකම් සැලසීමට කටයුතු කරන්නැයි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට උපදෙස් දුන්නේය.

## STF මූලස්ථානයේ රාජකාරියක් නැති ලොක්කන් නිසා වැඩ කොට උඩ

**රුවන්ත නිතුල්ගස්පිටිය**

පොලිස් විශේෂ කාර්ය බළකා මූලස්ථානයට අනුයුක්තව සිටින නිශ්චිත රාජකාරියක් නැති උසස් නිලධාරීන් 60කට අධික පිරිසක් හේතුවෙන් එහි දිනපතා රාජකාරි කටයුතු අවුල්සහගත තත්ත්වයකට පත්ව ඇතැයි 'දිනමිණ' ට වාර්තා වේ.

නියමිත රාජකාරියක් නොමැති තැන මේ උසස් නිලධාරීන් මීට ඉහත පරීක්ෂණ ශ්‍රේණියේ නිලධාරීන් සිදු කළ රාජකාරි ආවරණය කරන බව දන්වා මූලස්ථානයේ රැඳී සිටින බව පැවැසේ.

මේ අතර බළකාය තුළ කලක සිට පවතින මේ ගැටලුව නිරාකරණයට මේ දක්වා පියවරක් ගෙන නොමැති පසුබිමක ප්‍රශ්නය තවත් ඔඩුදුවන තීරණයක් ඉදිරියේදී ගැනීමට නියමිත බවද වාර්තා වෙයි.

ඒ අනුව මූලස්ථානයේ නිසි රාජකාරියක් නොමැති උසස් නිලධාරින් 64ක් රැඳී සිටියදී ඒ ගොඩට තවත් ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන් 10 දෙනකු සහකාර පොලිස් අධිකාරි නිලයට උසස් කර ඔවුන්ද මූලස්ථානයට අනුයුක්ත කිරීමට වෙර දැරීමයි.

මේ වන විට මූලස්ථානයේ සිටින උසස් නිලධාරීන් 64 දෙනාටම නිල රථයක් සහ ඔවුන්ගේ නිවෙසේ පුද්ගලික පරිහරණයට අමතර රථයක් බැගින් බළකායේ දෛනික රාජකාරි සඳහා භාවිත කළ වාහන 128ක්, බළකායේ රියැදුරන් 128ක් සහ එක් මසකට ඉන්ධන ලීටර් 250ක් බැගින් ලබාදෙමින් සිටින බව ආරංචි වෙයි.

උසස් නිලධාරීන්ගේ නිල රථයට අමතරව නිවෙසේ පුද්ගලික පරිහරණයට භාවිත කරන මූලස්ථානයේ දෛනික රාජකාරි සඳහා යොදා ගන්නා වාහන 64 සම්බන්ධයෙන් තොරතුරු වසන් කිරීමට වෙර දරන එම නිලධාරීන් එම වාහන දිවයිනේ විවිධ කඳවුරු වෙත අනුයුක්ත කර ඇතැයි හුවා දැක්වීමට උත්සාහ ගන්නා බවද සඳහන්ය.

## සතොස වාහන අවභාවිත කළැයි චූදිත හිටපු නි. ඇමැති අබ්දුල්ලා අද උසාවියට

**සුභාෂිණී සේනානායක සහ සිරංජනී කුමාරි**

යහපාලන ආණ්ඩුව සමයේ ලංකා සතොස ආයතනයේ වාහන අවභාවිත කිරීමේ චෝදනාව මත ත්‍රිකුණාමල දිස්ත්‍රික් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මෙන්ම හිටපු නියෝජ්‍ය ඇමැති, අබ්දුල්ලා මොහොමඩ් මහරූෆ් මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කොටුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අද (17) දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස නියෝග කර තිබේ.

මහේස්ත්‍රාත්වරිය මේ නියෝගය සිදු කර ඇත්තේ 14 දා අත්අඩංගුවට ගත් මොවුන් දෙදෙනා අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය. මොවුන් දෙදෙනා අද (17) සිද්ධියට අදාළව නඩුව ගොනු කර ඇති කොටුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලෙස මහේස්ත්‍රාත්වරිය බන්ධනාගාරයට නියෝග කර තිබේ.

ලංකා සතොස ආයතනයේ වාහන අවභාවිතාවක් 2015ත් 2019ත් අතර කාලය තුළ සිදුව ඇති බවට ලද පැමිණිල්ලක් මත මොවුන් අත්අඩංගුවට ගෙන තිබේ.

## මව සහ දරුවා යට කළ රියැදුරු සොයා මෙහෙයුම්

අනුරාධපුර පාදෙණිය මාර්ගයේ පහළ බලල්ල දේවාල හංදිය ප්‍රදේශයේදී මවක සහ දරුවකු රිය අනතුරකට ලක් කළ කැබ් රථයේ රියැදුරු සොයා පොලිස් පරීක්ෂණ ක්‍රියාත්මක බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ මහතා පවසයි.

පෙරේදා (15) සවස 6.30ට පමණ පාදිකමාරුවක් හරහා ගමන් කරමින් සිටි මවක සහ ඇයගේ කුඩා පුතු කැබ් රථයක ගැටීම හේතුවෙන් ඔවුන් දෙදෙනා මිය ගොස් තිබුණි. එම කැබ් රථයේ 11 දෙනකු ගමන් කරමින් සිට ඇති අතර අනතුරෙන් පසුව රථයේ රියැදුරු සහ තවත් දෙදෙනකු පැන ගොස් තිබේ.

## බුද්ධි තොරතුරට රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂ නිසි පියවර ගෙන නෑ

**හිටපු වැ.බ. අධ්‍යක්ෂ ජනපති කොමිසමට කියයි**


**සුභාෂිණී සේනානායක**

ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල වන බවට 2019 අප්‍රේල් 20 රාත්‍රි 8ට පමණ ලද බුද්ධි තොරතුර සම්බන්ධයෙන් හිටපු රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂවරයා නිසි පියවර ගෙන නැති බවත් ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට රාජ්‍ය බුද්ධි සේවයට පැහැදිලි හැකියාවක් තිබූ බවත් රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු වැඩ බලන අධ්‍යක්ෂ, විශ්‍රාමික සහකාර පොලිස් අධිකාරි පරාක්‍රම ලංකාපුර මහතා පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් සොයා බැලෙන ජනාධිපති පරීක්ෂණ කොමිසම හමුවේ ඊයේ (16) පැවැසුවේය.

2019 වසරේ අප්‍රේල් මස 21 වන දින ජාතික තව්හිද් ජමාත් සංවිධානයට සම්බන්ධ සහරාන් හෂීම් ඇතුළු කණ්ඩායමක් විසින් ත්‍රස්ත ප්‍රහාරයක් දියත් කළ හැකි බව දන්වමින් එම මස 20 වැනි දින සවස ලැබුණු තොරතුර සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කිරීමට රාජ්‍ය බුද්ධි සේවයට අවස්ථාව තිබූ බව පැවැසූ ඒ මහතා එම තොරතුර සම්බන්ධයෙන් හෝටල්වලට සහ දේවස්ථානවලට දැනුම් දීමේ හැකියාවද රාජ්‍ය බුද්ධි සේවයටම තිබුණු බව කියා සිටියේය.

# වැඩි පිරිසකට ප්‍රතිලාභ ලැබෙන ව්‍යාපෘතිවලට ප්‍රමුඛතාව දෙන්න

**මහින්ද අලුත්ගෙදර, අනුරාධපුරය සිට**



2021 අය වැය යෝජනා ක්‍රියාත්මක කිරීමේදී වැඩි පිරිසකට ප්‍රතිලාභය ලබාදෙන ව්‍යාපෘතිවලට ප්‍රමුඛතාව ලබාදෙන්නැයි ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතා මහජන නියෝජිතයන්ට සහ රාජ්‍ය නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

එම යෝජනා ක්‍රියාත්මක කිරීමේදී ග්‍රාමීය මට්ටමින් ලැබෙන අදහස්, යෝජනා සම්බන්ධයෙන්ද අවධානය යොමු කරන ලෙස දැනුම් දුන් රාජපක්ෂ මහතා රටේ සෑම ප්‍රදේශයකම ජනතා අදහස් ලබා ගැනීම වෙනුවෙන් සියලු ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු එළඹෙන 21 හා 22 දිනයන්හි රැස් කර වන ලෙසත් දැනුම් දුන්නේය. මේ සම්බන්ධයෙන් ඉදිරි දින කිහිපය ඇතුළත ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් දැනුවත් කිරීමට පියවර ගන්නා බව ප්‍රකාශ කළ ඒ මහතා මේ අය වැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා මුල්තැනක් ලබාදීම වෙනුවෙන් පළාත් පාලන ආයතනවලට විශාල වගකීමක් තිබෙන බවත් ඒ අනුව නිසි පරිදි ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ඉදිරි වසර තුළ ළඟා කර ගැනීමේ හැකියාව තිබෙන බවත් පෙන්වා දුන්නේය.

බැසිල් රාජපක්ෂ මහතා මේ බව සඳහන් කළේ අනුරාධපුරයේ පිහිටි උතුරු මැද පළාත් සභා ශ්‍රවණාගාරයේදී ඊයේ (16) පැවති 2021 අය වැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ "ගම සමඟ පිළිසඳරක්" තුළින් "වැඩ සමඟ යළි ගමට" ජාතික වැඩසටහනේ උතුරු මැද පළාත් කමිටු සාකච්ඡාවට එක් වෙමිනි. ලබන වසරේදී ශ්‍රී ලංකාව සෑම අංශයකින්ම නගා සිටුවීමේ දැවැන්ත පෙරළිය සඳහා "ගම සමඟ පිළිසඳරක්" තුළින් "වැඩ සමඟ යළි ගමට" වැඩසටහන සමඟ උපරිම කැපවීමෙන් එක්වන්නැයි බැසිල් රාජපක්ෂ මහතා මෙහිදී උතුරු මැද පළාත් දේශපාලන නායකයන්ට සහ රාජ්‍ය නිලධාරීන්ට ආරාධනා කළේය.

## ආසාදිතයෝ 785ක් සුවය ලබති

**73%ක් සුවය ලැබීම රටේම ජයග්‍රහණයක්**

**වෛද්‍ය හරිත අලුත්ගේ**

**සන්ධ්‍යා කරුණාරත්න**

කොවිඩ් - 19 වයිරසය ආසාදනයවූවන් 785ක් ඊයේ (16) සුවය ලබා නිවෙස් වෙත යෑමත් සමඟ සමස්ත සුවය ලැබූ සංඛ්‍යාව 25,652ක් බව වසංගත රෝග විද්‍යා අංශය දැනුම් දෙයි.

ආසාදිතයන් ලෙස වාර්තා වන පුද්ගලයන්ගෙන් සියයට 73ක් පමණ මේ වන විට පූර්ණ සුවය ලබා නිවෙස් වෙත යෑම සමස්ත රටම ලබා ඇති ජයග්‍රහණයක් බව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයේ සංස්කාරක වෛද්‍ය හරිත අලුත්ගේ මහතා පැවැසුවේය.

කොවිඩ් - 19 ආසාදිතයන් මේ වන විට සමස්තයක් ලෙස 34,121ක් වාර්තා වී ඇති අතර රෝහල්වල ප්‍රතිකාර ලබමින් සිටිනුයේ ආසාදිතයන් 8,312ක් බවද වසංගත රෝග විද්‍යා අංශය සඳහන් කරයි.

මේ වන විට මරණ 157ක්ද වාර්තා වී ඇති අතර කොවිඩ් ආසාදිතයන් හඳුනා ගැනීම සඳහා පීසීආර් පරීක්ෂණ ලක්ෂ 10කට අධික සංඛ්‍යාවක් සිදු කර තිබේ.

## උපරිමාධිකරණ ගින්න සුළුවෙන් හිතන්න බෑ

**පා. මන්ත්‍රී මනූෂ නානායක්කාර**

**පහන් විජේසේකර**

අලුත්කඩේ උපරිමාධිකරණ සංකීර්ණය තුළ ගින්නක් හට ගැනීම සුළුවෙන් තැකිය නොහැකි බව සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී මනූෂ නානායක්කාර මහතා පැවැසීය.

එය කාගේ හෝ නඩු ඉක්මණින් විසඳීමේ ක්‍රමයක්ද එසේ නැතිනම් කඩාකප්පල්කාරී ක්‍රියාවක් දැයි කියා ජනතාව තුළ සැකයක් මතු වෙමින් පවතින බවද ඒ මහතා කීවේය.

20වැනි සංශෝධනයත් සමඟ අධිකරණයේ පරිපාලනය අතට ගැනීම, නිදහස් කර ගැනීමට සිරකරුවන් පෝලිමක් සිටීම වැනි කාරණා හදිසි ගිනි ගැනීමත් සමඟ සම්බන්ධ වනවාදෝ කියා සමාජ කතිකාවක් හටගෙන ඇති බවත් හෙතෙම ප්‍රකාශ කළේය.

ඔහු මේ අදහස් පළ කළේ කොළඹ විපක්ෂ නායක කාර්යාලයේදී ඊයේ (16) පැවති මාධ්‍ය සාකච්ඡාවකට සහභාගි වෙමිනි.

# පාස්කු දා ප්‍රහාරයෙන් මැරුණු අයට වඩා බේරුවල-දිගන වින්දිතයන්ට වන්දි දීලා

**සුභාෂිණී සේනානායක**

අප්‍රේල් 21 ප්‍රහාරයෙන් මිය ගිය පුද්ගලයන්ට ගෙවූ වන්දි මුදලට වඩා වැඩි වන්දි මුදලක් බේරුවල සහ දිගන ආශ්‍රිත සිදුවීම්වලින් ජීවිතක්ෂයට පත්වූ පුද්ගලයන් වෙනුවෙන් ගෙවා ඇති බව ඊයේ 16 පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කරන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව හමුවේ අනාවරණය විය.

මේ බව අනාවරණය වූයේ හානි පූර්ණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ එස්. එම්. බදුර්දීන් මහතා ඊයේ (16) කොමිසම හමුවේ දුන් සාක්ෂි අනුව මේ තීරණය ගනු ලැබීය.

දිගන ආශ්‍රිතව හටගත් නොසන්සුන්කාරී වාතාවරණය පිළිබඳ සාකච්ඡා කිරීමට එවකට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ, ලක්ෂ්මන් කිරිඇල්ල, රවුෆ් හකීම් යන ඇමැතිවරුන්ගේ සහභාගීත්වයෙන් මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවැති රැස්වීමකදී බවත් අදාළ සිදුවීමෙන් ජීවිතක්ෂයට පත්වූවන් සඳහා ගෙවිය යුතු වන්දියට අදාළව මුදල් තීරණය කිරීම දේශපාලනික වශයෙන් සිදුවූ බවත් වැඩ බලන අධ්‍යක්ෂවරයා කොමිසම හමුවේ පැවැසුවේය.

දිගන සහ බේරුවල ප්‍රදේශ ආශ්‍රිතව ඇතිවූ ගැටුම්කාරී තත්ත්ව හේතුවෙන් මිය ගිය පුද්ගලයන් සඳහා වන්දි මුදල් ලෙස රුපියල් ලක්ෂ විස්සක් ගෙවූ නමුත් අප්‍රේල් 21 ප්‍රහාරයෙන් මිය ගිය පුද්ගලයන් සඳහා වන්දි මුදල් ලෙස ගෙවා ඇත්තේ රුපියල් ලක්ෂ දහයක් පමණක් බව කියා සිටි ඒ මහතා එක් එක් සිද්ධිවලදී වන්දි ගෙවීම මෙලෙස තීරණය කිරීම අසාධාරණ බව කොමිසම හමුවේ පිළිගත්තේය.

"පාස්කු ප්‍රහාරයෙන් මිය ගිය පුද්ගලයන්ට සහ දිගන හා බේරුවල සිදුවීම් හේතුවෙන් මිය ගිය පුද්ගලයන් සඳහා ගෙවන ලද මුදල අතර අසාධාරණයක් තිබෙනවා නේද" යන්න මෙහිදී කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා සාක්ෂිකරුගෙන් විමසා සිටියේය.

දිගන හා බේරුවල සිදුවීම් හේතුවෙන් ජීවිත හානිවූ පුද්ගලයන් වෙනුවෙන් ලබා දුන් වන්දි මුදල් සමඟ සලකා බැලීමේදී අප්‍රේල් 21 ප්‍රහාරයෙන් මිය ගිය පුද්ගලයන්ට ගෙවූ වන්දි මුදලේ යම් අඩුවක් ඇතැයි තමන් පිළිගන්නා බව හානි පූර්ණය සඳහාවූ කාර්යාලයේ වැඩ බලන අධ්‍යක්ෂ එස්. එම්. බදුර්දීන් මහතා කියා සිටි අතර විවිධ සිදුවීම්වලින් ජීවිතක්ෂයට පත්වූවන්ට විවිධ ප්‍රමාණවලින් වන්දි මුදල් ගෙවීම සාධාරණ හා නිවැරදි නොවන බවද කියා සිටියේය.

මෙරට තුළ හානි පූර්ණය සඳහා වන්දි මුදල් ගෙවීමේ නිශ්චිත පිළිගත් ක්‍රමවේදයක් නොමැතිවීම විශාල අඩුපාඩුවක් මෙන්ම නිලධාරීන් දුෂ්කරතාවට පත් කරවන්නක් බවද හානි පූර්ණය සඳහා වූ කාර්යාලයේ වැඩ බලන අධ්‍යක්ෂ එස්. එම්. බදුර්දීන් මහතා කොමිසම හමුවේ පැවැසුවේය.

එබැවින් දේපළ සහ ජීවිත හානිවූවන් සඳහා වන්දි ගෙවීමේදී සැමට සාධාරණත්වය ඉටු වන නිශ්චිත ක්‍රමවේදයක් සකස් කළ යුතු බව සාක්ෂිකරු කොමිසම හමුවේ අවධාරණය කළේය.

## සෞභාග්‍යයේ දැක්ම තුළින් නැ'හිර සම්පත්වලින් ප්‍රයෝජන ගත හැකියි - ආණ්ඩුකාර අනුරාධා යහම්පත්

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම තුළින් නැගෙනහිර පළාතේ ඇති සියළු සම්පත් වල ප්‍රයෝජනය ගැනීමට හැකි බවද නැගෙනහිර ආණ්ඩුකාර අනුරාධා යහම්පත් මහත්මිය පැවසුවාය. එය යථාර්ථයක් කිරීම සඳහා සියළු දෙනාම කැපවී කටයුතු කළ යුතු බවද ආණ්ඩුකාරවරිය කීවාය. සෞභාග්‍යයේ දැක්ම යටතේ නැගෙනහිර පළාත තුළ ක්‍රියාකාරී තිරසාර සැලැස්මක් සැකසීමේ ප්‍රධාන උත්සවයට මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදි ඊයේ (16) එක් වෙමින් ඇය මේ බව කියා සිටියාය.

එහිදි වැඩිදුරටත් අදහස් දැක්වූ ආණ්ඩුකාරවරිය, සෞභාග්‍යයේ දැක්ම වෙනුවෙන් කැප වෙලා වැඩ කරපු ප්‍රවීනයන් පිරිසකට. මමත් ඒ කාලේ ඒ කණ්ඩායමත් සමග වැඩ කළා. වියත්මග සංවිධානය සහ තවත් සංවිධාන සමඟ. ඉතින් අපි හිතුවා අපේ රට සංවර්ධිත රටක් කරා යාමට නම් අපේ ඉලක්ක නිවැරදිව හඳුනා ගත යුතුයි. අපි සෞභාග්‍යයේ දැක්ම බලාපොරොත්තු වුනේ රට තුළ සැබෑ වෙනසක් ඇති කරන්න. අපි දන්නවා අපේ රජය යුද්ධයක් තිබුනු අවස්ථාවක බලයට පත් වෙච්ච වෙලාවේ යුද්ධය ඉවර කරලා දෙන්න පොරොන්දු වුණා. කිවුවා වගේම ඔවුන් ඒ යුද්ධය ඉවර කරලා දුන්නා. පාරවල් හදලා උතුරු නැගෙනහිර පළාත් වල සංවර්ධනයකට මුල පිරුවා. අවුරුදු කීපයක් යහපාලන ආණ්ඩුව ඒ සියල්ල ආපස්සට හැරෙවුවා. දැන් සෞභාග්‍යයේ දැක්මෙන් සංවර්ධිත රටක් කරා රැගෙන යාම තමයි සිදු කරන්න තියෙන්නේ. ජනාධිපතිතුමා ඇතුළු රජය ඉතාම කාර්යශීලි ලෙස මේ පියවරවල් ඉස්සරහට ගෙන යයි.

1 පිටුවෙන් ...

### ජාතික සම්පත්...

කොළඹ වරායේ නැගෙනහිර ජැටිය සංවර්ධනය කිරීමට හැකියාවක් නැති බැවින් එය විකිණීමේ සූදානමක් ආණ්ඩුවට ඇති බවත් නැගෙනහිර ජැටිය මෙන්ම ගාලු වරායට අයත් ඉඩම් විකිණීමටත් මේ වන විට සූදානමක් ඇතැයි හෙතෙම පැවැසීය.

ආසියාවේ දැවැන්තම වරායක් ලෙස කන්ටේනර් මෙහෙයවමින් විශාල ආදායමක් හා ලාභ ලැබූ වරායට මේ තත්ත්වය උදාවූයේ සේවකයන්ගේ වරදක් නිසා නොවන බවත් එහි සම්පූර්ණ වගකීම රට පාලනය කළ ආණ්ඩු විසින් භාර ගත යුතු බවත් හෙතෙම කියා සිටියේය.

මේ තීන්දුව ඉවත් කර ගන්නා ලෙස දේශප්‍රේමී ජනතාව ආණ්ඩුවට බල කළ යුතු බවත් ඒ සඳහා පක්ෂයක් ලෙස කළ හැකි සියලු ක්‍රියාමාර්ග ගන්නා අතර මේ මංකොල්ලයට එරෙහිව හා ජාත්‍යන්තර හූ දේශපාලනයේ රට අනාරක්ෂිත කරන වෑයමට එරෙහිව පෙළ ගැසෙන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටින බවත් හෙතෙම අවධාරණය කළේය.

### පොදුරද මඬුලු...

වසරක කාලයක් බලපැවැත්වෙන මේ ධුරය සඳහා රටවල් 54ක තරුණ තරුණියන් 100 දෙනකු අතර ZOOM තාක්ෂණය ඔස්සේ පැවැති ඡන්ද විමසීමකින් අනතුරුව මේ පත් කිරීම කර තිබේ. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අවසන් වසරේ අධ්‍යාපනය හදාරන ඩිලාන් මහතා ජෛව යාන්ත්‍රික ඉන්ජිනේරුවරයකු වශයෙන්ද කටයුතු කරන අතර ඩ්‍රෝන තාක්ෂණය ඔස්සේ බීජ වැපුරුම් යන්ත්‍රයක් නිෂ්පාදනය කළේද මොහුය.

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය සහ ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධාන කරනු ලබන ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුවේ ප්‍රතිපක්ෂ නායකවරයා ලෙසද ඩිලාන් මහතා කටයුතු කරමින් සිටී.

එමෙන්ම මොහු සමඟ පොදු රාජ්‍ය මණ්ඩලීය තරුණ පාර්ලිමේන්තු නියෝජනය සඳහා තරුණ සේවා සභාවේ ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුවේ බලශක්ති හා මහජන උපයෝගිතා ඇමැති අවිනි නවරත්න මෙනවියද තේරීපත්වී ඇත.

### කොවිඩ් 19න් පීඩාවට පත්වූ...

කොවිඩ් වසංගත තත්ත්වය තුළ රටේ සාමාන්‍ය ජන ජීවිතය යථා තත්ත්වයට පත් කරලීම සඳහා කැපවී කටයුතු කළ සෞඛ්‍ය, ආරක්ෂක, පොලිස් ආදී වූ සේවාවන්හි නියුතු සමස්ත රාජ්‍ය සේවයට මේ ණය යෝජනා ක්‍රමය යටතේ සහන ලබාදීමට රාජ්‍ය සේවා අමාත්‍යාංශය අදාළ චක්‍ර ලේඛය මගින් උපදෙස් ලබාදී තිබේ.

ත්‍රිරෝද, පාසල් වෑන් සහ බස් රථ හිමියන්ට සහ පෞද්ගලික බස් රථ සේවකයන් වැනි අයට සිය බැංකු ගිණුම පවත්වාගෙන යන රාජ්‍ය බැංකුව වෙත ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කොට සහන ණය මුදල ඉල්ලුම් කිරීමට පිළිවන. මේ කාණ්ඩයට අයත් නොවන එහෙත් රාජ්‍ය බැංකුවල ගිණුම් ඇති දෛනික රැකියාවන්හි නිරතවූවනටද සිය බැංකුවෙන් මූල්‍ය පහසුකම් ඉල්ලුම් කළ හැකිය.

උදාවන නත්තල හා නව වසර සැමරීම වෙනුවෙන් ලබාදෙන මේ පරිපූරක උත්සව ණය යෝජනා ක්‍රමය සියයට 0. 625ක පොලී අනුපාතයක් යටතේ මාස 10කින් ගෙවීමට යටත් වන පරිද්දෙන් ලබා දීමට නියමිතය.

මසකට ආදායම රුපියල් 50,000.00 කට වැඩි රාජ්‍ය නිලධාරීන් සඳහා රුපියල් 50,000.00ක ණය මුදලක් ද රුපියල් 25,000.00 ත් රුපියල් 50,000.00ත් අතර වැටුප් ලබන නිලධාරීන් සඳහා රුපියල් 25,000.00ක ණය මුදලක්ද මසකට රුපියල් 25,000.00 කට අඩු වැටුප් ලබන රාජ්‍ය නිලධාරීන් සඳහා රුපියල් 10,000.00ක ණය මුදලක්ද මේ ණය යෝජනා ක්‍රමය යටතේ ලබා ගැනීමට හැකි වේ.

ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව යන බැංකු මගින් මේ ණය සහන ලබාදීමට නියමිත අතර අදාළ රාජ්‍ය ආයතනවල ප්‍රධානීන් මගින් ණය අයදුම් කරන නිලධාරීන්ගේ නාම ලේඛන සේවාස්ථානය අසල පිහිටි රාජ්‍ය බැංකු වෙත ඉදිරිපත් කිරීමෙන් ණය මුදල ලබා ගැනීමට ඉඩකඩ ලබාදී ඇත. අදාළ ණය මුදල දෙසැම්බර් මස 18 වැනි දිනට පෙර ඉල්ලුම්කරුවන්ගේ ගිණුම්වලට බැර කිරීමට කටයුතු යොදා ඇත.

කොවිඩ් 19 අභියෝගය හමුවේ අඩාල වූ ආර්ථිකය සහ ජන ජීවිතය මුළුමනින්ම යථා තත්ත්වයට පත් කොට 2020දී අහිමි වූ ප්‍රගතියද සමගින් 2021 වසරේ රට ඉදිරියට ගෙන යෑම රජයේ අරමුණ වී තිබේ.

## ඉඩ ඇති රෝහල් කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානවලට

**සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් තීරණයක්**

**සන්ධ්‍යා කරුණාරත්න**

වැඩි පිරිසකට ප්‍රතිකාර හා පහසුකම් ලබාදිය හැකි රෝහල් ක්ෂණිකව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ගෙන කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථාන බවට පරිවර්තනය කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය තීරණය කරයි. දෛනිකව වාර්තා වන කොවිඩ් 19 ආසාදිතයන් ප්‍රමාණය හේතුවෙන් මේ තීරණය ගෙන තිබේ.

ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් වෙන් කිරීමට නියමිත අතර අවශ්‍ය අමතර ප්‍රතිපාදන ලෝක බැංකු සහ ආසියානු සංවර්ධන අරමුදල්වලින් ගැනීමට අවධානය යොමුව ඇත. කොවිඩ් 19 ආසාදිතයන් 500-600ත් අතර ප්‍රමාණයක් මෙරටින් දිනකට වාර්තා වන අතර සුව වන ප්‍රමාණය 500ක් පමණ බව කොවිඩ් මර්දන කාර්ය සාධක ක්‍රියාකාරී සමාලෝචන කමිටුවේදී ඊයේ (16) හෙළි විණි.

සෞඛ්‍ය ඇමැති පවිත්‍රා වන්නිආරච්චි මහත්මියගේ ප්‍රධානත්වයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී ඊයේ (16 ) පෙරවරුවේදී මේ ක්‍රියාකාරී සමාලෝචන කමිටුව රැස් විය.

## වැලිසරින් පැන්න ආසාදිතයා අල්ලයි

**ආශ්‍රිතයෝ සොයා පරීක්ෂණ**

**රුවන්ත නිතුල්ගස්පිටිය සහ රාගම සමූහ**

වැලිසර ළය රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී පැන ගිය කොවිඩ් -19 ආසාදිතයා මරදාන- මස්ජිද් පාරේ නිවෙසක් ඉදිරිපිට සිටියදී පොලිස් භාරයට ඊයේ (16) පස්වරුවේ ගත් බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය 'දිනමිණ' ට පැවැසීය.

මරදාන පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත සිදු කළ මෙහෙයුමකින් මේ පුද්ගලයා පොලිස් භාරයට ගත් බවත් ඔහු නියමිත සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද මත නැවත වැලිසර ළය රෝහලට ඇතුළත් කළ බවත් එම කාර්යාලය කීය.

අදාළ පුද්ගලයා ව්‍යාජ ලිපිනයක් ඔස්සේ රෝහල්ගතව සිට කොවිඩ් ආසාදිත බවට තහවුරු වීමත් සමඟ පෙරේදා (15) පස්වරුවේ රෝහලෙන් පැන ගොස් ඇති බව වැලිසර රෝහලේ ප්‍රකාශකයකු සඳහන් කළේය.

ඒ අනුව ඔහු සොයා ගැනීමේ අරමුණින් පොලිස් මාධ්‍ය කොට්ඨාසය ඊයේ (16) පෙරවරුවේ මාධ්‍යයට ඡායාරූපයක් නිකුත් කළේය.

ඩීමෙල් වත්ත, ග්‍රෑන්ඩ්පාස් ලිපිනයේ ස්ථිරව පදිංචිවී සිටින මොහු රෝහලෙන් පලා යෑමෙන් අනතුරුව පෙරේදා පස්වරු 3.45ට පමණ මීගමුව - කොටුව බස්රථයක නැගී ආමර් වීදිය දක්වා පැමිණ ත්‍රිරෝද රථයක රාත්‍රිය ගත කර ඇති බව මූලික ප්‍රශ්න කිරීම්වලින් අනාවරණය වී ඇත.

මේ අනුව වැලිසර සිට ආමර්වීදිය දක්වා මොහු පැමිණි බස්රථයේ රියැදුරු, රිය සහායක, බස් රථයේ ගමන් ගත් පුද්ගලයන් තිදෙනකු සහ රැය පහන් කළ ත්‍රිරෝද රථයේ රියැදුරු සොයා ග්‍රෑන්ඩ්පාස් සහ මරදාන පොලිස් ස්ථාන වැඩි දුර විමර්ශන සිදු කරන බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය පැවැසීය.

මෙලෙස කොවිඩ් ආසාදිතයකු රෝහලකින් පැන ගිය 06 වැනි අවස්ථාව මෙය වන බව පැවැසූ පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ මහතා මෙලෙස රෝහල්වලින් පැන යන පුද්ගලයන්ට නිරෝධායන සහ රෝග වැළැක්වීමේ අඥාපනත ඔස්සේ වසර 03ක සිරදඬුවම් පැනවීමට පියවර ගන්නා බව කීය.

## උපරිමාධිකරණයේ ගින්න ගැන ස්වාධීන පරීක්ෂණයක් කරන්න

**එජාපය රජයෙන් ඉල්ලයි**

**ශිරෝමි අබයසිංහ සහ මැද කොළඹ සමූහ**
**ආරියරත්න ගනේගොඩ**

උපරිමාධිකරණයේ පසුගිය හටගත් ගින්න පිළිබඳ ස්වාධීන පරීක්ෂණයක් පවත්වන ලෙස එක්සත් ජාතික පක්ෂය රජයෙන් ඉල්ලා සිටී.

උපරිමාධිකරණ සංකීර්ණය පිහිටා තිබෙන කොළඹ අලුත්කඩේ ප්‍රදේශය දැනට වසා දමා ඇති අතර උසාවි කටයුතු මහජනතාව නොමැතිවීම හේතුවෙන් හදිසි නඩු සඳහා පමණක් සීමා කර තිබියදී මේ ගින්න ඇති වීමට ආරක්ෂාව අඩු වූයේ කෙසේ දැයි රජය සොයා බැලිය යුතු බව එම පක්ෂය ප්‍රකාශ කළේය.

එක්සත් ජාතික පක්ෂය සැලකිලිමත් වන්නේ ගින්න ඇති වූ ස්ථානය පිළිබඳ මතු වන වාර්තා පමණක් වන අතර උපරිමාධිකරණ මාෂල් උපුටා දක්වමින් මාධ්‍ය ප්‍රකාශ කළේ ගින්න සංකීර්ණයේ පහළම මාලය දක්වා ඇති වූ බවත් පහළම මාලයේ පිහිටා ඇති උසාවි වාර්තා කාමරයේ තත්ත්වය පිළිබඳ යාවත්කාලීන කිරීමක් ලබා දීමට ඒ වන විට මාෂල්ට නොහැකි වූවත් පසුව පොලිසිය ප්‍රකාශ කර ඇත්තේ වාර්තා කාමරයට කිසිදු හානියක් සිදුව නොමැති බවයි. සඳහන් කරන කෙසේ වෙතත්, කිසිදු ලිපිගොනුවක් අතුරුදහන් වී නොමැති බව සහතික කිරීම සඳහා වාර්තා කාමරයේ සම්පූර්ණ ඉන්වෙන්ටරි ලබා ගන්නා ලෙස එක්සත් ජාතික පක්ෂය රජයෙන් ඉල්ලා සිටී.

මේ සංකීර්ණයේ ආරක්ෂාව සම්බන්ධයෙන් වගකිව යුතු අය මේ සිද්ධියට වගකිව යුතු බව පෙන්වා දෙන එම පක්ෂය

2019 දී රජය භාරදීමට පෙර එක්සත් ජාතක පක්ෂයේ නායකත්වයෙන් යුත් රජය අධිකරණ වාර්තා ඩිජිටල්කරණය කිරීමේ කටයුතු කරමින් අවශ්‍ය පද්ධති ප්‍රසම්පාදනය කර ඒවා ක්‍රියාත්මක කිරීමට සිටි බවත් වර්තමාන රජය මේ ක්‍රියාවලිය අඛණ්ඩව කරගෙන ගොස් ඇත්දැයි සහ මේ වැදගත් කාර්යය ප්‍රමාද කළේ ඇයිද යන්න පිළිබඳත් පැහැදිලි කිරීමක් ලබා දෙන ලෙසත් රජයෙන් ඉල්ලා සිටියි.

## තවත් කොරෝනා මරණ තුනක්

**මුළු ගණන 160 දක්වා ඉහළට**

**සන්ධ්‍යා කරුණාරත්න**

ඊයේ (16) දහවල් වාර්තා වූ මරණ තුනත් සමගින් මෙරට කොවිඩ් 19 ආසාදිත මරණ සංඛ්‍යාව 160 දක්වා ඉහළ ගොස් තිබේ.

කොළඹ 14 ප්‍රදේශයේ පදිංචි වයස අවුරුදු 60ක කාන්තාවක් කොළඹ 15 ප්‍රදේශයේ පදිංචි වසය අවුරුදු 85ක හා 84ක පිරිමි පුද්ගලයන් දෙදෙනකු ඊයේ (16) මෙසේ මරණයට පත්ව ඇති අතර මේ තිදෙනාම කොවිඩ් නියුමෝනියා තත්ත්වය හේතුවෙන් මරණයට පත්ව තිබේ.

## මරණ දැන්වීම්


**බර්ටි ප්‍රනාන්දු මහතා** - ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයීය ආදි ශිෂ්‍ය, ආනන්ද විද්‍යාලයීය හිටපු ආචාර්ය, රෙග්නිස් (ලංකා) සහ සින්ගර් (ශ්‍රී ලංකා) හිටපු අධ්‍යක්ෂ, කුමුදිනී (ආනන්ද බාලිකා විද්‍යාලය සහ ජාතික අධ්‍යාපන ආයතනය) ආදරණීය ස්වාමිපුරුෂයා වූද, නදී සහ උදානගේ ආදරණීය පියාණන් වූද, සන්ජීව සහ රිනුෂ්කාගේ මාමණ්ඩිය වූද බර්ටි ප්‍රනාන්දු මහතා අභාවප්‍රාප්ත විය. ආදාහනය දෙසැම්බර් 18 වෙනි සිකුරාදා ප.ව. 4.30 ට ගල්කිස්සේ පොදු ආදාහනාගාරයේදී සිදු කෙරේ. අවමගුල් පෙරහැර ප.ව. 4.00 ට නිවසින් පිටත්වේ. **F72A, අතුල මාවත, ටෙම්පලර්ස් පාර, ගල්කිස්ස.** 077294

# තිරසර සංවර්ධන වැඩපිළිවෙළට එ.ජා. සංවිධානය දෙන සහයෝගය අගයනවා

## ඇමැති දිනේෂ් ගුණවර්ධන

මහින්ද අලුත්ගෙදර

### ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ගෙන වසර 65යි



තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය හා තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ එහි ආයතනවලින් ලැබෙන අඛණ්ඩ සහයෝගය අගය කරන බව ශ්‍රී ලංකාව ප්‍රකාශ කරයි.

එක්සත් ජාතීන් සමඟ පවතින දිගුකාලීන හවුල්කාරිත්වය ශ්‍රී ලංකාවට අභිමානයක් බව විදේශ සබඳතා ඇමැති දිනේෂ් ගුණවර්ධන මහතා පවසයි.

ඇමැතිවරයා මේ බව සඳහන් කළේ ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබා ගැනීම පිළිබඳ 65 වැනි සංවත්සරය සැමරීම වෙනුවෙන් විදේශ අමාත්‍යාංශයේ දී පැවති චාම් උත්සවයකදීය.

මෙම අවස්ථාවට ශ්‍රී ලංකාවේ සිටින එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන ප්‍රධානීන් සමඟ කලාපීය සහයෝගීතා රාජ්‍ය ඇමැති තාරක බාලසූරිය, එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක හැනා සිංගර් හා විදේශ අමාත්‍යාංශයේ ලේකම් අද්මිරාල් මහාචාර්ය ජයනාත් කොළඹගේ මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

මෙහිදී තව දුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා- ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලැබීමේ 65 වැනි සංවත්සරය පිළිබඳ සන්ධිස්ථානය සමරණ අවස්ථාව ඇමතීම සතුටට කරුණක්. එක්සත් ජාතීන් සමඟ පවතින දිගුකාලීන හවුල්කාරිත්වය ශ්‍රී ලංකාවට අභිමානයකි.

නිදහසින් පසු ගත වූ කාලය තුළ දී යටත් විජිත බලවතුන් සමඟ ඇති බැඳීම් හා වගකීම්වලින් ක්‍රමයෙන් නිරවුල් වූ ශ්‍රී ලංකාව, අන්තර්ජාතික ප්‍රජාවේ ක්‍රියාකාරී සාමාජිකයකු ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ තමාටම ආවේණික වූ ස්ථානයක් නිර්මාණය කළා. නොබැඳි ප්‍රතිපත්තිය මත පදනම්ව, ශ්‍රී ලංකාව නොබැඳි ව්‍යාපාරයේ ආරම්භක සාමාජිකයකු ලෙස ප්‍රධාන භූමිකාවක් ඉටුකළ අතර, ගෝලීය දකුණේ අවශ්‍යතා නියෝජනය කරමින්, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ බහුපාර්ශ්වික සාකච්ඡාවල නිරත වෙමින්, 77 කණ්ඩායමේ සාමාජිකයකු බවට ද පත්වුණා.

පසුගිය වසරේ පැවති ජනාධිපතිවරණයෙන් හා මේ වසරේ පැවති මහ මැතිවරණයෙන් ඒ මහතාගේ "සෞභාග්‍යයේ දැක්ම" වෙනුවෙන් ශ්‍රී ලංකා ජනතාවගෙන් විශිෂ්ට ජනවරමක් ලබාගත්, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් යුත් රජය, ස්වෛරීභාවය ආරක්ෂා කිරීම, රාජ්‍යයන්ගේ භෞමික අඛණ්ඩතාව සහ ඔවුන්ගේ දේශීය කටයුතුවලට ඇඟිලි ගැසීම් නොකිරීම යන එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ ශ්‍රී ලංකාවේ පවතින විශිෂ්ට සම්බන්ධතාව දිගටම පවත්වාගෙන යාම සඳහා දැඩි උනන්දුවක් දක්වනවා.

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ දක්වා ඇති සාරධර්ම මත පදනම්ව, පසුගිය වසර 65 තුළ දී ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ පද්ධතියට විවිධ ආකාරවලින් දායක වී තිබේ. ලංකාව 1960 දී එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ ස්ථිර නොවන සාමාජිකයකු බවට පත් වූ අතර, පසුව 1976 දී මහා සභාවේ සභාපති ලෙස ද කටයුතු කළා.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලාංකික තානාපතිවරුන් සහ විවිධ එක්සත් ජාතීන්ගේ සංසදවල සේවය කළ ශ්‍රී ලාංකික වෘත්තිකයන් දුන් සුවිශේෂී දායකත්වය මෙම අවස්ථාවේ දී සිහිපත් කළ යුතුයි. මලලසේකර මැතිතුමා, ෂර්ලි අමරසිංහ මැතිතුමා, නෙවිල් කනකරත්න මැතිතුමා, ජයන්ත ධනපාල මැතිතුමා සහ ගාමිණී කොරයා මැතිතුමා වැනි අපගේ ස්ථිර නියෝජිතවරුන් ඒ අතර වනවා.

එක්සත් ජාතීන්ගේ සංවිධානයට ඇතුළත් වනවිට, ශ්‍රී ලංකාව ඇතුළු ගෝලීය දකුණේ රටවල පැවති අපේක්ෂාවන් බොහොමයක් තවදුරටත් වලංගුව පවතී.

කොවිඩ්-19 වසංගතය පිළිබඳ කටයුතු කිරීම සඳහා බහුපාර්ශ්වීය ක්‍රියාකාරීත්වය පෝෂණය කිරීම සහ ගෝලීය සහයෝගීතාව බලමුලු ගැන්වීම සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය ඉටුකළ කාර්යභාරයට ශ්‍රී ලංකාව ප්‍රශංසා කරයි. මෙම ගෝලීය අභියෝගයට එරෙහිව සටන් කිරීම සඳහා වන සාමූහික ප්‍රයත්නයන්හි දී ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ එක්ව කටයුතු කිරීමට ශ්‍රී ලංකාව කැපවී සිටී.

එක්සත් ජාතීන්ගේ මහලේකම් ඇන්ටෝනියෝ ගුටරෙස් මහතා ප්‍රකාශයට පත් කළ දේශගුණික හදිසි අවස්ථාව ශ්‍රී ලංකාව අනුමත කරන අතර, ඒ වෙනුවෙන් ඇප කැප වී සිටින බවද කිව යුතුයි.

මෙහිදී අදහස් දැක්වූ එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක හරනා සිංගර් මහත්මිය අදහස් දක්වමින් එක්සත් ජාතීන්ගේ ව්‍යාප්තිය හා නිරායුධකරණය කිරීමේ ක්‍රියාවලීන් සඳහා ශ්‍රී ලංකාව ලබා දුන් දායකත්වය සිහිපත් කළ අතර, එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතන හරහා ශ්‍රී ලංකාව සමඟ සිදුකෙරෙන බහුවිධ සහයෝගීතාව ගැන සඳහන් කළාය.

නේවාසික සම්බන්ධීකාරකවරිය කියා සිටියේ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය, මානව වර්ගයාගේ සාමූහික සදාචාරාත්මක බලවේගයේ වඩාත්ම කල් පවත්නා සංග්‍රහකරණයක් බව ඔප්පු වී ඇති අතර, එමඟින් සෑම සාමාජික රටකටම ගෞරවය ලබා දෙන ලෙස ඉල්ලා සිටින බවයි.

# සියලු කොවිඩ් ඖෂධ සායනික පරීක්ෂාවකින් තහවුරු විය යුතුයි

## රාජ්‍ය ඇමතිනී සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ



කොවිඩ් 19 පාලනය කිරීම සඳහා යොදා ගැනීමට නියමිත කිසියම් ඖෂධයක් හෝ එන්නතක් නිසි සායනික පරීක්ෂාවකින් තහවුරු වූ ඒවා විය යුතු බවත් එසේ නොවුණහොත් එයින් අත්විය හැකි ප්‍රතිඵල අහිතකර විය හැකි බවත් ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග සහ කොවිඩ් රෝග පාලනය පිළිබඳ රාජ්‍ය අමාත්‍ය විශේෂඥ වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය සඳහන් කරයි.

අමාත්‍යවරිය මේ බව සඳහන් කළේ කොවිඩ් 19 පාලනය කිරීම සඳහා ලෝකයේ ඉදිරිපත්ව ඇති එන්නත් මෙරට කොවිඩ් 19 පාලනය කිරීමට යොදා ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් විශේෂඥ මතය විමසා බැලීමට ලංකාවේ ඉහළ පෙළේ වයිරස් සහ ක්ෂුද්‍රජීවී පිළිබඳ විශේෂඥයන් පිරිසක් සෞඛ්‍ය අමාත්‍යාංශයේදී හමුවූ අවස්ථාවේදීය.

වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය අමාත්‍යවරිය සඳහන් කළේ වෛද්‍යවරයකුගේ නිර්දේශයකින් ලබාදෙන ඕනෑම ඖෂධයක් හෝ එන්නතක් මිනිස් ශරීරයට අහිතකර නොවන බව තහවුරුවීම අත්‍යාවශ්‍ය වන බවත්, එමගින් ඇතිවන සංකූලතා, අතුරු ආබාධ පිළිබඳ නිවැරදි තක්සේරුවක් තිබිය යුතු බවයි. රෝග පාලනයට ගත යුතු ක්‍රියාමාර්ග සැමවිටම නිවැරදි විය යුතු බව පෙන්වාදුන් රාජ්‍ය අමාත්‍යවරිය, කොවිඩ් 19 සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති එන්නත් තවම පවතින්නේ සායනික පරීක්ෂණ මට්ටමේ වන බැවින් ඒ පිළිබඳ විශේෂඥ මතය මෙහිදී විමසන ලදි.

කොවිඩ් 19 සඳහා ලෝකයේ මේවන විට ඉදිරිපත්ව ඇතිඔක්ස්ෆර්ඩ්, ෆයිසර්, ස්පුට්නික් සහ සිනොවැක් යන එන්නත් වර්ග 4 සම්බන්ධයෙන් මූලික අවධානයක් යොමු වූ අතර, වෙන් වෙන් වශයෙන් එම එන්නත්වල වයිරසයට එරෙහිව ප්‍රතික්‍රියා කිරීමේ ප්‍රතිශතය, එය ගබඩා කර තැබීමේ උෂ්ණත්වය, ඒ සඳහා වන වියදම ආදී කරුණු පිළිබඳ සාකච්ඡා විය. එම එන්නත් පිළිබඳ සංසන්දනාත්මකව විමසා බැලීමක් ද සිදු කළඅතර තවදුරටත් මේ පිළිබඳ අධ්‍යයනය කර විශේෂඥ අදහස් ඉදිරිපත් කරන ලෙස අමාත්‍යවරිය දැන්වූවාය.

මෙම සාකච්ඡාව සඳහා ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග සහ කොවිඩ් රෝග පාලනය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අමල් හර්ෂ ද සිල්වා, වසංගත රෝග විද්‍යායතනයේ අධ්‍යක්ෂ විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර, මහාචාර්ය ජෙනිෆර් පෙරේරා, මහාචාර්ය නීලිකා මලවිගේ, වසංගත රෝග විද්‍යායතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය සමිත ගිනිගේ යන මහත්ම මහත්මීන් ඇතුළු විශේෂඥ වෛද්‍යවරු පිරිසක් එක්වූහ.

# වනජීවී නියාමක නිලධාරීහු වර්ජනය අතහරිති

අනුර ප්‍රේමලාල්

පොලොන්නරුවේ ජලගැලුම් නිම්න ජාතික වනෝද්‍යානය සම්බන්ධයෙන් මතු වී තිබෙන ගැටලුකාරී තත්ත්වය සම්බන්ධයෙන් කුමන හෝ තීරණයක් ගන්නවා නම් එය එය පවතින නීතියට අනුව සිදුවිය යුතු යැයි වනජීවී රාජ්‍ය ඇමැති ගත් තීරණය නිසා තම සංගමය වෘත්තීය ක්‍රියාමාර්ගය තාවකාලිකව අතහැර දැමූබව සමස්ත ලංකා වනජීවී නියාමක නිලධාරීන්ගේ සංගමයේ සභාපති ඒ.එස්.එස්. රණවකආරච්චි මහතා ප්‍රකාශ කළේය.

ඒ මහතා මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් අදහස් දක්වමින් කියා සිටියේ මේ පිළිබඳ රාජ්‍ය ඇමැති විමලවීර දිසානායක මහතා සමඟ තම සංගමය දීර්ඝ වශයෙන් සාකච්ඡාවක් පැවැත් වූ අතර එහිදි පවතින නීතියට පටහැනිව කිසිදු ක්‍රියා මාර්ගයක් නොගැනීමට තීරණය වුණු බවයි. මේ සම්බන්ධයෙන් දැනට පවතින නීතිය වනුයේ

වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතයි. මෙම ජාතික වනෝද්‍යානය හරහා මාර්ගයක් දැමීම, ඒ තුලට ගවයින් ඇතුළත් කිරීම වැනි ගැටලු මතුවීම නිසා මෙම අර්බුදය ඇතිවිය.

මේ ජාතික වනෝද්‍යානය තුළ නීතියට පටහැනිව යමක් වුණොත් යළි තම සංගමය හා ඊට සහයෝගය දක්වන සංගම් එකොළහක් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට පිවිසෙන බව මෙහිදි සිහිපත් කරනවා.

### රට දිනන ජයමිණ

සියවසක් කල් යෙහෙන් වැජඹුන
පුවත් ලොව මහ මෙරක් විලසින
සමබරව හිරු කිරණ විහිදන
'දිනමිණයි' රට දිනන ජයමිණ

- රත්නසිරි පතිරණ




NiSACO 011-2744444 බොරැල්ල පාර, අතුරුගිරිය. ෆැක්ස් - 011-2560535
www.nisaco.lk E-mail- nisacofurniture@gmail.com සියලුම ප්‍රදර්ශනාගාර සෑම දිනකම විවෘතයි
කළුබෝවිල | නුගේගොඩ | පන්නිපිටිය | නාරාහේන්පිට | විද්‍යාල හන්දිය


### නිල ප්‍රතිඵල — සුපිරි වාසනා




| දිනුම් අදින ලද දිනය | 15/12/2020 | 1557 | දිනුම් වාරය |
|---|---|---|---|

සුපිරි අංකය **14** | ජයග්‍රාහී අංක **01 03 43 48**

| | | | |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 04 ම ගැලපේනම් | රු. 500,000.00 | - |
| 2 ත්‍යාගය | සුපිරි අංකය සමඟ අංක 3 ක් ගැලපේ නම් | රු. 15,000.00 | 06 |
| 3 ත්‍යාගය | අංක 03 ක් ගැලපේ නම් | රු. 1,000.00 | 92 |
| 4 ත්‍යාගය | සුපිරි අංකය සමඟ අංක 2 ක් ගැලපේ නම් | රු. 200.00 | 293 |
| 5 ත්‍යාගය | අංක 02 ක් ගැලපේ නම් | රු. 100.00 | 4,362 |
| 6 ත්‍යාගය | සුපිරි අංකය සමඟ අංක 1 ක් ගැලපේ නම් | රු. 60.00 | 3,861 |
| 7 ත්‍යාගය | අංක 01 ක් ගැලපේ නම් | රු. 20.00 | 54,937 |
| 8 ත්‍යාගය | සුපිරි අංකය පමණක් ගැලපේ නම් | රු. 20.00 | 13,730 |

මෙවර දිනා ඇති මුළු මුදල
**රු. 2,281,800.00**

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාල සීමාවකට පමණි. රුපියල් ලක්ෂ 05 ට වැඩි ත්‍යාග රජයේ බදු නීති වලට යටත්වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යවේ.

ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය
**රු. 21,607,700.68**

ජාතික ලොතරැයි මණ්ඩලය / தேசிய லொத்தர் சபை / NATIONAL LOTTERIES BOARD
නො. 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන : 0114 607 000, 0112 324 324
ෆැක්ස් : 0114 663 416 වෙබ් : www.nlb.lk

## 2020-12.-15 - ජාතික ලොතරැයි මණ්ඩලය බිහිකල මුළු ත්‍යාග ලාභීන් සංඛ්‍යාව 650,491

## ජයග්‍රාහකයින් අතර බෙදාදුන් මුළු ත්‍යාග මුදල 25,226,150.00

රු. 2,000,000.00 ත්‍යාග 01 | රු. 100,000.00 ත්‍යාග 27

www.nlb.lk

### මහජන සම්පත — නිල ප්‍රතිඵල

දිනුම් වාරය - 4337

දිනය: 2020-12-15

ජයග්‍රාහී අක්ෂරය **D** | ජයග්‍රාහී අංක **2 1 4 7 3 9**

ත්‍යාග රටාව - අග සිට මුලට

| | | | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 වැනි ත්‍යාගය | 2 1 4 7 3 9 | රු. 2,000,000/- | 01 |
| 2 වැනි ත්‍යාගය | 1 4 7 3 9 | රු. 100,000/- | 12 |
| 3 වැනි ත්‍යාගය | 4 7 3 9 | රු. 10,000/- | 108 |
| 4 වැනි ත්‍යාගය | 7 3 9 | රු. 1,000/- | 1,065 |
| 5 වැනි ත්‍යාගය | 3 9 | රු. 100/- | 10,675 |
| 6 වැනි ත්‍යාගය | 9 | රු. 20/- | 105,462 |

ත්‍යාග රටාව - මුල සිට අගට

| | | | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 7 වැනි ත්‍යාගය | 2 1 4 7 3 | රු. 10,000/- | 11 |
| 8 වැනි ත්‍යාගය | 2 1 4 7 | රු. 1,000/- | 101 |
| 9 වැනි ත්‍යාගය | 2 1 4 | රු. 100/- | 1,096 |
| 10 වැනි ත්‍යාගය | 2 1 | රු. 50/- | 10,451 |
| 11 වැනි ත්‍යාගය | D | රු. 20/- | 42,208 |

**දිනා ඇති මුළු ත්‍යාග මුදල - රු. 10,209,050.00**

රුපියල් ලක්ෂ 5 හෝ ඊට වැඩි ත්‍යාග රජයේ බදු නීති රීතිවලට යටත් වේ. ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්යය වේ. ජයග්‍රාහී ලොතරැයි පත් වලංගුවන්නේ දිනුම් අදින දින සිට මාස 06ක කාල සීමාවකට පමණි.

මීළඟ දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය **රු. 10,696,634.00**

ජීවිතයේ සිහිනයට - වාසනාවේ ආශිර්වාදය

ජාතික ලොතරැයි මණ්ඩලය
32, දේශමාන්‍ය N. W. J. මුදලිගේ මාවත, කොළඹ - 01
දුරකථන: 011-4607000, 011-2324324. Fax: 011-4669416.
www.nlb.lk

### ගොවි සෙත — නිල ප්‍රතිඵල

| දිනුම් වාරය | 2632 | දිනුම් අදින ලද දිනය | 15/12/2020 |
|---|---|---|---|

ඉංග්‍රීසි අක්ෂරය **E** | ජයග්‍රාහී අංක **03 33 59 76**


| | සංයෝගය | තෑගි මුදල | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 4 ම නිවැරදි | රු. 1,000,000.00 | - |
| 2 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමඟ අංක 3 ක් නිවැරදි | රු. 100,000.00 | 04 |
| 3 ත්‍යාගය | අංක 3 ක් පමණක් නිවැරදි | රු. 2,000.00 | 170 |
| 4 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමඟ අංක 2 ක් නිවැරදි | රු. 1,000.00 | 375 |
| 5 ත්‍යාගය | අංක 2 ක් පමණක් නිවැරදි | රු. 100.00 | 9,038 |
| 6 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර සමඟ අංක 1 ක් නිවැරදි | රු. 40.00 | 5,899 |
| 7 ත්‍යාගය | අංක 1 ක් පමණක් නිවැරදි | රු. 20.00 | 148,903 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් නිවැරදි | රු. 20.00 | 27,035 |

මෙම දිනුම් වාරයේ බිහි වූ ජයග්‍රාහකයන් ගණන **191,424**

මෙවර දිනා ඇති මුළු තෑගි මුදල
**රු. 5,773,520.00**

ලබන දිනුම් වාරයේ සුපිරි ත්‍යාගය
**රු. 64,155,590.00**

ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාල සීමාවකට පමණි. රුපියල් ලක්ෂ 05 ට වැඩි ත්‍යාග රජයේ බදු නීති වලට යටත්වේ. ත්‍යාග මුදල් ලබා ගැනීමේ දී ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යවේ.



ජාතික ලොතරැයි මණ්ඩලය / தேசிய லொத்தர் சபை / NATIONAL LOTTERIES BOARD
නො. 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන : 0114 607 000, 0112 324 324
ෆැක්ස් : 0114 663 416 වෙබ් : www.nlb.lk

### මෙගා පවර් — නිල ප්‍රතිඵල

දිනුම් වාරය **704**

දිනය: 2020.12.15

ඉංග්‍රීසි අකුර **S** | සුපිරි අංකය **03** | ජයග්‍රාහී අංක **01 16 31 58**

| | ත්‍යාග රටාව | ත්‍යාග මුදල රු. | ජයග්‍රාහකයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 වන ත්‍යාගය | අංක 4 ක් පමණක් ගැළපේ නම් | 1,000,000.00 | - |
| 2 වන ත්‍යාගය | අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 100,000.00 | 06 |
| 3 වන ත්‍යාගය | අංක 3 ක් පමණක් ගැළපේ නම් | 1,000.00 | 85 |
| 4 වන ත්‍යාගය | අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 500.00 | 186 |
| 5 වන ත්‍යාගය | අංක 2 ක් පමණක් ගැළපේ නම් | 100.00 | 4,829 |
| 6 වන ත්‍යාගය | අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැළපේ නම් | 40.00 | 3,169 |
| 7 වන ත්‍යාගය | අංක 1 ක් පමණක් ගැළපේ නම් | 20.00 | 78,903 |
| 8 වන ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැළපේ නම් | 20.00 | 14,444 |

මීළඟ මෙගා සුපිරි ත්‍යාගය **රු. 59,823,316.80**

මීළඟ පවර් සුපිරි ත්‍යාගය **රු. 14,623,305.20**

මීළඟ ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය **රු. 26,554,878.00**

දිනා ඇති මුළු මුදල **රු. 3,254,600.00**

- රු. ලක්ෂ 5 වැඩි ත්‍යාග රජයේ බදු නීති රීති වලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබා ගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6 ක කාල සීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය
නො. 32,එන්.ඩබ්.ජේ මුදලිගේ මාවත, කොළඹ 01
දුරකථන: 011-2 470 662, 011-4 607 000, 0112-458 585
ෆැක්ස්: 0112 433 631,
වෙබ් අඩවිය: www.nlb.lk

### ධන නිධානය — නිල ප්‍රතිඵල

දිනය - 2020/12/15

දිනුම් වාරය - 374

ඉංග්‍රීසි අක්ෂරය **D** | ජයග්‍රාහී අංක **03 30 46 74**

| | සංයෝග | තෑගි | ජයග්‍රාහකයන් ගණන |
|---|---|---|---|
| 1 ත්‍යාගය | අංක 04 ගැලපේ නම් | රු. 1,000,000.00 | - |
| 2 ත්‍යාගය | අංක 3 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 100,000.00 | 05 |
| 3 ත්‍යාගය | අංක 3 ක් ගැලපේ නම් | රු. 3,000.00 | 96 |
| 4 ත්‍යාගය | අංක 2 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 1,000.00 | 206 |
| 5 ත්‍යාගය | අංක 2 ක් ගැලපේ නම් | රු. 100.00 | 5,041 |
| 6 ත්‍යාගය | අංක 1 ක් සමඟ ඉංග්‍රීසි අකුර ගැලපේ නම් | රු. 60.00 | 3,414 |
| 7 ත්‍යාගය | අංක 1 ක් ගැලපේ නම් | රු. 20.00 | 84,472 |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අකුර පමණක් ගැලපේ නම් | රු. 20.00 | 15,740 |

දිනා ඇති මුළු ත්‍යාග මුදල රු 3,707,180.00
බිහිවූ මුළු ජයග්‍රාහකයන් ගණන 108,974

මීළඟ වාරයේ සුපිරි ත්‍යාගය
**රු. 124,773,863.12**

- රු. ලක්ෂ 5 ට වැඩි ත්‍යාග රජයේ බදු නීතිරීතිවලට යටත් වේ.
- ත්‍යාග මුදල් ලබාගැනීමේදී ජාතික හැඳුනුම්පත අනිවාර්ය වේ.
- ජයග්‍රාහී ලොතරැයිපත් වලංගු වන්නේ දිනුම් අදින ලද දින සිට මාස 6ක කාලසීමාවකට පමණි.

ජාතික ලොතරැයි මණ්ඩලය / தேசிய லொத்தர் சபை / NATIONAL LOTTERIES BOARD
අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්ලිව්.ජේ.මුදලිගේ මාවත, කොළඹ 01.
දුරකථන 011 460 7000 011 232 4324

# ඉන්ෂාෆ් අහමඩ් මගේ සමීප මිතුරකු යැයි එල්ල වන චෝදනා ප්‍රතික්ෂේප කරනවා

## රියාජ් බදියුදීන්

**සුභාෂිණී සේනානායක**

2019 අප්‍රේල් මස 21 වැනිදා කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ දී මරාගෙන මැරෙන බෝම්බය පුපුරුවා ගත් ඉන්ෂාෆ් අහමඩ් නමැත්තා තමන්ගේ සමීප මිතුරකු යැයි එල්ල වන චෝදනා තරයේ ප්‍රතික්ෂේප කරන බවත්, ඉන්ෂාෆ් අහමඩ් එලෙස බෝම්බයක් පුපුරුවා ගත් බව තමන් දැනුම්වත් වූයේ ප්‍රහාරය එල්ල වූ දිනයේ රූපවාහිනියෙන් බවත් හිටපු ඇමැති රිෂාඩ් බදියුදීන් මහතාගේ සොහොයුරා වූ රියාජ් බදියුදීන් මහතා පාස්කු දා ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කරන ජනාධිපති පරීක්ෂණ කොමිසම හමුවේ පෙරේදා (14) සාක්ෂි දෙමින් කියා සිටියේය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත් විධිවිධාන ප්‍රකාරව රියාජ් බදියුදීන් සාක්ෂි දීමට ජනාධිපති කොමිසම හමුවට කැඳවා තිබුණි.

රියාජ් බදියුදීන් සාක්ෂි දීම අරඹමින් තමන් හිටපු ඇමැති රිෂාඩ් බදියුදීන් මහතාගේ මාධ්‍ය ලේකම් සහ සම්බන්ධීකරණ ලේකම් ලෙස කටයුතු කළ බව සඳහන් කළේය.

**රජයේ අධිනීතිඥවරයා:**
ඔබට කොමිසමට පැමිණෙන ලෙසට සිතාසියක් ලැබුණා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
එහෙමයි, ස්වාමීනි.
**රජයේ අධිනීතිඥවරයා:**
ඔබ ව්‍යාපාරිකයෙක් ද? ඔබට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කලා විශේෂ උපාධියක් තිබෙනවා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
එහෙමයි, ස්වාමීනි.
**රජයේ අධිනීතිඥවරයා:**
රිෂාඩ් බදියුදීන් කියන්නේ ඔබේ සහෝදරයා ද? ඔබ ඔහු ළඟ සේවය කළා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
එහෙමයි, ස්වාමීනි. ඔහුගේ මාධ්‍ය හා සම්බන්ධීකරණ ලේකම් ලෙස කටයුතු කළා.
**රජයේ අධිනීතිඥවරයා:**
2004 සිට මෙගා කන්ස්ට්‍රක්ෂන් ආයතනය ඔබ පවත්වාගෙන ගියා ද? එහි වර්තමාන නම මොකක් ද?
**රියාජ් බදියුදීන් මහතා:**
එහෙමයි, ස්වාමීනි. මෙගා ලංකා ග්‍රීන් කන්ස්ට්‍රක්ෂන්
**රජයේ අධිනීතිඥවරයා:**
OHRD කියලා රාජ්‍ය නොවන සංවිධානයක් තිබෙනවා ද? එය ආරම්භ කළේ කවුද?
**රියාජ් බදියුදීන් මහතා:**
ඔව්, ස්වාමීනි. මමයි ආරම්භ කළේ. මා ඇතුළු හතර පස් දෙනෙක් විසින් ආරම්භ කළා.
**රජයේ අධිනීතිඥවරයා:**
ඔබ ද දැනට එහි සභාපති? නැත්නම් කවුද?
**රියාජ් බදියුදීන් මහතා:**
මා ආරම්භක සභාපති. මගේ මාමා වන ෂියාබ්ඩීන් එහි සභාපතිවරයා.
**රජයේ අධිනීතිඥවරයා:**
ඔහු ඔබට මාමා වෙන්නේ කොහොමද?
**රියාජ් බදියුදීන් මහතා:**
මගේ සහෝදරයා වන රිෂාඩ් බදියුදීන් විවාහ වී සිටින්නේ ෂියාබ්ඩීන්ගේ දුව සමඟ.
**රජයේ අධිනීතිඥවරයා:**
OHRD සංවිධානයට මුදල් ලැබෙන්නේ කොහෙන්ද?
**රියාජ් බදියුදීන් මහතා:**
මා ඉන්න කාලේ US AID එකෙන් ලැබුණා. කටාර් අගමැතිවරයාගෙන් එහි තානාපති කාර්යාලය හරහා මුදල් ලැබුණා.
**රජයේ අධිනීතිඥවරයා:**
තුර්කියෙන් මුදල් ලැබුණා ද? එම මුදල් ලැබෙන්නේ කොහොම ද?
**රියාජ් බදියුදීන් මහතා:**
මට මතක නෑ. ඒ කාලේ එම ආයතනයේ මා සිටියේ නෑ. රාජ්‍ය බැංකු හරහා මුදල් ලැබෙනවා. මේ මුදල් ලැබෙන විට එම මුදල් ලැබෙන ආකාරය සම්බන්ධයෙන් පෝරමයක් තිබෙනවා පුරවන්න. එය පිරවූවාට පසුව තමයි මුදල් ලැබෙන්නේ.

**රජයේ අධිනීතිඥවරයා:**
2019 අප්‍රේල් මස 21 වැනිදා පාස්කු දා ප්‍රහාරය දන්නවා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
මාධ්‍යයෙන් දුටුවා.
**රජයේ අධිනීතිඥවරයා:**
2019 අප්‍රේල් මස 21 වැනිදා එල්ල වූ මරාගෙන මැරෙන ප්‍රහාර මාලාවේ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයට ප්‍රහාරය එල්ල කළේ ඉන්ෂාෆ් අහමඩ් නමැත්තා නොවේ ද?
**රියාජ් බදියුදීන් මහතා:**
ඔව්, මම රූපවාහිනියෙන් එය දැක්කා.
**රජයේ අධිනීතිඥවරයා:**
ඉන්ෂාෆ් අහමඩ් විවාහ වී සිටින්නේ කා සමඟ ද?
**රියාජ් බදියුදීන් මහතා:**
මගේ දුරින් ඥාතියෙක් වන අලව්දීන් බොස්ගේ දුව සමඟයි ඔහු විවාහ වෙලා සිටියේ. මා ඒ විවාහ උත්සවයට සහභාගි වුණා. එහිදී තමයි මම ඉන්ෂාෆ්ව දැන ගත්තේ.

**පාස්කු දා ප්‍රහාරය ගැන සොයන ජනපති කොමිසම**

**රජයේ අධිනීතිඥවරයා:**
විවාහයෙන් පසුව ඔහු ඔබ සමඟ දුරකතන සංවාද පැවැත්වුවා ද? ඔහුව ඔබ මිතුරෙක් ලෙස ඇසුරු කළා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
දුරකතන සංවාද පැවැත්වුවා. නමුත් මිතුරෙක් ලෙස ඇසුරු කළේ නෑ.
**රජයේ අධිනීතිඥවරයා:**
ඉන්ෂාෆ් අහමඩ් තඹ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන ගිය බව 2019 අප්‍රේල් මස 21 වැනිදා විට ඔබ දැන සිටියේ ද?
**රියාජ් බදියුදීන් මහතා:**
මම ඒක දැන ගත්තේ 2019 පෙබරවාරි මාසයේ. අපනයන සම්බන්ධ ගැටලුවක් නිසා මගේ සහෝදරයා වන රිෂාඩ් බදියුදීන්ව හම්බවෙන්න ඕනෑ කිවුවා. පසුව දවසක මා අමාත්‍යාංශයට ගිහින් සිටිය දී ඉන්ෂාෆ් ආයෙත් කතා කළා. මා අමාත්‍යාංශයේ ඉන්නවා කිවුවාම එතැනට මාව හමු වෙන්න ආවා. ඇවිත් ඇයි ඔයාගේ සහෝදරයා මට හමු වෙන්න වෙලාවක් නොදෙන්නේ, මම ඔහුට විරුද්ධව නඩු දානවා කියලා කිවුවා.
**ජනාධිපති කොමිසමේ සභාපති විනිසුරුවරයා:**
ඉන්ෂාෆ් අහමඩ්ට ඔබේ දුරකථන අංකය ලැබුණේ කෙසේ ද?
**රියාජ් බදියුදීන් මහතා:**
ඒක මම දන්නේ නෑ.
**ජනාධිපති කොමිසමේ සභාපති විනිසුරුවරයා:**
ඔබ සහ ඉන්ෂාෆ් අහමඩ් අතර දුරකතන ඇමතුම් කීයක් සඳහන් වෙනවා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කියූ විදිහට 07ක් තිබෙනවා. නමුත් ඒ එකක්වත් මා ගත් ඒවා නොවේ. 2019 වර්ෂයේ මා ඔහුට ඇමතුම් ගෙන නෑ. ඊට කලින් ගන්න ඇති.

**ජනාධිපති කොමිසමේ සභාපති විනිසුරුවරයා:**
ඔබ සහ ඉන්ෂාෆ් අහමඩ් කිසියම් අවස්ථාවක කොළඹ ප්‍රසිද්ධ හෝටලයක හමු වෙලා තිබෙනවා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
නෑ. මා ඔහුව පිට ස්ථානවලදී හමු වෙලා නෑ.
**රජයේ අධිනීතිඥවරයා:**
ඇයි ඔබේ සහෝදරයා ඉන්ෂාෆ්ව හමු වෙන්න අකමැත්තක් දැක්වූවේ?
**රියාජ් බදියුදීන් මහතා:**
මා දන්නේ නෑ.
**රජයේ අධිනීතිඥවරයා:**
ඔබ ඉන්ෂාෆ්ව මඟුල් ගෙදරින් දුටුවාට පසුව හමුවී තිබෙනවා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
අවස්ථා දෙකක දී හමුවී තිබෙනවා.
**රජයේ අධිනීතිඥවරයා:**
මෙගා කන්ස්ට්‍රක්ෂන් සමාගමේ හිමිකරුවා ඔබ. ඔබ එක් වාහනය ද භාවිත කළේ?
**රියාජ් බදියුදීන් මහතා:**
සමාගම පාඩු ලබමින් තිබුණේ. ලොකුවට වාහන භාවිත කළේ නෑ.
**රජයේ අධිනීතිඥවරයා:**
ඔබ අමාත්‍යාංශයේ වාහන භාවිත කළා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
නෑ.

**මගේ දුරකතන අංකය ඉන්ෂාෆ් අහමඩ්ට ලැබුණු විදිය මා දන්නේ නෑ**



**ඉන්ෂාඩ් අහමඩ් සමඟ දුරකතන සංවාද පැවැත්වූවත් මිතුරකු ලෙස ඇසුරු කළේ නෑ**

ඉන්ෂාෆ්ගේ විවාහ උත්සවයට මාත් සහභාගි වුණා

ඉන්ෂාෆ් විවාහ වී සිටියේ මගේ දුරින් ඥාතියකුගේ දුවක් සමඟයි

**US AID එකෙන් සහ කටාර්වලින් මුදල් ලැබුණා**

**රජයේ අධිනීතිඥවරයා:**
ඔබ 2019 පෙබරවාරි මස අවසානයේ අරාබි ජාතිකයන් පිරිසක් සමඟ මැදවච්චිය ප්‍රදේශයට ගියා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
නෑ.
**කොමිසම:**
දුරකතන ඇමතුම් කීයක් ඉන්ෂාෆ් ඔබට ගෙන තිබෙනවා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
මා අත්අඩංගුවට ගන්න අවස්ථාව වන විට ඇමතුම් 7ක් දී තිබෙනවා.
**කොමිසම:**
ඔබ ඇමැතුම් ගෙන තිබුණා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
2019 දී ගෙන නෑ. ඊට පෙර ගෙන ඇති.
**රජයේ අධිනීතිඥවරයා:**
ඔබ කොළඹ ප්‍රසිද්ධ හෝටලයක දී ඉන්ෂාෆ්ව හමුවී තිබෙනවා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
කිසිදු ස්ථානයක හමුවී නෑ.

**රජයේ අධිනීතිඥවරයා:**
OHRD ආයතනයේ වැඩවලට ඔබේ සහෝදරයා රිෂාඩ් බදියුදීන් උදව් කර තිබෙනවා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
නෑ. ප්‍රාදේශීය ලේකම් දිසාපති තමයි උදව් කළේ.
**රජයේ අධිනීතිඥවරයා:**
රිෆ්කාන් බදියුදීන් ඔබේ සහෝදරයෙක් ද? ඔහු මොනවා ද කරන්නේ?
**රියාජ් බදියුදීන් මහතා:**
ඔහු නිකම් ඉන්නවා. මීට පෙර පළාත් සභා මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කළා.
**රජයේ අධිනීතිඥවරයා:**
ඔබ, රිෂාඩ් බදියුදීන්, රිෆ්කාන් බදියුදීන් සියලු දෙනා එල්.ටී.ටී.ඊ. කාලයේ මන්නාරමේ සිටි අය නේද?
**රියාජ් බදියුදීන් මහතා:**
90ට පෙර මන්නාරමේ සිටියා. අපව පිටත් කළා.
**කොමිසම:**
පුත්තලම කඳවුරුවල ද සිටියේ?
**රියාජ් බදියුදීන් මහතා:**
ආරක්ෂාවට කඳවුරේ සිටියා.
**කොමිසම:**
කොහොමද ඉක්මනින් දියුණු වී මේ තත්ත්වයට පත් වුණේ?
**රියාජ් බදියුදීන් මහතා:**
එකම අවස්ථාවේ දියුණු වුණේ නෑ ස්වාමීනි. වසර 20කින් 21කින් පසුව තමයි මේ තත්ත්වයට ආවේ. 2001දී තමයි ව්‍යාපාර ආරම්භ කළේ.

මේ අවස්ථාවේ කාදිනල් හිමිපාණන් වෙනුවෙන් පෙනී සිටින ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා ප්‍රශ්න විමසීම ආරම්භ කළේය.

**ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා:**
ඔබ කිවුවා, සමාගමේ වැඩ ටික ටික කරගෙන ගියා කියලා. ඔබේ සමාගම ලිවර්පුල් ලෙස ගොඩනැඟිලි ඉදිකිරීම් කළා නේද?
**රියාජ් බදියුදීන් මහතා:**
එහෙමයි, ස්වාමීනි.
**ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා:**
ඉන්ෂාෆ් ඔබේ ළඟම මිතුරෙක් නේද?
**රියාජ් බදියුදීන් මහතා:**
එතරම් ළඟින් ඇසුරු කළේ නෑ.
**ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා:**
ඔබේ සහෝදරයා රිෂාඩ් බදියුදීන් මහතා ඉන්ෂාෆ්ගේ විවාහයේ සාක්ෂිකරුවෙක් ලෙස අස්සන් කළා කියා ඔබ දන්නවා නේද?

**රියාජ් බදියුදීන් මහතා:**
මා දන්නේ නෑ.
**ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා:**
ඉන්ෂාෆ් සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ බෝම්බකරු බව ඔබ දන්නවා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
රූපවාහිනියෙන් දුටුවා.
**ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා:**
දුරකථන ටවර් සම්බන්ධයෙන් විමර්ශන කර තිබුණා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව දුරකතන පරීක්ෂා කළා. ඒ කුලුනු තමයි පෙන්නුම් කළේ. මා අත්අඩංගුවට ගන්න අවස්ථාවේ කොහෙද සිටියේ කියා ඇහුවා. මා කිවුවා අමාත්‍යාංශයේ කියලා. අපේ අමාත්‍යාංශය තිබෙන්නේ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ තාප්පයට යාබදව.
**ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා:**
ඉන්ෂාෆ් අහමඩ් ඔබේ සහෝදරයාගේ අමාත්‍යාංශයට ඇවිත් නීතියේ මඟින් කටයුතු කරනවා කියලා කිවුවා. ඒ සම්බන්ධයෙන් පියවර ගෙන තිබුණා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
එන්තරවාසියක් යවා තිබුණා.
**ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා:**
ඔබ ඉන්ෂාෆ්ගේ මාමා ඊබ්‍රහිම්ගේ නිවෙසට ගොස් තිබෙනවා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
මා ගිහින් නෑ. දන්නෙත් නෑ.
**ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා:**
බෝම්බකරුගේ තඹ කර්මාන්ත ශාලාවට ගිහින් තිබෙනවා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
නෑ. කිසිම සම්බන්ධතාවක් නෑ.
**ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා:**
ඔබට සමාගම් කිහිපයක් තිබෙන බව කිවුවා. ඉන්ෂාෆ් ඒවාට සම්බන්ධවී තිබෙනවා ද?
**රියාජ් බදියුදීන් මහතා:**
නෑ.
**ජනාධිපති නීතිඥ ශමිල් පෙරේරා මහතා:**
ඔබ සාක්ෂි දෙමින් කියා සිටියා ඔබේ රැඳවුම් නියෝගය අවලංගු කළා කියලා. එය කවුරු කළා කියල ද දැන ගත්තේ?
**රියාජ් බදියුදීන් මහතා:**
වාර්තාවක් ඉදිරිපත් කර තිබුණේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන කළ නිලධාරියා. එය ස්ථානාධිපති අත්සන් කර සහකාර පොලිස් අධිකාරීවරයෙක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා සහ නියෝජ්‍ය පොලිස්පතිවරයා හරහා ආරක්ෂක ලේකම්වරයා වෙත ගොස් අත්සන් කිරීමට ජනාධිපතිවරයාට යොමු කර තිබුණා. ස්වාමීනි, මා නිදහස් කළේ අත්අඩංගුවට ගත් අනෙක් තුන් දෙනා අධිකරණයට ඉදිරිපත් කරන අයුරින් තමයි.

# කරගම්පිටිය පොදු වෙළෙඳපොළේ ව්‍යාපාර කටයුතු යළි ඇරඹේ



කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ වසා දමා තිබු කරගම්පිටිය පොදු වෙළෙඳපොළේ ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීම පසුගියදා (13) සිදු විය.

මෙහිදී වෙළෙඳුන්ට සහ පාරිභෝගිකයන්ට අවශ්‍ය මුව ආවරණ, අත්වැසුම් සහ විෂබීජනාශක දියර බෙදාදීම Colombo Knights ලියෝ සමාජයේ සභාපති ලියෝ ඉඳුනිල් උදාර පලිහවඩන මහතා ඇතුළු ලියෝ සමාජ සාමාජිකයන් විසින් සිදු කරන ලදි.

දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නගරාධිපතිවරයා ඇතුළු නාගරික මන්ත්‍රීවරුන්, දෙහිවල පොලිස් ස්ථානාධිපතිවරයා ඇතුළු නිලධාරීන්, ජාත්‍යන්තර සිංහ සමාජ 306C 2 සිංහාධිපති ආචාර්ය රසික එස්. ප්‍රියන්ත, 306C 2 ලියෝ දිස්ත්‍රික් උපදේශක ආචාර්ය ලසන්ත ගුණවර්ධන, පෙර සිංහාධිපති සිංහ නිමල් බුලත්සිංහල, නුගේගොඩ ශාන්ත ජෝන් විද්‍යාලයීය ලියෝ සමාජයේ සභාපති ලියෝ අම්රු විතානගේ ඇතුළු සාමාජකයෝ මේ අවස්ථාවට සහභාගී වූහ.

කොවිඩ් අභියෝගය හමුවේ සිය ජීවිත සටන ගෙන යෑමට කටයුතු කරන ජනතාවට සෞඛ්‍ය ආරක්ෂිතව සිය ජීවිත සටන ගෙන යෑමට ලියෝ සාමාජිකයන් වශයෙන් හැකි උපරිම දායකත්වය සහ සහයෝගය දෙන බව මෙහිදී අදහස් දක්වමින් Colombo Knights ලියෝ සමාජයේ සභාපති ලියෝ ඉඳුනිල් උදාර පලිහවඩන ප්‍රකාශ කළේය.

# උගතුන්ගේ විරැකියාව තරම් භයානක අර්බුදයක් තවත් නෑ

## ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස්

**ජයසිරි ජේදුරුආරච්චි - ගන්දර සමූහ**

සමාජයේ උගත් විරැකියාව තරම් භයානක අර්බුදයක් තවත් නැති බවත්, අධ්‍යාපනයේ ඇති උග්‍රම ප්‍රශ්නය අධ්‍යාපනය සහ රැකියාව අතර පරතරය බවත්, මේ පිළිබඳ ගැඹුරින් සිතා බැලිය යුතු බවත් අධ්‍යාපන ඇමැති ජී. එල්. පීරිස් මහතා පැවැසීය.


ඇමැතිවරයා මේ බව පැවැසුවේ පෙරේදා (15) බ්‍රැන්ඩික්ස් ආයතනයේ තාක්ෂණික සහාය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ මෙහෙයවීම මත මාතර දිස්ත්‍රික්කයේ තෝරා ගත් පාසල් සඳහා සුහුරු පුවරු දීමේ වැඩසටහනට එක් වෙමිනි. මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ගාමිණී ජයසේකර ශ්‍රවණාගාරයේදී මේ වැඩසටහන පැවැත්විය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'මෙරට දරුවකු උපාධියක් ගත්තාම හොඳ රැකියාවක් ගැන අපේක්ෂාවෙන් සිටිනවා. ඒත් එය මූලික වශයෙන් ඉටු වෙන්නේ නෑ. එවිට උද්ඝෝෂණවලට යනවා. ඒක විශාල ප්‍රශ්නයක්. මෙයට හොඳම විසඳුම කුමක්ද? ළමයාට රැකියාවක් ගත හැකි ප්‍රායෝගික අධ්‍යාපනයක් දිය යුතුයි. එක් එක් ළමයා තුළ තිබෙන නිපුනතා වෙනස්. ඒ තත්ත්වය හඳුනාගෙන එයට ගැළපෙන අධ්‍යාපනයක් දීමෙන් රැකියාවක් ගැනීමට හැකියාව ලැබෙනවා.

පසුගිය කාලයේ මා මෙරට සමාගම් රැසක් සමඟ කතා කළා. ඔවුන් කීවේ තම ආයතනවල රැකියා අවස්ථා නැතිව නොවෙයි, ඒ සඳහා එන උපාධිධාරීන් තුළ තම ආයතනයේ රැකියාවට ගැලපෙන නිපුනතා නැති බවයි. එදා තරුණ ප්‍රශ්න ගැන සොයන කොමිසමේ වාර්තාව හදන්න මා සම්බන්ධ වෙලා සමාජයේ විවිධ කොටස් සමඟ කතා කළාම තේරුණේ ඉංග්‍රීසි භාෂාවේ අඩුව තදින්ම තිබෙන බවයි. එදා ඔවුන් ඉංග්‍රීසි භාෂාව හැඳින්වූයේ කඩුව ලෙසයි.

ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලවල දරුවන්ගේ සහ අපේ දරුවන්ගේ හැකියාවන් අතර කිසිදු වෙනසක් නෑ. බුද්ධිය එකමයි. ඇත්තේ ඉංග්‍රීසි භාෂාවේ අඩුව පමණයි. අදත් මෙරට ඉහළම උසාවියේ නඩු අහන්නේ, නඩු වාර්තා සකස් කරන්නේ ඉංග්‍රීසි භාෂාවෙන්. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුමක්, උගත්කමක් අඩු ගමේ දරුවන්ට ලැබෙන අවස්ථා හරිම අඩුයි. අප මේ තත්ත්වය වෙනස් කළ යුතුයි. මේ සුහුරු පන්ති කාමර සහ සුහුරු පුවරු දීමෙන් අප බලාපොරොත්තු වන්නේ ඒ පරතරය නැති කර ඉංග්‍රීසි අධ්‍යාපනය හරවත්ව දරුවාට ආසාවෙන් ඉගෙන ගන්න පුළුවන් ආකාරයට සකස් කිරීමයි.



භාෂාවේ ගැටලුවත් සමඟ ඇති වන ගැටලු ප්‍රමාණයත් වැඩියි. රජයට හැම දෙයක්ම කරන්න අමාරුයි. ඒ නිසයි බ්‍රින්ඩික්ස් ආයතනය අපේ උදව්වට පැමිණ සිටින්නේ. අප ඉදිරියේදී නගර විශ්වවිද්‍යාල දහයක් ඇති කරන්න සැලසුම් කර තිබෙනවා. විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරගැනීමේ ප්‍රමාණය වැඩි කර තිබෙනවා. මේ සියල්ල සිදු කර රැකියා වෙළෙඳපොළට ගැලපෙන පිරිසක් විශ්වවිද්‍යාලයෙන් බිහි කර ගන්නා විට ප්‍රශ්න රැසකට විසඳුම් ලැබෙනවා.'

**පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහ මහතා**

'අද මෙරට දරුවන්ට ඉංග්‍රීසි භාෂාවේ දැනුම පිළිබඳ ගැටලුවක් ඇතිවී තිබෙන්නේ ඉගැන්වීම් ක්‍රමවේදයේ ඇති වෙනස තුළයි. වසර දහ තුනක් පාසලේ ඉගෙන ගන්නා දරුවා එයින් එළියට එන විට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුමක් නැතිනම් එහි ගැටලුවක් ඇති බව පැහැදිලියි. මෙරට විෂය මාලාව සංශෝධනය වෙනවා සේම ඉංග්‍රීසි ඉගැන්වීමේ ක්‍රමවේදයේ ද පැහැදිලි වෙනසක් ඇති කළ යුතුයි.

ලෝකයේ අනෙකුත් රටවල ඉංග්‍රීසි ඉගැන්වීමේ ක්‍රමවේද වෙනස්. ඒත් අපේ රටේ එහෙම නෑ. අපේ රටේ හැමදාම අර්බුද ඇති වුණේ භාෂා ගැටලුව තුළයි. ඉංග්‍රීසි භාෂාව හැමදාම ප්‍රශ්නයක් වුණා. දැන්වත් මේ සඳහා පැහැදිලි විසඳුමක් දිය යුතුයි. අපේ පරම්පරාවේ සියයට හැත්තෑ පහකට ඉංග්‍රීසි ලියන්න කියවන්න හැකියාවක් නෑ. ඒක තමයි ඇත්ත. ඒ නිසයි මා කීවේ ඉගැන්වීමේ ක්‍රමවේදයේ වෙනසක් ඇති විය යුතුයි කියලා.

මගේ දේශපාලන ගමනේ අවුරුදු විසි තුනක් පුරා මහජන නියෝජිතයකු ලෙස වැඩිම ප්‍රතිපාදන වෙන් කර දුන්නේ අධ්‍යාපනයට. එදා මා ගමේ පාසලේ ඉගෙන ගෙන මාතර නගරයේ පාසලකට එන විට ගම සහ නගරයේ අධ්‍යාපනයේ වෙනස හොඳින්ම හඳුනා ගත්තා. ඒ නිසා මේ උත්සාහය ඉහළින්ම අගය කරනවා. මාතර හැමදාමත් අධ්‍යාපනයෙන් ඉහළම තැන ඉන්නවා. හැම විභාගයකින්ම දකුණ ඉදිරියෙන් ඉන්නා විට මාතර එකට සිටියා. ඒත් අපේ දිස්ත්‍රික්කයේ විරැකියාව සියයට හතක්. මේවා ගැන අප වඩාත් ගැඹුරින් සිතිය යුතුයි.'

# මාදිවෙල - බටහිර නාගරික කෘෂිකර්මාන්ත - පාරිසරික ව්‍යාපෘතිය අගමැති අතින් ජනතා අයිතියට

මාදිවෙල - බටහිර නාගරික කෘෂිකර්මාන්ත හා පාරිසරික සංවර්ධන ව්‍යාපෘතිය අගමැති මහින්ද රාජපක්ෂ මහතා අතින් පසුගිය (15) දා ජනතා අයිතියට පත් විය.

කි.මී. 1.5 ක ඇවිදීමේ මංතීරුවක්, කි.මී. 1.5 ක දිගින් යුත් පාපැදි මංතීරු දෙකක්, ළමා උද්‍යානයක්, අංග 8 කින් සමන්විත එළිමහන් ව්‍යායාම් ප්‍රදේශයක්, එකවර රථ 40 ක් ගාල් කළ හැකි රථගාලක්, ප්‍රධාන මාර්ගයට සමාන්තරව රථවාහන ගාල් කිරීමේ ප්‍රදේශයක් සහ යල මහ කන්න දෙකම වගාකිරීමට ජලය සපයා දිය හැකි වැව් දෙකක් මෙම ව්‍යාපෘතියට අයත්ව තිබිණි.

"සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව අක්කර 23ක ප්‍රදේශයක් පුරා පැතිර පවතින මෙම සංවර්ධන ව්‍යාපෘතියේ වැඩ ආරම්භවූයේ පසුගිය අප්‍රේල් මස 21 වැනි දා ය.

කොවිඩ් -19 පළමු රැල්ල පැතිරයන අවස්ථාවේ විවිධ බාධක මැද ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය මාස අටක පමණ ඉතා කෙටි කාලයක් තුළ ජනතා අයිතියට පත් කිරීම උදෙසා නාගරික සංවර්ධ හා නිවාස ඇමැතිවරයා ලෙස අගමැති මහින්ද රාජපක්ෂ මහතා අවැසි උපදෙස් ලබා දුන්නේය.

කොවිඩ් - 19 අභියෝගයට සාර්ථකව මුහුණ දෙමින් රටේ සංවර්ධන ව්‍යාපෘතින් ද ක්‍රියාත්මක කළ යුතු යැයි අගමැති මහින්ද රාජපක්ෂ මහතා අමාත්‍යාංශ නිලධාරින්ට දුන් උපදෙස් මත මෙම ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කැර තිබේ.



ඒ අනුව මෙම පාරිසරික ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති ඉතිහාසයේ ලබාගත් විශිෂ්ට ජයග්‍රහණයකි. ව්‍යාපෘතියට අදාළ ඉදිකිරීම් කටයුතු ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන ලදී. ඊට වැය කළ මුළු පිරිවැය රුපියල් මිලියන 390 ක් වේ.

මෙයට පෙර ජනතා අයිතියට පත් කළ මෙම ව්‍යාපෘතියේ මූලික අදියර දැනටමත් සාර්ථක ලෙස ක්‍රියාත්මක වේ. ඒ යටතේ කාබනික පොහොර භාවිතයෙන් දේශීය වී වර්ග පමණක් වගා කරන කුඹුරු ප්‍රදේශයක් හා ප්‍රථම වරට ගොඩ බෝග වගාව කොළඹ ආශ්‍රිත ප්‍රදේශයන් හි ප්‍රචලිත කිරීමේ අරමුණින් හඳුන්වා දුන් ගොඩ බෝග වගා බිම් කොටස් 44 ක් සමන්විතය.

ඇමැති නාමල් රාජපක්ෂ, රාජ්‍ය ඇමැතිවරුන් වන ආචාර්ය නාලක ගොඩහේවා, කංචන විජේසේකර, ලොහාන් රත්වත්තේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ජගත් කුමාර, මදුර විතානගේ, ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්, ප්‍රේමනාත් සී. දොලවත්ත, ඩයනා ගමගේ, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති, වරලත් වාස්තු විද්‍යාඥ හර්ෂාන් ද සිල්වා, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, වරලත් නගර නිර්මාණ ශිල්පි ප්‍රසාද් රණවීර සහ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සභාපති විශ්‍රාමික මේජර් ජනරාල් එම්. ආර්.ඩබ්ලිව්. ද සොයිසා ඇතුළු මහත්ම මහත්මීන් ඇතුළු පිරිසක් මෙම අවස්ථාවට එක්ව සිටියහ.

# අංගම්පිටියේ සංවර්ධන කටයුතු අගමැතිගේ නිරීක්ෂණයට



අංගම්පිටිය, 9 වැනි පටුමග හා නාවල පාසල් මාවත යා කෙරෙමින් ඉදි කෙරෙන ගුවන් පාලමේ ඉදි කිරීම් කටයුතු අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ නිරීක්ෂණයට පෙරේදා (15) ලක් විය.

ජනතාවගේ එදිනෙදා ජන ජීවිතයට බාධා නොවන පරිදි උපරිම තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් පාලමේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කිරීම සඳහා අගමැතිතුමා එහිදී මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

මෙහිදී රැස්ව සිටි ජනතාව සමඟ අගමැතුමා සුහද කතාබහක ද නිරත විය. මෙම අවස්ථාව සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී මධුර විතානගේ මහතා ඇතුළු පිරිසක් එක්ව සිටියහ.



# රටේ සහ ජනතාවගේ හෙට දවස වෙනුවෙන් වැදගත් තීන්දු තීරණ ගන්නා නිලධාරීන් ආරක්ෂා කරන්න ආණ්ඩුව සූදානම්

## ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ කියයි

**මහින්ද අලුත්ගෙදර, අනුරාධපුරයේ සිට**

රටේ සහ ජනතාවගේ හෙට දවස වෙනුවෙන් වැදගත් තීන්දු තීරණ ගන්නා සියලු නිලධාරීන් ඕනෑම අවස්ථාවක ආරක්ෂා කරන්න ආණ්ඩුව සූදානම් බව ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතා ප්‍රකාශ කරයි.

බැසිල් රාජපක්ෂ මහතා මේ බව සඳහන් කෙළේ අනුරාධපුරයේ පිහිටි උතුරු මැද පළාත් සභා ශ්‍රවණාගාරයේ ඊයේ (16) පැවති 2021 අය වැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ "ගම සමඟ පිළිසඳරක්" තුළින් "වැඩ සමඟ යළි ගමට" ජාතික වැඩසටහනේ උතුරු මැද පළාත් කමිටු සාකච්ඡාවට එක් වෙමිනි. ලබන වසරේ දී ශ්‍රී ලංකාව සෑම අංශයකින්ම නගාසිටුවීමේ දැවැන්ත පෙරළිය සඳහා "ගම සමඟ පිළිසඳරක්" යටතේ "වැඩ සමඟ යළි ගමට" වැඩසටහන සමඟ උපරිම කැපවීමෙන් එක්වන්නැයි බැසිල් රාජපක්ෂ මහතා මෙහිදී උතුරු මැද පළාත් දේශපාලන නායකයන්ට සහ රාජ්‍ය නිලධාරීන්ට ආරාධනා කෙළේය.

එහිදී වැඩිදුරටත් අදහස් පළකළ බැසිල් රාජපක්ෂ මහතා මෙසේද පැවසීය.

ජනතාව වෙනුවෙන් තීන්දු තීරණ ගන්න ගොස් තමා සහ රාජ්‍ය නිලධාරීන් කිහිප දෙනකු සිරබත් කෑවා. මහජන සේවය කිරීමේ දී බිය නොමැතිව තීන්දු තීරණ ගන්නා හැම දෙනා ආරක්ෂා කරන්න ජනාධිපතිවරයා, අගමැතිවරයා ප්‍රමුඛ වත්මන් ආණ්ඩුව සූදානම්.

රටේ පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සෞඛ්‍ය නිර්දේශ අනුව යමින් මේ සාකච්ඡාව සංවිධානය කර තිබෙනවා. අපි විශේෂයෙන්ම ගම සමඟ පිළිසඳරක් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී මහජන නියෝජිතයන්, රාජ්‍ය නිලධාරීන් සහ ප්‍රජා නායකයන් සෞඛ්‍ය ක්‍රමවේද අනුගමනය කළයුතු වෙනවා. 2015 වසරේ දී මහින්ද රාජපක්ෂ මහතාගේ ආණ්ඩුව වෙනස් වූ පසුව වත්මන් ජනාධිපතිතුමා මේ මවුබිම ඔබේම අදහස්වලින් ගොඩනැඟීම සඳදහා නව දේශපාලන සංස්කෘතියක් ඇති කරන්න ප්‍රවීණයන් සමඟ වියත් මග ගොඩනගා එක් එක් විෂයන් සම්බන්ධයෙන් කරුණු සොයා බැලුවා. වසර දෙක තුනක් ඒ කටයුතු කළ පසුව මෙය ගමේ ජනතාවගේ අදහස් විමසන්න කියා ඉල්ලා සිටියා. මේ රටේ ගම් 36000 තුළම ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ ගමේ ජනතාවගේ අදහස්, දියුණු කරන ක්‍රමවේද හඳුනා ගත්තා. එතැනින් අපි එක් එක් විශේෂඥ කමිටු නිර්මාණය කර යම් සැලසුමක් නිර්මාණය කළා. එතැන් සිට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සෞභාග්‍යයේ දැක්ම නිර්මාණය කළා. එය තනි පුද්ගලයකුගේ නිර්මාණයක් නොවෙයි.

හැකි අවස්ථාවකම ඔහු ගමකට ගොස් අවශ්‍යතා හඳුනාගෙන කරුණු විමසුවා. බදුල්ල, පුත්තලම, මාතලේ දිස්ත්‍රික්කවල ඒ මහතා සංචාරය කළා. ආයතන ප්‍රධානීන්, ගමේ ජනතාව සමඟ සාකච්ඡා කළා. එතැනි සිට හැම කටයුත්තක් ගැනම අවබෝධයක් ලැබුවා. බලයට පත්වූ පසුව හැම අමාත්‍යාංශයක් ගැනම සාකච්ඡා කර ඇමැතිවරු, නිලධාරීන්, විෂයන් ගැන දැනුම් ඇති අය සමඟ සාකච්ඡා කර පූර්ව අයවැයක් ලෙස 2021 අය වැය ඉදිරිපත් කළා. ජනතාව මුල්කර ගත් අයවැයක් ක්‍රියාත්මක කිරීමේ දී ජනතාව සහභාගි කරවා ගෙන කළයුතුයි. එදා ගම සමඟ පිළිසඳර ක්‍රියාත්මක කිරීමේ දී නිලධාරීන්ට සහභාගි වෙන්න පුළුවන් වුණේ නැහැ. ඒ නිසා අපි මේ අයවැය ක්‍රියාත්මක කිරීමේ දී නිලධාරීන්ගේ ද අදහස් ගන්න කටයුතු කළා. මේ අයවැය ඉදිරිපත් කරන විට මුළු ලෝකයම දරුණු වසංගතයකට මුහුණ දී සිටිනවා. අපේ රටත් ඉතාම අවධානම් තැනක තිබෙනවා. ඇතැමුන් ඉන්නේ අපේ රට බංකොලොත් වෙයි කියලා බලා ගෙන.

අපේ රට කඩා වැටෙනතුරු ඔවුන් බලා ඉන්නවා. ලොව ශ්‍රේණිගත කරන ආයතන සියල්ල අපේ රට පහලට දානවා. විදේශ මුදල් එන ප්‍රධාන මාර්ග අඩු වී තිබෙනවා. මේ වසරේ මාර්තු 15 දා සිට සංචාරකයන් එන්නේ නැහැ. ඉන්න සංචාරකයන් ද අසරණ තත්ත්වයට පත්ව තිබෙනවා. අපිට මුදල් පැමිනෙන්නේ විදෙස් ශ්‍රමිකයන්ගෙන්. එයත් මාස කිහිපයක් පහළ වැටුණා. නමුත් දැන් ක්‍රමයෙන් එය වැඩිවී ගෙන යනවා. නොවැම්බර් මාසයේ සියයට 34ක පමණ වැඩිවීමක් දකිනවා. විදේශ ආධාර සහ ණය ලැබෙන්නෙත් නැහැ. ආධාර ලබාදෙන රටවල් බොහොමයක් කොවිඩ් වසංගතයේ ගොදුරක් වී තිබෙනවා. අපේ රට ගන්න පුළුවන් ණය උපරිම සීමාවට අරගෙන තිබෙනවා. ණය ලබා ගැනීම සීමා කරන්න ආණ්ඩුවට සිදු වුණා. සෘජු විදේශ ආයෝජන ද මේ වසංගත තත්ත්වය නිසා වැළකී තිබෙනවා. විදෙස් ආයෝජකයන් එන්නේ නම් දින 14ක් නිරෝධායනයට ලක් වෙනවා. නමුත් පසුගිය මාසයේ දී අපේ රටේ කර්මාන්ත ශාලාවක් ආරම්භ කරන්න හැකියාව ලැබී තිබෙනවා.

අපනයන මගින් ලැබෙන ආදායම පහක වැටුණත් සැප්තැම්බර් වනවිට වැඩිවීමක් තිබෙනවා. අපනයනය වැඩිකිරීම තුළින් තමයි අපේ සියලු අවශ්‍යතා ඉටුකර ගන්න පුළුවන් වෙන්නේ. අපේ රටට ඉන්ධන ආනයනය කිරීම, ඖෂධ ආනයනය කිරීම සිදු කරන්න ඒ තුළින් පුළුවන් වී තිබෙනවා. මේ තත්ත්වය තුළ 2021 අයවැය ඉදිරිපත් කරන්න සිදු වුණා. මේ අය වැයෙන් ඇතැම් අංශවලට විශාල මුදලක් වෙනත් වර්ෂවලට සාපේක්ෂව වෙන්කර තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කිරීම මේ නිලධාරීන්ට වගකීම පැවරෙනවා. මේ කටයුත්ත කිරීමේ දී අනුගමනය කළයුතු වැඩපිළිවෙළක් තිබෙනවා. මේ අයවැයෙන් හැම අංශයකටම මුදලක් වෙන්කර තිබෙනවා. ජනතාවගේ ඉල්ලීම් අනුව ඒවා ක්‍රියාත්මක කරන්න. 21 හා 22 දවස්වල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සියල්ල රැස් කරන්න කියා ඉල්ලනවා. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු මේ සඳහා ඉදිරි සතිය තුළ ඒ අයට දැනුම් දෙනවා. ඒ කමිටු කැඳවා ගම් සමඟ පිළිසඳරක් එක් ග්‍රාමසේවා වසමකට අවම එක් රැස්වීමක් හෝ පවත්වා යෝජනා ලබා ගන්න. මේ



අයවැය යෝජනා සඳහා මුල්තැනක් දෙන්න. පළාත් පාලන ආයතනවලට විශාල වගකීමක් තිබෙනවා.

එක් වසමකට ප්‍රමිතියෙන් යුතු පෙර පාසලක් ඇති කරන්න. පාසල්වල විෂය පථය සම්බන්ධයෙන් ජාතික මට්ටමින් කටයුතු කරනවා. ජලය, සනීපාරක්ෂක කටයුතු ආදිය සම්පූර්ණ කරන්න මුදල් වෙන්කර තිබෙනවා. ඩිජිටල් ශ්‍රී ලංකවක් ඇති කරන්න ජනාධිපතිතුමා වෙහෙසෙනවා. මේ මසා 12ක් තුළ ලංකාවේ සියලු දෙනාටම නිවෙසේ සිට අවශ්‍ය සන්නිවේදන මාර්ග සකස් කර දෙන්න කටයුතු කරනවා. මාර්ග සම්බන්ධයෙන් මහින්ද රාජපක්ෂ මහතාගේ කාලයේ විශාල වෙනසක් වුණා. මෙවරත් කිලෝමීටර් 100,000 ක් සංවර්ධනය කර ගෙන යනවා. වසර තුනක් හතරක් තුළ මේ කටයුතු සිදු කරනවා. සෑමට බීමට ජලය සපයන්න පියවර ගෙන තිබෙනවා. බීමට සුදුසු ජලය ලබා දෙන්නට ප්‍රමුඛත්වය දෙනවා. මෙවර වැඩිම මුදලක් තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයට රුපියල් මිලියන 8400ක් පමණ වෙන්කර තිබෙනවා. ක්‍රීඩා පිටි සංවර්ධනය කරන්නත් ඒ තුළින් පියවර ගෙන තිබෙනවා. සුළු වාරිමාර්ග යටතේ වැව් ප්‍රතිසංස්කරණය කරන්න කටයුතු කරනවා.

මේ සියල්ල කරනවිට පරිසරය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරනවා. වනෝද්‍යාන ඇති කරන්නත් පියවර ගෙන තිබෙනවා. වනජීවීන්ගෙන් ගොවීන්ට වන හානි අවම කරන්නත් විශාල මුදලක් වෙන්කර තිබෙනවා. ජනතාවගේ ජීවනෝපාය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයට ඉල්ලූ රුපියල් මිලියන 10000ක් ලැබී තිබෙනවා. මුළු රටේම ආර්ථිකය රඳා තිබෙන්නේ ජීවනෝපාය හා ආදායම් ඉහළ නැංවීම තුළයි. ජීවනෝපාය වෙනුවෙන් විශාල මුදලක් වෙන් කර තිබෙනවා. ඒ වෙනුවෙන් ප්‍රමුඛත්වය දෙන්න. කාන්තා ව්‍යවසායකාවන් බිහිකරන්නත් අවධානය යොමුව තිබෙනවා. බලශක්ති අමාත්‍යාංශයට ගමට විදුලි බලය ලැබෙන විදියට ට්‍රාන්ස්ෆෝමර් 5000ක් විදුලිබලය නිෂ්පාදනය සඳහා සූර්ය බලය දෙන්න පියවර ගෙන තිබෙනවා. සෞභාග්‍යයේ දැක්ම තුළ කරුණු ගොනු කර ක්‍රියාවට නංවනවා. ගමේ අදහස් ගැනීම සඳහා ගම සමඟ පිළිසඳර වැඩසටහන ආරම්භ කළා. ගමේ කමිටුවල යෝජනා සඳහා ප්‍රමුඛත්වය දෙන්න කියා ඉල්ලනවා.

මේවා සංවිධානය කළයුතු ආකාරය ගැන දැනුවත් කර තිබෙනවා. මේ සියල්ල කරන අතරතුර අපේ සංස්කෘතිය, දේශීයත්වය ආරක්ෂා කරන්නත් පියවර ගන්නවා. සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රමුඛතාවය දීමේ දී වැඩි පිරිසකට ප්‍රතිලාභය දෙන ඒවාට අවස්ථාව දෙන්න. මීට පෙර ඉදිරිපත් කළ යෝජනා, මේ වනවිට අසම්පූර්ණ යෝජනා සම්පූර්ණ කිරීම වැදගත් වෙන අතර අපි පරණ ඒවා නඩත්තු කරන්නේ නැහැ. මෙවැනි කරුණු වෙනුවෙන් අවධානය යොමු වියයුතු වෙනවා. අතරමඟ නතර වී තිබෙන වැඩසටහන් වෙනුවෙන් මුල්තැන දෙන්න. යෝජනා පිටපත් තුනක් එවන්න. ඒවා අපි ප්‍රමුඛතා ගත කරනවා. මේවා සමානව බෙදන්න වෙනවා. නිලධාරීන් හා සම්පත් ප්‍රමාණය බලා ඒවා ක්‍රියාත්මක කරනවා. අදාළ අමාත්‍යාංශයට යවන ගමන් ජනාධිපති කාර්ය සාධන බලකාය අපි සොයා බලනවා. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වෙනුවෙන් එක් ලිපි ගොනුවක් බැගින් ලබා දී තිබෙනවා. මේ වෙනුවෙන් කටයුතු කිරීමේ දී වෙනස් වන්න බිය වන්න එපා. වෙනස් විදියට සිතා කටයුතු කරන්න. ආණ්ඩුව ඔබව ආරක්ෂා කරන්න ඉන්නවා. හරියට මේ රට ඉන්නේ ගිනි කන්දක් උඩ කියන්න පුළුවන්.

එක් පැත්තකට ගියෝත් විනාශ වෙන්නත් පුළුවන්. හරි පැත්තට ගියොත් දියුණු කරන්නත් පුළුවන්. සමහර ප්‍රදේශවලට ගියාම නව මඟකට යොමුව තිබෙනවා. මේ තුළ අපි යම් යම් දේ සිදු වෙනවා. අදටත් අපිට අභියෝග තිබෙනවා. නමුත් කොවිඩ් මුළු ලෝකයටම මුහුණ දෙන්න සිදුව තිබෙනවා. ලොව බලවතුන් අද අසරණ වී තිබෙනවා. මෙය අපිටත් පොදුයි. සියලු දෙනා එක්ව මුහුණ දෙන්නේ නම් ඊට මුහුණ දෙන්න පුළුවන්. මේ වර්ෂය රට දියුණු කරන වසරක් ලෙස අපි සිතමු. 2005 වසරේ සිට 2010 වසර දක්වා වසර 30ක යුද්ධය අවසන් කොට රට ආර්ථික වශයෙන් ගොඩනගන්න පියවර ගත්තා. ත්‍රස්තවාදය තිබෙන තුරු රට දියුණු කරන්න නොහැකි වුණා. යුද්ධය අවසන් කළ පසුව ශීඝ්‍රවර්ධනයක් කරා යන්න පුළුවන් වුණා. ඒ නිසා කොවිඩ් අවසන් කරන තුරුම අපිට දියුණුවක් ලබන්න බැහැ. සංඛ්‍යා ලේඛන අනුව උතුරු මැද අඩුම කොරෝනා රෝගීන් ප්‍රමාණයක් වාර්තා වෙන්නේ. මේ ආකාරයට අපි ඉදිරියට යමු.

ජනවාරි 1 වැනි දා සිට මේ රට සංචාරකයන්ට විවෘත කරන්න අපේක්ෂා කරනවා. මෙය නියාමන ව්‍යාපෘතියන් ලෙස 26 වැනි දා සංචාරකයන් එනවා. 4000 ට වැඩි පිරිසක් එනවා. එය අපිට ලොකු ශක්තියක්. මේ තුළ අපිට දියුණු වෙන්න පුළුවන්. දකුණු පළාතේ වැඩිපුර සංචාරක ව්‍යාපාරයෙන් යැපෙනවා. සේනා දළඹුවන්ගේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ආණ්ඩුව මැදිහක් වී කටයුතු කරනවා. මේ තත්ත්වය යළි මතුව තිබෙනවා. අපි අපේක්ෂා කළ වර්ෂාව ද ලැබී නැහැ. ගොඩ ගොවි තැන සාර්ථක වුණා. මෙවැනි තත්ත්වයන් වෙනවා. මහජන නියෝජිතයන් ද ගොවීන්ට සහාය දෙන්න කටයුතු කළයුතු වෙනවා. පෙර පාසල් සහ පෞද්ගලික පාසල් සම්බන්ධයෙන් මේ දක්වා තීන්දුවක් ලබගෙන නැතත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අවධානය යොමුව තිබෙනවා. ඉදිරියේ දී ඒ සම්බන්ධයෙන් තීන්දුවක් ගනී. මේ කාර්යය කරද්දී මේ උවදුරෙන් බේරෙන්නේ නොමැතිව ඉදිරියට යන්න බැහැ. මෙය ව්‍යාප්ත වූ පසුව යළි විවෘත කරන්න අමාරුයි. පැලියගොඩ වෙළෙඳපොළ මාස කිහිපයකට පසුව අද විවෘත කළා.

විශාල මුදලක් ගොවියන් වෙනුවෙන් වෙන් කරනවා. නොමිලේ පොහොර සහ අනෙකුත් පහසුකම් ලබා දෙන්න. එවැන්නක් කර හොඳ මිලක් දෙන්නත් ආණ්ඩුව කටයුතු කරනවා. නමුත් ඒ හා සමානව පාරිභෝගිකයාට ඒ සහනය ලැබෙනවා ද යන්න ගැටලුවක්. ආණ්ඩුව සතුව ස්ථිරසාරව වී තොග නොමැති වීම ඊට හේතුව වී තිබෙනවා. ගිය කන්න වී අලෙවි මණ්ඩල මහන්සි වුණා අවශ්‍ය තරම් වී තොග පවත්වාගෙන යන්න. ඊළග කන්නයේ සිට හැම ගොවියකුගෙන්ම සියයට 8ත් 10ත් අතර ප්‍රමානයක් වී මිලදී ගන්න කටයුතු කරනවා. ගම් මට්ටමින් ධාන්‍යාගාර ස්ථාපිත කරන්න බලනවා. ඒ සඳහා කන්ටේනර් ලබා දෙන්නත් සමූපකාර හා ගොවි සමිති සඳහා සුදුසු ගබඩා සකස් කළයුතු වෙනවා. එවැනි ධාන්‍යාගාර වෙනුවෙන් මෙවර අයවැයෙන් මුදලක් වෙන් කර තිබෙනවා. වී මිලට ගන්න අවශ්‍ය මුදල් ද වෙන්කර තිබෙනවා. සමෘද්ධි ව්‍යාපාරයට සමූපකාරයට ඒ වෙනුවෙන් සම්බන්ධ වෙන්න පුළුවන්. අද සමූපකාර ප්‍රාදේශීක විශාල ප්‍රමාණයක් වැසී තිබෙනවා. විශේෂයෙන්ම කාන්තාවන් මුල් කර ගෙන ව්‍යවසායකයන් නිර්මාණය කරන්න පියවර ගෙන තිබෙනවා.

ගෙදරක් සහ වෙළෙඳ සලක් ඇති කරන්න සහාය ලබා දෙනවා. රටපුරා භාණ්ඩ නිසි පරිදි බෙදා හරින්න යම්කිසි ව්‍යාපාර ජාලයක් අවශ්‍ය වෙනවා. ඇතැම් ප්‍රදේශවල සමූපකාර හොඳින් ක්‍රියාත්මක වෙනවා. ඒ වෙනුවෙන් වැඩපිළිවෙළක් සකස් කරන්න පියවර ගෙන තිබෙනවා. ගොවීන්ට අවශ්‍ය පොහොර නිසි පරිදි ලබා දෙන්න පියවර ගෙන තිබෙනවා. පොහොර භාවිතා කළයුතු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 6500ක් වුණත් පසුගිය වසර දක්වා ගෙන්වා තිබෙන්නේ මෙට්‍රික් ටොන් 350000ක් පමණයි. නමුත් මේ ආණ්ඩුව අවශ්‍ය තරම් පොහොර ගෙන්වා තිබෙනවා. ගොවියාට අවශ්‍ය වේලාවට පොහොර නොලැබෙන්නේ නම් නිසි ප්‍රයෝජන ගන්න බැහැ. පොහොර වෙනුවෙන්ම රාජ්‍ය ඇමැතිවරයෙක් ඉන්නවා. පොහොර කාර්යාංශයක් තිබෙනවා. පොහොර ගෙන්වීම වෙනුවෙන් වැඩිම මුදලක් වෙන් කරනවා. මේ වෙනුවෙන් විශේෂ අවධානය යොමු කරන්න. වරායෙන් සෘජුවම මේ පළාතට පොහොර එවනවා. ප්‍රජා මූල සංවිධාන හරහා ගමේ කටයුතු සිදු වෙනවා. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල දී ඒ ඒ විෂයන් අනුව කටයුතු කරන්න ඒ ඒ ආයතනවලට බාර දෙන්න.

මේ වනවිට ග්‍රාම සංවර්ධන සමිතිවල මුදල් සීමාව වැඩි කරන්න ද ආණ්ඩුවේ අවධානය යොමුව තිබෙනවා. ඒ වගේම ඉඩම් මායිම් කිරීම සම්බන්ධයෙන් විවිධ චෝදනා තිබෙනවා. ඉඩම් මායිම් වෙනස් කිරීමට ද කිසිවකුටත් බලයක් දී නැහැ. ප්‍රාදේශීය ලේකම්වරයාට ඒ සම්බන්ධයෙන් තීරණ ගන්න බලය තිබෙනවා. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු අගමැති කාර්යාලයෙන් ඇමැතිවරු හා රාජ්‍ය ඇමැතිවරු කණ්ඩායම් 4කට හැදිලා එනවා. එහිදී ප්‍රශ්න විසඳා ගන්න පුළුවන්. අපිට ගැටලු තිබෙනවා. ඒවා ජනතාව තුළ ඇති වෙනවා. ඒවා විසඳීම වෙනුවෙන් ගතයුතු ක්‍රියාමාර්ග වලත් ගැටලු ඇතිවන අවස්ථා තිබෙනවා. රටේ තිබෙන සංවේදී ප්‍රදේශයක් වන උතුරු මැද ජනතාවට මේ දක්වා ක්‍රියාත්මක කළ හැම ව්‍යාපෘතියකින්ම හොඳ ප්‍රතිඵල ලැබෙනවා වගේම අවාසනාවන්ත ප්‍රතිඵල ද ලැබී තිබෙනවා. හැඟීම්වලට අනුව පමණක් නොව කල්පානා කොට විද්‍යාත්මකව කරුණු සොයා බලා තීන්දු ගතයුතු වෙනවා. මේවා දිනක් තුළ විසඳන්න බැහැ. මහජන නියෝජිතයන් ඒ වගකීම ඉටු කරනවා. රජයේ නිලධාරීන් ද වගකීමෙන් වැඩ කරනවා.

**උතුරු මැද පළාත් ආණ්ඩුකාර මහීපාල හේරත් මහතා-**

"වැඩ සමඟ යළි ගමට" වැඩසටහන උතුරු මැද පළාතේ ආරම්භ කරන්න බැසිල් රාජපක්ෂ මහතා පූර්ණ සහාය ලබා දී තිබෙනවා. ඒ මහතාගේ ප්‍රධානත්වයෙන් අද මේ සාකච්ඡාව පැවත්වීම අපට ඉතාම වැදගත්. මේ වැඩසටහන පළාතේ ක්‍රියාත්මක කිරීම තුළින් විශාල සංවර්ධනයක් අපේක්ෂා කරන්න පුළුවන්. මේ කාර්යභාරය රටපුරාම ගෙන යන්න බැසිල් රාජපක්ෂ මහතා නායකත්වය ලබා දෙනවා. මේ අවස්ථාවට පළාතේ දිස්ත්‍රික්ක දෙකම නියෝජනය කරමින් දේශපාලන නියෝජිතයන් මෙන්ම රාජ්‍ය නිලධාරීන් විශාල පිරිසක් සම්බන්ධ වෙනවා.

මේ පළාතේ ජනතාව වෙනුවෙන් අපි රජයේ නිලධාරීන් සම්බන්ධව කටයුතු කළයුතු වෙනවා. බැසිල් රාජපක්ෂ මහතා මේ දරණ උත්සාහයට අපේ සහාය ලබාදිය යුතු වෙනවා. බැසිල් රාජපක්ෂ මහතා ආර්ථික සංවර්ධන ඇමැතිවරයා ලෙස ආරම්භ කළ වැඩසටහන්වලට එහා ගොස් නව වැඩසටහන් ක්‍රියාත්මක කරමින් රට සංවර්ධනය කරන්න උත්සාහයක් ගෙන තිබෙනවා. මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න අපි ආණ්ඩුව සමඟ එක්ව කටයුතු කරනවා.

'ගම සමඟ පිළිසඳරක්' වැඩසටහන තවදුරටත් පුළුල් කර එහිදී නියෝජනය නොවූ පිරිස්වල සහ රාජ්‍ය නිලධාරින්ගේ සහයෝගය ලබා ගැනීමට පළාත් මට්ටමින් දියත් කෙරෙන 'වැඩ සමඟ යළි ගමට' වැඩසටහන් මාලාවේ තෙවැනි රැස්වීම ඊයේ (16) අනුරාධපුරයේ දී පවැති අතර ලබන 21 වැනිදා දක්වා මෙම රැස්වීම් මාලාව සංවිධානය කර තිබේ. මෙවර අයවැය ලේඛනයෙන් ඉතිහාසයේ පෙර නොවූ විරූ ප්‍රමුඛතාවයක් ග්‍රාමීය සංවර්ධනය වෙනුවෙන් ලබාදී තිබෙන අතර ඒ අනුව එකී සංවර්ධන මෙහෙයුම රටපුරා ගමින් ගමට ක්‍රියාවට නැංවීම වර්තමානයේ උදාවී තිබේ. මේ සඳහා ම "ගම සමඟ පිළිසඳර - වැඩ සමඟ යළි ගමට" නව වැඩසටහන් මාලාව දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතා පියවර ගෙන ඇත.

ඇමැතිවරුන් වන එස්.එම්. චන්ද්‍රසේන, ශෙහාන් සේමසිංහ, රොෂාන් රණසිංහ, සිරිපාල ගම්ලත්, දුමින්ද දිසානායක, මහාචාර්ය චන්න ජයසුමන, පාර්ලිමේන්තු මන්ත්‍රී උද්දික ප්‍රේමරත්න උතුරු මැද පළාත් හිටපු ප්‍රධාන ඇමැති එස්.එම් රංජිත් මහත්වරු ඇතුළු අනුරාධපුරය හා පොළොන්නරුව දිස්ත්‍රික්ක නියෝජනය කරමින් දේශපාලන නියෝජිතයන් සහ රාජ්‍ය නිලධාරින් රැසක් මේ අවස්ථාවට සහභාගි වූහ.

**ඡායාරූප - විමල් කරුණාතිලක**

# මහපොළින් විශ්වවිද්‍යාල පද්ධතියක් ගොඩනඟනවා

## පළමුවැන්න නුවරඑළියේ

### ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන



අනුර ප්‍රේමලාල්

මහපොළ භාරකාර අරමුදලෙන් ජාතික විශ්වවිද්‍යාල පද්ධතියක්, ඇති කිරීමට බලාපොරොත්තුවන බවත් එහි පළමුවැන්න නුවරඑළිය දිස්ත්‍රික්කයේ ඉදිරි කරන බවත් වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා පැවසීය.

ඒ මහතා මේ බව ප්‍රකාශ කළේ ඉකුත් දා (14) මහපොළ භාරකාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ අඹේවෙල ඉදිකිරීමට යෝජිත නව විශ්වවිද්‍යාලය සඳහා වෙන් කර ඇති ඉඩම නිරීක්ෂණ චාරිකාවකට එක් වෙමිනි.

එහිදි වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේද කීවේය. මෙරට යෞවනයන්ගේ දක්ෂතා කුසලතා හා නිර්මාණාත්මක හැකියාවන් වර්ධනය කිරීම වෙනුවෙන් අවශ්‍ය පාසල්, වෘත්තීය පුහුණු ආයතන හා උසස් අධ්‍යාපන ආයතන පිහිටුවීමට දිවංගත ලලිත් ඇතුළත්මුදලි මහතා නිර්මාණය කළ මහපොළ භාරකාර අරමුදල මඟින් මෙවැනි ජාතික විශ්වවිද්‍යාල පද්ධතියක් සකස් කිරීමටත්, එහි පළමු විශ්වවිද්‍යාලය වශයෙන් කෘෂිකාර්මික තාක්ෂණය පිළිබඳ නවෝත්පාදන අධ්‍යාපනය ලබා දීම සඳහා ජෛව පද්ධති තාක්ෂණ විශ්වවිද්‍යාලයක් නුවරඑළිය ප්‍රදේශයේ පිහිටුවීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේත්, කැබිනට් මණ්ඩලයේත් අනුමැතියෙන් සියලු කටයුතු සලසා තිබෙනවා.

අපනයන සංවර්ධනය කරගැනීම සඳහා නිවැරදි කත්සේරුවන් තුළින් නව කර්මාන්ත බිහි කිරීමේ වැදගත්. එමෙන්ම මෙම වගා කටයුතු සම්බන්ධව ප්‍රාථමික මට්ටමක පවතින දැනුම උපයෝගී කරගනිමින් දැනට ක්‍රියාත්මක වන අපනයන කටයුතු තවදුරටත් වර්ධනය කිරීමත් වැදගත්. නුවරඑළිය දිස්ත්‍රික්කයේ පවත්නා විභවය ජාත්‍යන්තර වෙළෙඳපොළ සඳහා නිෂ්පාදන නිකුත් කිරීමේ ධාරිතාව සඳහා ප්‍රමාණවත් වන බවයි. එමෙන්ම මෙම විභවය ප්‍රයෝජනයට ගනිමින් කැපූ මල් ක්ෂේත්‍රය, කෝපි, අර්තාපල්, එළවළු හා පලතුරු වගා ආදී සියලු අංශවලට තම දායකත්වය ලබා දීමට නුවරඑළිය ප්‍රදේශයේ ගෘහස්ථ වගාකරුවන් හා තරුණ තරුණියන්ට අවශ්‍ය කරන තාක්ෂණික හා ශිල්පීය දැනුමත්, අධ්‍යාපනය, පුහුණුව මෙන්ම අත්දැකීම් හුවමාරුව වෙනුවෙන් උසස් අධ්‍යාපන ආයතනයක් ඇති කිරීමට මහපොළ භාරකාර අරමුදල් මණ්ඩලය කටයුතු කරනවා.

මෙම අවස්ථාවට රාජ්‍ය අමාත්‍යවරුන් වන ලසන්ත අලගියවන්න, ජීවන් තොණ්ඩමන්, නුවරඑළිය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී එස්. බී. දිසානායක, වෙළෙඳ අමාත්‍යාංශ ලේකම් හද්‍රාණී ජයවර්ධන, නුවරඑළිය දිස්ත්‍රික් ලේකම්, රුහුණු විශ්ව විද්‍යාලයේ හිටපු කුලපති මහාචාර්ය සේනානයක, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආචාර්ය සෙනවිරත්න මහත්ම මහත්මීන්, මහපොළ භාරකාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලයේ නිලධාරීන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

# රටේ අනාගතය ශක්තිමත් කරන්න නම් සියලු ජාතීන්ට පිළිගත හැකි ව්‍යවස්ථාවක් සකසිය යුතුයි

### මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල



පහන් විජේසේකර

රටට අනාගතයක් අවශ්‍ය වන්නේ නම් රටේ සිටින සියලු ජාතීන්ට පිළිගත හැකි ව්‍යවස්ථාවක් සකස් කළ යුතු බව විපක්ෂයේ ප්‍රධාන සංවිධායක සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල මහතා පැවසීය.

ඔහු මේ බව පැවසුවේ කොළඹ විපක්ෂ නායක කාර්යාලයේ දී ඊයේ (15) පැවැති මාධ්‍ය සාකච්ඡාවකට සහභාගී වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක් වූ හෙතෙම මෙසේ ද පැවසීය.

අපේ රටට නිදහස ලැබෙන්න අවුරුද්දකට කලින් නිදහස් ශ්‍රී ලංකාවට අලුත් ව්‍යවස්ථාවක් සකස් කරන්න සෝල්බරි සාමිවරයා ආවා. එදා එතුමා අපේ රටේ සියලු දේශපාලන පක්ෂ, සියලු ජාතීන් සහ ආගමික සංවිධානත් එක්ක සාකච්ඡා කර අපේ නිදහස් ලංකාවේ ප්‍රථම ව්‍යවස්ථාව සකස් කෙරුවා. නමුත් නිදහස ලැබුණු පසු අපේ රජයයන් ව්‍යවස්ථාවන් හඳුන්වා දුන්නා බණ්ඩාරනායක මැතිනිය ජනරජ ව්‍යවස්ථාව හඳුන්වා දුන්නා. ජේ ආර්. ජනාධිපතිතුමා විධායක ජනාධිපති ධුරය ඇතුළු රටේ ව්‍යවස්ථාවක් හඳුන්වා දුන්නා. මේ රටේ ඉන්න විශේෂයෙන්ම උතුරු නැගෙනහිර දේශපාලන පක්ෂ විශේෂයෙන්ම ද්‍රවිඩ පක්ෂවලින් දායකත්වයක් ලැබුණේ නැහැ.

මේ රජය විශාල බලයකුත් එක්ක අලුත් ව්‍යවස්ථාවක් ගැන කතා කරනවා. අපේ රටට අනාගතයක් අවශ්‍ය නම් මේ රටේ ඉන්න සියලු ජාතීන්ට පිළිගත හැකි ව්‍යවස්ථාවක් නිර්මාණය කරන්න ඕනේ.

යහපාලන ආණ්ඩුවේදී සභානායක හැටියට පාර්ලිමේන්තුවම ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයක් හැටියට පරිවර්තනය කරන යෝජනාවක් පාර්ලිමේන්තුවට ගෙනාවා. එදා සියලු දේශපාලන පක්ෂ නියෝජනය කළ පිරිස් විසිදෙනකුගෙන් සමන්විත කමිටුවට එක් වුණා. අප රැස්වීම් 78ක් තිබ්බා. මෙම මෙහෙයුම් කමිටුවට රටේ තියෙන දේශපාලන සංවිධාන සිවිල් සංවිධාන වෘත්තීය සමිති වගේම මහ ඇමැතිවරුන් ද ඇවිත් කරුණු දැක්වූවා.

ඇත්ත වශයෙන්ම ඒ වෙලාවේ වැඩිම බලය බෙදීමක් ඉල්ලුවේ දකුණේ මහ ඇමතිවරුන්. ඒ කෙසේ වෙතත් රැස්වීම් 78කට සහභාගි වෙලා අතුරු වාර්තාවක් සැකසුවා. අපේ අතුරු වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර දින 5ක් සාකච්ඡා කෙරුවා. දින 5ක් දක්වපු ඒ අදහස් සාකච්ඡා කර කෙටුම්පතක ට ආසන්න ලියවිල්ලක් හදලා තිබුණා. නමුත් අවාසනාවකට ඒ කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කලින් දින 52 කුමන්ත්‍රණය ඇවිල්ලා අපේ රජයට පාර්ලිමේන්තුවේ බලය නැති වුණා. රජය අලුත් ව්‍යවස්ථාවක් හදනවා නම් ආපහු මුල ඉදන් පටන් ගන්න ඕනේ නෑ. සියලු දේශපාලන පක්ෂ එකතු වෙලා යහපාලන ආණ්ඩුව සකස් කළ හදපු ඒ නවත්තපු තැන ඉඳලා එකඟ වෙන්න බැරි දේවල් ඉවත් කරලා කටයුතු කරන්න පුළුවන්. එහෙම කළොත් අපේ රටේ සියලු ජාතීන් පිළිගන්න නිර්මාණය වන බව ඒකාන්තයි.

මෙහිදී අදහස් දැක්වූ සමගි ජන බලවේගය පාර්ලිමේන්තු මන්ත්‍රී නලින් බණ්ඩාර මහතා- මේ ආණ්ඩුව කොරෝනා වසංගතය මර්ධනය කරන්න අසමත් වී සිටිනවා. විශේෂෙන්ම දෙවන කොරෝනා රැයේදී රජය ක්‍රියාත්මක කරපු ආකාරය නිසා අද කොරොනාත් එක්ක ජීවත් වෙන්න වෙලා තියෙනවා අපේ ජනතාවට. මොනවා වුණත් මිනිස්සු මේ ජීවන අරගලය වැදගත්. රජයේ යුතුකම තමයි රටේ ජනතාවගේ ජීවන අරගලයට යම් ශක්තියක් ලබාදීම. මට අද වේල් තුන කා ගන්න බැරුව බහුතරයක් ඉන්නවා. ඒ වගෙ වෙලාවක රජයේ ගජමිතුරන් තමන්ගේ ව්‍යාපාර ටික කරගෙන යනවා අප දැක්කා. මහාපරිමාණ සීනි ජාවාරමක් ගැන හෙළිදරව්වක් කළා. රුපියල් බිලියන 10ක පමණ පාඩුවක් රජයට මේ හරහා සිදු වී තියෙනවා. ජනතාවට සහන දෙන්න කියා සීනි ආනයන බද්ද ශත 25 දක්වා අඩු කරා. හැබැයි රුපියල් අසූ පහට සීනි දෙන්න තමයි රජය බලාපොරොත්තු වුණේ. රටේ කොහෙවත් රු.80 පාට සීනි නැහැ හැබැයි ටොන් 90000කට වැඩි ප්‍රමාණයක් ලංකාවට සීනි ගෙන්නලා.



# ඒකාධිපති පාලනයක් ඇති බව ජාත්‍යන්තරයට ඒත්තු ගැන්වීමට විපක්ෂය කැසකවනවා

### රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ

උපාලි කරුණාරත්න

'රට ඒකාධිකාරයක් යටතේ පාලනය වනවා' යැයි එක්සත් ජාතීන්ගේ සංවිධානයට, යුරෝපා සංගමයට වැරදි වැටහීමක් දීමට විපක්ෂය උත්සාහ කරමින් සිටින බව ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ මහතා පැවසීය.

රාජ්‍ය ඇමැතිවරයා මේ බව කියා සිටියේ සීමාසහිත මරදගහමුල පේෂකාර්මිකයන්ගේ සමුපකාර සමිතියේ සහ එම කර්මාන්ත ශාලාවේ වැඩ කටයුතු සම්බන්ධයෙන් සොයා බැලීමේ නිරීක්ෂණ චාරිකාවකට පසුගියදා (13) සහභාගී වෙමිනි.

පසුගිය වසරේදී භාර ගත්තේ යහපාලන රජය විසින් ක්ෂණ ආර්ථිකයක් බවට පත් කළ රටක් බවත්, වත්මන් රජය දේශීයත්වයට මුල්තැන ලබා දෙමින් රටේ ආර්ථිකය නඟාසිටුවීමට කටයුතු කරමින් සිටින බවත් රාජ්‍ය ඇමැතිවරයා මෙහිදී කීය.

වත්මන් රජය සෑම විටම රටේ ස්වාධීනත්වය හා දේශීයත්වය අගය කරන බවත්

දේශීය කර්මාන්ත හා දේශීය කර්මාන්තකරුවා නඟා සිටුවීම ජනාධිපතිවරයාගේ සහ අගමැතිවරයාගේ පරමාර්ථ බවද පැවසීය.

මෙම අවස්ථාවට සීමාසහිත මරදගහමුල පේෂකාර්මිකයන්ගේ සමුපකාර සමිතියේ සභාපති ජගත් කුමාර මහතා හා එහි උප සභාපති ජී. කරුණාජීව මහතා ඇතුළු පිරිසක් සහභී වූහ.

# මාතලේ සෙම්බුවත්තට සංචාරක ආකර්ෂණය ගෙන එනවා

### රාජ්‍ය ඇමැති කනක හේරත්

චන්ද්‍රිමා කරුණාරත්න

මාතලේ සෙම්බුවත්ත ප්‍රදේශය දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණය හිමිවන පරිදි වඩාත් විධිමත් පාරිසරික සංචාරක ප්‍රදේශයක් බවට පත්කරන බව සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය කනක හේරත් ප්‍රකාශ කළේය.

රාජ්‍ය අමාත්‍යවරයා මේ බව ප්‍රකාශ කළේ රජයට අයත් මාතලේ ඇල්කඩුව වැවිලි සමාගමේ නිරීක්ෂණ චාරිකාවකට සහභාගී වෙමිණි.

ඇල්කඩුව වතුයාය තුළ පිහිටා ඇති සෙම්බුවත්ත සංචාරක ප්‍රදේශය මේ වනවිටත් යම් මට්ටමකට සංචාරක ආකර්ෂණය දිනාගෙන ඇති නමුත්, එය විධිමත්ව සංවර්ධනය කිරීමෙන් සංචාරක ගමනාන්තයක් බවට පත්කිරීමේ හැකියාව ඇති බව අමාත්‍යවරයා පෙන්වා දුන්නේය.

කැම්බෙල් වන රක්ෂිතයෙන් ගලා එන දිය දහරින් පෝෂණය ලබන ස්වාභාවික නාන තටාකවලින් සැදුම්ලත් සෙම්බුවත්ත වැවද සංචාරක ආකර්ෂණය නොඅඩුව ලබන ස්ථානයකි. මහනුවර සිට කි.මී. 30.6ක දුරකින් ද මාතලේ සිට කි.මී. 21.8ක දුරකින් ද පිහිටා ඇති සෙම්බුවත්ත, පාරසරික සංචාරක කලාපයක් ලෙස සංවර්ධනය කිරීමේ හැකියාව ඇති බව රාජ්‍ය අමාත්‍යවරයා පෙන්වා දුන්නේය.

සෙම්බුවත්ත ප්‍රදේශය ක්‍රමවත්ව සංවර්ධනය කිරීම විධිමත් සංවර්ධන සැලැස්මක් යටතේ සිදු කළ යුතු බව ප්‍රකාශ කළ රාජ්‍ය අමාත්‍යවරයා ඒ සඳහා සුදුසු සංවර්ධන සැලැස්මක් සකස් කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

ප්‍රදේශයේ පාරසරික වැදගත්කම තව දුරටත් උද්දීපනය වන ලෙසත් පාරිසරික සෞන්දර්ය ආරක්ෂා වන ලෙසත් සංවර්ධන සැලැස්ම සැකසීමේදී විශේෂ අවධානය යොමු කළ යුතු බව රාජ්‍ය අමාත්‍ය කනක හේරත් අවධාරණය කළේය.

එමෙන්ම සංවර්ධන සැලැස්ම සැකසීමේදී සංචාරක ක්ෂේත්‍රයේ අවශ්‍යතා, අනාගත ඉලක්ක පිළිබඳ සැලකිල්ල යොමු කරන ලෙස දැන්වීය.

මේ යටතේ ප්‍රදේශයේ පාරසරික විවිධත්වය පිළිබඳ, ජෛවයේ අඛණ්ඩ පැවැත්ම වෙනුවෙන් පාරසරික පද්ධති ආරක්ෂා කිරීමේ වැදගත්කම පිළිබඳ සංචාරකයන් දැනුම්වත් කිරීමේ තොරතුරු පියසක් ඇති කිරීමට ද යෝජිතය.

# වරාය සුරැකෙන්නේ නැඟෙනහිර ජැටිය බේරා ගත්තොත් පමණයි

### ජවිපෙ කාරක සභික වසන්ත සමරසිංහ



නදී මානික්කගේ

ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඉතුරු වෙන්නේ නැගෙනහිර ජැටිය බේරා ගැනීමෙන් පමණක් බව ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කාරක සභික වසන්ත සමරසිංහ මහතා පැවසීය.

ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේදී පුගියදා පැවැති මාධ්‍ය හමුවකට එක්වෙමින් එසේ කී වසන්ත සමරසිංහ මහතා ජාතික සම්පත් විකිණීමට විරුද්ධව බලයට පැමිණි රාජපක්ෂ ආණ්ඩුව ජාතික සම්පත් විකුණමින් සිටින බවද කීවේය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ වසන්ත සමරසිංහ මහතා මෙසේ ද කීවේය.

ජාතික සම්පත් විකුණන්නේ නැති බව කියමින් බලයට ආව රාජපක්ෂවරුන් අද හැල්මේ විකිණීම පටන්ගෙන තිබෙනවා. කොළඹ වරාය නැගෙනහිර ජැටිය විකිණීමට අමතරව ගාලු වරායේ ඉඩම් අවුරුදු 35ක් බදුදීමට මැනුම් කටයුතු කරනවා. ගාල්ල පොලිස් බැරැක්කය ඇතුළු ඉඩම් අවුරුදු 99කට බදු දෙන්න මැනුම් කටයුතු කරනවා. ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි ටික ෂඩක් සමාගමට බලහත්කාරයෙන් තියාගන්න ඉඩ ඇරලා. ආණ්ඩුව තමන්ගේ ආර්ථික ප්‍රතිපත්තිය බවට පත් කරගෙන තිබෙන්නේ සුපුරුදු ලෙසම මහජන දේපොළ විකිණීමයි. ඔවුන් ජනතාවට කියන්නේ පුළුවන් නම් හොයාගෙන කාපල්ලා, අපි විකුණන් කනවා කියලයි. ආණ්ඩුවේ අද ප්‍රතිපත්තිය මේකයි.

අප ජනතාවට කියන්නේ ආණ්ඩුව ගෙනයන මේ ප්‍රතිපත්තියට ඉඩ දුන්නොත් දරුවන්ගේ අනාගතයට කිසිම දෙයක් නැතිවෙන බවයි. කොළඹ වරාය ආසියාවේ ප්‍රධාන වරාය අතරින් එකක්. ඒක ලෝකයේ 22වැනි ප්‍රධාන වරායයි. භූගෝලීය පිහිටීම අතින් ගත්තාම සේද මාවතේ තිබෙන වැදගත් වරායක්. වරාය අධිකාරියට අයිති වරායන් 7ක් අපේ රටට තිබෙනවා. කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය, හම්බන්තොට, පේදුරුතුඩුව, ඔලුවිල්, සහ කන්කසන්තුරේ වරායන්. මින් කන්කසන්තුරේ, පේදුරු තුඩුව, ඔල්විල් වරායන් අක්‍රීයයි. ඒ වරායන් සංවර්ධනය කරන්න කියා ඉල්ලන්නේ නැතිව කොළඹ වරායටම එන්නේ ඇයි? මේ වෙනකොටත් වරාය අධිකාරියෙන් පවත්වාගෙන යන තැනක් විකුණන්න හදන්නේ ඇයි?

ලෝකයේ ප්‍රවාහන සේවා කුඩා නැව්වල සිට විශාල නැව් දක්වා පරිවර්තනය වෙලා. දැන් එන්නේ කන්ටේනර් 20,000කට වඩා ගෙන යා හැකි විශාල නැව්. ඒ නැව් එන්නේ ගැඹුරු වරායවලට විතරයි.

2019 මැයි මාසයේ කැබිනට් පත්‍රිකාවක් දාලා රනිල්-මෛත්‍රී ආණ්ඩුව අවබෝධතා ගිවිසුමක් අස්සන් කළා. ඊට පස්සේ මේ ආණ්ඩුවෙන් 2020 ජූනි මාසේ 20 වැනිදා ජොන්ස්ටන් ප්‍රනාන්දු ඇමැතිවරයා කැබිනට් පත්‍රිකාවක් දානවා. රනිල්-මෛත්‍රී පාලන කාලයේ ඇති කරගත් අවබෝධතා ගිවිසුම අනුව ඉස්සරහට යන්න ගෙනා කැබිනට් පත්‍රිකාවක් ඒක. ඊට පස්සේ පසුගිය ඔක්තෝබර් 22 වැනිදා රෝහිත අබේගුණවර්ධන දැම්ම කැබිනට් පත්‍රිකාවෙන් යෝජනා කළ ඉන්දීය - ජපන් හවුල් සමාගමෙන් ණය ගන්න බැරි බව දැන් කියනවා.

පසුගිය නොවැම්බර් මාසේ 9 වැනිදා රෝහිත අබේගුණවර්ධන ඇමැතිවරයා කැබිනට් පත්‍රිකාවක් අනුමත කරගෙන කමිටුවක් පත් කරනවා. කමිටුවේ අරමුණ නැගෙනහිර ජැටිය 85%ක අයිතිය ඉන්දියානු 'අදානි' සමාගමට දීමයි. නමුත් මේවා නාමික දේවල් විතරයි. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ කාලයේ නැගෙනහිර ජැටිය විවෘත කරන්න ගිය වෙලාවේ අපේ රටේ ජාතික කොඩිය දාන්න දුන්නේ නැහැ. 1999 දී නැව් සමාගම් 38ක් ලෝකයේ ප්‍රවාහන කටයුතුවල නිරතව සිටියා. දැන් තිබෙන්නේ නැව් සමාගම් 8යි. මේ අනුව විශාල නැව්වලට එන්න පුළුවන් ගැඹුරින් වැඩි ජැටි තියෙන වරායවලට විතරයි ආර්ථික වටිනාකම් තිබෙන්නේ. නැගෙනහිර ජැටිය කියන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයිති සල්ලි උල්පතක්. ඒ නිසා වරාය ඉංජිනේරුවන් ඇතුළු සියලු දෙනා මේක වරාය අධිකාරියෙන් කරගෙන යන්න යෝජනා ඉදිරිපත් කළා. දොඹකර 3ක් නැගෙනහිර ජැටියේ හයිකර දැන් මෙහෙයුම් කරගෙන යනවා. ආදායම් ලැබෙනවා. වරාය අධිකාරිය මේ ජැටියේ සංවර්ධනය සඳහා දැනට ඩොලර් මිලියන 80කට වඩා ආයෝජනය කර තිබෙනවා. තව ඩොලර් මිලියන 400ක් ආයෝජනය කළොත් මේ නැගෙනහිර ජැටිය අති විශේෂ වටිනාකමක් සහිත ජැටියක් බවට පත්වෙනවා. වසරකට කන්ටේනර් මිලියන 3ක් මෙහෙයවමින් ඩොලර් මිලියන 250කට වැඩි ආදායමක් උපයන්න පුළුවන්.

එහෙම නම් වසර 6ක්- 7ක් යන කොට සමස්ත ජැටිය හදන්න ගිය ණය මුදල පියවලා භාණ්ඩාගාරයට මුදල් එකතු කරන්න පුළුවන්. එහෙම තැනක් තමයි අද ඉන්දියාවට දොළ පිදේනියක් හැටියට පුදන්න යන්නේ.

අප ජනතාවගේ අවධානයට යොමු කරන්නේ සල්ලි හොයන්න පුළුවන් තැන් විකිණීමට ආණ්ඩුව ගෙනයන ක්‍රියාමාර්ග ගැන අවදිවෙන්න කියායි.

ආයෝජකයෝ හොයනවා කියලා ආණ්ඩුව කරන්නේ මේ සම්පත් විකුණලා තමන්ට ලැබෙන කොමිස් කුට්ටිය ගන්න එකයි. ගෝඨාභය රාජපක්ෂ සම්පත් විකුණන්නේ නැහැ කියා බලය අරගෙන ඔහුගේ මූලිකත්වයෙන් රැස්වන කැබිනට් මණ්ඩලයේදී විකිණීමේ කැබිනට් පත්‍රිකා සම්මත කරනවා. මේ අපරාධ කරන්න එපා. මහා භාණ්ඩාගාරයට බරක් නැති රටට ආදායම් ලැබෙන තැන් විකුණන්න එපා. බිලියන ගණනක් පාඩු ලබන ආයතන මේ රටේ ජනතාව පිට පටවලා තියෙනවා. එහෙම තියෙද්දී ලාභ ලබන තැන් විකුණන්න හදන්නේ ඇයි ? පාඩු ලබන ආයතන පවා එම තත්වයෙන් මුදා ගන්න ඕනෑ. ලෝකයේ රටවල් තමන්ගේ ආර්ථිකයන් ශක්තිමත් කරගන්න කටයුතු කරද්දී, අපේ රටේ පාලකයෝ සියලු වත්කම් අත්හරිමින් ඉන්නවා. ශ්‍රී ලංකා වරාය අධිකාරිය ඉතුරු වෙන්නේ නැගෙනහිර ජැටිය බේරා ගත්තොත් පමණයි. ආණ්ඩුව ගෙන එන මේ විකිණීමේ ක්‍රියාවලිය පරද්දන්න පෙළගැහෙන්න කියා අප ජනතාවට කියනවා. ඒ වෙනුවෙන් ඔබට කළ හැකි සියලු දේ කරන්න, හඬ නඟන්න කියාත් අප මේ රටේ ජනතාවගෙන් ඉල්ලා සිටිනවා.

## ජාතික සම්පත් විකුණන්නේ නෑ කියා බලයට පැමිණි අය අද ඒ කාර්යය පටන් අරන්

14
ඉතිහාසයෙන් සැඟවූ උපුලිය

23
රාවණාගේ නැඟිටීම වළක්වන්න ඉන්දියාවේ පූජාවක්

24
කුවේණිගේ ළතෝනිය දෝංකාර දෙන තෝනිගල



# සංචාරම

## ස්වර්ණභූමියේ අතීතාවලෝකනය



# දීඝවාපී රන් සන්නස හෙළි කළ වසර 1800ක ඉතිහාසය

දීඝවාපී වෙහෙර සොළොස්මස්ථානවලින් එකකි. තුන්වැනි ලංකාගමනයේදී කැලණිය, සමන්ගිර සහ දිවාගුහාවට වැඩම කළ බුදුන් වහන්සේ අනතුරුව සමාපත්ති සුවයෙන් වැඩ සිටීම සඳහා 'දිගාවැවට' වැඩම කළ බව වංශ කතා හෙළි කරයි. පසුගියදා දීඝවාපියෙන් හමුවූ කරඬුවල නෙළුම් මල සහ ශ්‍රී පාද ලකුණු සටහන් කර තිබේ. එබැවින් ඒවා සර්වඥ ධාතූන් විය හැකි යැයි අනුමාන කෙරේ.සියවස් ගණනාවක අතීතය කියැවෙන ඉකුත් දා හමුවූ කරඬු සහ රන් සන්නස පිළිබඳ අනාවරණයකි මේ.



සලපතළ මළුවේ සෙල්ලිපිය

නැගෙනහිර පළාතේ අම්පාර දිසාවේ අක්කරපත්තුවට ආසන්නව දීඝවාපි ග්‍රාමසේවා වසම තුළ සමන්තුරය හා අක්කරපත්තුව අතර තීරයේ දීඝවාපි රජමහා වෙහෙර පිහිටා ඇත. අම්පාර - අක්කරපත්තුව මාර්ගයේ කිලෝ මීටර් 6 ක් පමණ ගමන් කොට වරිපතන්චේන හන්දියෙන් හැරී නැවත කිලෝමීටර් 12 ක් ගමන් කිරීමෙන් මෙම ස්ථානයට පිවිසිය හැකිය.

අක්කර පන්සියයකට අධික භූමිප්‍රදේශයක් පුරා පැතිර ගිය විවිධ ආරාමික නටබුන් මෙහි දැකිය හැකි අතර දීඝවාපිය, අම්පාර දිසාවේ පිහිටි නටබුන් සහිත ස්ථාන අතරින් වැදගත්කමක් උසුලයි. අතීතයේ රුහුණට අයත්ව පැවති දීඝවාපිය "දිග් වූ වැව", "දිගා වැව" "දීඝවාපිය" ලෙසින් ජන ව්‍යවහාරයේ පැවත ඇත. එමෙන්ම ඓතිහාසික මූලාශ්‍රවල සඳහන් වෙන පරිදි දිගාවැව, දීඝවාපි මණ්ඩල, දීඝවාපිරට්ට, දිගාමඩුළු, දිගාවෑ, දිගාමඩුල්ල ආදී වශයෙන් දැක්විය හැකිය. අම්පාර, කොණ්ඩවට්ටවන වැවට නුදුරින් 1953 දී හමු වූ ටැම් ලිපිය අනුව දිගාමඩුල්ල ලෙසින් හැඳින් වූ පැරණි භූමිය නිශ්චිතවම හඳුනාගත හැකි විය.

සොළොස්මස්ථානවලින් එක් ස්ථානයක් වන දීඝවාපිය නැගෙනහිර පළාතේ පිහිටි ප්‍රධාන දාගැබ වශයෙන් සැලකේ. දීඝවාපිය පිළිබඳව ප්‍රථමයෙන්ම ඓතිහාසික තොරතුරු අනාවරණය වන්නේ බුදුන් වහන්සේගේ තෙවැනි ලංකාගමනය පිළිබඳ තොරතුරුවලිනි. දීපවංශය හා මහාවංශය සඳහන් කරන්නේ බුදුහිමියන් කැලණිය, සමන්තකූටය හා දිවාගුහාව යන ස්ථානයන්හි නැවතී දිගාවැවට වැඩම කර සමාපත්ති සුවයෙන් වැඩ සිටි බවයි.

දීඝවාපි වෙහෙරට තරමක් දුරකින් පිහිටි නටබුන් සහිත අප්‍රකට භූමියක වූ බ්‍රාහ්මී සෙල්ලිපියක "දිගවපි පොරණ" ගැන හා එහි විසූ වෙළෙන්දන් විසින් කරන ලද පූජාවක් පිළිබඳව සඳහන් කර ඇති බව එල්ලාවල මේධානන්ද හිමියෝ පවසති. එය ක්‍රි.ව. 2 වන සියවස දක්වා අතීතය නියෝජනය කරන අතර "දිගවපි පොරණ" යනු දීඝවාපි නගරය ලෙස ද එය දීඝායු ජනපදයේ නුවරක් වූ බවත් එය දියුණුව පැවති බවත් උන් වහන්සේ වැඩිදුරටත් සඳහන් කර ඇත.

ධාතුවංශයේ කාවන්තිස්ස රජු සේරුවිලයාදි දීඝනබය පිහිටන තැන දිගාමඩුල්ලෙහි සද්ධාතිස්ස කුමාරයා නැවැත් වූ බව දැක්වේ. එහෙත් අභිලේඛන සාධක අනුව ඊට පෙර කාවන්තිස්ස කුමරු ද ඔහුට පෙර ගෝඨාභය කුමරුද දීඝවාපියේ සිට ඇත. වංසකථා අනුව දීඝවාපියේ සංවර්ධන කටයුතු හා ආගමික කටයුතු සම්බන්ධව වැදගත් තැනක් හිමි වනුයේ සද්ධාතිස්ස රජුටය.(ක්‍රි.පූ. 137-119) ඔහු දීඝවාපියේ සිට ගොවිතැනින් රට සංවර්ධනය කරමින් දීඝවාපි විහාරය කළ බවත් ස්තූපයට සත්රුවන් සැට්ටයක් කරවා රත්තරනින් කරත්ත රෝද සමාන මල් සාදා එහි සන්ධියක් පාසා එම මල් අමුණා පූජා කළ බවත් මහාවංශයේ සඳහන්ය. එල්ලාවල මේධානන්ද හිමියන් සොයා ගන්නා ලද මාදනකන්දේ ලෙන් ලිපිය අනුව සද්ධාතිස්ස, අනුරාධපුර රජකමට පත් වීමට ප්‍රථම පචී බුමියේ (ප්‍රාචීණ භූමිය, නැගෙනහිර පළාත) රජු ලෙස කටයුතු කර ඇතැයි දැක්වේ.

අංගුත්තර නිකාය අට්ඨකථාවෙ දීඝවාපියේ වැඩ වාසය කළ මහාජාතක භාණක තෙරුන් ගැන සඳහන් වන අතර එම තෙරුන් වෙස්සන්තර ජාතකය දේශනා කරනු ඇසීමට මාගම සිට සාමණේර නමක් පැමිණි බව දක්වා ඇත. එසේම මලය මහාදේව තෙරුන් ධජග්ග සූත්‍රය දෙසූ විහාරස්ථාන අතුරින් දීඝවාපිය ද එක් තැනක් විය.

මහාවංශයේ සඳහන් පරිදි මහා පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ (ක්‍රි.ව.1153-1180) දීඝවාපී ප්‍රදේශය මානාභරණ රජු හා සුගලා දේවියගේ බල ප්‍රදේශයක් ලෙස පැවත ඇත. එමෙන්ම දිගාමඩුල්ල ප්‍රබල රාජ්‍යයක් ලෙස පරිපාලනය වූ බව ද දීඝවාපියෙ ඇති වූ කැරලි මර්දනයට 'එකල් හි මහ බලැති සියලු ඇමැතියෝද ප්‍රධානීහු ද දිගා වෑ මඩුලු රට ගන්නට නික්මුණෝ...' යනුවෙන් ද මහාවංශයේ සඳහන් වීමෙන් සනාථ වනුයේ දීඝවාපි විහාරය ද එකල ඉතා සශ්‍රීක තත්ත්වයක පැවති බවයි. එසේම වංශකතාවල දැක්වෙන්නේ මහා පරාක්‍රමබාහු රජුගේ බලඇණි මේ ප්‍රදේශය මුළුමනින්ම විනාශ කළ බවය. 18 වන සියවසේ දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු (ක්‍රි.ව.1747-1780). 'නබ'චේතිය නම් ස්ථානයට පැමිණි බව මහාවංශයේ දැක්වෙන අතර එය දීඝවාපිය ලෙස තහවුරු විය. මෙම දාගැබ හා විහාරය නඩත්තු කිරීම සඳහා ගවමහීෂාදීන් හා වී බීජ අමුණු දහසක වපසරියකින් යුත් ගම්බිම් ප්‍රදානය කිරීමක් කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් සිදුකර ඇත. ඒ බැව් සඳහන් සෙල්ලිපිය දාගැබට නැගෙනහිරින් පිහිටි අතර එය පූජ්‍ය බණ්ඩිගොඩ බුද්ධරක්ඛිත හිමියන් විසින් පිටපත් කර ඇත.

දීඝවාපිය හා තදාසන්න ප්‍රදේශය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ගවේෂණය කර ඇති අතර දීඝවාපිය පැරණි ජනාවාසය වර්ග කිලෝමීටර් 64 ක භූමිභාගයක විසිරී ඇති බව සඳහන්ය. ජනාවාසයේ කේන්ද්‍රය ලෙස දීඝවාපිය සැලකේ. ආරක්ෂිත

> **මහල්ලකනාග මහ රජු නමින් හැඳින්වූයේ ප්‍රදානයට අදාළ රජුගේ පියාය. ඒ අනුව අදහස් වන්නේ ඔහු ක්‍රි.ව.134 සිට 140 දක්වා රට පාලනය කළ බවත් ඒ රජුගේ පුත් කණිට්ඨතිස්ස රජ මෙය ප්‍රදානය කර ඇති බවත්, මළතිස හෙවත් කණිට්ඨතිස්ස යන නාමය මෙහිදි කියවෙන බවත්ය. මහා වංශයේ සඳහන් වනුයේ කණිට්ඨතිස්ස ක්‍රි.ව.164 -192 තෙක් රජ කළ බවය. එබැවින් අදින් වසර 1800ක පමණ ඉතිහාසයක් මෙහි ඇති බව අවබෝධවේ.**



හමුවූ රන් කරඬු සහ රන් සන්නස

ස්මාරක 35 ක් පමණ මෙම භූමිය පුරා ව්‍යාප්තව ඇත. අනුරාධපුර මුල් අවධියේ ඉතිහාසය දක්වා දිවෙන දීඝවාපි ස්තූපයේ වර්තමානය වන විට උපරිභාගය දක්නට නොලැබේ. එහි උපකල්පනය කර ඇති උස මීටර් 112 ක් වුවද දැනට විද්‍යමාන වන ස්තූපයේ උස මීටර් 22.41 කි.

දීඝවාදි දාගැබ ක්‍රි.පූ. 137 -119 ත් අතර කාලවකවානුවේදී ඉදිවෙන්නට ඇතැයි යන්න ද දාගැබ නිර්මාණයෙන් අවුරුදු 200 කට පමණ පසු වාහල්කඩ ඉදිකරන්නට ඇති බවට ද සාධක පවතී. දකුණු වාහල්කඩ පිහිටි ස්ථානයේ සලපතළ මළුවේ ඇති සෙල්ලිපියක් අනුව තහවුරු වන්නේ එම සලපතළ මළුව ක්‍රි.ව.2 වන සියවසේ දී නිර්මාණය කර ඇති බවයි.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් 1964 වර්ෂයේ සිදුකරන ලද කැණීමේ දී ස්තූපයේ ඊසාන දෙස පිළිම ගෙයක තිබී කාසි කිහිපයක් ලැබී ඇත. එමෙන්ම මෙම දාගැබ වටා ප්‍රාකාර බැම් දෙකක් තිබුණු බවත් ඒවා ඇතුළු බැම්ම සහ පිට බැම්ම ලෙසින් හඳුනාගෙන ඇති අතර මෙම ප්‍රාකාරවලින් ඇතුළු මාලකයට ප්‍රවේශ වීමට පුළුල් දොරටු තිබූ බව සඳහන්ය. එම අවස්ථාව වන විට පස්වලින් වැසී තිබුණු බැවින් දාගැබේ ස්වරූපය හඳුනා ගැනීම දුෂ්කර වී ඇත. හමු වූ නටබුන් අනුව එම වාහල්කඩ ඉතා කලාත්මක වූ බව දැක්වේ.

ස්තූපය පිහිටි භූමිය අවට පුරාවිද්‍යාත්මක සාධක බහුල ලෙස හඳුනාගත හැකිය. ගොඩනැගිලිවලට සම්බන්ධ වූ ගල් කණු හා පාදම් කොටස් ද පිළිම ගෙවල්වල නටබුන් ද අඩි හතර හමාරක් පමණ උසැති කවන්ධ හිටි පිළිමයක් සහ කුඩා ඔත් පිළිමයක් සොයා ගැනුණි. පසුව සිදු කළ කැණීම්වලදී ඉතා පැරණි බෝධිඝරයක, ආවාස ගෙයක මෙන්ම ආරෝග්‍ය ශාලාවක නටබුන්ද හමු වී ඇත.

එමෙන්ම 1986 දී ස්තූපයේ බටහිර වාහල්කඩෙහි සිදුකළ කැණීමේදී රන් කරඬු 3 ක් සොයා ගැනීමට හැකි විය. එම කරඬුවලින් විශාලම කරඬුව ක්‍රි.ව. 164 -192 දක්වා කාලයට අයත් බව තහවුරු විය. එම කාල වකවානුවේදී රාජ්‍ය පාලනය සිදුකරනු ලැබූයේ කණිට්ඨතිස්ස රජුය. විශේෂිත ශෛලමය කරඬුවක් තුළ මෙම රන් කරඬු 3 තැන්පත් කර තිබී ඇති අතර ස්තූපයක ස්වරූපයට හැඩ ගන්වා තුනී රන් තහඩු උපයෝගී කොටගෙන මෙම රන් කරඬු නිමවා තිබිණි. එම අවස්ථාවේදී ද රන්පත් ඉරුවක ලියන ලද බ්‍රාහ්මී අක්ෂර සහිත ලිපියක් හමු විය. එය ක්‍රි.ව. 2 වන සියවසට අයත් යැයි සඳහන්ය.

1986 දී සොයාගත් ලිපිය

**'නක මහරජ පුත මලිතිස රජහ සොවණ තුබෙ'**

2020 දි සොයාගත් රන් සන්නසෙහි ලිපිය

**'සිධ මහනකරජහ පුත මළිතිස රජහ සොවණ තුබෙ'**

එය සිංහල බසට නැගූ විට තේරුම මෙසේය.

'යහපතක් වේවා මහානාග (මහල්ලක නාග) රජුගේ පුත් මළතිස (කණිට්ඨතිස්ස) රජුගේ රන් කරඬුව.

ඒ අනුව 2020 නොවැම්බරයේදී සොයා ගත් රන් කරඬු තුළ තැන්පත් කළ රන් පතෙහි ද සඳහන් වූයේ ඉහත සඳහන් ලිපියේ අන්තර්ගතයයි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අභිලේඛන සහ නාණක විද්‍යා අංශයේ අධ්‍යක්ෂ නාමල් කොඩිතුවක්කු එම රන් සන්නස කියවා, එහි භාෂාව පුරාණ සිංහල බවත් අක්ෂර අපර බ්‍රාහ්මී බවත් ප්‍රකාශ කළේය.

මෙම සන්නසට අනුව මහල්ලකනාග මහ රජු නමින් හැඳින්වූයේ ප්‍රදානයට අදාළ රජුගේ පියාය. ඒ අනුව අදහස් වන්නේ ඔහු ක්‍රි.ව.134 සිට 140 දක්වා රට පාලනය කළ බවත් ඒ රජුගේ පුත් කණිට්ඨතිස්ස රජ මෙය ප්‍රදානය කර ඇති බවත්, මළතිස හෙවත් කණිට්ඨතිස්ස යන නාමය මෙහිදි කියවෙන බවත්ය. මහා වංශයේ සඳහන් වනුයේ කණිට්ඨතිස්ස ක්‍රි.ව.164 -192 තෙක් රජ කළ බවය. එබැවින් අදින් වසර 1800ක පමණ ඉතිහාසයක් මෙහි ඇති බව අවබෝධවේ.

මේ අනුව පැහැදිලි වන්නේ කණිට්ඨතිස්ස රජු විසින් මෙම මහා ස්තූපය යථාවත් කළ බවය. දකුණු වාහල්කඩ ආසන්නයේ තැන්පත් කර තිබූ ශෛලමය කරඬුව මෙම කාලවකවානුවට අයත් යැයි විශ්වාස කෙරේ. වාහල්කඩ මැද කොටසේ කුටීරයක් තනා ඒ මත ගල් පුවරුවක් තබා තැන්පත් කර තිබූ ශෛලමය කරඬුව අඟල් 18 ක් පමණ උසින් යුක්තය. එම කරඬුව ආසන්නයේම පොල් තෙල් පහනක් දල්වා තිබෙන්නට ඇතැයි යන්න සාධක ලැබෙන අතර ඒ අසලම පැරණි පහනක්, මුද්දක්, පබළු ඇට කිහිපයක් හා මැණික් යැයි විශ්වාස කළ හැකි පාෂාණ කිහිපයක් ද සොයා ගන්නා ලදි.

මෑතකදී කළ එම කැණීමෙන් රනින් කළ කරඬු 4 ක් හා රන්පතක ලියූ සන්නසක් ඉහත ශෛලමය කරඬුව තුළ තැන්පත් කර තිබුණි. එම කරඬු අතරින් නෙළුම් මල සහ සිරිපතුල් ලාංඡනය සටහන් කොට තිබූ කරඬු දෙකක් විය. එමෙන්ම පළිඟුවලින් නිර්මාණය කරන ලද කරඬුවක් ද මේ අතර තිබී හමුවිය.

පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය සෙනරත් දිසානායක පවසන්නේ චෛත්‍ය කැණීමේ දී ප්‍රමාණ දෙකක ගඩොල් හමු වූ බවත් දාගැබ අසල ගරා වැටුණු විශාල ගඩොල් ගොඩක් තිබුණු බවත්ය. එසේම මහාචාර්යවරයා ප්‍රකාශ කරනුයේ 1840 දි පමණ මඩකලපුවේ එවකට කටයුතු කළ දිසාපති ඔවුන්ගේ විවිධ ඉදිකිරීම් සඳහා දාගැබේ ගර්භයේ ගඩොල් කොල්ල කා ඇති බවය. එම හේතුව නිසා ගර්භයේ වළක් සෑදෙන්නට ඇත. එම වළ පැවති තැන එක එල්ලේම මෙම ශෛලමය කරඬුව හමු වී ඇත. මෙම වළ හේතුවෙන් දාගැබේ ව්‍යුහයට යම් හානියක් සිදු වූ බැවින් ගර්භයේ විශාල කොටසක් කඩාගෙන මළුවට වැටී තිබුණි. එම කොටසේ මෙම ධාතූන් වහන්සේලා තැන්පත් කර තිබූ කරඬුව තිබුණු බවත් එය ධාතු ගර්භයේ තිබූ කරඬුවක් මිස වාහල්කඩින් හමු වූ එකක් නොවන බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අදහසයි.

ඒ අනුව වැඩි දුරටත් ප්‍රකාශ කළේ වාහල්කඩත් කරඬුවත් අතර කිසි සම්බන්ධතාවයක් නොමැති බවය. එමෙන්ම මෙම කරඬුවල නෙළුම් මල හා ශ්‍රී පාද ලකුණුවලින් බුදුන් වහන්සේ සංකේතවත් කරන බැවින් නිසැකවම මෙම ධාතූන් සර්වඥ ධාතූන් වහන්සේලා විය හැකිය යන්න මහාචාර්ය සෙනරත් දිසානායකගේ මතයයි.


ධාතූන් වහන්සේලා දැනට කච්චේරි භූමියේ සුරක්ෂිතව තැන්පත්කොට ඇති අතර ඉදිරියේදී සන්නස සහ ධාතු සහිත එක් කරඬුවක් මහජනතාව වෙනුවෙන් තබාගෙන ඉතිරි ධාතූන් දීඝවාපි දාගැබ පිළිසකර කොට නැවත තැන්පත් කිරීමට කටයුතු කරන බව පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රකාශ කළේය.



කැණීම් සිදු කෙරෙමින් පවතින අයුරු

රැක්ෂිලා වෙත්තමුණි

# ඉතිහාසයේ සැඟවූ උපුලිය හමුවෙයි



© Darsha Kapuge

**සීගිරි අසිරිය නොහොබිනා අතපෙවීමක් කොට බිම දැමූ අන්තවාදී දේශපාලනික ආගමිකයන්ගේ නොපනත්කමට මහ රහතුන් ඉඩ හළේ මන්ද? විජය කුමරුගේ සිට මහසෙන් කුමරු දක්වා ලක්රාජ කතා වත ලියා තබන විට සිංහලයාගේ පරම සතුරා ලෙස දුටුගැමුණු පෙන්නූ එළාරයන් ගැන පවා මැදහත්ව ලියූ මහානාම තෙරිඳු මේ උපුලි දුව ගැනවත් ලියා නොතැබුවේද?**

නිල් කමල් උපුල් ලියගේ ලවන් තුඩක රස රහසට ලොබ බැඳ එ රස ගී කියවමින් ඇවිද ගියෙමි. එවිට හද මැවුණේ උත්පලායය. ඒ අප දන්නා පුරාණතම උපුල් ලියය. තථාගතයාණන් වහන්සේගේ පාමුල නිවී පහන් ඇ තෙමේ වාම මහ රහත් තෙරණී වන්නීය . එ රහත් උපුලියව සිවුර ගලවා සළලෙකු දූෂණය කළ හද කම්පිත පුවත ඇසිල්ලේ සිහිවිය. දැන් ගල මුදුනට අව් රැල්ල විත් සන සැරේට රස්නය. ඒ කෝමළ ලාලිත පිය ගැට පියමැන ශෛල ගුහාවට වැදුණි. මම මහාවංශයේ තිස්නම වන පරිච්ඡේදයේ පහළව - දහසය ගාථා සිහි කළෙමි . ඒ එසේ නම් මම විත් සිටියේ මහානාම මහ රහතුන් වැඩ විසූ ලෙන තුළටය. තැනින් තැන අමුතු ලතාවෙන් තනිව රහස් ගැබ සඟවා ගත් ගුහා තලාව දිස්වේ. නිල් ගුවන් ගැබ නීල වා කැරළි ගොමුව නෙත රසින් පුරවයි. මොහොතින් කඩා හැලුනේ මහ වැස්සකි. ශෛල ගුහා පියස්ස මතට ඇද හැලෙන වැසි දිය ගයන්නේ අමුතු ගීයකි. එ ගීයත් ඈ වගේමය. තේරුම් ගත නොහැකි රහසකි. යළිත් උපුල් ලිය සිහිවේ. සැබවින්ම බුදුන්ගේ වාම දහරාවට නායකත්වය දුන් ස්ත්‍රී මහ තෙරණිය උපුලිය හෙවත් උප්පලවන්නාය. එවිට එ දහරාවේ පුරුෂ මහ තෙරිඳු කෝළිත හෙවත් මුගලන්ය. එ මුගලන්ද උපුලිය සේම උපුල් පැහැයේය. මම සොයන උපුලිය ද උපුල් පැහැයේය.

ඒ මියුරු පද අතරින් ඒ නදුන් සිත්තම් මැදින් ඈ සොයන්නට විමි. වඳින්නට කඳු තරණය කරන රටක බලන්නට නඟින එකම කන්ද මේ කන්දය .ඒ සීගිරියයි. සීගිරිය සිරිලක්දිව සිවු වන අගනුවරය. එනමුත් එකම එක රජෙක් විතරක්ම රජ පද සිරිත් දැරූ මෙරට දෙවන අගනුවර සීගිරියයි. එක රජෙක් රජ පදවි දැරූ ඊට පෙර නුවර තම්මැන්නා නුවරය. පුදුමය විජය රජු සිංහල රජ සිරිත ඇරඹූ තම්මැන්නා නුවරට දිගු රාජ යුගයක් විය නොහැකි වූ සැටිය . එ වගේම සිංහලයා ලෝකේ මුදුනට රැගෙන ගිය සීගිරියට ද දිගු ගමනක් රාජ්‍ය පාලනයේ හිඳින්නට බැරි වූ සැටිය. ඒත් විජයත් කාශ්‍යපත් අපට සිටින පරම රමණීය රොමැන්ටික් රජ සිරිත් දෙපළය. මේ රොමැන්ටික පෙම්වතුන් දෙදෙනාටම තම දරුවන්ට කිරුළ උරුම කර දෙන්න බැරි වූයේ පුදුම ලෙසය. ඒ අතින් තමන් තැනූ අගනුවරටත් තමන් තැනූ දරුවන්ටත් රාජ උරුමය උරුම කර දීමට මේ දෙන්නාම අපොහොසත් වූ හද කම්පිත හැඟුම්බර කථා වේදනාවට සිංහලයන් තවමත් ඇහුම්කන්දී ද නැත. මේ කිමදැයි සිතමි . වැස්ස තවත් දිගුව ගී ගයයි . සීගිරි මස්තකය පුරා ඒ දැකුම්කළු සුරතළිය උපුලි කුමරිය දුව පැන යන කළ මේ ගුහා ද්වාරය පාමුලට විත් උන්වහන්සේ බලා හිඳින්නට ඇත. සැබවින්ම රති සුව ඉහිරෙන කස්සපයන්ගේ බෞද්ධ රාජ පව්ව අසබඩට වී ලොවුතුරු දැහැන් වඩමින් උන්වහන්සේ කෙතරම් නිරාමිස ප්‍රීති සුවයක් විඳින්නට ඇත් ද . ඒත් විජයගෙන් පටන් ගෙන මහසෙන්ගෙන් මහාවංශය අවසන් කළ මහානාම තෙරිඳු කස්සප අරහයා වදනක් හෝ කොහේ නමුත් ලියා තිබිය යුතුයැයි සිතේ.

නිවන සාක්ෂාත් කරගත් මේ ඉතිහාසඥයා සීගිරි ආලකමන්දාවේ බවුන් වැඩුවේ නොවේනම් කුමටද? අඩුම තරමින් කැටපත් පවුරෙහි ඉතිහාස කවියක් නොලියා සිටියැයි කෙසේ සිතන්නද? . ඉතිහාසඥ කවියෙකු ගැදි පැදි පද ශූරයෙකු එලෙස නොකොට සිටිය හැකි යැයි කොහොම සිතන්නද? . රහතුන් වියතුන් මග නොයතත් මේ රහතුන්ට එවන් වියත් වත පුරන්නට හේතු වේ . ඒ සීගිරිය තම්මැන්නා නුවර සේ නොව භික්ෂු දේශපාලනයේ පළමු ලාංකික ගොදුර වූ නිසාය . සීගිරිය බිඳ දමන්නට අන්තවාදී දේශපාලනික ආගමිකයන්ගේ "පත්තනිකුජ්ජන කර්මය" සිදු කරන්නේ මහ රහත් මහනාහිමියන් එහි වැඩ විසූ සමයේය .

පියා මැරූ නිසා කස්සපයන්ට සඟුන් වහන්සේලා එරෙහි වූ බව කියයි . එසේ නම් තම පියාට ස්ත්‍රී සළු යවා චරිත ඝාතනය කළ දුටුගැමුණු හෝ බෝසත් සිරි සඟබෝ ඝාතනය කළ ගොළු අබා හෝ එක දිගට තම සැමියන් මරමින් රජ අසුන රති යහනක් කළ අනුලාව හෝ රජ බලයෙන් පහ කරන්නට අන්තවාදී දේශපාලනික ආගමිකයන් කි‍්‍රයා නොකළේ මන්ද? පත්තනිකුජ්ජන කර්මය" කළ දා පටන් ලක්දිව දේශපාලනය අසුරුවන මේ සඟුන් වහන්සේලාට ලොව මුදුනට යළිත් රට රැගෙන යාමට නොහැකි වූයේ කිමද . ගුහා දොරින් තුරුල් වැහි දිය රටාවකට ගලා වැටේ . එ මද වැහි වතුරින් මුහ සනසා ගෙන සීගිරිය වැව් ඉවුරට විත් සිතන විට යළිත් ඈ සිහි විය.

සීගිරි කාස්සප මැරුණු පසු ඔහු දුව උපුලියට කුමක් වුවාද? ශෛල මත ඇඳි සිත්තම් ගැන ඇති පදමට වාද සරුකර ඇතද උපුලිය ගැන සොයා බලන තරමට කරුණාවක් හෝ වුවමනාවක් නැත්තේ ඇයි දැයි සිතෙයි. ගල් තලාව පුරා සිත්තම්ව ඇති උපුල් මල් තවමත් නීල නිලිනව මේ කියාපාන්නේ උපුලි කුමරිය ගැන කඳුළු කථාවද? .

සීගිරි අසිරිය නොහොබිනා අතපෙවීමක් කොට බිම දැමූ අන්තවාදී දේශපාලනික ආගමිකයන්ගේ නොපනත්කමට මහ රහතුන් ඉඩ හළේ මන්ද? විජය කුමරුගේ සිට මහසෙන් කුමරු දක්වා ලක්රාජ කතා වත ලියා තබන විට සිංහලයාගේ පරම සතුරා ලෙස දුටුගැමුණු පෙන්නූ එළාරයන් ගැන පවා මැදහත්ව ලියූ මහානාම තෙරිඳු මේ උපුලි දුව ගැනවත් ලියා නොතැබුවේද? ඒ නිසා සොයන්නට ඉතිහාසයක් ඇති බැව් සිතමින් අතීතකාමයේ දිගු දුරක් ඇවිද යන පරහිතකාමී වෙහෙස ඇරඹිය යුතුයැයි සිතුණි . ගලින් හෙළට බැස හෙළින් වන වැද "වියවුල්" පොතට ආයේ එ බැවිණි . එ අන්තවාදී දේශපාලන ආගමිකයන් සෙත් පිරිත් කියවමින් දකුණු භාරතයෙන් ගෙන්වා ගත් මුගලන් කුමරු හා කස්සප රජ තෙමේ සටන ඇරඹූතැනය. වියවුලේ පෙත "වියවුල් පොත" ලෙස ඉතිහාස රිද්මයට අනුව පද ගත් වූ ගම් දොරය. එහි ඇති "සෙල් ලිපිය" කි‍්‍ර. ව. අටවන සියවසේය. ඒ කියන්නේ පස්වන සියවසට අයත් ගැටුමේ භූමියට අටවන සියවසේ විත් සතරවන කාශ්‍යප සෙල් ලිපියක් ලියා තබා යන්නේය. මේ කථාවේදි සිහි වන්නේ කාස්සප ඇරඹි රාජ නාම සිරිත කෙතරම් ජනපි‍්‍රය වුවාද යන්නය. ඒ කාස්සප නමින් ලක් සිහසුනට රජුන් අට දෙනෙකුම බිහිව ඇති නිසාය. මේ සිතුවිලි වියවුල් පොත දුටු කල උනන විට සිතුණේ මේ කස්සපලා අට දෙනා වෙනම අරන් කියවා බැලිය යුතුය කියාය. කස්සප පැරදවූ මුගලන් පෙරමුණට එරෙහිව ඒ සමයේ මතුවන මතවාදි රැල්ල මෙලෙස අට වතාවක් කස්සපලා අට දෙනෙකුම රජ සිරිතට ඔසවා තබා ඇත්තේ හරිම පුදුම විදියටය.

මේ අපූරු නාම රැල්ල ගැන සිතමින් සීත මාලිගාවේ උත්තර පස්සයට පිවිසීමි. එවිට දක්ෂිණ සීත මාලිගාව යළිත් දැක බලා ගන්නට සිතුණි. දකුණු උතුරු සීත මාලිගාවල නීල උත්පල - ශ්වේත උත්පල ලලිත ලියන් සමග කස්සපයන් තැනූ ඉසුරු බර ලෞකික රජ වරුණ සිහිවේ. සැබවින්ම අට වතාවක් කස්සප නමින් රජුන් බිහිව ඇත්තේ මේ ඉසුරු බර යුග මතකයේ ආනන්දයට වන්නට ඇත. මෙලෙස අපිට යළිත් ඇත්තේ අග්බෝලා නම දෙනෙකු සහ පරාක්‍රමබාහුලා අට දෙනකි. පරාක්‍රමබාහුලා රණ විරුවන්ය . අග්බෝලා සැදැහැවතුන්ය. කස්සපලා ලෞකික රසවතුන්ය . මේ කථාව සීත මාලිගාඋතුරු දොරටුවේදී සිහි වූ විට වැටහුණේ තවත් මතකයකි. එනම් සිංහලයන්ට අතීතයේ හිමිව තිබී ඇත්තේ දහරා තුනක් බවය. ඒ රණකාම දහරාව සැදැහැවත් දහරාව සහ ලෞකික දහරාවය. ඒත් සිංහලයන් දැන් බොහෝ කලක සිට රණකාම දහරාවද සැදැහැවත් දහරාවද වැළඳගෙන ලෞකික දහරාව බියෙන් සඟවාගෙන ඇත්තේය. ඒත් පුදුමය හැමදාමත් ආච්චිලා ද සීයලා ද අම්මලා ද තාත්තලා ද මාමාලා ද නැන්දලා ද අයියලා ද මල්ලිලා ද නංගිලා ද අක්කලා ද ගමේ පන්සලේ ලොකු හාමුරුවන් ද ඉස්කොලේ ලොකු සර්ලා ද සමග විත් සීගිරිය නරඹන නැරඹිල්ලය. අතීත ලලිත ලියගේ පයෝධර ද නිතඹ ද නැබ ද වසාරොද ද උකුල ද ළැම සහ මුවරදද දිගැස් ද බලා එකට විත් එකට ගලින් බැස රාග විරෝධී මත වපුරන වැපිරිල්ලය . ඒත් සිංහලයන් නොදන්නේ තමුන් ලොවේ පුදුම ජාතියක් වූයේ ලෞකික රාජ රැල්ලේ පිහිටෙන් බවය.

මේ නොදන්නා කම දන්නා කමක් නොවන්නේ මන්ද . මෙහෙම සිතාගෙන උපුල් වෙහෙර බලන්නට ගියෙමි . එය අද පිදුරංගල රජ මහ වෙහෙරයි නම් තබා ඇත . තම සාර දියණි උපුලි නමින් කස්සපයන් තැනූ වෙහෙරෙහි නමත් මැකී ගොස්ය . මේ වෙහෙරට ආ විට වැටහුණේ ලක් සිහසුන කාස්සපයන්ගේ දියණි උපුලිය අතට පත් වුවේ නම් සීගිරියෙන් ඔබ්බට ලක් රාජ කතාවත දිව යන දිගු ගමනය. ක්රි. ව. 898 දී සීගිරිය සිංහලෙන් අමතක කර දැම්මේය . ඉන් සියවස් හතක් හෙවත් වර්ෂ හත්සිය විසි හයක් ගෙවී ඉංග්‍රීසි ජාතික එච් .ෆෝබස් මෙහි යන තුරා සීගිරිය අමතක වූයේ මන්ද . පුදුමය කි‍්‍ර. ව. නමවන සියවසෙන් මෙපිට කිසිම රජෙක් සීගිරියට පා නොතැබුවේ මන්ද කියාය . ඒ අතර තුර සීගිරිය තම මිතුරන්ට පැවරූ සීගිරිය හා බැඳුනු එකම රජ සීතාවක රාජසිංහය . ඒ ඔහු ද එකළ අන්තවාදී දේශපාලනික ආගමිකයන්ගේ මාරක විරෝධයට හසු වූ රජු වූයේ ද දෛවෝපගත ලෙසය. මෙලෙස සිතා බලාගෙන ඇවිද යන කළ සිතුණේ සීගිරි මිතුරන් සොයා යන්නටය.

එවිට කැටපත් පවුරට විත් සීගිරි ලියන් ගැන කාම රාගී පද බැඳි යුරෝපීය මිතුරන් හමුවූයේ ඈත යුගයෙන්ය . ග්‍රීසියෙන් මිසරයෙන් මැසිඩෝනියාවෙන් විත් මේ කවි ගෙතූ අපරදිග රසවතුන් ගැන මෙනෙහි වූ විට පුදුමය මෙදත් සීගිරි හා බැඳුණු අපරදිග මිතුරු කැළ සිහිවූ විටය. ෆෝබස්, බෙල්, මැක්ස්මුලර්, හියු නෙවිල් සහ ගෛගර් වන් මෙම යුරෝ කේන්ද්‍රීය ජාන සිංහල රූ සිත්තම පද පොකුරු හා ගෘහ නිර්මාණ මෙපමණට වැලඳ ගත්තේ පුදුම ලෙසය. සැබවින්ම මේජර් ෆෝබස් තම සුකුමාල කුමාර ජීවිතය අතහැර සීගිරියට පෙම්බැන්දේය. බෙල් ශ්‍රීමතානෝ සීගිරියට තම දිවියෙන් විසි දෙවසරක් කැප කරමින් මියෙන තුරා ඒ හා කැපවූයේ ප්‍රේමණීයවය. මහත් පුදුමය දනවන්නේ කි‍්‍ර. ව. 1962 දී ලාංකික අමනයන් සීගිරි කුමරියන් තාර ගා දූෂණය කළ විට ඈ කුමරි බඹසර යළිත් පෑදුවේ ඉතාලි පුතෙකු වූ මොරේන්ච්වෝ වූ අසිරියය. මේ කථාව කොතරම් යුරෝ දිග ඇසුරින් පිරී ගියේද යත් ලෝක කලා සමුළු සියල්ලට සීගිරිය රැගෙන ගියේ යුරෝ වියතුන්ය .

කෙතරම් යුරෝ දේශීන් මේ විස්කමට හද බැඳ ගත්තේ ද යත් උපුලි කුමරිය ගැන අනුවේදනය මතු කරන්නේ ද ඒ අපරදිග සුර කුමරෙකි . ඒ ජර්මන් රාජ සිටු පුත්‍රයෙකු වූ වෙඩ්මන් කාට්ර් හිබන්සන්ය. ලක්දිව ලෞකික බුදුදහම සහ තාපස බුදු දහම අතර මතවාදී අරගලයට බිලිව උපුලි ද ඝාතනය වී ඇතැයි ඔහු ශෝක ගීයක් ලියන්නේ යුනෙස්කෝ සංස්කෘතික සඟරාවටය . මෙලෙස සීගිරි කාස්සපයන්ගේ දිගැස් මනකල් දැකුම්කළු දූ කුමරියට ලෝක දෙනෙත යා වන්නේ එලෙසය.

ඈ වෙනුවෙන් සීගිරි ගල මත නැග සියවස් ගණනාවක් කවි ගෙතූ හුදී ජන කවි කිවියන් පද බැඳි පද වැල් දැන් තෝරා බේරා ගත යුතුය. ඒ වෙනුවෙන් ආනන්ද කුමාරස්වාමින්ද, පරණවිතාරනයන් ද, ආචාර්ය බෙනිල් ප්‍රියන්ක සහ රාජා ද සිල්වා මෙන්ම කේ.ජයතිලකයන් ද විජමු ලොකුබණ්ඩාරයන් ද අරුත විනිස කළ පද අරුත් බලන්නට සීගිරි ගලින් බැසවිත් දැහැන් ගතවීමි . එවිට වැටහුනේ සීගිරි කස්සපයන්ට පසු තවත් කස්සපලා සත් දෙනකු රජ වුවද ඒ සියල්ලෝ ද උපුලි කුමරිය ඉතිහාසෙන් මකා දැමූ හැටිය . මෙහෙම සිතුන විට විජය රජුගේ නීල උපුල් පුත්‍ර ජීවහත්ථද කාස්සපගේ උපුලි දුවද ඉතිහාසෙන් මැකී යෑමෙන් මේ රජුන් දෙදෙනාම එකම තාලේ යැයි සිතුනි.

**සුජිත් අක්කරවත්ත**

# ගිහි ඇඳුමේ පළිරෝධ සහ සිවුරේ අනුසස්




*පසුගිය ලිපියෙන් අප අවධාරණය කළේ ග්‍රන්ථකරණයේ අනුසස් පිළිබඳවයි. සමාජයේ විවිධ තරාතිරම්වල වෙසෙන අවිවේකී ජනයාට විවෙකී විටෙක කියවා ධර්ම ඥානය දියුණු කර ගැනීම ගැන එහිදී සඳහන් විය. අද ලිපියෙන් අවධාරණය කෙරෙන්නේ ගිහි දිවියේ දුක් කම්කටොළු සහ පැවිදි දිවියෙහි අනුසස් පිළිබඳ පූජාවලී දෙවන පරිච්ඡේදයෙහි සඳහන් ලස්සන විවරණයකි. ගිහි දිවිය කිසිදා සැපක් නම් නොවන බව ඕනෑම කෙනෙකුගේ මතයයි. බකිංහැම් මාලිගාවෙහි වෙසෙන මහ රැජින ද වෙසෙනුයේ බොහෝ සංතාප මධ්‍යයේ විය යුතුය. ඩයනාගේ හදිසි මරණය එදා රජ ගෙදර ද සසළ කළෙහිය. අවශේෂ ගිහි ගෙවල් පිළිබඳ කවර කථාද? සම්බාධ නැති ගැටුම් නැති දුක් නැති ශෝක නැති ගිහි ගෙදරක් මෙම ලෝකයේ නොව පර සක්වලවත් නැත.*

සම්බාධ තරමක් හෝ අඩු තැනක් ලෙස බුදු හිමියන්ගේ නිර්දේශය වූයේ පැවිදි දිවියයි. පැවිදි දිවිය තරම් සරල නිදහස් දිවියක් මේ තුන් ලෝකයෙහි ම නැත. ගිහි දිවියෙහි ඇති කිසිදු සම්බාධයන් මෙහි නොමැත. ගිහි දිවියෙහි බර මොනරෙකුගේ පිල්බරට සමාන වන අතර පැවිදි දිවිය දියේ සැහැල්ලුවෙන් පීනා යන හංසයෙකුට උපමා කළේ එබැවිනි.

මිට අදාළ වැදගත් විග්‍රහයක් පූජාවලි කතුවරයා අපට ගෙනෙන්නේ බුදු හිමියන්ගේ බෝසත් ආත්ම විවරණයේදීය. සුමේධ තවුසා පිළිබඳ තොරතුරු අපට ලැබෙන්නේ දීපංකර නියත විවරණයේ ය. මහණ වනු කැමති සුමේධ තවුසන්ට මග කියන්නේ ද තවුස් පිරිකර පුදනු ලබන්නේ ද සක් දෙවිඳු විසිනි. ඒ මෙහොතෙහි තවුසාණන් විසින් තමන් ඇඳ සිටි ගිහි ඇඳුමෙහි දොස් නවයක් දකී.


මේ සළුව මාහැඟි බව තපසට එක් පළිරෝධයෙක. අනුන් නිසාම උපදවා ගැන්ම එක් පළිරෝධයෙක. වහා කිළිටි වීම එක් පළිරෝධයෙක. මාළු වීම එක් පළිරෝධයෙක. සිතූ විට නොලැබීම එක් පළිරෝධයෙක. තපසට අනංග වීම එක් පළිරෝධයෙක. සතුරන්ට සාධාරණ වීම එක් පළිරෝධයෙක. ඇඳීමෙන් මද වඩනා බව එක් පළිරෝධයෙක. ලෝබ වඩනා බව එක් පළිරෝධයෙක.

පූජාවලි කතු බුදුපුත් හිමියන් දක්වන මෙම කරුණු අදටත් අදාළය. ගිහි ඇඳුම සොයා ගැනීම දුෂ්කරය. කවර තරම් විසිතුරු ඇඳුම් මෝස්තර දවසින් දවස වෙළෙඳ පොළ ආක්‍රමණය කරන විට ඒවා අත්පත් කර ගැනීම අපහසුය. වහාම සේදිය යුතු වෙයි එමෙන්ම සෑම ගිහි ඇඳුමක්ම පාහේ මදය මානය වැඩි කරවයි. එසේම තණ්හාව වැඩි කරලන්නේ ද ඇඳුමමය. එහෙත් මේ කිසිදු පළිරෝධයක් සිව්රට නැත.ඇතැම් විට සිවුරට පළිරෝධය වන්නේ එය පොරවන්නාගේ අනුචිත බව අපවිත්‍ර බව නොගැළපෙන බව සහ කොටින්ම කිවහොත් පව්කාර බවය. සත් හැවිරිදි නිග්‍රෝධ සාමණේරයෝ අසූ හාර දහසක් මිනිසුන් මැරූ කෲර චණ්ඩාශෝකයන්ගේ වික්ෂිප්ත මනස සන්සුන් කළෙහුය. දහසක් මිනිසුන් මරා දැමූ අඟුල්මල් තෙරුන් මේ සිවුර දරා ගත් විට ප්‍රසව වේදනාවෙන් හඬන මවක ඉදිරියේ හද සසළ කරන්නට සමත් විය. ඒ පිංබර වුන් සිවුර දරා ගත් විට වෙනසයි. පූජාවලියෙහි සිව්රේ අනුසස් දොළහක් විවරණය වෙයි. කවරහ යත්,

මේ මාහැඟි නොවීම එක් ගුණයෙක. අනුන්ගෙන් උපදවා ගන්නක් නොවීම එක් ගුණයෙක. ස්ව හස්තයෙන් ම උපදවා ගත හැක්කේ එක් ගුණයෙක. වහා නොකෙළෙසෙන්නේ එක් ගුණයෙක. සොරුන් මීට ලෝභ නොකරන්නේ එක් ගුණයෙක. ගිය ගිය තැන සුලභව ලැබෙන්නේ එක් ගුණයෙක. තපසට ඉතා සරු බව එක් ගුණයෙක. අනුභව කරන්නාට කෙළෙස් නූපදීම එක් ගුණයෙක. ඉතා අල්පේච්ඡ බව එක් ගුණයෙක. අනුභවයට ලඝු වීම එක් ගුණයෙක. අනුන්ගෙන් නොඉල්වා ලැවීම එක් ගුණයෙක. නට කළ ලෝභ සිත් නූපදීම එක් ගුණයෙක.

මේ අනුව සිවුර මේ ලෝකයේ නොබැඳුණු වස්ත්‍රය වෙයි. මීය වඩා නිදහස් වස්ත්‍රයක් තවත් වෙයිද? සිවුරේ වටිනාකමක් නැත. එයට වටිනාකම එක් වන්නේ සුදුස්සෙකු එය පොරවා ගත් විටය. සිවුරක් මසා ගන්නට තමන්ටම හැකි වෙයි. පැරණි සම්ප්‍රදාය වූයේ එයයි. සිවුරක් ලෙහෙසියෙන් කෙලෙසා ලන්නට ද නොහැකිය. සොරුන් කිසිදා සිවුරු පැහැර ගෙන යන්නේ ද නැත. එසේම රාග දෝස මෝහාදී කෙළෙස් දුරු කරලීමට උචිතම වස්ත්‍රයයි. පරිහරණය ඉතා පහසු වන සිවුර අල්පේච්ඡ බවේද සංකේතයයි. භික්ෂුවට ඇත්තේ තුන් සිව්රයි. දෙපට සිවුර, තනිපට සිවුර හා අඳන සිවුරයි.

සිවුරක් දිරා ගිය විට එය භාවිතයෙන් ඉවත් නොකරයි. ආනන්ද හිමියන් කොසොල් රජුට කළ විග්‍රහයක දැක්වෙන්නේ පොරවන සිවුර පරණ වූ කල්හි යහනේ ඇතිරිල්ල බවට පත් කර ගන්නා බවයි. අනතුරුව බිම බුමුතුරුණක් කර ගන්නා බවයි. ඉන්පසු කුටියේ පාපිස්නාවට ගන්නා බවයි. එය දිරා ගිය කල දැලි පිහියෙන් කුඩාවට කපා මැටි සමග අනා කුටි සාදා ගන්නා බවයි. ලෝකයේ එලෙස පරිහරණය කෙරෙන වෙනත් ඇඳුමක් තවත් ඇත්ද? ප්‍රතිචක්‍රීකරණ සංකල්පය මුලින් ම ලොවට අනාවරණය කළෝ භික්ෂූන් වහන්සේලාය. නාගරික පංසලක මෙම කාර්ය මෙලෙස සිදු නොවූව ද ඈත ගමක හෝ අරණ්‍යයක තවමත් මෙම සංකල්පය දැකිය හැකිය. මේ අනුව පූජාවලිය විග්‍රහය රසබරය.( ලබන සතියට )



**මහාචාර්ය
අගලකඩ සිරිසුමන හිමි
සිංහල අංශය
කොළඹ විශ්වවිද්‍යාලය**

# ගුවනේ විසිරුණු සිහිමල් හීනය

නිල් අහසේ පියාසලමින් සිටි නිදහස් කුරුල්ලන් දෙස බලා උන් චූටි පුතා අම්මාගේ ඇකයට තුරුලු වූයේ කුරුල්ලකු වීමේ හීනය ගැන සුරතල් වදන් තෙපුලමිනි.

'අම්මේ මට කුරුල්ලෙක් වෙන්න ඕනෑ'

පුංචි ශාලින්ද කුරුල්ලෙකුගේ වෙස් ගෙන තැන තැන ඇවිද ගියේ පියාඹන සිරිය මවමිනි. ඒ දෙස බලා උන් අම්මා කවදාක හෝ තම පුතණුවන් උඩු ගුවනේ පියාසරනු දැකීම තම සිහිනය බවට පත්කර ගත්තාය. පවුලේ බාලයා ලෙස කෙළිදෙළෙන් හැදුණු වැඩුණු ශාලින්දට කවුරුත් ආදරයට කීවේ 'කුරුල්ලා' කියාය. ඇතැම් තැන්හි දී ශාලින්ද කුරුලු පැටියා වූයේ සැමගේම ආදරය සහ නොමඳ සුරතලයට බඳුන් වෙමිනි. කාලයාගේ ඇවෑමෙන් ශාලින්ද තම ගමන තෝරාගන්නේ ගුවන් නියමුවකු වීමේ අදිටන සිත තුළ දරාගනිමිනි.

ගුවන් නියමුවකුවීමේ සිහිනය පසුපස හඹා ගිය ශාලින්ද ගුවන් හමුදාව සමඟ එක්වන්නේ තම එකම බලාපොරොත්තුව සඵල කර ගැනීමේ අරමුණෙනි. සියලුදෙනාගේම සිත දිනාගත් පෞර්ෂවත් තරුණයකු වූ මේ පුංචි කුරුල්ලාට මිතුරන් ඇමතුවේ 'ශාලි' යන නමිනි. තමාගේ උඩු ගුවන් සිහිනය සාර්ථක කර ගැනීමට ශාලින්ද නිරතුරුවම වෙහෙසව කටයුතු කළ අයකු වූයේ සියලුදෙනාගේම සිත් දිනාගනිමිනි.

පුහුණු ගුවන් නියමු කැඩෙට් නිලධාරියකු වන අතර, ඔහු ත්‍රිකුණාමලය චීන වරාය ගුවන් හමුදා කඳවුරට අනුයුක්තව සේවය කළ අයෙකි. කෑගල්ල මාපිටිගම අලුත් වලව්වේ පදිංචි කේ. ආර්. ශාලින්ද විමුක්ති බණ්ඩාර අමරකෝන් වන ඔහු මිය යන විට 23 වෙනි වියේ පසුවිය. 2019 වසරේ ජනවාරි මස ගුවන් හමුදා සේවයට එක් වූ ශාලින්ද විමුක්ති බණ්ඩාර අමරකෝන් කෑගලු මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකි.

සිය සොඳුරු තාරුණ්‍ය මව්බිම වෙනුවෙන් කැප කළ අභීත රණවිරුවාගේ තොරතුරු සොයා 16 වනදා රුවන්වැල්ල, මාපිටිගම අලුත් වලව්ව වෙත ගියෙමු. අප එහි යන විටත් අවට ගම්වැසියන්, නෑදෑ හිතමිතුරන් තැන් තැන්වල එක්රොක් වූ ශාලින්දට වූ මේ හදිසි විපත පිළිබඳ කතාබහ කරමින් සිටිනු දක්නට ලැබුණි.

15 වනදා දහවල් කන්තලේ සූරියපුර ප්‍රදේශයේ දී ගුවන් අනතුරෙන් මිය ගිය ශාලින්ද විමුක්ති බණ්ඩාර අමරකෝන් ත්‍රිකුණාමලය චීන වරාය ගුවන් හමුදා කඳවුරට අනුයුක්තව සිටි අයෙකි. ඔහු පියාසර සැසි 84ක් අවසන්කොට ඇති අතර, තවත් පියාසර සැසි 4ක් නිම කිරීමට තිබී ඇත. ත්‍රිකුණාමලය චීන වරාය ගුවන් හමුදා කඳවුරෙන් දහවල් 10 ගුවන් යානය පිටත් වී ඇති අතර, ගුවන්ගත කර විනාඩි 15කට පමණ පසු එම ගුවන් යානය හා ප්‍රධාන මෙහෙයුම් මැදිරිය සමඟ පැවැති සම්බන්ධතා බිඳ වැටී තිබේ.

ඉන් පසුව සිදුවූයේ කුමක් දැයි දන්නේ ශාලින්දත්, හිස් අහසත්, වලාකුළුත් හැර ඔහු කුඩා කළ ආදරය කළ කුරුල්ලන් පමණි. ශාලින්ද පැදවූ ගුවන් යානය ගුවන් පථයෙන් නොපෙනී ගොස් තිබුණි. ශාලින්ද ජීවතුන් අතර ඇතැයි බොහෝදෙනකු අනුමාන කළ ද එය එතරම් සුබදායි සිහිනයක් නොවීය. බිමට පතිත වී කැඩී බිඳී ගිය ගුවන් යානයත්, එය තුළ වූ ශාලින්දගේ දේහයත් හමුවූයේ කුඹුරක වැටී තිබියදීය. ශාලින්දගේ කුරුලු සිහිනය බොඳ වූයේ එසේය. බොඳ වූ ශාලින්දගේ සිහිනය ගැන බොහෝ දෙනකු සිටින්නේ දැඩි කම්පාවෙනි.

"ගුවන් අනතුරෙන් මියගොස් සිටින්නේ මගේ එකම මල්ලී. එයා හරියට කුරුල්ලෙක් වගේ. අම්මා ආදරයට කීවේ කුරුල්ලා කියලා. පුංචි කාලේ ඉඳලම එයාට ආසාව තිබුණේ ගුවන් නියමුවෙක් වෙන්න.

ගුවන් නියමුවෙක් දැකලාවත් නැති කාලේම මල්ලී කීවේ මමත් කවදා හරි පයිලට් කෙනෙක් වෙනවා කියලා. එයාගේ ඒ සිහිනය සැබෑ කර ගන්න අපි ඉඩ දුන්නා. අපේ ගෙදර වීරයා මුළු රටේම වීරයා වෙලා.

ආයේ කවදාවත් එන්නේ නැති වෙන්න ඉගිලිලා ගියා. මදුරුවෙක්වත් මරන්නේ නැති මේ අහිංසකයා අපි දාලා යයි කියලා හිතාගන්න බෑ. මල්ලි අන්තිමට කතා කළේ 13 වෙනි ඉරිදා වීඩියෝ කෝල් එකක් අරන් එදා මම අම්මා, අක්කා එක්ක මල්ලි ගොඩක් වෙලා කතා කළා. අම්මා කීවා අවුරුදු 300 කට විතර පස්සේ නත්තල් තරුවක් දකින්න ලැබෙනවා කියලා. ඒක බලන්න එන්න නිවාඩුවක් ලැබෙයි නේද කියලාත් ඇහුවා.

එයා අපි ඔක්කෝමලා හිනස්සලා අපි එක්ක ගොඩක් වෙලා කතා කළා. අපි හිතුවේ නෑ මේ කතා කරන්නේ අන්තිම වතාවට ද කියලා. මල්ලිට එහෙම දෙයක් වුණේ කොහොමද කියලා අපිට හිතාගන්න බෑ.

ඒයා අපි එක්ක ජීවත් වෙනවා කියලා අපිට හිතෙන්නේ. එයා ගොඩක් අහිංසකයි. කිසිම කෙනෙක්ගේ හිත රිදවලා නෑ. මල්ලි නිවාඩු ආපුහම එයාගේ යාළුවෝ හැමදාම ඇවිල්ලා එයා එක්ක ඉන්නවා. එයා හැම කෙනාටම උදව් කළා. එයා පුහුණු කඳවුරේ සීනියර් මැන්. අපේ වීරයා මුළු ලෝකෙටම වීරයා වෙලා අපෙන් යන්න ගියා."

තම එකම මල්ලී වූ 'කුරුලු පැටියා' ලෝකයෙන්ම පියඹා නික්ම යෑම ගැන ඇයට ඇත්තේ වචනවලට පෙරළාගත නොහැකි කම්පනයකි. අවන්ති අමරකෝන් ශාලින්දගේ ලොකු අක්කාය. කුඩා කාලයේ වෙල් නියරවල දුව පැන ඇවිදිමින් කුරුල්ලකු වන්නට සිහින මැවූ ආදරණීය මල්ලීගේ නිසල වූ දේහය පිළිබඳ සිතමින් ඈ කඳුළු සලන්නීය. ඒ සහෝදරත්වයේ සැබෑ කඳුළකි.

තම එකම පුතු මෙලොවින් සමුගෙන ගිය වග ඒ අම්මා පිළිගන්නේ නැත. කොයි මොහොතක හෝ කුරුලු වේශයෙන් තම පුතණුවන් ඇකයට වඩිනු ඇතැයි ඒ අම්මා නොනිමි බලාපොරොත්තුවෙන් සිටින්නීය. ඈ බොහෝ අහස දෙස බලා සිටී. නැවත ගහකොළ දෙස බලයි. කුරුලු කූජනයට කන්දෙයි. ඒ අතර කුරුලු පැටියාට කතා කරයි. ඒ උත්තරීතර මව් සෙනෙහසක නොනිමෙනා ගුණයයි. ඒ අතර ඈ ශාලින්ද ගැන අතීත කතාන්දර කියයි.

"ඇයි දෙයියනේ මේ වගේ අහිංසකයෙකුට මෙවැනි විපතක් වුණේ. මගේ සුරතල් කුරුලු පැටියට මොකද මේ වුණේ. පුංචි කාලේ ඉඳලාම අහසේ ඉගිලෙන්න තමයි හීන මැවුවේ. ඒ හීනේ එයාට සැබෑ කර ගන්න ගුවන් හමුදාවට බැඳෙන්න අවසරය දුන්නා. මම හිතුවේ නෑ මගේ අහිංසක කුරුලු පැටියා අපිව දාලා ඉගිලිලා යයි කියලා. එයා හැම දේටම දක්ෂයෙක්, පුහුණු කඳවුරේ තුන්සියක් අතරින් පළවෙනියා එයා. මගේ පණ මට නැති වුණා."

අම්මා කෙනෙකුට තමාගේ දරුවා වියෝවීම ජීවිතය නැතිවන තරමටම දුකකි. ඒ දුක අතරින් ඈ තම පුතාගේ වීරත්වය ගැන හඬ නගමින්, හඬමින් කියන්නීය. ඒ හඬ අහස් කුස සිසාරා ඇදෙන්නේ ගිගුම් දෙමිනි. කුරුලු පැටියා යළි නොඑන්නටම යන්න ගොසිනි. අම්මා තවමත් අහස දෙස බලාගත්වනමය. ඒ නිල් අහසේ ගුවන් යානයක් ගමන් කරන සෑම මොහොතකදීම මේ අම්මාට ආදරණීය කුරුලු පැටියා මතක් වනු ඇත. හෙටත් මේ නිල් අහසේ ගුවන් යානා පියාසරනු ඇත. කුරුල්ලන් ඒ දෙස බලා සිටිනු ඇත. සියලුම දෙනාගේ සෝ සුසුම් මැද ශාලින්ද දැන් දිගු සුවදායී නින්දකය. ඒ නින්ද බිඳින්නට කුරුලු හඬට නොහැකිය.

**ප්‍රදීප් කුමාර ධර්මරත්න**



අනතුරට ලක් වූ ගුවන් යානය අසල සිටින ශාලින්ද




ශාලින්ද සිය සොහොයුරියන් දෙදෙනා සමඟ

**ගුවන් අනතුරෙන් මියගොස් සිටින්නේ මගේ එකම මල්ලී. එයා හරියට කුරුල්ලෙක් වගේ. අම්මා ආදරයට කීවේ කුරුල්ලා කියලා. පුංචි කාලේ ඉඳලම එයාට ආසාව තිබුණේ ගුවන් නියමුවෙක් වෙන්න. ගුවන් නියමුවෙක් දැකලාවත් නැති කාලේම මල්ලී කීවේ මමත් කවදා හරි පයිලට් කෙනෙක් වෙනවා කියලා. එයාගේ ඒ සිහිනය සැබෑ කර ගන්න අපි ඉඩ දුන්නා. අපේ ගෙදර වීරයා මුළු රටේම වීරයා වෙලා.**


මියගිය ශාලින්ද මව සමඟ











# ලංසු කැඳවීමයි

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

| 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|
| කලාප / අංශය / පළාත | ලංසු යොමු අංකය / අයිතම විස්තරය හා ප්‍රමාණය | ලංසු භාර ගන්නා අවසාන දිනය හා වේලාව | ලංසු පොත් මිලදී ගත හැකි කාර්යාලය සහ අදාළ අංකය | ලංසු පොතෙහි මිල (රුපි.) | ලංසු වර්ගය ICB/ NCB |
| **අමු ද්‍රව්‍ය** | | | | | |
| ජනන (මහවැලි සංකීර්ණය) | MC/UKTPS/2020/22 ඉහළ කොත්මලේ විදුලි බලාගාරය සඳහා 48V VRLA AGM වර්ගයේ බැටරි පද්ධතියක් ලබා ගැනීම | 2021/01/06 වන දින පැය 14.30 දක්වා. | ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය ,ඉහළ කොත්මලේ විදුලි බලාගාරය, ලංකා විදුලිබල මණ්ඩලය, ඉංජිනේරු ශවීන්ද්‍රනාත් ප්‍රනාන්දු මාවත, නියම්ගම්දෙර ,කොත්මලේ. දුරකථන: 0512233211 / 0777253216 / 0777253098 ෆැක්ස්: 0512233168 | 500.00 සියලුම ගෙවීම් මහවැලි සංකීර්ණයේ රැස්කිරීමේ ගිණුම් අංශයේ මහජන බැංකුවේ මූලස්ථාන ශාඛාවේ ගිණුම් අංක 204-2002-30085-134 ගිණුමට බැර කර අදාළ රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් 2021/01/05 දින දක්වා සතියේ වැඩ කරන දිනයකදී 9.15 පැය සිට 00:00 පැය දක්වා ලබා ගත හැක. | ජාතික තරඟකාරී ලංසු |
| සම්ප්‍රේෂණ | TR/AM&CM//NCB/2019/50/D සම්ප්‍රේෂණ අංශයට අයත් භාවිතයට ගනු නොලබන අබලි ද්‍රව්‍ය මිලදී ගෙන ඉවත් කර ගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම | 2020 දෙසැම්බර් 30. පෙ.ව. 10.00. ලං.වි.ම. සම්ප්‍රේෂණ ගබඩාව, ඕපාත, කොටුගොඩ | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වත්කම් කළමනාකරණ හා තත්ව අධීක්ෂණ (සම්ප්‍රේෂණ) කාර්යාලය, ලං.වි.ම., කෙන්ට් පාර, කොළඹ 09. (අබලි ද්‍රව්‍ය බැලීම සහ වැඩි විස්තර සඳහා අමතන්න 0112669738) | 3500.00 | NCB |
| බෙදාහැරීම් කලාප 01 කොළඹ නගරය | DGM(CC)/EE(MM)/PPC/2020/135 Supply & Delivery of Low Voltage Vertical Fuse Switch Disconnector for Feeder Pillars | 2021-01-06 10.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කොළඹ නගරය) කාර්යාලය, සිව්වන මහල, ලක්ෂ්මන් ගොඩනැගිල්ල 340, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 03 මගින් 2021-01-05 දිනට පෙර දුරකථන : 011-2575930 | රු.1000.00 | දේශීය |
| බෙදාහැරීම් අංශය - 1 (වයඹ) | ඩීජීඑම්/එන්ඩබ්පී/සීඊ/සීඑම්/ටී/2020/260 ගණකාධිකාරී (වියදම්) ඒකකය සඳහා වැටුප් පත්‍රිකා (Confidential Pay Advice) 25,000ක් මුද්‍රණය කර සපයා ප්‍රවාහනය කිරීම. | 2021 ජනවාරි 06 ප.ව 02.00 | ප්‍රධාන විදුලි ඉංජිනේරු (වාණිජ) කාර්යාලය, නාරම්මල පාර, ඇස්සැද්දුම, කුලියාපිටිය. 037 - 2281892 | 1,000.00 | NCB |
| අංශය- 2/ මධ්‍යම | CP/CE(COM)/PPC/2020/516 කටුගස්තොට සහ කුණ්ඩසාලේ ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු බල ප්‍රදේශයන් හි මනු කියවීම සඳහා පාරිභෝගික සම්බන්ධීකාරකවරුන්ගේ භාවිතයට ජංගම දුරකථන 88ක් සපයා භාරදීම. | 2021-01-06 දින ප.ව. 2.00 ට | ප්‍ර.ඉ. (වාණිජ) කාර්යාලය, ලංකා විදුලිබල මණ්ඩලය, අංක 04, අස්ගිරිය පාර, මහනුවර. දු.අ. 081-2234324, 081-4472724 | 1000.00 | NCB |
| බෙදාහැරීම් අංශය 3 (ඌව) | DGM(UVA)/CE(COM)/C1/2K20/101 රිදිමාලියද්ද නව පාරිභෝගික සේවා මධ්‍යස්ථානය සඳහා වායු සමීකරණ උපකරණ සැපයීම, සවි කිරීම සහ නඩත්තු කිරීම | 2021 ජනවාරි මස 06 වැනිද ප.ව. 03.00 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය ලංකා විදුලිබල මණ්ඩලය, අංක . 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ, බදුල්ල. දු.ක : 055 2222474 | 500.00 | NCB |
| බෙදාහැරීම් අංශය 3 (ඌව) | DGM(UVA)/CE(COM)/C1/ICB/2K20/006 විදුලි ඉංජිනේරු මහියංගනය ඒකකය සඳහා නව ත්‍රී රෝද රථයක් මිලදී ගැනීම සහ සැපයීම | 2021 ජනවාරි මස 27 වැනිද ප.ව. 03.00 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය ලංකා විදුලිබල මණ්ඩලය, අංක . 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ, බදුල්ල. දු.ක : 055 2222474 | 1000.00 | ICB |
| බෙදාහැරීම් අංශය 3 (ඌව) | DGM(UVA)/CE(COM)/C1/2K20/097 ඌව පළාත සඳහා ගිනි නිවන උපකරණ සැපයීම, බෙද ස්ථාපිත කිරීම හා නැවත පිරවීම | 2021 ජනවාරි මස 06 වැනිද ප.ව. 03.00 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය ලංකා විදුලිබල මණ්ඩලය, අංක . 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ, බදුල්ල. දු.ක : 055 2222474 | 500.00 | NCB |
| බෙදාහැරීම් අංශය 3 (ඌව) | DGM(UVA)/CE(COM)/C1/PS/2K20/103 ඌව පළාත සඳහා මීටර් 11 / කි.ග්‍රෑ. 850 පෙරැදි කොන්ක්‍රීට් කණු 100ක් මිලදී ගැනීම හා සැපයීම (ලං.වි.ම. පිරිවිතර 044-2:1997) | 2021ජනවාරි මස 06 වැනිද ප.ව. 03.00 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය ලංකා විදුලිබල මණ්ඩලය, අංක . 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ, බදුල්ල. දු.ක : 055 2222474 | 500.00 | NCB |
| බෙදාහැරීම් අංශය 3 (ඌව) | DGM(UVA)CE(COM)/C1/ 2K20/104 ඌව පළාත සඳහා අදුවෙනරු කට්ටල (36kV ) 600 ක් මිලදී ගැනීම සහ සැපයීම | 2021 ජනවාරි මස 06 වැනිද ප.ව. 03.00 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය ලංකා විදුලිබල මණ්ඩලය, අංක . 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ, බදුල්ල. දු.ක : 055 2222474 | 500.00 | NCB |
| බෙදාහැරීම් අංශය 3 (ඌව) | DGM(UVA)/CE(COM)/C1/2K20/106 මහියංගන ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය සඳහා ආරක්ෂිත සේප්පුවක් මිලදී ගැනීම සහ සැපයීම | 2021 ජනවාරි මස 06 වැනිද ප.ව. 03.00 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය ලංකා විදුලිබල මණ්ඩලය, අංක . 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ,බදුල්ල. දු.ක : 055 2222474 | 500.00 | NCB |
| බෙදාහැරීම් අංශය 3 (ඌව) | DGM(UVA)/CE(COM)//RC/2K20/107 ඌව පළාත සඳහා මීටර් 8.3 කි.ග්‍රෑ. 100 වැරකැවූ සැහැල්ලු කොන්ක්‍රීට් කණු 1000ක් මිලදී ගැනීම සහ සැපයීම (ලං.වි.ම. පිරිවිතර : 44-5:2017) | 2021 ජනවාරි මස 06 වැනිද ප.ව. 03.00 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය ලංකා විදුලිබල මණ්ඩලය, අංක . 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ, බදුල්ල. දු.ක : 055 2222474 | 500.00 | NCB |
| **ඉදිකිරීම්** | | | | | |
| බෙදාහැරීම් අංශය 3 (ඌව) | CW&B/DGM/Uva/10/2019 දියතලාව තෙමහල් ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය ඉදි කිරීම **සුදුසුකම්** : CIDA(ICTAD) ශ්‍රේණියේ C4 හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදිකිරීම් | 2021.01.14 දින 14.00 පැයට අවසන් කරනු ලැබේ. 2021.01.13 දින 13.00 පැය දක්වා ප්‍රසම්පාදන පත් නිකුත් කරනු ලැබේ. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සිවිල් වැඩ හා ගොඩනැගිලි) කාර්යාලය, ලංකා විදුලිබල මණ්ඩලය, 4 වන මහල, රජයේ ලිපිකරු සේවා සංගම් ගොඩනැගිල්ල, අංක. 90, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 දු.ක : 011 244 7567, 011 244 7568 | 15,000/- | NCB |
| **සේවා** | | | | | |
| ජනන අංශය (මහවැලි සංකීර්ණය) | රන්දෙණිගල නිවාස පෙදෙස්වලට 2021 සඳහා පෞද්ගලික ආරක්ෂක සේවයක් සැපයීම MC/RND/PT/2020/07 | 2021.01.13 14:00 පැය | ප්‍රධාන ඉංජිනේරු, රන්දෙනිගල විදුලි බලස්ථානය, ලංකා විදුලිබල මණ්ඩලය, තැ.පෙ. 05, රන්ටැඹේ. දුරකථන : 055-4929011, ෆැක්ස් : 055-2245755 විද්‍යුත් : cerdmc.gen@ceb.lk | රු.500.00 මහජන බැංකුව මූලස්ථාන ශාඛාවේ ලං.වි.ම. මහවැලි සංකීර්ණයේ රැස්කිරීමේ ගිණුම් අංක: 204-2002-30085-134 ගිණුමට බැර කර ලදුපත ඉදිරිපත් කළ යුතුය. | NCB |
| ජනන අංශය (තාපබල සංකීර්ණය) | TC/KPS/ME(FS)/2020/08/811/3210 කැළණිතිස්ස බලාගාරයේ GT Fr V අදියර II ඉන්ධන සැපයුම් තළය සැපයීම හා ස්ථාපිත කිරීම | 2020.01.06 දින 14:00 පැයට | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලය (තාපබල සංකීර්ණය), ලංවිම, ජනන මූලස්ථානය, නව කැළණි පාලම පාර, 10600, කොලොන්නාව. දු.ක.: 011-2437426, 011-2423897 | රු. 1,500.00 | NCB |
| බෙදාහැරීම් කලාප 01 කොළඹ නගරය | DGM(CC)/CE(C&CS)/PPC/2020/142 නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කොළඹ නගර) කාර්යාලයට අනුයුක්ත ප්‍ර.ඉ (බලශක්ති කළමනාකරණ) ඒකකය සඳහා කුලී වෑන්රථයක් ලබා ගැනීම (වසර 02 ක් සඳහා) | 2021-01-06 10:00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කොළඹ නගරය) කාර්යාලය, සිව්වන මහල, ලක්ෂ්මන් ගොඩනැගිල්ල 340, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 03 මගින් 2021-01-05 දිනට පෙර දුරකථන : 011-2575930 | රු.1,000.00 | දේශීය |

| 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|
| කළාප / අංශය / පළාත | ලංසු යොමු අංකය /<br>අයිතම විස්තරය හා<br>ප්‍රමාණය | ලංසු<br>භාර ගන්නා අවසාන<br>දිනය හා වේලාව | ලංසු පොත් මිලදී ගත හැකි කාර්යාලය සහ<br>අදාළ අංකය | ලංසු<br>පොතෙහි<br>මිල (රුපි.) | ලංසු<br>වර්ගය<br>ICB/<br>NCB |
| බෙදාහැරීම් අංශය - 1<br>(වයඹ) | ඩීජීඑම්/එන්ඩබ්පී/සීඊසීඑම්/ටී/2020/266<br>ප්‍රධාන විදුලි ඉංජිනේරු (හලාවත)<br>කාර්යාලයට අයත් විදුලි අධිකාරී (වාණිජ)-II සඳහා<br>කුලී පදනම මත<br>වෑන් රථයක් ලබා ගැනීම. | 2021 ජනවාරි 06<br>ප.ව 02.00 | ප්‍රධාන විදුලි ඉංජිනේරු (වාණිජ) කාර්යාලය,<br>නාරම්මල පාර, ඇස්සැද්දුම, කුලියාපිටිය.<br>037 - 2281892 | 1,000.00 | NCB |
| බෙදාහැරීම් අංශය - 1<br>(වයඹ) | ඩීජීඑම්/එන්ඩබ්පී/සීඊසීඑම්/ටී/2020/270<br>මදුරන්කුලිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය සඳහා<br>මදුරන්කුලිය නගර සීමාව තුළින්<br>ජලය, විදුලිය, දුරකථන, මාර්ග පහසුකම් සහිත<br>වර්ග අඩි 2,500 නොඅඩු ගොඩනැගිල්ලක් සහිත<br>පර්චස් 40 කට<br>නොඅඩු ඉඩමක්<br>කුලී හෝ බදු පදනම මත ලබා ගැනීම. | 2021 ජනවාරි<br>06<br>ප.ව 02.00 | එම | 1,000.00 | NCB |
| බෙදාහැරීම් අංශය - 1<br>(වයඹ) | ඩීජීඑම්/එන්ඩබ්පී/සීඊසීඑම්/ටී/2020/298<br>මානව සම්පත් නිලධාරී (වයඹ) සඳහා<br>කුලී පදනම මත මෝටර් රථයක් ලබා ගැනීම. | 2021 ජනවාරි 06<br>ප.ව 02.00 | එම | 1,000.00 | NCB |
| අංශය- 2/ මධ්‍යම | CP/CE(COM)/PPC/2020/495<br>ප්‍රධාන ඉංජිනේරු (බෙදාහැරීම් නඩත්තු) ම.ප.<br>ඒකකය සඳහා කුලී පදනම මත වසර 02ක කාලයකට<br>වෑන් රථයක් ලබා ගැනීම. | 2021-01-06 දින<br>ප.ව. 2.00ට | ප්‍ර.ඉ. (වාණිජ) කාර්යාලය, ලංකා විදුලිබල මණ්ඩලය,<br>අංක 04, අස්ගිරිය පාර, මහනුවර.<br>දු.අ. 081-2234324, 081-4472724 | 1000.00 | NCB |
| අංශය- 2/ මධ්‍යම | CP/CE(COM)/PPC/2020/518<br>නාවලපිටිය ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු<br>කාර්යාලය පවත්වාගෙන යාම සඳහා<br>බදු / කුලී පදනම මත පහත සඳහන්<br>පහසුකම් සහිත ගොඩනැගිල්ලක්<br>වසර 02ක කාලයකට ලබා ගැනීම.<br>නාවලපිටිය නගරයට ආසන්න විය යුතුය.<br>වර්ග ප්‍රමාණය ව.අ. 4800කට නොඅඩු වීම.<br>සැහැල්ලු වාහන 04ක් නවතා තැබිය හැකි ස්ථානයක් වීම.<br>ජලය, විදුලිය, දුරකථන සහ සනීපාරක්ෂක<br>පහසුකම් තිබිය යුතුය. | 2021-01-06 දින<br>ප.ව. 2.00ට | තමා විසින් සකස් කරගත් අයදුම්පතක බලාපොරොත්තු වන කුලිය සහ<br>ගොඩනැගිල්ලේ සියලු විස්තර සඳහන් කර එවන්න.<br>දු.අ. 054-2222363 | | NCB |
| අංශය- 2/ මධ්‍යම | CP/CE(COM)/PPC/2020/519<br>ගලගෙදර ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු බල ප්‍රදේශයට අයත්<br>හතරලියද්ද වි.පා.සේ. මධ්‍යස්ථානයේ විදුලි අධිකාරී නිල නිවස<br>සඳහා පහත සඳහන් අවශ්‍යතාවන් සහිත<br>නිවසක් කුලී / බදු පදනම මත වසර 02ක<br>කාලයක් සඳහා ලබා ගැනීම.<br>හතරලියද්ද වි.පා.සේ.මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ පිහිටා<br>තිබිය යුතුය.<br>අවම වශයෙන් කාමර 03කින් සමන්විත විය යුතුය.<br>ජලය, විදුලිය, දුරකථන පහසුකම් තිබිය යුතුය.<br>වාහන නවතා තැබිය හැකි පහසුකම් තිබිය යුතුය.<br>නිවස වටා ආරක්ෂිත වැටක් හෝ<br>තාප්පයක් තිබිය යුතුය. | 2021-01-06 දින<br>ප.ව. 2.00ට | තමා විසින් සකස් කරගත් අයදුම්පතක බලාපොරොත්තු වන මාසික කුලිය සහ<br>ඉඩමේ සියලු විස්තර සඳහන් කර එවන්න.<br>දු.අ. 081-2374283<br>දු.අ. 081-4949191 | | NCB |
| බෙදාහැරීම් අංශ 02<br>(බපළ) | DGM/WPN/DIV/EC4/2020-02<br>මීරිගම පාරිභෝගික සේවා මධ්‍යස්ථානයේ විදුලි අධිකාරී නිල<br>නිවස අළුත්වැඩියා කිරීම. | 2020-12-31<br>ප.ව 2.00 දක්වා | විදුලි ඉංජිනේරු,<br>ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය,<br>ලංකා විදුලිබල මණ්ඩලය,<br>කොළඹ පාර,දිවුලපිටිය.<br>දු.ක. 031-2243096, ෆැක්ස් 031-2243026 | 1,000.00 | දේශීය |
| බෙදාහැරීම් අංශ 02<br>(බපළ) | WPN/NCB/COM - V02/2020/151<br>නෙත් බදු කුලී පදනම මත මෝටර් රථයක් ලබා ගැනීම.<br>(රියදුරු සහිතව) ප්‍රධාන ඉංජිනේරු -වාණිජ | 2020-12-30<br>ප.ව 2.00 දක්වා | නි.සා. (බපළ) කාර්යාලය, ලං.වි.ම., නො. 280, නුවර පාර, කිරිබත්ගොඩ.<br>දු.ක. 011-2911071/72 | 500.00 | දේශීය |
| බෙදාහැරීම් අංශ 02<br>(බපළ) | WPN/NCB/D -V09/2020/152<br>නෙත් බදු කුලී පදනම මත මෝටර් රථයක් ලබා ගැනීම.<br>(රියදුරු සහිතව) විදුලි ඉංජිනේරු -දිවුලපිටිය | 2020-12-30<br>ප.ව 2.00 දක්වා | නි.සා. (බපළ) කාර්යාලය, ලං.වි.ම., නො. 280, නුවර පාර, කිරිබත්ගොඩ.<br>දු.ක. 011-2911071/72 | 500.00 | දේශීය |
| බෙදාහැරීම් අංශ 02<br>(බපළ) | WPN/NCB/J-V130/2020/153<br>නෙත් බදු කුලී පදනම මත වෑන් රථයක් ලබා ගැනීම. ප්‍රාදේශීය<br>නඩත්තු ඒකකය (ප්‍රධාන ඉංජිනේරු - ජා-ඇල) | 2020-12-30<br>ප.ව 2.00 දක්වා | නි.සා. (බපළ) කාර්යාලය, ලං.වි.ම., නො. 280, නුවර පාර, කිරිබත්ගොඩ.<br>දු.ක. 011-2911071/72 | 500.00 | දේශීය |
| බෙදාහැරීම් අංශ 02<br>(බපළ) | WPN/NCB/J-V129/2020/154<br>නෙත් බදු කුලී පදනම මත කෲ කැබ් රථයක් ලබා ගැනීම.<br>ප්‍රධාන විදුලි ඉංජිනේරු කාර්යාලය- ජා-ඇල | 2020-12-30<br>ප.ව 2.00 දක්වා | නි.සා. (බපළ) කාර්යාලය, ලං.වි.ම., නො. 280, නුවර පාර, කිරිබත්ගොඩ.<br>දු.ක. 011-2911071/72 | 500.00 | දේශීය |
| බෙදාහැරීම් අංශ 02<br>(බපළ) | WPN/NCB/DGM-V47/2020/155<br>නෙත් බදු කුලී පදනම මත වෑන් රථයක් ලබා ගැනීම.<br>ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (වාණිජ) | 2020-12-30<br>ප.ව 2.00 දක්වා | නි.සා. (බපළ) කාර්යාලය, ලං.වි.ම., නො. 280, නුවර පාර, කිරිබත්ගොඩ.<br>දු.ක. 011-2911071/72 | 500.00 | දේශීය |
| බෙදාහැරීම්<br>අංශය 3 (ඌව) | DGM(UVA)/CE(COM)/DEO1/HV-35/DI-<br>02/2K20/79<br>විදුලි ඉංජිනේරු (දියතලාව) ඒකකයේ විදුලි අධිකාරී (වාණිජ)<br>වෙත කුලී පදනම මත වසර දෙකක් සඳහා වෑන් රථයක්<br>ලබාගැනිම | 2021 ජනවාරි මස 06 වැනිද<br>ප.ව. 03.00 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය<br>ලංකා විදුලිබල මණ්ඩලය,<br>අංක . 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ, බදුල්ල.<br>දු.ක : 0552222474 | 500.00 | NCB |
| බෙදාහැරීම්<br>අංශය 3 (ඌව) | DGM(UVA)/CE(COM)/<br>HV-121/DI-07/2K20/80<br>විදුලි ඉංජිනේරු (දියතලාව) ඒකකයේ ඇල්ල පා.සේ.ම. වෙත<br>කුලී පදනම මත වසර දෙකක් සඳහා ත්‍රී රෝද රථයක් ලබා<br>ගැනිම | 2021 ජනවාරි මස 06 වැනිද<br>ප.ව. 03.00 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය<br>ලංකා විදුලිබල මණ්ඩලය,<br>අංක . 04, ස්ප්‍රිංවැලි පාර,<br>හිඳගොඩ, බදුල්ල. දු.ක : 0552222474 | 500.00 | NCB |
| බෙදාහැරීම්<br>අංශය 3 (ඌව) | DGM(UVA)/CE(COM)/<br>HV-124/DI-10/2K20/81<br>විදුලි ඉංජිනේරු (දියතලාව) ඒකකයේ ඇල්ල පා.සේ.ම. වෙත<br>කුලී පදනම මත වසර දෙකක් සඳහා ලොරි රථයක් ලබා<br>ගැනිම | 2021 ජනවාරි මස 06 වැනිද<br>ප.ව. 03.00 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය<br>ලංකා විදුලිබල මණ්ඩලය,<br>අංක . 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ, බදුල්ල.<br>දු.ක : 0552222474 | 500.00 | NCB |
| බෙදාහැරීම්<br>අංශය 3 (ඌව) | DGM(UVA)/CE(COM)/<br>HV-122/DI-08/2K20/82<br>විදුලි ඉංජිනේරු (දියතලාව) ඒකකයේ ඇල්ල<br>පා.සේ.ම. වෙත කුලී පදනම මත වසර දෙකක් සඳහා<br>කෲ කැබ් රථයක් ලබා ගැනිම | 2021 ජනවාරි මස 06 වැනිද<br>ප.ව. 03.00 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය<br>ලංකා විදුලිබල මණ්ඩලය,<br>අංක . 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ, බදුල්ල.<br>දු.ක : 0552222474 | 500.00 | NCB |
| බෙදාහැරීම්<br>අංශය 3 (ඌව) | DGM(UVA)/CE(COM)/<br>HV-88/BD-13/2K20/83<br>විදුලි ඉංජිනේරු (මහියංගනය) ඒකකයේ කන්දකැටිය<br>පා.සේ.ම. වෙත කුලී පදනම මත වසර දෙකක් සඳහා<br>ත්‍රී රෝද රථයක් ලබා ගැනිම | 2021 ජනවාරි මස 06 වැනිද<br>ප.ව. 03.00 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය<br>ලංකා විදුලිබල මණ්ඩලය,<br>අංක . 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ, බදුල්ල.<br>දු.ක : 0552222474 | 500.00 | NCB |
| බෙදාහැරීමේ අංශය -03<br>(සබර) | ටෙන්ඩර් අංකය:<br>SAB/CE(COM)/SS/2020/16<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාල සංකීර්ණය සඳහා<br>වසර 01 ක කාලයකට පෞද්ගලික ආරක්ෂක<br>සේවාව ලබා ගැනීම. | 2021-01-06<br>ප.ව.2.00 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සබරගමුව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය,<br>ලං.වි.ම., නව නගරය, රත්නපුර.<br>045-2225891-5, ෆැක්ස්. 045-2226084 | 1,000.00 | NCB |
| බෙදාහැරීම් අංශ 4<br>(දකුණු පළාත) | නි.සා.(ද.ප.)/ලි2/කුලී වාහන/2020/83<br>ප්‍රධාන ඉංජිනේරු (බෙදාහැරීම් නඩත්තු ) - වෑන් 03 | 2021.01.06<br>ප.ව.2.00 | නි.සා.(ද.ප.) කාර්යාලය, ලං.වි.ම., අංක.167,<br>මාතරපාර, ගාල්ල.<br>දු.අං. 091-2232095, 091-2232058 | 500.00 | NCB |
| කලාප 04<br>(දකුණු<br>පළාත) | දප/ගා/ලි3/තවලම වි.අ.නි.නි./2020/11<br>ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු ගාල්ල කාර්යාලයට අයත්<br>තවලම පා.සේ.ම.හි විදුලි අධිකාරී නිල නිවස සඳහා<br>වසර 02 ක කාලයක් සඳහා අවම<br>වශයෙන් ව.අ. 2000ට නොඅඩු විදුලිය,<br>ජලය හා වාහන නැවැත්වීමේ පහසුකම් සහිත නිවසක් තවලම<br>හෝ<br>නෙළුව ප්‍රාදේශීය සභා සීමාව තුළින්<br>කුලී පදනම මත ලබා ගැනීම. | 2020.12.30<br>ප.ව.2.00 | ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය.<br>ලංකා විදුලිබල මණ්ඩලය,<br>නො. 187/3, බණ්ඩාරනායක පෙදෙස, ගාල්ල<br>දු.ක - 09122-34344 | 500.00 | NCB |

| 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|
| කළාප / අංශය / පළාත | ලංසු යොමු අංකය / අයිතම විස්තරය හා ප්‍රමාණය | ලංසු භාර ගන්නා අවසාන දිනය හා වේලාව | ලංසු පොත් මිලදී ගත හැකි කාර්යාලය සහ අදාළ අංකය | ලංසු පොතෙහි මිල (රුපි.) | ලංසු වර්ගය ICB/ NCB |
| කලාප 04 (දකුණු පළාත) | දප/අකු/ලි6/පවිත්‍රතා/2020/0221 අකුරැස්ස ප්‍රාදේශීය ප්‍රධාන විදුලි ඉංජිනේරු කාර්යාලය සහ වැලිගම, අකුරැස්ස, දෙනියාය, මොරවක පා.සේ.ම. හා පස්ගොඩ උප පා.සේ.මධ්‍යස්ථානය සඳහා පවිත්‍රතා කටයුතු සේවා සපයා ගැනීම. | 2020.12.30 ප.ව. 02.00 | ප්‍රධාන ඉංජිනේරු, ප්‍රාදේශීය ප්‍රධාන විදුලි ඉංජිනේරු කාර්යාලය, ලංකා විදුලිබල මණ්ඩලය, අංක.08, යාකබැද්ද පාර, අකුරැස්ස. | 1,000.00 | NCB |
| වත්කම් කළමනාකරණ (සිවිල් වැඩ හා ගොඩනැගිලි) | CW&B/DGM/JS/06/2020 රජයේ ලිපිකරු සේවා සංගම් ගොඩනැගිල්ලේ ස්ථාපිත ලංකා විදුලිබල මණ්ඩලයේ ශාඛා සඳහා වසරක කාලයක් වෙනුවෙන් ගොඩනැගිල්ල තුළ සනීපාරක්ෂක හා පවිත්‍රතා සේවා සැපයීම **සුදුසුකම්** : ටෙන්ඩර් පතෙහි කොන්දේසිවල සඳහන් කර ඇති පරිදි | 2021-01-07 දින ප.ව. 2.00ට 2021-01-06 දින මධ්‍යාහ්න 12.00 දක්වා ප්‍රසම්පාදන පත් නිකුත් කරනු ලැබේ. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සිවිල්වැඩ හා ගොඩනැගිලි) කාර්යාලය, ලංකා විදුලිබල මණ්ඩලය, 4 වන මහල, රජයේ ලිපිකරු සේවා සංගම් ගොඩනැගිල්ල, අංක : 90, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02. 011 244 7567, 011 244 7568 | 500.00 | NCB |

ලංකා විදුලිබල මණ්ඩලය වෙනුවෙන් සපයාගැනීම් කමිටුවේ සභාපති විසින් හැකියාවැති සැපයුම්කරුවන් වෙතින්, ජාත්‍යන්තර / ජාතික තරගකාරී ලංසු ඉදිරිපත් කිරීමේ පදනම මත මුද්‍ර, තබන ලද ලංසු කැඳවන අතර,එම ලංසු ඉදිරිපත් කළ යුත්තේ ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් මිලදී ගන්නා ලද ලංසු පොත් පමණක් උපයෝගී කරගෙනය.

අපේක්ෂිත ලංසු ඉදිරිපත් කරන්නන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට පමණක් ලංසු පොත් නිකුත් කරනු ලැබේ. අවශ්‍ය වූ විටක ඔවුන් 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතට අනුකූලව ලියාපදිංචි විය යුතුය.

ලංසු භාර ගන්නා අවසාන දිනයට කලින් දින දක්වා සෑම ලංසු පොතක් වෙනුවෙන්ම ඉහත 6 වන තීරුවේ සඳහන් මුදල ගෙවා ලංකා විදුලිබල මණ්ඩලයේ අදාළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී / ප්‍රධාන ඉංජිනේරු වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මගින් 0900 පැය සිට 1500 පැය දක්වා සාමාන්‍ය වැඩ කරන දිනයන් තුළ මිලදී ගත හැක. මේ සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී නමින් ලියන ලද බැංකු අණකරයක් මගින් හෝ මුදල් මගින් හෝ ගෙවිය හැක.

විදේශීය තානාපති කාර්යාල /වෙළඳ කොමිෂන්වලට, ලංසු පොත්වල තොරතුරු පිටපත් ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අදාළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී / ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ දී නොමිලේ ලබා ගත හැක. එමෙන්ම ලංසු පොත් අපේක්ෂිත ලංසු ඉදිරිපත් කරන්නන් හා ඔවුන්ගේ නියෝජිතයින්ට අදාළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී / ප්‍රධාන ඉංජිනේරු කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂා කළ හැක.

ලංසු ඉදිරිපත් කරන්නන් හෝ ඔවුන්ගේ අනුමැතිය ලත් නියෝජිතයින් ඉදිරිපිටදී ඉහත තීරු අංක 9 හි සඳහන් ස්ථානයන්හිදී ලංසු භාරගැනීම අවසන් කරන වේලාවේදීම, එසේ ඉදිරිපත් කරන ලද සියලුම ලංසු විවෘත කරනු ලබන අතර, ප්‍රමාදව ඉදිරිපත් කරනු ලබන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මීට අදළ සියලු විස්තර හා පැහැදිලි කිරීම් විමසිය යුත්තේ ලංසු පොත් නිකුත් කරනු ලබන ලංකා විදුලිබල මණ්ඩලයේ අදළ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන ඉංජිනේරු වෙතිනි.

✷ ICB - **අන්තර්ජාතික තරගකාරී ලංසු**, NCB - **දේශීය තරගකාරී ලංසු**

**සාමාන්‍යාධිකාරී**

ටෙන්ඩර් අයිතමයන් සඳහා අදාළ තොරතුරු පිටපත් **www.ceb.lk** නිල වෙබ් අඩවියෙන් භාගත කරගැනීමට හැකිය.

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

විදුලිබලයෙන් සැසිරීමත් දිවියක්

# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## ලංසු සඳහා ආරාධනයයි (IFB)

01. ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත දැක්වෙන අයිතම සඳහා යෝග්‍යතාපූර්ණ සුදුසුකම්ලත්, ලංසුකරුවන් වෙතින් මුද්‍ර, තබන ලද ලංසු දැන් කැඳවනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | ටෙන්ඩරයේ නම | ලංසු සුරක්ෂණය (ඇපකරය) (රුපියල්) | (වැට් (VAT) ඇතුළුව) ලංසු ලිපිලේඛන ගාස්තුව (රුපියල්) | භාර ගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|
| CMS/LP/19/PT/11/057 | 15 Nos. Motor Tyres 18.00 x 25 Tubeless 40 PLY for Mitsui Paceco RTGCS | 90,000.00 | 1,000.00 | 24.12.2020 13.30 පැය |
| CMS/LP/20/PT/04/056 | Motor Tyres 1000 x 20 16 PLY (Croos PLY) - 100 Nos. | 35,000.00 | 1,000.00 | 24.12.2020 13.30 පැය |

02. රුපියල් මිලියන 5 ඉක්මවන ටෙන්ඩර් සඳහා 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතේ වන විධිවිධාන අදළ වන බව ලංසුකරුවන්ට මෙයින් දැනුම් දෙනු ලැබේ. ඒ අනුව කොන්ත්‍රාත්තුවේ මුළු කාලය පුරාම, එකී පනත අනුවම බැඳී කටයුතු කරන ලෙස ඉහත සඳහන් ටෙන්ඩරය හා සම්බන්ධව සියලු පාර්ශ්වයන් වෙතින් ඉල්ලා සිටිනු ලැබේ. තවද, ඕනෑම විදේශීය නිෂ්පාදකවරයෙකුගේ හෝ සැපයුම්කරුවෙකු සඳහා හෝ වෙනුවෙන්, ඒජන්තවරයෙකු, උප-ඒජන්තවරයෙකු, නියෝජිතයෙකු හෝ නම් කරන ලද අයෙකු ලෙස කටයුතු කිරීමට කැමැත්තක් දක්වන ඕනෑම ලංසුකරුවෙකු පොදු කොන්ත්‍රාත්තු රෙජිස්ට්‍රාර් හා ලියාපදිංචි වී ස්වකීය ලංසු ලිපිලේඛන සමග තිසි පරිදි සම්පූර්ණ කරන ලද ලියාපිදංචි කිරීමේ සහතිකය ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.
03. ලංසුකරුවන් අවම වශයෙන් පසුගිය වසර තුන (3) ක කාලය තුළ සමාන ස්වභාවයේ භාණ්ඩ සැපයීමේ ව්‍යාපාරයක නිරත වී සිටිය යුතුය.
04. අභිලාෂී ලංසුකරුවන්හට, වැඩිදුර විස්තර තොරතුරු ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ) වෙතින් ලබාගත හැකිවන අතර, ලංසු ලිපිලේඛන කාර්යාල වේලාවන් තුළ පහත දැක්වෙන ලිපිනයේදී පරීක්ෂා කර බැලිය හැකිය.
05. අභිලාෂී ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් පහත සඳහන් ලිපිනයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා 04 වන තීරුවේ සඳහන් ආපසු ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව, 2020 දෙසැම්බර් 18 වන දින සිට ලංසු භාරගන්නා අවසාන දිනට පෙර දින දක්වා, රාජකාරී දිනවලදී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා මිලදී ගත හැකිය. ගෙවීමේ ක්‍රමය මුදලින් වනු ඇත.
06. ලංසු, එම ලංසු භාරගන්නා අවසාන වේලාවට පෙර ලැබෙනසේ පහත සඳහන් ලිපිනයට භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ. ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම පහත සඳහන් ලිපිනයේදී පැමිණ සිටින ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේදී විවෘත කරනු ලැබේ. සියලුම ලංසු සමග ඉහත සඳහන් වටිනාකමට වන ලංසු සුරක්ෂණයක් (ඇපකරයක්) ද ඉදිරිපත් කළ යුතුය.

**ප්‍රධාන කළමනාකරු (සැපයුම් හා ද්‍රව්‍ය කළමනාකරණ),**
**සැපයුම් අංශය - ශ්‍රී ලංකා වරාය අධිකාරිය,**
**අංක 45, ලේඩින් බැස්ටියන් පාර, කොළඹ 01.**

**දුරකථන අංක** : 2482231, 2483338, 2482499, 2482638, 2482832, 2482409, 2482652.
**ෆැක්ස් අංක** : 2381652, 2470443

# විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම

**බෙදාහැරීම් අංශ 4**

## ලංකා විදුලිබල මණ්ඩලය

ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදහැරීම් අංශ 4, මිල විතරයන් කැඳවීමේ ක්‍රියාවලිය (quotations), රාජ්‍ය ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතිය ('PROMISe' - Government Procurement Management platform) ඔස්සේ සිදු කිරීමට තීරණය කර ඇති බව ලංකා විදුලිබල මණ්ඩලයේ ලියාපදිංචි සැපයුම්කරුවන් හට සතුටින් දැනුම් දෙමු.

මේ මගින්, ලංකා විදුලිබල මණ්ඩලයේ සැපයුම්කරුවන් හට වඩාත් විනිවිදභාවයෙන් හා පහසුවෙන් ප්‍රසම්පාදන කටයුතු හා එක්විය හැකි වේ.

ඒ අනුව, ලංකා විදුලිබල මණ්ඩලයේ බස්නාහිර පළාත දකුණ 1 කාර්යාලයේ හා දකුණු පළාත් කාර්යාලයේ 2021 වර්ෂය සඳහා ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන සියලුම සැපයුම්කරුවන් 2021 ජනවාරි 01 දිනට පෙර www.promise.lk වෙබ් අඩවිය ඔස්සේ රාජ්‍ය ප්‍රසම්පාදන කළමනාකරණ පද්ධතියෙහි (PROMISe - Government Procurement Management platform) ලියාපදිංචි වියයුතු බව මෙයින් දැනුම් දෙමු.

**www.promise.lk**
**PROMISe - Government Procurement Management System**

මේ සඳහා වන ඕනෑම කරුණු විමසීමක්, පහත සඳහන් අංකයන් ඇමතීමෙන් ලබා ගත හැක.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බ.ප.ද I),**
**ලංකා විදුලිබල මණ්ඩලය, 3 වන මහල,**
**අංක 25, නගර සභා පටුමග, දෙහිවල**

**Tel: +94 11 2124900**
**Fax: +94 112623940/112633692**
**E-mail: dgmwps1@ceb.lk**

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දකුණු පළාත),**
**ලංකා විදුලිබල මණ්ඩලය, අංක 167,**
**මාතර පාර, ගාල්ල**

**Tel: +94 91 2232058**
**Fax: +94 91 2232058**
**E-mail: dgmsp1@ceb.lk**


ඉහත ලියාපදිංචි වීමේදී, සැපයුම් භාණ්ඩ සඳහා අදළ ප්‍රසම්පාදන කේතයන් (CPV codes) ඇතුළත් කිරීමට වග බලා ගන්නා ලෙසද වැඩි දුරටත් දන්වා සිටිමු. (මෙම කේතයන් www.promise.lk ඔස්සේ ලබා ගත හැක)

**අතිරේක සාමාන්‍යාධිකාරී**
**බෙදාහැරීම් අංශ 4**
**ලංකා විදුලිබල මණ්ඩලය**

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

විදුලි බලයෙන් සැසිරීමත් දිවියක්


The Housewives' companion
Classifieds on
Daily News

BE BETTER INFORMED!
News you can trust now free on your mobile phone.
Dinamina Daily News Thinakaran
Visit - apps.lakehouse.lk
DOWNLOAD TODAY!
AVAILABLE AT

LAKE HOUSE

# ටෙන්ඩර් දැන්වීමයි

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

අධ්‍යාපන අමාත්‍යාංශය

NLSL

## පිරිසිදු කිරීම් හා සනීපාරක්ෂක සේවා සැපයීම - 2021

කොළඹ 07, නිදහස් මාවතේ, අංක 14 හි පිහිටි ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල ගොඩනැගිල්ල පිරිසිදු කිරීම් හා සනීපාරක්ෂක සේවා සැපයීම් සඳහා 2020.12.28 දින ප.ව.2.00 දක්වා අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනවලින් සීල් තැබූ මිල ගණන් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් භාර ගන්නා අවසන් දිනය හා වේලාව 2020.12.28 දින ප.ව.2.00 වන අතර, එම වේලාව අවසන් වූ වහාම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුට හෝ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැකිය.

වැඩි විස්තර හා ටෙන්ඩර් ලියකියවිලි ආපසු නොගෙවනු ලබන රු. 2,000/- ක මුදලක් ගෙවා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මුදල් අංශයෙන් 2020.12.24 දින ප.ව. 3.00 දක්වා ලබාගත හැකිය. සෑම ටෙන්ඩරයක් සමඟම ටෙන්ඩර් කොන්දේසිවල දක්වා ඇති පරිදි මුළු වටිනාකමින් 2%කට නොඅඩු වටිනාකමට කොන්දේසි විරහිත ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට ඉදිරිපත් කළ යුතු වේ.

ඉදිරිපත් කරන ටෙන්ඩර් "කොළඹ 07, නිදහස් මාවතේ, අංක 14 හි පිහිටි ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩල සභාපති" නමට නියමිත වෙලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම හෝ කළ හැකිය.

**සභාපති,**
**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය,**
**අංක 14, නිදහස් මාවත,**
**කොළඹ 07.**

## බේරා නොගත් රන් භාණ්ඩ වෙන්දේසිය

2020.12.19 දිනට කුරුණෑගල ශාඛාවේ පැවැත්වීමට නියමිතව තිබූ භාණ්ඩ වෙන්දේසිය අවලංගු කරන ලද බව මෙයින් දන්වා සිටිමු.

සහකාර සාමාන්‍යාධිකාරී
(මෙහෙයුම් හා පරිපාලන)
නො. 450, ගාලුපාර, කොළඹ 03.

**පෑන් ඒෂියා බැංකුව**
සැබවින්ම ශ්‍රී ලාංකීයයි

## කොළඹ මහා නගර සභාව

### නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව

### මිල ගණන් කැඳවීම

### ටෙන්ඩර් විවෘත කිරීමේ දිනය දීර්ඝ කිරීම

01. කොළඹ 06, කුරේ ක්‍රීඩාංගණයෙහි යෝජිත ක්‍රීඩාගාරය ඉදිකිරීම

2020-12-18 දිනට විවෘත කිරීමට නියමිතව තිබූ ඉහත සඳහන් ටෙන්ඩරය 2020-12-24 දින පැය 10.00 දක්වා දීර්ඝ කළ අතර, ලංසු ලියකියවිලි 2020-12-23 දින පැය 10.00 දක්වා නිකුත් කරනු ලැබේ.

- ❖ මිල ඉල්ලීමේ වලංගු කාලය : 2021-06-21
- ❖ ලංසු ඇපකරයේ වලංගු කාලය : 2021-07-21

**නීතිඥ රෝෂණී දිසානායක,**
**නාගරික කොමසාරිස්,**
**කොළඹ මහා නගර සභාව,**
**නගර ශාලාව.**
**කොළඹ 07.**

## afc රන් ණය සේවාව
## රන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

එලායන්ස් ෆිනෑන්ස් කොම්පැනි පීඑල්සී පහත සඳහන් ස්ථානවල උකස් තබන ලද 2019-07-31 / 2019-08-30 / 2019-09-30 සහ 2019-10-31 දිනයන් වලදී කල්පිරුණු, මෙතෙක් බේරා නොගත් රන් භාන්ඩ 2020-12-30 වන දින පෙ.ව. 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### රන් ණය මධ්‍යස්ථාන

**අළුත්ගම, අම්බලන්ගොඩ, අම්පාර, අනුරාධපුර, අතුරුගිරිය, අවිස්සාවේල්ල, බදුල්ල, බලංගොඩ, මඩකලපුව, චන්කනෛයි, චාවකච්චේරි, හලාවත, චුන්නක්කම්, දඹුල්ල, ගලේවෙල, මොණරාගල, හැටන්, හෝමාගම, හොරණ, ජා-ඇල, යාපනය, කඩවත, කදුරුවෙල, කඩුවෙල, කලවංචිකුඩි, කල්පිටිය, කිලිනොච්චි, කිරිබත්ගොඩ, කිරිඳිවැල, මාලබේ, මාතර, මීගමුව, නිට්ටඹුව, පානදුර, පිළියන්දල, පේදුරු තුඩුව, පූගොඩ, රත්නපුර, රිකිල්ලගස්කඩ, තිරුනවේලි, ත්‍රිකුණාමළය, වව්නියාව, වැලිමඩ, දෙහිඅත්තකණ්ඩිය, ගල්ගමුව, කළුතර, කෑගල්ල, කැලණිය, කුරුණෑගල, නාවලපිටිය, රාගල, රාජගිරිය, වැලල්ලවාය**

### වෙන්දේසිය පැවැත්වෙන ස්ථානය සහ දිනය
**නො 722, කෝට්ටේ පාර, රාජගිරිය**
**2020-12-30**

වෙන්දේසිය සඳහා පැමිණෙන සියලුම දෙනා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය. දැනුම්දීමකින් තොරව වෙන්දේසිය අවලංගු කිරීමේ, කල් දැමීමේ හා ඒකාබද්ධ කිරීමේ බලය එලායන්ස් ෆිනෑන්ස් කොම්පැනි පී එල් සී සතුය.

ආරම්භය 1956
එලායන්ස් ෆිනෑන්ස්
කොම්පැනි පී එල් සී
සෞභාග්‍යයට විශ්වාසනීය අඩිතාලමක්

ප්‍රධානි - රන් ණය
**එලායන්ස් ෆිනෑන්ස් කොම්පැනි පී.එල්.සී**
නො.722, කෝට්ටේ පාර, රාජගිරිය.
දුරකථන - 0115 573600



**21 වැනි සියවසට එළඹෙන යෞවනයට**
නිරවුල් ගමන් මඟ
බුදුසරණ

## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

අධ්‍යාපන අමාත්‍යාංශය

### සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021

2021 වසර සඳහා ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයට අවශ්‍ය පහත සඳහන් භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා නිෂ්පාදකයින්ගෙන් / කොන්ත්‍රාත්කරුවන්ගෙන් හා සැපයුම්කරුවන්ගෙන් 2020.12.31 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**භාණ්ඩ සැපයීම්**

**(අ) කාර්යාලයීය උපකරණ**
01. වානේ අල්මාරි, කැබිනට් හා වානේ පුස්තකාල උපකරණ.
02. කාර්යාල ලී බඩු උපකරණ හා පුස්තකාල දැව උපකරණ.
03. පොත් බැඳීම් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ.
04. පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර හා අනෙකුත් කාර්යාලයීය උපකරණ.
05. වායුසමීකරණ යන්ත්‍ර

**(ආ) ලිපි ද්‍රව්‍ය**
06. සියලුම වර්ගවල කාර්යාලයීය ලිපි ද්‍රව්‍ය හා කඩදාසි වර්ග
07. පරිගණක සඳහා මුද්‍රණ කඩදාසි, පරිගණක රිබන් හා ටෝනර්.
08. ඩිජිටල් මුද්‍රණ යන්ත්‍ර හා ඡායා පිටපත් යන්ත්‍ර සඳහා තීන්ත, රිබන් හා ටෝනර් වර්ග.
09. ඡායා පිටපත් කඩදාසි.
10 පොලිතීන්.
11. රබර් මුද්‍ර, සහ දින මුද්‍ර.

**(ඇ) ගොඩනැගිලි ද්‍රව්‍ය හා වාහන අමතර කොටස්**
12. විදුලි භාණ්ඩ, බල්බ් වර්ග හා වයර්
13. යතුරු තහඩු, ඇණ වර්ග හා වෙනත් ලෝහමය භාණ්ඩ.
14. තීන්ත වර්ග, වාර්නිෂ් හා තිනර්.
15. තුනී ලෑලි, එම්.ඩී.එෆ්. බෝඩ්
16. ඇලුමිනියම් බාර්, වානේ තහඩු හා ඇණ මුරිච්චි.
17. ටයර්, ටියුබ් සහ බැටරි (කැබ් රථ, වෑන් රථ හා කාර් සඳහා)

**(ඈ) පොත් බැඳුම් ද්‍රව්‍ය**
18. පොත් බැඳුම් රසායනික ද්‍රව්‍ය කපුරුබෝල.
19. පොත් බැඳීම සඳහා මැලියම් සහ නූල්.
20. පැඟිරි තෙල්, කුරුඳු තෙල්, හල් දුම්මල, බිම් දුම්මල ආදිය.
21. පොත් බැඳීම සඳහා අවශ්‍ය කඩදාසි වර්ග, හාඩ්බෝඩ්, ලෙදරට්, මාබල් කොළ, චිප් බෝඩ් හා එතුම් කොළ, අම්ල රහිත ටිෂූ කඩදාසි, අත්කඩදාසි ආදිය.

**සේවා සැපයීම්**

**(ඉ) නඩත්තු කටයුතු**
22. ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු.
23. ගොඩනැගිලි පිරිසිදු කිරීම්, සනීපාරක්ෂක සේවා හා වැක්ස් කිරීමේ කටයුතු.
24. විදුලි කාර්මික හා ජලනළ කාර්මික කටයුතු.
25. ගොඩනැගිලි වායුසමීකරණය කිරීම.
26. වාහන අලුත්වැඩියා, සේවා කිරීම සහ රථවාහන වායුසමීකරණ කටයුතු.
27. කාර්යාල උපකරණ අලුත්වැඩියාව සහ නඩත්තු කටයුතු (ලී බඩු, වානේ උපකරණ)
28. කාර්යාල යන්ත්‍රසූත්‍ර අලුත්වැඩියාව සහ නඩත්තු (පරිගණක / යතුරුලියන / ඡායා පිටපත් යන්ත්‍ර)
29. වඩු කාර්මික / පෙදරේරු සේවා සැපයීම.

(ඊ) මුද්‍රණ කටයුතු
30. සියලුම මුද්‍රණ කටයුතු.
31. චිත්‍ර, බැනර්, පෝස්ටර් හා පින්තාරු වැඩ හා වෙනත්.
32. පොත් බැඳුම් කටයුතු.

(උ) වෙනත් සේවා
33. නිල හැඳුනුම්පත් සැකසීම.
34. ප්‍රදර්ශන කුටි සැලසුම් කිරීම හා නිර්මාණය කිරීම.
35. පොත් සංඛ්‍යාංකකරණය කිරීම (Digitization)

ලියාපදිංචිවීම සඳහා පහත සඳහන් ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් **කොළඹ 07, නිදහස් මාවතේ, අංක 14 හි ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සභාපති** නමට 2020.12.31 දිනට පෙර ලියාපදිංචි තැපැලෙන් ලැබෙන සේ එවිය යුතුය. එක් එක් අයිතම සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "**සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021**" යනුවෙන් සඳහන් කර ලියාපදිංචි වන අයිතමයේ අක්ෂරය සහ අංකය යෙදිය යුතුය. ලියාපදිංචි අයදුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීම් කරනු ලැබුවද, අවශ්‍ය අවස්ථාවලදී අනෙකුත් සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමේ අයිතිය සහ ඉදිරිපත් කරන අයදුම්පත් හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මණ්ඩලය සතුව පවතී.

සැපයුම්කරුවන් වශයෙන් ලියාපදිංචි වීම සඳහා රු. 500/- ක ආපසු නොගෙවන ගාස්තුවක් අයකරනු ලබන අතර, එම මුදල ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය නමින් ටොරින්ටන් ශාඛාවේ ඇති ලංකා බැංකු ගිණුම් අංක 2323283 තැන්පත් කර අනු පිටපත අයදුම් පත සමග ඉදිරිපත් කළ යුතුය. චෙක්පත් මගින් එවනු ලැබිය හැකි අතර චෙක්පත "**සභාපති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**" නමින් ලිවිය යුතු වේ.

මිල ගණන් කැඳවීමේදී අඛණ්ඩව මිල ගණන් ඉදිරිපත් නොකරන හා ඇණවුම් කරන භාණ්ඩ හා සේවා සැපයීමට අපොහොසත් ආයතන දැනුම් දීමකින් තොරව ලියාපදිංචි ලේඛනයෙන් කපාහරිනු ඇත.

**සභාපති,**
**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.**

### ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
### සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රය

01. ලියාපදිංචිය අපේක්ෂා කරන අයිතමය / අයිතමයන් හා එයටට අදාළ අක්ෂරය හා අනු අංකය : ..........
02. සැපයුම්කරුවන්ගේ නම, ලිපිනය, දුරකථන අංකය හා ෆැක්ස් අංකය : ..........
03. ව්‍යාපාර නාමය (තනි අයිතිය / හවුල් ව්‍යාපාරය / සී.ස. සමාගම් / නියෝජිත ආයතන) ..........
04. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ අංකය හා දිනය. (පිටපත් ඇමිණිය යුතුය) ..........
05. ණය පහසුකම් සැලසිය හැකි කාලය ..........
06. තැන්පත් කළ මුදල (මුදල් / චෙක්පත්) රු .......... ලදුපත් අංකය ..........
07. 2019 වසර සඳහා රජයේ දෙපාර්තමේන්තු, අර්ධ රාජ්‍ය ආයතන හා වෙනත් ආයතන සඳහා කළ සැපයීම් හෝ සේවා පිළිබඳ විස්තර (ලිපි මගින් සනාථ කළ යුතුය)

දිනය .......... ..........
අයදුම්කරුගේ අත්සන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
**මහාමාර්ග අමාත්‍යාංශය**
**මාර්ග සංවර්ධන අධිකාරිය**

## ලංසු කැඳවීම

ජාතික තරගකාරී ලංසුකරණය

### කිමී 100,000 වැඩසටහන යටතේ තෝරාගත් මාර්ග සඳහා ඇස්ෆෝල්ට් සැපයීම, ඇතිරීම සහ සම්පීඩනය කිරීම

01. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත විස්තර කර ඇති කොන්ත්‍රාත්තුවට අදාළව සියලුම දිස්ත්‍රික්ක සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අංකය | කොන්ත්‍රාත්තුවේ නම | සම්භාව්‍යතා මුදල රහිතව ඉංජිනේරු තක්සේරුව (රු.මි) (එක් කොන්ත්‍රාත්තුවකට) | ලංසු ඇපකරය (රු. මි) (එක් කොන්ත්‍රාත්තුවකට) | නැවත නොගෙවන ගාස්තුව (රු.) (VAT සහිතව) (එක් කොන්ත්‍රාත්තුවකට) | කොන්ත්‍රාත්තු කාලය මාස |
|---|---|---|---|---|---|
| 01 | එක් එක් දිස්ත්‍රික්කය තුළ කිමී 100,000 වැඩසටහන යටතේ තෝරාගත් මාර්ග සඳහා ඇස්ෆෝල්ට් සැපයීම, ඇතිරීම සහ සම්පීඩනය කිරීම | 490.0 | 5.0 | 10,000.00 | 06 |

02. **අවශ්‍ය ස්ථානවල මිශ්‍රණ පාදමක් සැපයීම, ඇතිරීම සහ සම්පීඩනය කිරීම සහ ඉංජිනේරුවරයාගේ උපදෙස් පරිදි මිමී 40 හෝ 50 ක බන්ධන ස්ථරයක් සහ ගෙවීම් ස්ථරයක් සැපයීම, ඇතිරීම සහ සම්පීඩනය කිරීම**, මෙයට ඇතුළත් වේ.

03. ලංසු කැඳවීම ජාතික තරගකාරීත්ව ලංසු පටිපාටිය අනුව සිදු කෙරෙනු ලැබේ.

04. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට ලංසුකරුවා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ මහා මාර්ග සඳහා වන විශේෂත්වය යටතේ **C 3 හා ඊට ඉහළ** ශ්‍රේණියේ ලියාපදිංචි වී සිටිය යුතුය.

05. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2020/12/17** සිට **2020/12/28 පැය 15.00** දක්වා මාර්ග සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියෙන් (http://www.rda.gov.lk/source/bids-ads.htm) ලංසු ලේඛන බාගත කරගත හැකිය.

06. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට පහත සඳහන් කාර්යාලයෙන් වැඩි දුර තොරතුරු ලබාගත හැකිය.

ව්‍යාපෘති අධ්‍යක්ෂ
දේශීය බැංකු අරමුදල් ව්‍යාපෘතිය
අංක. 24/A, අශෝක වටරවුම, ගැමුණු මාවත,
සුභූතිපුර, බත්තරමුල්ල
දු.අ. : 011-2187172 ෆැක්ස් : 011-2187173

07. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්, ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව සඳහා "**අධ්‍යක්ෂ ජනරාල්, මාර්ග සංවර්ධන අධිකාරිය**" නමට නිකුත් කෙරුණු VAT සහිත **රු.10,000.00** ක ගෙවීම් නියෝගයක් (දින 90 ක් වලංගු) ලබාගත යුතු අතර එය ලංසු ලේඛන සමග ඉදිරිපත් කළ යුතුය. ගෙවීම් නියෝගයක් නොමැති ලංසු ලේඛන ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. පූර්ව ලංසු රැස්වීම **මහාමාර්ග අමාත්‍යාංශය, 8 වන මහල, "මගනැගුම මහමැදුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල** හිදී **2020 දෙසැම්බර් 23** වන දින **පැය 14.00 ට** සිදු කෙරෙනු ලැබේ.

09. ලංසුව, ලංසු වලංගු කාලයේ සිට තවත් දින 28 කට වලංගු වන ලෙස ලංසු ඇපකරයක් සහිතව ඉදිරිපත් කළ යුතුය.

10. ගෙවීම් නියෝගයේ මුල් පිටපත සමඟ අදාළ ලංසුව, **පිටපත් දෙකකින්** යුතුව **2020 දෙසැම්බර් 30** වන දින **පැය 11.00ට** හෝ එදිනට පෙර සභාපති, අමාත්‍යාංශයීය ප්‍රසම්පාදන කමිටුව, මහාමාර්ග අමාත්‍යාංශය, 8 වන මහල, "මගනැගුම මහමැදුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල වෙත ගෙනවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ස්කයිප් තාක්ෂණය භාවිතා කර ලංසු විවෘත කරනු ලැබේ. විවෘත කිරීමේ දිනට පෙර ස්කයිප් සම්බන්ධතාවයට අදාළ තොරතුරු දැනුම්දෙනු ලැබේ.

11. ලංසු කැඳවීමේ අවසන් දින සිට **දින 119** ක් දක්වා කාලයකට ලංසු වලංගු වේ.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**මහා මාර්ග අමාත්‍යාංශය**
**8 වන මහල, "මගනැගුම මහමැදුර",**
**ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල**

**තරුණියන්ගේ කාන්තාවන්ගේ මවුවරුන්ගේ**
හද බැඳි කාන්තා පත්තරය
**සෑම බදාදාවකම**
**තරුණී**

**1950 සිට දිනපතා සහ සතිපතා පත්‍රවල පළවූ හා පළනොව ඡායාරූපවල දළ සේයාපට පුස්තකාලයේ තැන්පත් කර ඇත. ඔබටත් ඡායාරූප ලබාගැනීමට අවශ්‍ය නම් පුවත්පතේ නම, දිනය සහ ඡායාරූපයේ විස්තර සඳහන් කොට ලියා හෝ පැමිණ විමසන්න.**

**පුස්තකාලයාධිපති**
**දුරකථන**
**(011) 2 242 9491**

LAKE HOUSE

BE BETTER INFORMED!
News you can trust now free on your mobile phone.
Dinamina Daily News Thinakaran
Visit - apps.lakehouse.lk
DOWNLOAD TODAY!
AVAILABLE AT




LAKE HOUSE

# කළුතරටත් ONLINE ප්‍රශ්න

## ඇමතුමක් එන වෙලාවට දුරකතනයත් අරන්

## ගෙට උඩහ ගලට දුවන්න ඕනෑ



**පී. සෝමරත්න - මීගහතැන්න සමූහ**

කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් මෙරට අධ්‍යාපනයට සිදුව ඇත්තේ බලවත් පාඩුවකි. අනෙක් අතට එය ප්‍රබල අභියෝගයකි. කොවිඩ් - 19 වසංගතය පාලනය කර පාසල්, විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන ආයතන සහ පෞද්ගලික අධ්‍යාපන ආයතන යළි සුපුරුදු ලෙස ආරම්භ කරන තෙක් දරුවන්ට අධ්‍යාපනය දීමට නොගන්නා උත්සාහයක් නැත. නමුත් අපේ රටේ පවතින තාක්ෂණික දියුණුවේ යම් යම් ගැටලුවලට ගම්බද දරුවෝ මුහුණදී සිටිති. යල්පැන ගිය සාම්ප්‍රදායික ක්‍රම වෙනුවට දියුණු ලෝකය සමග යා යුතු නිසා අධ්‍යාපනය ද යාවත්කාලීන කළ යුතුමය. විද්‍යුත් මාධ්‍ය මඟින් අධ්‍යාපනය දීමේදී රූපවාහිනිය, ගුවන් විදුලිය, අභිභවා යමින් අන්තර්ජාලය භාවිත කරමින් 'ඔන්ලයින්' ක්‍රමයට ඉගැන්වීම මේ වන විට පෙර පාසල් දරුවාගේ පටන් විශ්වවිද්‍යාල සිසු සිසුවියන් දක්වාම පැතිර ගොස් තිබේ. කොවිඩ් - 19 හෝ වෙනත් වසංගතයක් හේතුවෙන් දරුවන්ගේ අධ්‍යාපනය අඩාළ වීමට ඉඩ දිය නොහැකිය. එසේම අධ්‍යාපනය ලබනවාද? ජීවත් වනවාද? යන්න ද ප්‍රශ්නයකි. නමුත් ලෝකය විශ්ව ගම්මානයක් නිසාම තාක්ෂණික මෙවලම් භාවිතයෙන් අධ්‍යාපන කටයුතු සිදු කිරීම ද අරුම පුදුම අමාරු කටයුත්තක් ද නොවේ.

කොවිඩ් - 19 හේතුවෙන් කබලට වැටුණු පාසල් දරුවන් අතිබහුතරයක් ළිපට වැටෙන්නේ අපේ රටේ ඔන්ලයින් අධ්‍යාපනයත් සමඟය. දුරකතන ඇමතුමක් ගන්නට ගස්, ගල් උඩ නගින්නට සිදුව ඇති ගම් බිම් බොහෝය.

තාක්ෂණික පහසුකම් අතින් යම් මට්ටමක සිටිනා බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ ගම්මාන රැසක ජනතාව තවමත් දුරකතන ඇමතුමක් ගැනීමට පවා පහසුකම් නැත. කළුතර දිස්ත්‍රික්කයේ බොහෝ ප්‍රදේශවල විශාල මුදල් දී චන්ද්‍රිකා තාක්ෂණයෙන් යුතු ඇන්ටනාවක් භාවිත නොකළහොත් රූපවාහිනිය නැරඹීමද කළ නොහැකිය. බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කය සිතියමෙන් කොළඹට ඉතා ළඟය. නමුත් තාක්ෂණික පහසුකම් අතින් ඈතය. මේ ගැන ප්‍රදේශවාසීහු 'දිනමිණ'ට මෙසේ පැවසූහ.

**බදුරලිය බදුරුගල්ලේ සුමිත්,**

"බදුරලිය බදුරුගල්ල ප්‍රදේශයට මොනම සිග්නල් එකක්වත් නෑ. මේ පැත්තට සාමාන්‍ය දුරකතන ඇමතුමත් ගත්තත් කැඩි කැඩී තමයි ඇහෙන්නේ. ඇමතුමක් එන වෙලාවට දුරකතනය අරගෙන ගෙට උඩහ තියෙන ගල උඩට දුවන්න ඕනෑ. මේ පැත්තට 3G, 4G තියා අඩුම තරමේ දුරකතන ඇමතුමක්වත් ගන්න බැහැ. මතුගම, කළුතර ටෙලිකොම් කාර්යාලවලට මේ ගැන ලිව්වා, කිව්වා. වැඩක් වුණේ නැහැ."

**පැලවත්ත යට්ටපාත ප්‍රදේශයේ පදිංචි විශ්වවිද්‍යාල සිසුවකු වන සසිඳු ජයවර්ධන,**

"අන්තර්ජාල වැඩක් කරගන්න ඕන වුණාම ලැප්ටොප් සහ දුරකතන අරගෙන ගමේ ටිකක් දුර සිග්නල් තියෙන උස තැනක් තියෙනව, එතනට යනවා. මේ දවස්වල කරන 'ඔන්ලයින්' ඉගැන්වීම මේ පැත්තෙ අපට නම් විහිළුවක් විතරයි."






**හෙවෙස්ස මණ්ඩාගල සුමනාවතී,**

"අපේ ජංගම දුරකතනය තියල තියෙන්නෙ ගෙදර ජනේලය උඩයි. ඇමතුමක් ආවම ඒක අරගෙන උඩට නගින්න ඕනෑ. ඒත් විසන්ධි වෙනවා. මේ ප්‍රදේශයට මොනම සමාගමකවත් සම්බන්ධතාවකට සිග්නල් නෑ."

**බුලත්සිංහල දෙල්පාවල සුසිලා ප්‍රියන්ති,**

"ඔන්ලයින් නෙමෙයි රූපවාහිනිය බලන්නත් රුපියල් හත් අටදාහක් දීල 'සැටලයිට්' ඇන්ටනා ගන්න ඕනෑ. කොවිඩ් - 19 නිසා මිනිස්සුන්ට කුලී රස්සාවක් වත් නෑ. ආදායම් නෑ. ඉතින් දරුවන්ට ඩේටා දාන්න අම්ම - තාත්තට සල්ලි නෑ."

# ආයෝජන මණ්ඩල නිලධාරීන්ට

## රාජ්‍ය ඇමැති විදුරගෙන් දොස්

**කල්‍යාණප්‍රිය රණසිංහ හොරණ විශේෂ**



හොරණ වගවත්ත කර්මාන්තපුරයට අයත් පිවිසුම් මාර්ගය පුළුල් කිරීම සම්බන්ධයෙන් අධීක්ෂණ චාරිකාවකට එක් වූ රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක මහතා ආයෝජක මණ්ඩලයේ නිලධාරීන්ගේ ක්‍රියාකලාපය විවේචනයට ලක් කරන ලදි. විකල්ප මාර්ගයක් තිබියදී එය වසා දමා අබලන් මාර්ගය පුළුල් කිරීම සම්බන්ධයෙන් ජනතාව දැඩි ලෙස විරෝධය පෑම පිළිබඳ සොයා බැලීමට ගිය අවස්ථාවේදී ඇමැතිවරයා මෙසේ එම නිලධාරීන්ට දොස් පවරා තිබේ.

"ආයෝජකයොත් එන්න ඕනෑ. හැබැයි ගමේ මිනිස්සු ගැන හිතන්න අවශ්‍යයි. පාර නිසා මිනිස්සුන්ගේ ගෙවල් කඩාගෙන යනවා නම් කිසිම විටෙක මම එයට ඉඩ දෙන්නේ නැහැ" යැයිද වික්‍රමනායක මහතා එහිදී කීය.

එහිදී වික්‍රමනායක මහතා වැඩිදුරටත් මෙසේද කීවේය.

"පරිසරය ආරක්ෂා විය යුතුයි. ජනතාවගේ ජන ජීවිතය ආරක්ෂා විය යුතුයි. එසේම මෙවැනි ආයෝජනවලින් ජනතාවට ප්‍රයෝජනයක් ලැබිය යුතුයි."

මේ අවස්ථාවට ගුවන් සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ඩී. වී. චානක, ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් අයිරාංගනී වීරසිංහ, හොරණ නගරාධිපති ඩබ්ලිව්. සිරිසෝම, හොරණ ප්‍රාදේශීය සභාවේ සභාපති අශෝක රණතුංග, හොරණ ප්‍රාදේශීය සභාවේ කොට්ඨාස මන්ත්‍රී මහේෂ් කුමාර යන මහත්ම මහත්මීහුද සහභාගි වී සිටියහ.

# කුරක්කන් මිල ඉහළ යෑමෙන්

## මාතලේ කෑම වෙළෙන්දෝ අසීරුතාවට

**නාඋල සමූහ**


කුරක්කන් කිලෝවක මිල රුපියල් තුන්සියපනහක් දක්වා ඉහළ යෑම හේතුවෙන් කුරක්කන් ආශ්‍රිත නිෂ්පාදන කටයුතුවල නිරත මාතලේ - ලග්ගල ප්‍රදේශයේ පිරිස් දැඩි අසීරුතාවකට පත්ව ඇතැයි ආහාර අලෙවි කරන්නෝ පවසති. රුපියල් දෙසීයක් වැනි මිලකට පැවති කුරක්කන් කිලෝවක් එකවර ඉහල මිලකට අලෙවි කිරීම හේතුවෙන් සිය නිෂ්පාදන සිදු කිරීම ගැටලුකාරී තත්ත්වයක් බව කුරක්කන් ආශ්‍රිත නිෂ්පාදකයෝ කියා සිටිති.

ලග්ගල ප්‍රදේශයේ බහුල වශයෙන් සිදුකරනු ලබන කුරක්කන් අලෙවිය හේතුවෙන් මේ වන විට ඒ ආශ්‍රිත නිෂ්පාදන බිහි කිරීම සඳහා අවශ්‍ය කුරක්කන් තොග වැඩි මිලට මිල දී ගැනීම දුෂ්කර කාර්යයක් වී ඇතැයි නිෂ්පාදකයෝ කියා සිටිති. කුරක්කන් පිටි අලවි කරනා ලග්ගල ප්‍රදේශයේ කාන්තාවක් වන ඒ.ජී. පොඩිමැණිකේ මහත්මිය කියා සිටියේ කුරක්කන් ඇට කිලෝවක් පිටි කළ පසු ලැබෙන්නේ ග්‍රෑම් අටසීයක පමණ පිටි ප්‍රමාණයක් බවයි. ඇසුරුම් හා ලේබල් සහිතව ග්‍රෑම් 500 කුරක්කන් පැකට්ටුවක් ඇය විසින් අලවි කරනු ලබන්නේ රුපියල් දෙසියතිහකටය. මේ තත්ත්වය හමුවේ කුරක්කන් ආශ්‍රිත නිෂ්පාදනවල මිල ගණන්ද ඉහළ ගොස් ඇති බව මේ සම්බන්ධයෙන් කළ විමසීමකදී මාතලේ හා දඹුල්ල අතර පිහිටි කුරක්කන් ආශ්‍රිත නිෂ්පාදන අලවි කරන්නෝ කියා සිටියහ.

දිනමිණ දුසත දස අත ම එක තැන

# සේරුවිල පූජා නගරයේ ගරාවැටෙන ගොඩනැගිලි පිළිසකර කර දෙන්න

## මුංහේනේ මෙත්තාරාම නාහිමි




**සුමිත්‍රා කුමාරිහාමි - කන්තලේ සමූහ**

සේරුවිල මංගල මහා විහරස්ථානයේ පූජා නගරයේ ඉදිරිකරමින් පැවති ගොඩනැගිලි හතරක් මේ වන විට ගරා වැටෙමින් පවතින අතර ඒවා නැවත පිළිසකර කර දීම හෝ කඩා ඉවත් කර දැමීමට කටයුතු කරනා මෙන් සේරුවිල මංගල මහා විහාරාධිපති කථිකාචාර්ය උතුරු නැගෙනහිර ප්‍රධාන සංඝනායක මුංහේනේ මෙත්තාරාම නාහිමියෝ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගෙන් ඉල්ලා සිටිති.

නාහිමියන් මාධ්‍ය වෙත අදහස් දක්වමින් මෙසේද පැවැසූහ.

"ධාතු මන්දිරයක්, කුඩා ධර්ම ශාලාවක් හා සංඝාවාස දෙකක් මෙසේ ඉදිකරමින් තිබුණා. යුද්ධය හේතුවෙන් බැතිමතුන් පැමිණීමක් ඒ කාලයේ සිදු වුණේ නෑ. මේ ප්‍රදේශ ජනශූන්‍ය වීමෙන් භාවිතයට නොගත් මෙම ගොඩනැගිලි දැන් ගරාවැටිලයි තියෙන්නේ. නාගරික සංවර්ධන අධිකාරියෙන් මේවායෙහි වහලවල් බිත්ති ප්‍රතිසංස්කරණය කරන්න සැලසුම් කරලා පසුගිය රජයෙන් මුදල් වෙන් කරලා තිබුණා. නමුත් ආණ්ඩු පෙරළියත් එක්ක ඒ වැඩකටයුතු අතරමග නැවතුනා. ජනාධිපතිතුමාගේ අවධානය මේ වෙත යොමු කරමින් මේ ගොඩනැගිලි නැවත භාවිතයට ගත හැකි තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය වැඩකටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටිනවා" යැයි උන්වහන්සේ පැවැසූහ.

එසේ පිළිසකර කිරීමට නොහැකි නම් මේවා මේ ස්ථානයෙන් ඉවත් කිරීමට වැඩපිළිවෙළක් සලසන මෙන් උන්වහන්සේ අවසානයේ පවසා සිටියහ.




# ඓතිහාසික මාතලේ ග්‍රන්ථය නව මුහුණුවරකින්

**ප්‍රියන්ත සුමනසේන - උකුවෙල සංචාරක සහ විරාජ් අබේසිරි මාතලේ මධ්‍යම**

"ඓතිහාසික මාතලේ ග්‍රන්ථය යළි නව මුහුණුවරක් ගනිමින් සංරක්ෂණය කිරීම ඉතාම වැදගත් වෙනවා. මේ වන විට ජනසන්නිවේදනය කියන මේ විෂය ඉතාමත් ඉහළින් දියුණු වෙලා තිබෙනවා යැයි" දඹුල්ල රාජමහා විහාරාධිපති ඉනාමලුවේ සුමංගල මාහිමිපාණන් වහන්සේ වදාළහ. ඓතිහාසික මාතලේ ග්‍රන්ථය සංරක්ෂණය කිරීමේ හා පිං පැමිණවීමේ අවස්ථාව සඳහා පැවති විද්වත් සභාවක් අමතමින් උන්වහන්සේ මෙසේ ද කීහ.

"පොත මුද්‍රණය කරනවා කියන්නේ සන්නිවේදන මාධ්‍යයක්. නමුත් සන්නිවේදන මාධ්‍යය ඉක්මවා ගිහිල්ලා අන්තර්ජාල හරහා විශාල පාඨක පිරිසක් අතරට යවන්න හැකියාව තිබෙනවා. මේ ග්‍රන්ථය මුද්‍රණය කිරීම පුංචි අඩුවක් සම්පූර්ණ කිරීමක් පමණයි. මේ ග්‍රන්ථය ස්කෑන් කරලා නැවත මුද්‍රණය කරන්න වෙනවා. ඒ තාක්ෂණය තුළින්ම ලිපි ගොනුවක් වශයෙන් ඉලෙක්ට්‍රොනික් පොතක් වශයෙන් අන්තර්ජාලයට මුදා හරින්න පුළුවන්."



මේ අවස්ථාවට මාතලේ දිසාපති එස්. එම්. ජී. කේ. පෙරේරා, අතිරේක ලේකම් සාන් විජේතිලක හා අතිරේක නිසාන්ත කරුණාතිලක මාතලේ හිටපු සංස්කෘතික සහකාර අධ්‍යක්ෂ (විශ්‍රාම) සේපාල විජේසූරිය යන මහත්වරු ඇතුළු මාතලේ දිස්ත්‍රික්කයේ රාජ්‍ය සම්මානලාභී ලේඛකයන් හා විද්වතුන් පිරිසක් සහභාගි වී සිටියහ.

# නාවලපිටිය නගර සභා

## අයවැය සම්මතයි

**පෙරමුණේ කුලරත්න - නාවලපිටිය විශේෂ**

නාවලපිටිය නගර සභාවේ 2021 වසර සඳහා අයවැය පසුගියදා එහි සභාපති සසංක සම්පත් සංජීව මහතා විසින් සභාවට ඉදිරිපත් කළ අතර එය වැඩි ඡන්ද දෙකකින් සම්මත විය. 2021 වසරේ නගර සභාවේ ආදායම පහළොස් කෝටි අනූතුන්ලක්ෂ හැටහතරදහස් හාරසිය තිහකි. වියදම රුපියල් දාහතර කෝටි විසි දෙලක්ෂ හතළිස්තුන්දහස් දෙසිය අනූදෙකකි. අතිරික්තය දාහත්කෝටි දොළොස් ලක්ෂ එක්දහස් එකසිය තිස් අටකි. මෙහිදී පාලක එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් මනෝ ගනේෂන් මහතාගේ නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා ප්‍රගතිශීලී සන්ධානයේ මන්ත්‍රී රාජා විජයරාගවන් මහතා අයවැයට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ අතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රී මොහොමඩ් මුනාස් මහතා සභාවට නොපැමිණි අතර ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රී ඒ. ඒච්. අසුරබලි මහතා ශ්‍රී ලංකා පොදුජන එක්සත් පෙරමුණ කණ්ඩායම සමඟ අයවැයට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන ලදි. ඒ අනුව නාවලපිටිය නගර සභාවේ 2021 වර්ෂය සඳහා ඉදිරිපත් කළ අයවැයට පක්ෂව ඡන්ද අටක්ද විපක්ෂව ඡන්ද හයක්ද ලැබී තිබිණි.

# කසිප්පු බෝතල් 550ක්

## ප්‍රවාහනය කළ 5ක් දැලේ

**සුනිල් මිහිඳුකුල - කොච්චිකඩේ විශේෂ**

නීති විරෝධී මත්පැන් බෝතල් 550ක් ගෝඩා ඩ්‍රැම් 15,000ක් සහ පෙරීමේ උපකරණ ද එම මත්පැන් ප්‍රවාහනය සඳහා භාවිත කළ වාහනය ද සමග සැකකරුවන් 5 දෙනකු අත්අඩංගුවට ගත් බව කොච්චිකඩේ පොලීසිය ප්‍රකාශ කළේය. මෙලෙස සැකකරුවන් අත්අඩංගුවට ගෙන ඇත්තේ දංකොටුව ප්‍රදේශයේ සිට කොච්චිකඩේ පොලිස් වසම හරහා මත්පැන් ප්‍රවාහනය කරමින් සිටියදීය.

# කතරගම සාහිත්‍ය උත්සවයේදී කලාකරුවන් 64කට තිළිණ




**කේ. ඩී. දේවප්‍රිය - කතරගම සංචාරක**

සාහිත්‍ය මාසය වෙනුවෙන් කල් දමා තිබූ කතරගම ප්‍රාදේශීය සාහිත්‍ය කලා උලෙළ සෞඛ්‍ය උපදෙස් මත කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පසුගියදා පැවැත්විණි. කතරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති පාසල් 05ක සිසුන්ගේ නිර්මාණ හා කලා සංගම් ඇතුළු ප්‍රදේශයේ කලාකරුවන්ගේ නිර්මාණ 64ක් තෝරාගෙන මේ පිරිස් සඳහා තිළිණ හා සහතිකපත්‍ර ප්‍රදානය කිරීම සිදුවිණි.

කතරගම ප්‍රාදේශීය ලේකම් ඒ. එම්. නන්දසිරි මහතාගේ ප්‍රධානත්වයෙන් මෙම වැඩසටහන පැවති අතර මේ අවස්ථාව සඳහා කතරගම ජයසුමනාරාමාධිපති ඌව පළාත් රාමඤ්ඤ මහ නිකායේ ප්‍රධාන සංඝනායක නාවිමන නාලක හිමි, සෙල්ලකතරගම වතුරුවා රාජමහා විහාරාධිපති සෙල්ලකතරගම විද්‍යාලයේ ආචාර්ය දෙනගම ධම්මරතන හිමියන් වැඩම කර සිටි අතර කතරගම ප්‍රාදේශීය සභාවේ සභාපති චානක අමිල් රංගන, කතරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන නිලධාරිනි දීපිකා සිරිවර්ධන, ප්‍රවීණ කිවිඳු නිමල් කුඩාතේහි යන මහත්ම මහත්මීහු ඇතුළු පිරිසක් සහභාගි වී සිටියහ.

# බියගම තෙත් බිම් සංවර්ධන ව්‍යාපෘතිය අරඹයි

**මහානාම විතානගේ - මල්වාන සමූහ හා සුදත් පුබුදු කීර්ති - දෙල්ගොඩ සමූහ**

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ උපදෙස් අනුව රජය මඟින් ආරම්භ කිරීමට යෝජිත බියගම තෙත් බිම් උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය ඉකුත්දා සියඹලාපේ හන්දිය ශරීර සුවතා ව්‍යායාම මංතීරුව අසලදී උත්සවාකාරයෙන් ආරම්භ කරන ලදි. නාගරික සංවර්ධන රාජ්‍ය ඇමැති නාලක ගොඩහේවා මහතා මෙහි ප්‍රධාන ආරාධිතයා විය. මෙම ව්‍යාපෘතිය යටතේ මෙහි ශරීර සුවතා ව්‍යායාම මංතීරුවට පහසුකම් සලසා දෙමින් රථ ගාලක්, හරිත උද්‍යානයක්, ළමා උද්‍යානයක්, වෙළෙඳසල්, බොජුන් හල්, ස්වයං රැකියා නිෂ්පාදන අලෙවිසල්, ජලාශ, ක්‍රීඩා මධ්‍යස්ථානයක්, විවෘත ව්‍යායාම මධ්‍යස්ථානයක්, වැවක් ආදිය ඉදි කරනු ඇත.

මේ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් රුපියල් මිලියන 150ක මුදලක් වෙන් කර තිබෙනා අතර මෙය අක්කර 50කින් සමන්විත වේ. මේ ප්‍රදේශයේ දැනට තිබෙන පරිසර පද්ධතිය රැකගෙන එම සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කිරීම මෙහි තවත් විශේෂත්වයක් විය. මෙම ආරම්භ කිරීමේ අවස්ථාවට ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ප්‍රසන්න රණවීර, ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී සහන් ප්‍රදීප් විතාන, බියගම ප්‍රාදේශීය සභාවේ සභාපති ආනන්ද ගනේපොල, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති හර්ශාන් ද සිල්වා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ඩුලීප් විජේසේකර, හිටපු බස්නාහිර පළාත් සභා මන්ත්‍රී ගුණසිරි ජයනාත් හා සියඹලාපේහන්දිය ශරීර සුවතා ව්‍යායාම මංතීරුවේ සභාපති නිමල් කාරියප්පෙරුම යන මහත්වරුන් ද බියගම ප්‍රාදේශීය ලේකම් චන්දිමා සූරියආරච්චි මහත්මිය ද ඇතුළු නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීහු සහභාගි වී සිටියහ.



# මැණික්කුඹුර ආර්ථික මධ්‍යස්ථානයේ අත්සෝදන ජලය කානු දිගේ

**එස්. ජී. විජේරත්න - කටුගස්තොට සමූහ**

කටුගස්තොට මැණික්කුඹුර විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය තුළ දෑත් සේදීම සඳහා සවි කර ඇති බේසම්වලින් ඉවතට යන අපිරිසුදු ජලය කානු පද්ධතිවලට නිසි අයුරින් ගලා නොයෑම හේතුවෙන් ගැටලුකාරී තත්ත්වයක් මතුව තිබේ. වෙළෙඳ සංගමයේ කාර්යාලය ඉදිරිපිට සවි කර තිබෙනා බේසමෙන් ඉවතට යන අපවිත්‍ර ජලය ඒ අසල ඇති කානුවට ගලා යෑමට සලස්වා තිබුණ ද එම කානුව නිසි පරිදි බෑස්මක් සහිතව ඉදි කර නොතිබීමෙන්නි එය ද උතුරා යමින් තිබෙන අයුරුද දැක ගත හැකි වේ. ආර්ථික මධ්‍යස්ථානය තුළට දෛනිකව පැමිණෙන 4000ක පමණ පිරිසකට මේ නිසා පවතින කෝවිඩ් - 19 අවදානමත් එක්ක සනීපාරක්ෂක ගැටලු මතුව තිබේ.

මෙම ගැටලුව පිළිබඳ ආර්ථික මධ්‍යස්ථානයේ වෙළෙඳ සංගමයේ සභාපති ඩී. එන්. සිල්වා මහතාගෙන් කළ විමසීමකදී ඒ මහතා මෙසේ පැවැසීය.

"අපි මේ වන විට සමිතියේ මුදලින් රුපියල් 53,000ක් පමණ වැය කර දෑත් සේදීමට බේසම් 07ක් මිල දී ගෙන තිබෙනවා. ඒ වගේම ඒවා සම්බන්ධ කිරීමට ඇවැසි ජල නළ පද්ධතියට රුපියල් 25,000ක් පමණ වැය කර වතුර බට අරගෙන තිබෙනවා. අපි අද හෙටම නගර සභාවේ අදාළ ආයතන සමඟ එකතු වී එම බේසම් නිසි පරිදි සකස් කරනවා. ඒ වගේම කානු පද්ධතියත් නිසි පරිදි ජලය ගලා යන අයුරින් සකස් කිරීමට කටයුතු කරනවා.





මහා රාවණා පුරාවත - 3

# රාවණා නැගිටීම වළක්වන ඉන්දියානුවන්ගේ පූජාව

**(සංවාදයට විවෘතයි)**

රාවණා යැයි කියූ සැණින් අප සිත්හි මැවෙන චිත්‍රයක් ඇත; අප සිත්සතන් තුළ තැන්පත් වූ රූපකායක් ඇත. අද වන විට ඔහු පිළිබඳ බොහෝ දේ ලියවෙයි; සාකච්ඡා කෙරෙයි; චිත්‍රපට හා ටෙලි නාට්‍ය ද තැනෙයි. මේ සා විශාල කතිකාවකට බඳුන්ව ඇති රාවණා පිළිබඳ ඉතිහාසය මෙන්ම ඔහුගේ බලපරාක්‍රමය පිළිබඳ තොරතුරු පිපාසාවෙන් පෙළෙන්නන් වෙනුවෙන් ලියැවෙන රාවණා පුරාවතේ තුන්වැනි ලිපියයි මේ. රාවණා පිළිබඳවත් රාවණා පරපුර පිළිබඳවත් ශ්‍රී ලාංකිකයන් අතර විවිධ මත පවතී. ඒ සම්බන්ධයෙන් පර්යේෂණ, ගවේශන හෝ නිරීක්ෂණ කරන්නන්ට මේ ලිපි පෙළ සඳහා සම්බන්ධ විය හැකිය. ඔබේ සංවාදාත්මක ලිපියත් ' කටාරම ' වෙත යොමු කරන්න.

මහා රාවණයන්ට එරෙහිව ඉන්දියානුවන් වාර්ෂිකව දුසේරා පූජාව පවත්වන්නේ ප්‍රබල හේතුවක් නිසාය. එනම් මහා රාවණයන් මිය ගොස් නැති බවත්, සිහිමුර්ජා තත්ත්වයෙන් සිටින බවත් ඔවුන් දන්නා නිසාය.

රාම-රාවණා යුද්ධයේදී රාවණ මිය ගියේ නැත. සිදුවූයේ සිහිමුර්ජා වීම පමණි. එය සිදුවූයේ විභීෂණයන් විසින් රහසිගතව රාම වෙත ලබා දුන්, මහා බ්‍රහ්මයාගේ ආශිර්වාද ලත්, මහා බලැති දිව්‍යමය ආයුධයක් වන 'බ්‍රහ්මස්ත්‍රය' නමැති හීයෙන් ලද පහරින්ය.

මෙම හීයෙන් රාවණයන්ට විද්දොත්, එය රාවණයන්ට බලපාන ආකාරය, එම හීය සඟවා ඇති ස්ථානය, එම ස්ථානයේ ඇති රහස්‍යභාවය, එම හී පහරින් රාවණයන් ඉතා දිගු කලකට සිහිමුර්ජා වන බවත්, විශේෂයෙන් පෘථිවිය පවතින තාක් රාවණා මරා දැමිය නොහැකි බවත් වැනි අතිශය රහස්‍ය කරුණු දැන සිටි එකම රාමගේ කිට්ටුවන්තයා වූයේ විභීෂණයන්ය. එම තොරතුරු දැන 'බ්‍රහ්මස්තය' අවිය ද විභීෂණයන්ගෙන් ලබාගත් රාම එයින් යැවූ බ්‍රහ්මස්ත හී පහරින් රාවණා සිහිමුර්ජා තත්ත්වයට පත් විය. එහෙත් වහාම ක්‍රියාත්මක වූ රාවණගේ 'ගන්ධබ්බ' සේනාව, සිහිමුර්ජා වූ රාවණාගේ සිරුර රැගෙන ගොස් රහසිගතව සඟවන ලදී.

සිරුර අතුරුදහන් වුවද රාවණා මිය නොගිය බැව් රාම දැන සිටියේය. ඒ හෙයින් කවදා හෝ දිනෙක රාවණා යළි සිහිගන්වා නැගිටින බැව් රාම දැන සිටියේය. එවක් පටන් රාවණා යළි නැගිටීම වළකාලීම සඳහා වාර්ෂික දුසේරා පූජාව පැවැත්වීම ආරම්භ කළේය. මේ වන විට වසර දහස් ගණනක් තිස්සේ ඉන්දියානුවන් විසින් වාර්ෂික දුසේරා පූජාව පවත්වයි. රාවණා මිය නොගිය බව ඉන්දියානුවන් ද තරයේ විශ්වාස කරන බවට මෙය හොඳම නිදර්ශනය වෙයි. මෙම පූජාවේ ප්‍රධාන අරමුණ වන්නේ රාවණා යළි නැගිටීම වළක්වාලීමය. යළි රාවණයන් අවදි වුවහොත් ඔවුනට විඳින්නට සිදුවන විපාක ඔවුන් මනාව වටහා ගෙන ඇත.

මෙම දුසේරා පූජාව පැවැත්වීමට මහ පොළව මත ලංකා සිතියම සකස්කොට ඒ මත මහා රාවණයන්ගේ විශාල පිළිරුවක් සවි කරනු ලබයි. ඒ අසලින්ම රාවණගේ සොහොයුරු කුම්භකර්ණ සහ රාවණ පුත් ඉන්ද්‍රජිත් හෙවත් මේඝනාදයන්ගේද පිළිරූ ඉදිකරනු ලබයි. ඉන්පසු සෙරෙප්පුවලින් තැනූ මල්මාල එම පිළිරුවලට පළඳවයි. අනතුරුව ඒවාට ඊතලවලින් විද පුළුස්සා දමයි. අනතුරුව ඉන්ද නොනැවතී කාන්තාවන් විසින් සෙරෙප්පු සහ පොල්වලින් පහර දෙමින් කෙළ ගසනු ලබයි. පිළිම ගිනිගෙන දැවී යන තෙක් 'දුෂ්ට රාවණා මැරියන්' සහ 'දුෂ්ට රාවණාට නැගිටින්නට බැරිවෙයන්' යන අරුත් ඇති වැකි කියමින් බොහෝ වේලාවක් සාප කරනු ලබයි.

මෙසේ සාප කිරීමේ ප්‍රබල හේතුව වන්නේ අක්ෂරවල තිබෙන බලයයි. මන්ත්‍ර ජප කිරීමෙන් බලයක් ඇතිවන්නාක් මෙන්, දහස් සංඛ්‍යාත ජනතාවක් එකවර එලෙස සාප කිරීමෙන් කිසියම් බලයක් ශක්තියක් උපදියි. මේ බව හොඳින් දන්නා ඉන්දියානුවන් රටේම ජනයා ඒකරාශී කරමින් රට පුරා එකම වේලාවක දුසේරා පූජාව සිදුකරන්නේ රාවණයන් යළි නැගිටීම වළක්වාලීම සඳහාය. දසදහස් සංඛ්‍යාත පිරිසක් හදවතේ සැබෑ ක්‍රෝධයක් උපදවාගෙන 'දුෂ්ට රාවණා මැරියන්' යන අදහසින් එකම මොහොතක නොකඩවා මහා හඬින් පවසා සිටීමෙන් එය බලයක් බවට පත් වෙයි. ශක්තියක් බවට පත්වෙයි.

එසේනම් මෙවැනි අවස්ථාවකදී, මෙවැනි ශාප කිරීමකදී අප විසින් කළ යුත්තේ කුමක්ද? අප ද විශාල පිරිසක් ඒකරාශීකොට, එකම වෙලාවක, එකම හඬින් 'රාවණා යළි නැගිටිනු' යනුවෙන් නොකඩවා අධිෂ්ඨානශීලීව විශාල හඬකින් පවසා ඊට ප්‍රතිවිරුද්ධව ක්‍රියා කිරීමයි.

මෙයින් අදහස් වන්නේ, ඉන්දියානු පිරිස හඬනගන ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක හඬක් අප විසින් නැගිය යුතු බවයි.

එසේ කළ යුත්තේ ඔවුන් හඬ නැගීමෙන් උපදින ශක්තියට වඩා වැඩි ශක්ති බලවේගයක් අප විසින් නිකුත් කළ යුතු බැවිනි. එවිට ඔවුන්ගේ ශක්තිය හීන වී අපගේ ශක්තිය ප්‍රබල වීමයි. මෙය අප ලක්දෙරණ පුරා එකම දවසක, එකම වේලාවක සිදුකළ යුතුය. ඉන්දියානුවන් රාවණයන්ට එරෙහිව සිදුකරනු ලබන්නේ 'දුසේරා' පූජාව පමණක් නොවේ. එවැනි තවත් පූජාවක් මෙසේය. ඉන්දියාවේ එක්තරා දේවාලයක දල්වන ලද ගිනිමැලයක් මත විශාල වතුර හැලියක් තබා, ඊට රාවණයන්ගේ වෛද්‍ය උපකරණ ආදිය දමා ජලය හොඳින් නටවනු ලබයි.

මෙහි විශේෂත්වය මෙයයි. මෙම කටයුත්ත හෙවත් මෙම උපකරණ අධික රස්නයෙන් පවත්වා ගැනීම සඳහා මෙම 'තැම්බීම' දවස් තුන්සිය හැටපහ තිස්සේ පැය විසිහතරම සිදු කිරීමයි. ඊට අවශ්‍ය මන්ත්‍ර ජප කිරීමට ද, ගිනිමැලය නොනිවී පවත්වා ගැනීමට ද පිරිසක් යොදවා සිටියි. මෙයින් ඔවුන් අදහස් කරන්නේ සිහිමුර්ජාවෙන් සිටින මහා රාවණා යළි නැගිටුවීම සඳහා කරනු ලබන ඖෂධ හෝ ප්‍රතිකාර බෙලහීන කිරීමයි.

එපමණකින් නොනවතින ඔවුන් මෙරටට ද පැමිණ මේ ආකාරයේ පූජාවන් සිදුකරන බව දැන් ඔප්පු වී හමාරය. මේ සඳහා මොවුන් ප්‍රධාන වශයෙන් තෝරාගෙන ඇති ස්ථානයක් වන්නේ රාවණා ඇල්ල ය.

මෙම ස්ථානයේද ඔවුන් විවිධ පුද පූජා පවත්වමින්, මන්ත්‍ර ජප කරමින් 'රාවණා මැරියන්' යනුවෙන් පූජා පවත්වයි. මොවුන් මේ සඳහා තෝරාගෙන ඇති කාලය වන්නේ අපට නැකැත් නැති නොනගත කාලයයි.

මේ පිළිබඳව අපගේ රාවංශය පර්යේෂණ කණ්ඩායමට රහසිගත තොරතුරක් ලැබිණි. ඒ අනුව ක්‍රියාත්මක වූ අප, ඔවුන්ට ප්‍රතිවිරුද්ධව මන්ත්‍ර ජප කළ හැකි පිරිසක් සමඟ එම ස්ථානයට යන විටත්, අප එන බව කෙසේ හෝ සැලවී ඔවුන් එතැනින් පලා ගොස් තිබිණි.

මොවුන් මෙසේ කුමන ආකාරයේ පූජාවන් සිදුකළ ද එය එතරම් පහසු කටයුත්තක් නොවේ. මහා රාවණයන් වසර ගණනාවක් තිස්සේ ලබාගෙන තිබූ අධ්‍යාත්මික ශක්තිය සාමාන්‍ය මිනිසුන්ගේ වචන උච්චාරණයකින් බිඳ දැමීම එතරම් පහසු කටයුත්තක් නොවේ.

එසේම උදේ සවස සූර්ය වන්දනාව සිදුකරමින්, පංචශීලයෙහි යෙදෙමින්, නිර්මාංශ ජීවිතයක් ගත කළ මහා රාවණයන්ට කාශ්‍යප බුදුරදුන්ගේ පිහිට නිරතුරුවම ලැබිණි. ඊට අමතරව ශිව දෙවියන්ගේ සහ නිකුම්භලාවියන්ගේ නොමද ආරක්ෂාව හා ආශිර්වාදය ද ලැබෙයි. අඟහරු ලෝකවාසීන්ගේ නිරතුරු ඖෂධ ලබාදීම මත ද, විශේෂයෙන් රාවණයන්ගේ සිරුර බෙහෙත් ඔරුවක බහා ඊට අවශ්‍ය සියලු ඇප උපස්ථාන කිරීම, ඊට ගන්ධබ්බ සේනාවෝ සහායට සිටීම, විහඟ බළකාය රැකවරණය සැපයීම සහ සොබාදහමේ ආශිර්වාදය ද හේතුවෙන් නිරතුරුවම මහා රාවණයන් රැකී සිටියි. මේ විශ්වය තුළ සූර්යයා පවතින තාක් රාවණයන් සතු ශක්තිය ද විනාශ කළ නොහැක. එමෙන්ම මහා බ්‍රහ්මයන්ගෙන් ලද ආශිර්වාදය වූයේ පෘථිවිය පවතින තාක් රාවණයෝ ජීවත් වීමය.

ඉන්දියානුවන්ගේ මෙම පළිගැසීමේ නැතහොත් විනාශකාරී සිතිවිල්ලෙන් කරනු ලබන දුසේරා පූජාවේ බල අඩුකිරීමට හෝ බලරහිත කිරීමට දැන් අප රට තුළ රාවණා බළඇණි ඒකරාශී වෙමින් පවතියි. මේ වන විට එම රාවණා බළඇණි එක්වී සිදුකරනු ලබන 'දුසේරා පූජාවට එරෙහි ප්‍රතිපූජා' ආරම්භ කොට තිබේ. මේ සියලු පූජාවන්හි අරමුණ වන්නේ ඉන්දියානුවන්ගේ දුසේරා පූජාවට එරෙහිව එහි බලගැන්වීම අහෝසි කිරීමයි.

දුසේරාවට එරෙහිව කරනු ලබන පූජාවන් විවිධාකාරය. මේ අනුව අප විසින් පළමුව කරනු ලබන්නේ, ඉන්දියාවේ රාවණා පිළිරූ දල්වනු ලබන වේලාවට ලංකාව පුරා තිබෙන සියලු රාවණා රූප සිසිල් කිරීමයි. ඉන්දියාවේ පිළිරූ ගිනිගෙන අවසන් වනතුරු සිසිල් පැන්, තැඹිලි වතුර සහ කිරි යොදා ගනිමින් මෙම සිසිල් කර තබා ගැනීම සිදු කරනු ලබයි. එසේම රාවණා ගුණ ගයනු ලබයි. රණබෙර වාදනය ද එක් අංගයකි. හෙළ නැටුම් ගැයුම් හා වැයුම් සිදුකොට අවසානයේදී රාවණයන්ගේ දසිස් බලයෙන් එකක් වන 'අංගම් හටන්' ශිල්පයේ රණකෙළි පූජාව පවත්වනු ලබයි.

මෙම සියලු පූජාවන් සිදු කරන්නේ මහා රාවණ යන්ත්‍රය පොළව මත ඇඳ එම සීමා තුළය. සතරකොන ස්වස්තික මුද්‍රා ඇඳ ඒ මත බුලත් තබා, ඒ මත මල් තබා, ඒ මත පොල්තෙල් පහන් දැල්වීම කළ යුතුය. අවට එළිය කරන්නේ දල්වනු ලැබූ විලක්කු වලිනි.

මහා රාවණ යන්ත්‍රය ඇඳි කොටස වටා තැඹිලි පහන් පූජාව කළ යුතුය. රාවණා පිළිරුව සහිත මාලිගය තුළ ගොක්කොළ, පොල් මල්, නුග - අඹ - කොහොඹ ආදී කොළ එල්ලා තබයි. නිල්, කහ, රතු වර්ණයේ කැලෑමල් ද රතු සහ සුදු නෙළුම් යන දියේ පිපෙන මල් ද පූජාව සඳහා භාවිත කරයි. මල්මාලාවලින් පිළිමය සරසනු ලැබේ. මේ වෙනුවෙන් කරනු ලබන පූජා විධි කිහිපයකි.

භාතිය මදනායක





> ඉන්දියානුවන්ගේ මෙම පළිගැසීමේ නැතහොත් විනාශකාරී සිතිවිල්ලෙන් කරනු ලබන දුසේරා පූජාවේ බල අඩුකිරීමට හෝ බලරහිත කිරීමට දැන් අප රට තුළ රාවණා බළඇණි ඒකරාශී වෙමින් පවතියි. මේ වන විට එම රාවණා බළඇණි එක්වී සිදුකරනු ලබන 'දුසේරා පූජාවට එරෙහි ප්‍රතිපූජා' ආරම්භ කොට තිබේ. මේ සියලු පූජාවන්හි අරමුණ වන්නේ ඉන්දියානුවන්ගේ දුසේරා පූජාවට එරෙහිව එහි බලගැන්වීම අහෝසි කිරීමයි.
> දුසේරාවට එරෙහිව කරනු ලබන පූජාවන් විවිධාකාරය.


දෙවන සෙල්ලිපිය

# කුවේණිගේ ළතෝනිය දෝංකාර දෙන ආනමඩුවේ තෝනිගල

ශ්‍රී ලංකාවේ ඓතිහාසික තොරතුරු විමර්ශනය කරන විට තෝනිගල නමින් පුරාවිද්‍යාත්මක සෙල්ලිපි ඇති වැදගත් ස්ථාන දෙකක් හමුවේ.එකක් වවුනියාව දිස්ත්‍රික්කයේ ඇති තෝනිගලයි.කිත්සිරිමෙවන් රාජ්‍ය සමයට අයත් මෙම සෙල්ලිපියේ එකල බැංකු ක්‍රමය සහ ආර්ථිකය ගැන සඳහන්වේ.අනෙක් තෝනිගල පිහිටා ඇත්තේ පුත්තලම දිස්ත්‍රික්කයේ ආනමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේය. මෙම තෝනිගල විජය-කුවේණි පුරාවෘත්තය හා බැඳී ඇති ඓතිහාසික ස්ථානයකි. එමෙන්ම ක්‍රි.පූ. පළමු ශත වර්ෂයට අයත් විශාලම අක්ෂර සහ දිගම සෙල්ලිපි දෙකක් හමු වී ඇති නිසා පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුක්ත ඓතිහාසික ස්ථානයකි. මෙම ලිපියෙන් විමර්ශනය කරනු ලබන්නේ ආණමඩුවේ තෝනිගල පුරාවිද්‍යාත්මක ස්ථානය පිළිබඳවය. පුත්තලම සිට කුරුණෑගල මාර්ගයේ කි.මී. 24 ක් පමණ ගිය විට හමුවන පරමාකන්ද හන්දියෙන් වමට හැරී මීටර් 500 ක පමණ දුරක් ගමන් කළ විට ආනමඩුවේ තෝනිගල නම් පුරාවිද්‍යාත්මක ස්ථානය හමුවේ.

විජය-කුවේණි සම්බන්ධ තෝනිගල පුරාවිද්‍යාත්මක මුලාශ්‍ර තවමත් නිසි ලෙස ගවේෂණය කර නොමැත.එනිසා සාහිත්‍ය මූලාශ්‍ර සහ ජනප්‍රවාද ඇසුරින් විජය-කුවේණි කතා පුවත ගොඩ නැඟී ඇති බව පෙනේ. සාහිත්‍ය මූලාශ්‍ර අතර මහාවංශය, පූජාවලිය ,කුවේණි අස්න වැදගත් තැනක් ගනී. විජය පුරාවෘත්තයෙන් කියවෙන පරිදි රජකම ගැනීම සඳහා විජය විසින් කුවේණි සහ ඇගේ නෑදෑයින් අතර ඇති වූ සටනින් විජය ජයගෙන ඇත.ඉන්පසු විජය කුවේණි හැර දමා යනවිට ඔහු පසු පස හඹා ගිය කුවේණියට නවතින ලෙස අණකර ඉරක් ගලේ ඇඳ ගිය බවත් එම අණ ඉර අසල සිට කුවේණිය ලතෝනි දුන් බවත් එතැන් පටන් එම ස්ථානය ළතෝනි ගල ලෙස හැඳින් වූ බවත් සාහිත්‍ය මුලාශ්‍රවල මෙන්ම ජනප්‍රවාදයේ පවතී.

පසුව දිගු කලක් ව්‍යවහාරයෙන් ‘ල’ ලොප් වී තෝනිගල වූ බව එක් මතයකි.ප්‍රබලයකුට දෙස් දෙවොල් කීමට හෝ ශාප කිරීමට නම් ඔහුගේ බල ප්‍රදේශයෙන් පිට සිට කළ යුතුයැයි සමාජ සම්මතයකි. විජය විසින් කුවේණි මාලිගාවෙන් පලවා හැරි පසු කුවේණියද විජයට ශාප කිරීමට ඔහුගේ බල ප්‍රදේශයෙන් පිට වී ඇවිත් දෙස්දෙවොල් දෙමින් ළතෝනි දුන් බව තවත් ජනප්‍රවාදයකින් කියවේ.

ඒ හේතුවෙන් ළතෝනි දුන් ගල ළතෝනි ගල ලෙස හඳුන්වා ඇත.පසුව තෝනිගල වන්නට ඇතැයි සිතිය හැකි බව විජය පුරාවෘත්තය ගවේෂණය කළ විද්වත්හු පෙන්වා දෙති. විජයාවතරණය පිළිබඳව සාහිත්‍ය මූලාශ්‍ර සහ ජනප්‍රවාද අතර ඇත්තේ එකිනෙකට පරස්පර කතන්දරය .

එහෙත් ඒ සෑම කතාවකින්ම මූලිකවම කියවෙන්නේ විජය සහ කුවේණි තෝනිගල අවට ජීවත් වී සිටි බවයි. විජය-කුවේණි කතාවට සාහිත්‍ය මූලාශ්‍ර රාශියක් ඇතත් ඓතිහාසික වටිනාකමකින් යුත් පුරාවිද්‍යා සාක්ෂි ඇත්තේ ඉතාමත් ස්වල්පයකි. එම මූලාශ්‍ර පවා නිසි ලෙස ගවේෂණය කර නැත.

තෝනිගල අවට යක්ෂ ගෝත්‍රිකයන්ගේ ජනාවාස තිබූ බව ග්‍රාම නාම කිහිපයක් මූලික කරගෙන සනාථ කිරීමට උත්සාහයක් දරා ඇත.තෝනිගල සිට කි.මී. 6 ක් පමණ දුරින් ‘ගරයක්ගම’ පිහිටා තිබේ. එමෙන්ම කුවේණියට තම පරපුරේ යකුන් දෙස් දුන් පෙදෙස ‘යක්දෙස්සගල’ බවට මතයක් පවතී. මේ හැර ආනමඩුව නගරය ආසන්නයේ ‘දරුමපාලය’ නමින් ගම් පෙදෙසක් ඇත.මේ ගමේ නම පිළිබඳව පුරාවිද්‍යා චක්‍රවර්ති එල්ලාවල මේධානන්ද හිමියෝ මෙසේ පවසති.

කුවේණියගේ දරුවන් දෙදෙනා වන ජීවහත්ථ සහ දිසාල ඇතිදැඩි වූ ගම්පියස දරුමපාලය ගමයි. ඒ දරු+උන්+පොල> දරුන්පොල> දරුම්පොල> දරුමපාලය ලෙස භාවිතයට පැමිණ ඇති බවයි. මේ හේතුන් මත කුවේණි තම්මැන්නා රජගෙදරින් පිටමංව අපේ තෝනිගල හරහා යන්නට ඇතැයි උන්වහන්සේ පවසති. තෝනිගල පිළිබඳව තවත් අදහසක් වන්නේ දෙමළ භාෂාවෙන් ‘තෝනි’ යනු ඔරුවයි.

මෙම ප්‍රදේශය ඔරුගල නමින්ද භාවිතා වී ඇත.ඔරුවක හැඩයෙන් යුත් පොකුණක් තෝනිගල ආසන්නයේම තිබී ඇත.මෑත කාලයේදී එය ගල් කඩන ව්‍යාපාරිකයින් විසින් වෙඩි දමා ගල් අලෙවි කර ඇත.ඔරුවක හැඩයට ජලය එක්රැස්වන කොටස පමණක් දැන් ශේෂ වී ඇත. මෙම



තෝනිගල නාම පුවරුව


සිමෙන්ති බදාම දියවී යන අයුරු

පොකුණ තම ජලස්නාන කටයුතු සඳහා භාවිතා කළ බවට ජනප්‍රවාදයක් ඇත.

විජය-කුවේණි කතා පුවත නිසා තෝනිගල ඓතිහාසිකව වැදගත්වන්නා සේම ක්‍රි: පූ: පළමු ශත වර්ෂයට අයත් ශිලා ලේඛන දෙකක් නිසා පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුක්තවේ. මේ සෙල්ලිපි දෙක ලංකා ඉතිහාසයේ හමු වී ඇති විශාලම අක්ෂර සහිත දිගම ශිලා ලේඛන වේ.මෙයින් එක් සෙල්ලිපියක් අක්ෂර 116 කින් සමන්විත වන අතර එය චාපාකාරව ගලේ කොටා ඇත. ශුද්ධ අක්ෂර නාගරවලින් ලියා ඇති මෙම ලිපිය වඩාත් වැදගත් වන්නේ අඩියක් පමණ විශාලව අඟලක් පමණ ගැඹුරට ගලේ කොටා ඇති නිසාය. එසේම අශෝක අක්ෂර නාගර ඒ අයුරින්ම මේ ලේඛනවලින් දැකගත හැකිය. පළමු ලිපියට මීටර් 400 ක් පමණ උතුරු දෙසින් එක දිගට පේලියට නෙළා ඇති තවත් ශිලා ලේඛනයක් ඇත.

පළමු ලිපියේ මෙන්ම ගැඹුරු සහ විශාල අක්ෂර මේ ලිපියේ ද දැකගත හැක.

පළමු ශිලා ලේඛනය

**පරමුඛ අභය පුත පරුමුඛ තිසහවාපි අචගිරික තිශ පවතහි අගත අනගත චතුදිශ ශගශ දිනෙ දෙවන පිය මහරජ ගාමිණි අභය නියතෙ අචනගර කච තව්රිකිය නගර කච පරුමක අභය පුත පරුමක තිශ නියත පිතෙ රජහ අගත අනාගත ශගශ** ප්‍රමුඛ අභයගේ පුත්‍ර ප්‍රමුඛ තිස්සගේ වැව අචාරගිරික තිස්ස පබ්බත විහාරයේ සතර දිගින් වඩිනා පැමිණි නොපැමිණි සංඝයාට පූජා කරන ලදි.ප්‍රමුඛ අභයගේ පුත්‍ර තිස්ස විසින් සතර දිසාවෙන් පැමිණි නොපැමිණි මහා සංඝයාට රජු ලවා පූජා කරන ලදි. යන්න එහි අදහසයි.

පළමු ශිලා ලේඛනයට මීටර් 400 ක් පමණ උතුරු දෙසින් දෙවන සෙල්ලිපිය පිහිටා ඇත.මෙම ලිපි දෙකම එකම අරමුණකින් එකම අර්ථයෙන් නෙළා ඇති අතර වචන කීපයකින් පමණක් වෙනස් වී ඇත.ශිලා ලේඛනවල මූලික අර්ථය සමානවේ.

මේ ලිපිවල සඳහන් පරිදි මහරජ ගාමිණි අභය යනු ක්‍රි: පූ: 99 77 කාලයේ දෙවන වරට රාජත්වයට පත්ව සිටි වට්ඨාගමිනි අභය (වළගම්බා) රජතුමාය. සෙල්ලිපිවල කාලය නිර්ණය කරන ප්‍රධාන සාධකය වන්නේ ලිපිවල සඳහන් ‘පිතෘ රාජ’ යන පදයයි.

හෙළ රාජාවලියෙහි පිතෘ රාජ යන උපපදය යෙදුන එකම රජු වළගම්බා රජු පමණකි.ඔහු පුත් ‘තිශ’ යනු මහාචුලි මහා තිස්ස බව මහාචාර්ය සෙනරත් පරණවිතානයන් inscription of ceylon කෘතියේ සඳහන් කර ඇත.

ශිලා ලේඛනවල ‘පවත’ යනුවෙන් සඳහන් කර ඇත්තේ කුමක්ද යන්න ගැන නිශ්චිත අර්ථයක් ගැනීමට මෙතෙක් කිසිදු විද්වතකුට හැකිවී නැත. මහාචාර්ය පරණවිතාන සූරින් පවසන්නේ ‘පවත’ යනු ‘විහාරය ’යන්නයි. තවත් වියතුන් කිහිපදෙනෙක්ම ‘පර්වතය’ හෝ ‘වැව’ යනුවෙන් යෙදුවත් අර්ථයට හානියක් නොවන බව පවසයි. පවත යනු විහාරය නම් තෝනිගලට කි.මී. 4 ක් පමණ දුරින් පිහිටා ඇති පරමාකන්ද විහාරය ශිලා ලේඛනයේ සඳහන් විහාරය ලෙස සැලකිය හැකිය.

පරමාකන්ද ලෙන් විහාරයේ ද බ්‍රාහ්මී අක්ෂරවලින් ලියන ලද ලෙන් ලිපි මෙන් සෙල්ලිපි කිහිපයක් ද ඇත. තෝනිගල සහ පරමාකන්ද ලෙන් ලිපි අක්ෂරවල සමකාලීන බවක් පෙන්වන බවත් ඉතිහාසඥයෝ පවසති.

පරමාකන්දේ මහපොකුණ අබියස ගල්බිත්තියේ ඇති ලිපියේ සහ තෝනිගල ලිපිවල අක්ෂර සාකල්‍යයෙන්ම සමාන බව කියවේ. තෝනිගල ලිපිවල සඳහන් වැව (වපි) ගල පිටුපස ඇති වැව විය හැකිය.

දෙවන ලිපියේ ‘වපි’ වෙනුවට ‘ඉමවපි’ (මෙම වැව) යනුවෙන් සඳහන් කර ඇත.හෙන්රි පාකර් (1909) සිය Ancient ceylon කෘතියේ එකල මේ වැවට භාවිතා කළ නම ‘ගලවැව’ හෝ ‘ගලේවැව’ බව දක්වා ඇත.දෙවන ලිපියේ තවත් වැදගත් කාරණයක් වන්නේ සිංහල ශිලාලේඛනවල ‘ඉ’ අක්ෂරය දක්නට තිබීමයි.


මේ ලිපිවලින් එකල සමාජ ආර්ථික සහ සංස්කෘතික කරුණු කිහිපයක් ද හෙළිවේ. ‘පරම්පරා නිලනාම’ ‘තනතුරු නිලනාම’ දේපොළ ප්‍රදානයන් වැනි දේ පිළිබඳව තොරතුරු හෙළි කර ගැනීමට ද හැකිවේ. ශිලාලේඛනවල සඳහන් ‘පරුමක’ ‘දෙවනපිය’ ආදී නාම රාජ්‍ය පාලනයට සම්බන්ධ නාමයන්වේ.සෙල්ලිපිවලට අනුව එකල පෞද්ගලික වැව් තිබී ඇති බව පැහැදිලිවේ. එම වැව්වලින් ගම්වලින් ලැබෙන ආදායම් නියම කරන ලද පන්සල්වලට පරිත්‍යාග කිරීමේ සිරිතක් තිබූ බව ද සනාථවේ.

වර්තමානය වනවිට මේ ශිලාලේඛන දෙකෙහිම ආරක්ෂාව සඳහා යකඩ වැටවල් වෙන වෙනම ඉදිකර ඇති නමුත් ලේඛනවල තත්ත්වය පරීක්ෂා කරන විට වැට පමණක් සෙල්ලිපිවල ආරක්ෂාවට ප්‍රමාණවත් නොවන බව පෙනේ. විජය -කුවේණි පුරාවෘත්තයට සම්බන්ධ සාක්ෂි පදනම් කරගෙන තෝනිගල පුරාවිද්‍යාත්මක පර්යේෂණයක් මෙතෙක් නොකිරීම කනගාටුවට කරුණකි. සෙල්ලිපි වැස්සට තෙමෙමින් අව්වට වේළෙමින් තවත් කලක් ගතවන විට දැනට ඇති නටබුන්වල ද ශේෂවන කොටසක් දැකීමට නොහැකි වනු ඇත. එනිසා තෝනිගල ඓතිහාසික වැදගත්කම කාලයේ වැලිතලාවෙන් වැසී යා හැකිය.

ඒ පිළිබඳව ගවේෂණය කිරීම පුරාවිද්‍යාඥයින්ගේ ,ඉතිහාසඥයින්ගේ මෙන්ම දේශප්‍රේමී නායකයින්ගේ ද යුතුකමකි. යකඩ වැටක් ඉදි කර සෙල්ලිපිවල ආරක්ෂාව සැපයීම පිළිබඳව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට පැසසිය යුතු වුවත් වැට සවි කිරීමට භාවිතා කර ඇති සිමෙන්ති බදාමය දියවී සෙල්ලිපි හරහා ගලා යාම නිසා ඉදිරියේදී අක්ෂර විකෘති වීමක් මෙන්ම විනාශ වීමක් ද සිදු වීමට බොහෝදුරට ඉඩකඩ ඇත.

දැනටමත් සෙල්ලිපිවල ඓතිහාසික පෙනුමට හානියක් සිදු වෙමින් පවතී. තෝනිගල වැනි ඉතා පැරණි ඓතිහාසික පුරා විද්‍යාත්මක ස්ථාන ආරක්ෂා කළ යුත්තේ අපේ යටගියාව පිළිබඳ තොරතුරු නිවැරදිව හෙළි කර ගැනීමට ඇති විශ්වසනීය මූලාශ්‍ර හේතුවෙනි.

**කෝනාර එම්. ගුණපාල**


සෙල්ලිපියේ අකුරු


ඔරුවක හැඩය ඇති පොකුණ


තෝනිගල වැව

කටාරම
සංස්කරණය - බන්ධුල ගුණරත්න
‘කටාරම’ ගැන ඔබේ අදහස් අපට කියන්න
‘කටාරම’, දිනමිණ, අංක 35, ලේක් හවුස්, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
katarama@lakehouse.lk

2020 දෙසැම්බර් 17 බ්‍රහස්පතින්දා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# දිනමිණ The Dinamina ටෙන්ඩර් හා අනෙකුත් දැන්වීම්

## ලංසු සඳහා ආරාධනයයි

### රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර

01. රුහුණ විශ්වවිද්‍යාලයේ, උප කුලපති වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත දී ඇති ශ්‍රේණි හා විශේෂතා යටතේ ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය ලබා ඇති යෝග්‍යතා පූර්ණ හා සුදුසුකම් ලත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ.

| අංකය | කාර්යය | ICTAD ශ්‍රේණිය (ගොඩනැගිලි) | ආපසු නොගෙවන ගාස්තුව (රු.) | ආපසු ගෙවන ටෙන්ඩර් ගාස්තුව / ලංසු සුරක්ෂණය (රු.) | ඉංජිනේරු වරයාගේ ඇස්තමේන්තුව (රු. මිලියන වලින්) | කොන්ත්‍රාත් කාලය (දින) |
|---|---|---|---|---|---|---|
| 01 | ගාල්ල, හපුගල, රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ විෂයාන්තර අධ්‍යයන අංශයෙහි පරිගණක මධ්‍යස්ථානය ලෙස භාවිතයට ගැනීමට පැරණි පුස්තකාලයේ යෝජිත නවීකරණය (RUH/REHAB/ENG/2020/01) | C 6 හෝ C 5 | 4,000.00 | 110,000.00 | 11.39 | 75 |

02. ලංසු කරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය මගින් මෙහෙයවේ.
03. එක් එක් ලංසුව සඳහා ඉහත දක්වා ඇති පරිදි ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුවක් ගෙවීමෙන් 2021 ජනවාරි 06 වැනිදා 14.00 පැය දක්වා ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදීගත හැකිය.
04. ලංසු 2021 අප්‍රේල් 08 දින දක්වා වලංගු විය යුතුය.
05. සියලුම ලංසු සමග ඉහත දක්වා ඇති පරිදි ලංසු සුරක්ෂණයක් සහ ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවා ලබාගත් ලදුපතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.
06. ලංසු සුරක්ෂණය **කොන්දේසි රහිත හා මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ උපකුලපති නමට** නිකුත් කළ එකක් විය යුතුය. ලංසු සුරක්ෂණය 2021 මැයි 06 දින දක්වා වලංගු විය යුතුය.
07. ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන **දිනය හා වේලාව 2021 ජනවාරි 07 දින 14.00 පැය වේ.**
08. යථා පරිදි සම්පූර්ණ කළ මුද්‍රා, තැබූ ලංසු අනු පිටපතකින් යුතුව ඉහත සඳහන් ලංසු භාරගැනීමේ අවසාන දින හෝ ඊට පෙර මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටිය අංක 01 හි ඉහත සඳහන් අවසාන දින හෝ ඊට පෙර තැන්පත් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. කවරයේ වම් ඉහළ කෙළවරේ කොන්ත්‍රාත්තුවේ නම සහ අංකය සඳහන් කළ යුතුය.
09. ලංසු භාරගැනීමේ වේලාව අවසන් වූ වහාම ඉහත ලිපිනයේදී සියලුම ලංසු විවෘත කෙරේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට සහභාගී වන ලෙස ආරාධනය කෙරේ.
10. අභිලාෂී ලංසුකරුවන්ට වැඩිමනත් තොරතුරු මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ සහකාර ලේඛකාධිකාරී (ප්‍රාග්ධන වැඩ) වෙතින් (දුරකථන 041-2227000 දිගුව 2131) ලබාගත හැකි අතර, ලංසුකරණ ලිපිලේඛන ඉහත ලිපිනයේදී කාර්යාල වේලාවන් තුළ නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර.**
**2020 දෙසැම්බර් 17**

---

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**මහා මාර්ග අමාත්‍යාංශය**

## මාර්ග සංවර්ධන අධිකාරිය

## ලංසු සඳහා ආරාධනයයි

### දක්ෂිණ අධිවේගී මාර්ගයේ 8+000 (EOI-LHS) හි කුඩා විවේක පෙදෙසක් ඉදිකිරීම

1. මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත විස්තර කොට ඇති ව්‍යාපෘතිය සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

   දක්ෂිණ අධිවේගී මාර්ගයේ 8+000 (EOI-LHS) හි කුඩා විවේක පෙදෙසක් ඉදිකිරීම මෙම කර්මාන්තයට අඩංගු වේ.

| කොන්ත්‍රාත් අංකය | කොන්ත්‍රාත්තුවේ නම | ඉංජිනේරු ඇස්තමේන්තුව (අනිශ්චිත වියදම් හැර) රු. මිලියන | ICTAD ශ්‍රේණිය | ලංසු ඇපකරය (රු.) |
|---|---|---|---|---|
| RDA/EOM&M/GOSL/STDP/MiniRest/2020/30 | දක්ෂිණ අධිවේගී මාර්ගයේ 8+000 (EOI-LHS) හි කුඩා විවේක පෙදෙසක් ඉදිකිරීම | 106.6 | සී4 | 1,600,000.00 |

2. කොන්ත්‍රාත්තුව සඳහා වන ඉදිකිරීම් කාලසීමාව ලිත් දින 181 කි.
3. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.
4. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, ඉහත සඳහන් කළ ශ්‍රේණිය හෝ ඉහළ ශ්‍රේණියක මහා මාර්ග ඉදිකිරීම් සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ දැනට ලියාපදිංචිය ලබා තිබිය යුතුය.
5. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු පහත සඳහන් කාර්යාලය වෙතින් ලබාගත හැකි අතර, එම කාර්යාලයේදී කාර්යාල වේලාව තුළදී ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

   අ. වැඩබලන අධ්‍යක්ෂ (EOM&MD) මාර්ග සංවර්ධන අධිකාරිය, කහටගහහේන, වල්ගම, බණ්ඩාරගම.

   දුරකථනය : 011-3047817, 011-3047806, ෆැක්ස් : 038-2289560
6. ආපසු ගෙවනු නොලබන රු. 20,000.00 + 1,600.00 (වැට් බදු) ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2020-12-17 වෙනි දින සිට 2021-01-13 වෙනි දින දක්වා 09.00 පැය හා 14.45 පැය අතර බණ්ඩාරගම, වල්ගම, කහටගහහේන, මාර්ග සංවර්ධන අධිකාරියේ (EOM&M අංශය) අධ්‍යක්ෂ වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ, කට්ටලයක් මිලදීගත හැකිය. ගෙවීම් මුදලින් සිදු කළ යුතුය. 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව ඒජන්ත සහ ටෙන්ඩරයේ සාර්ථක ජයග්‍රාහිලාභීන් සමාගම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතුය.
7. ලංසු, පිටපත් දෙකකින් යුතුව, 2021-01-14 වෙනි දින 14.00 පැයට හෝ ඊට පෙර ලැබෙන පරිදි **"අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය, 1 වන මහල, "මගනැගුම මහමැදුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල"** යන ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.
8. ලංසු, 2021-04-15 වෙනි දින දක්වා වලංගු විය යුතුය.
9. ලංසු සමග ලංසු ඇපකරයක් අමුණා එවිය යුතු අතර, එය 2021-05-13 වෙනි දින දක්වා වලංගු විය යුතුය.
10. පූර්ව ලංසු රැස්වීමක් 2021-01-05 වෙනි දින 10.30 පැයේදී බණ්ඩාරගම, වල්ගම, කහටගහහේන මාර්ග සංවර්ධන අධිකාරියේ (අධ්‍යක්ෂ EOM&M) කාර්යාලයේදී පැවැත්වේ.

**සභාපති,**
**මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව,**
**මාර්ග සංවර්ධන අධිකාරිය,**
**1 වන මහල, "මගනැගුම මහමැදුර",**
**අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

---


පත්‍රය බාරේ පළවන
දැන්වීම් සඳහා එවන පිළිතුරු
සාමාන්‍ය තැපෑලෙන්
එවිය යුතුයි

ලියාපදිංචි තැපෑලෙන් එවන ලියුම්
බාරගනු නොලැබේ




බුද්ධියට පණිවිඩයක්
ජීවිතයට නැවුම් බවක්
බුදුසරණ


---

**(වැවිලි අමාත්‍යාංශය / පොල්, කිතුල්, තල් හා රබර් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදනය හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය)**

## හලාවත වැවිලි සමාගම

### පොල් ගස් සහ පොල් ලෙලි අලෙවි කිරීමට මිල ගණන් කැඳවීම

| වත්ත | අලෙවිකරන | | ප්‍රසම්පාදනය විවෘත කරන | | |
|---|---|---|---|---|---|
| | ද්‍රව්‍ය | ප්‍රමාණය | දිනය | වේලාව | ස්ථානය |
| නිකවැරටිය | පොල් ගස් (වැටුණු / මැරුණු / කණාටු) | 225 | 2020.12.23 | පෙ.ව. 10.30 | නිකවැරටිය වතු කොට්ඨාසය තුත්තිරිවැව වත්ත, කොබෙයිගනේ. |
| හලාවත | පොල් ගස් (වැටුණු / මැරුණු) | 110 | 2020.12.23 | පෙ.ව. 10.30 | හලවාත වතු කොට්ඨාසය, සිත්තම්පලම් වත්ත, පොත්තුක්කුලම, පල්ලම |
| | පොල් ලෙලි | 94,278 | | | |
| දිවුලපිටිය | පොල් ලෙලි | 473,697 | 2020.12.24 | පෙ.ව. 10.30 | දිවුලපිටිය වතු කොට්ඨාසය, කටුකෙන්ද අංක 03 වත්ත, බඩල්ගම |

01. අදාළ ප්‍රසම්පාදනපත් රුපියල් 500/- ක ගාස්තුවක් ගෙවා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා සහ ප්‍රසම්පාදනපත් විවෘත කරන දිනයේ පෙ.ව. 10.15 දක්වා ඉහත සඳහන් ස්ථාන වලින් ලබාගත හැක.
02. වැඩි විස්තර සඳහා දුරකතන අංක 032-5741267 නිකවැරටිය, 032-2051522 හලාවත සහ 031-5679751 දිවුලපිටිය යන වතු අධිකාරිවරුන් අමතන්න.

**සභාපති - ප්‍රසම්පාදන කමිටුව,**
**හලාවත වැවිලි සමාගම, 165, පුත්තලම් පාර, හලාවත.**

---

**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**
**ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

CONSTRUCTION INDUSTRY DEVELOPMENT AUTHORITY (SUCCESSOR TO ICTAD)

## භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021

2021 වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා නිෂ්පාදකයන්ගෙන් / භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවීම.

| 01. | සැපයුම් | අයිතම අංකය |
|---|---|---|
| 01 | සියලුම කාර්යාල ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | 1.1 |
| 02 | කාර්යාල ලී බඩු හා වානේ නිෂ්පාදන (අල්මාරි, පුටු, මේස, කැබිනට්) ආදිය | 1.2 |
| 03 | පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර ඇතුලු සියලු ඉලෙක්ට්‍රෝනික උපාංග හා අමතර කොටස් | 1.3 |
| 04 | පරිගණක මෘදුකාංග | 1.4 |
| 05 | සියලුම ගොඩනැගිලි ද්‍රව්‍ය | 1.5 |
| 06 | මෝටර් රථ අමතර කොටස් හා උපාංග / ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ හා අමතර කොටස් | 1.6 |
| 07 | ටයර්, ටියුබ්, බැටරි (Wheel Alignment and Balancing ඇතුලුව) | 1.7 |
| 08 | ඕෆ් සෙට් හා ඩිජිටල් මුද්‍රණ කටයුතු | 1.8 |
| 09 | සියලුම ටෝනර් වර්ග සහ කාට්රිජ් වර්ග | 1.9 |
| 10 | තෑගි භාණ්ඩ හා සිහිවටන, ලෝහමය ලාංඡන කුසලාන හා පදක්කම් සාදා සැපයීම | 1.10 |
| 11 | වායු සමීකරණ යන්ත්‍ර, කම්ප්‍රේෂර් සහ වායු සමීකරණ අමතර කොටස් | 1.11 |
| 12 | සියලුම විදුලි උපකරණ හා දුරකථන පද්ධති | 1.12 |
| 13 | නිළ ඇඳුම් රෙදි සහ මසා නිමකරන ලද රෙදිපිළි (කමිස, කලිසම්, වැඩහල් ඇඳුම්, පාවහන් සහ ආරක්ෂිත පාවහන්) | 1.13 |
| 14 | හාඩ්වෙයාර් අයිතමයන් | 1.14 |
| 15 | ශ්‍රව්‍ය දෘෂ්‍ය අයිතමයන් | 1.15 |
| **02.** | **සේවා** | |
| 01 | සියලුම කාර්යාල ලී බඩු හා උපකරණ අලුත්වැඩියාව | 2.1 |
| 02 | මෝටර් රථ අලුත්වැඩියාව | 2.2 |
| 03 | වාහන වාර සේවා කටයුතු | 2.3 |
| 04 | වාහන ටින්කරින් කිරීම, පේන්ට් කිරීම, කට් ඇන්ඩ් පොලිෂ් කිරීම | 2.4 |
| 05 | වාහන කුෂන් වැඩ හා ඇතිරිලි වැඩ | 2.5 |
| 06 | වාහන වායුසමනය කිරීම | 2.6 |
| 07 | වාහන කුලියට ගැනීම කාර් / වෑන් / ලොරි | 2.7 |
| 08 | කාර්යාලීය හැඳුනුම්පත් සකස්කිරීම හා ඡායාරූපකරණය | 2.8 |
| 09 | වායුසමීකරණ අලුත්වැඩියාව හා නඩත්තු කිරීම | 2.9 |
| 10 | පරිගණක මුද්‍රණ කටයුතු, ඡායා පිටපත් යන්ත්‍ර අලුත්වැඩියා කිරීම | 2.10 |
| 11 | සනීපාරක්ෂක හා පවිත්‍රතා සේවාව | 2.11 |
| 12 | කෘමි උවදුරු පාලනය සේවාව | 2.12 |
| 13 | කාර්යාල වෙන්කිරීම (Partitioning) | 2.13 |

I. සැපයුම් ද්‍රව්‍ය ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට හෝ අධිකාරිය විසින් නම්කරන ස්ථාන වෙත ගෙනවිත් භාරදිය යුතුය.
II. ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලබන අතර, බාහිර සැපයුම්කරුවන්ගෙන්ද මිල ගණන් කැඳවා අවශ්‍ය මිලදී ගැනීම් හා සේවාවන් ලබාගැනීමේ අයිතිය අධිකාරිය සතුය.
III. ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි වී තිබිය යුතුය.

සැපයුම්කරුවෙක් වශයෙන් ලියාපදිංචි වීම සඳහා එක් එක් අයිතමය වෙනුවෙන් ආපසු නොගෙවන රු. 1500/- + VAT ලියාපදිංචි ගාස්තුවක් ගෙවිය යුතුය.

ලියාපදිංචිය සඳහා ඉදිරිපත්කරනු ලබන ඉල්ලුම්පත් අදාළ ලියකියවිලි සහ ලියාපදිංචි කිරීමේ ගාස්තු සභාපති, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය නමට රේඛනය කරන ලද චෙක්පත් සභාපති, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, සව්සිරිපාය, 123, විජේරාම මාවත, කොළඹ 07 යන ලිපිනයට **2021.01.07** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි. තවද ඉහත ලිපිනයේ මුදල් අංශයට පැමිණ ලියාපදිංචි ගාස්තු ගෙවා රිසිට් පතක් ලබාගත හැක. ලියාපදිංචිය සඳහා අවශ්‍ය විස්තර ඇතුළත්වන ඉල්ලුම්පත පහත දක්වා ඇත. ඉල්ලුම්පත් ඇතුලු ලියකියවිලි බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021"** යනුවෙන් සඳහන් කළ යුතුය.

සැපයුම්කරු VAT බදු ගෙවීම සඳහා ලියාපදිංචි වී ඇත්නම් VAT බදු අංකය සඳහන් දේශීය ආදායම් බදු දෙපාර්තුමේන්තුවෙන් ලබාගත් සහතිකයේ පිටපතක් අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ ඉදිරිපත් නොකරන අයදුම්කරුවන් VAT බදු සඳහා ලියාපදිංචි වී නොමැති බවට සළකනු ඇත.

සභාපති
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
සව්සිරිපාය, 123, විජේරාම මාවත,
කොළඹ 07.
විමසීම් - දුරකථන අංක : 011-2696166

**ආදර්ශ අයදුම් පත්‍රය**
**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**
**සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2021**

01. ලියාපදිංචිය අපේක්ෂා කරන අයිතමය හා අංකය - ..........................................
02. සැපයුම්කරුගේ / ආයතනයේ නම - ..........................................
03. ලිපිනය - ..........................................
04. දුරකථන අංකය / ෆැක්ස් අංකය - ..........................................

ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි පිටපතක් අමුණා එවිය යුතුය.

01. චෙක්පත් අංකය - ..........................................
02. දිනය - ..........................................
03. වටිනාකම - ..........................................

සැපයුම්කරුවෙකු ලෙස මා තෝරාගනු ලැබුවහොත් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් නියෝග කරනු ලබන කොන්දේසි හා නියමයන්ට යටත්ව නියමිත ආදර්ශයන්ට හා පිරිවිතරයන්ට අනුව 2021 වර්ෂය තුළ ද්‍රව්‍ය / සේවා සැපයීමට හා ඉටුකිරීමට එකඟ වෙමි.

දිනය ..........................................          ..........................................
සැපයුම්කරුගේ අත්සන
(රබර් මුද්‍රාව)

# ලංකා විදුලිබල මණ්ඩලය
# இலங்கை மின்சார சபை
# CEYLON ELECTRICITY BOARD

විදුලි පාරිභෝගිකයිනට අනර්ඝ සැපයුමක් හා සේවාවක් ලබාදීමේ අරමුණ සපුරා ගනු වස්, ලංකා විදුලිබල මණ්ඩලය පහත සඳහන් ප්‍රදේශවල විදුලි පද්ධතියේ නඩත්තු, පුනරුත්ථාපන හෝ තැනීම් කටයුතු කිරීමට අදහස් කරයි. මේ නිසාවෙන්, එම ප්‍රදේශවල විදුලිබල සැපයුම, පහත දක්වා ඇති දිනයන්හි / වේලාවන් හිදී තාවකාලිකව අත්හිටුවීමට සිදුවේ. මේ නිසා විදුලි පාරිභෝගිකයිනට සිදුවන අපහසුතාවයට අපගේ කනගාටුව ප්‍රකාශ කරන අතරම, සැලසුම් කරන ලද වැඩ අවසන් වූ වහාම නැවත විදුලි සැපයුම යථාතත්වයට පත් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් පියවර ගනු ලැබේ.

# මධ්‍යම පළාත

## 2020 දෙසැම්බර් මාසය තුළ පහත සඳහන් දිනයන් හා වේලාවන්හිදී විදුලිය අත්හිටුවනු ලැබේ. (II කොටස)

| දිනය | බලපැවැත්වෙන ප්‍රදේශ |
|---|---|
| **කටුගස්තොට විදුලි ඉංජිනේරු කාර්යාලය** | |
| **වත්තේගම පාරිභෝගික සේවා මධ්‍යස්ථානය** | |
